

සිංහල

# පුග්ගල පඤ්ඤත්ති විභාගය.

සිංහල

# පුගගල පඤඤතති

විභාගය



මුද්දරගම ධමමාලඞකාර සථවිර

2/75

# සිංහල
# පුග්ගල පඤ්ඤත්ති විභාගය.


සම්පාදක:-

ත්‍රිපිටකාචාර්ය පණ්ඩිත
මුද්දරගම ධම්මාලඞ්කාර ස්ථවිර.


හැඳින්වීම:-

බලගල්ලේ
සරස්වතී පිරිවෙන්හි
උපප්‍රධානාචාර්ය පූජ්‍ය පණ්ඩිත
හපුවලානේ ශ්‍රී ඤාණාලෝක මහාස්ථවිර
පාදයන් වහන්සේ.


ප්‍රකාශක:-

මුද්දරගම රෙජිස්ත්‍රාර් තැන්පත්
වෛද්‍යාචාර්ය ආර්. ඇස්. ඒ. ඇම්. ඊ. ශේඛාරත්න
වෛද්‍යතිලක මුහන්දිරම් මැතිතුමා.

මුද්‍රණය:-

දෙවලපොල මුද්‍රණාලය
දෙවලපොල

2498
1954

# හැඳින්වීම.

නමො බුද්ධාය.

## සිංහල පුග්ගල පඤ්ඤත්ති විභාගය.

බුද්ධදෙශනාව සූත්‍ර, අභිධර්ම, විනය, යි පිටකත්‍රයකින් යුක්තය. එහි අභිධර්ම පිටකය ධම්මසඞ්ගණී ආදී ප්‍රකරණ සතකින් සමුපලක්‍ෂිතය. ඒ ප්‍රකරණයන් අතුරෙහි පුග්ගල පඤ්ඤත්තිය ද එක් ප්‍රකරණයකි.

බුද්ධ දෙශනාවෙහි දක්වුණු ෂඩ්විධ ප්‍රඥප්තීන් අතුරෙහි පුද්ගල ප්‍රඥප්තිය විදහා දක්වමින් දෙශිත ධර්මය එහි ඇතුළත්වෙයි. එය පාලිභාෂාවෙන් දෙශිත හෙයින් සිංහල භාෂාව පමණක් දන්නා බෞද්ධ ලෝකයාට වැඩක් නැත. බුද්ධ ධර්මයෙහි බොහෝ දහම් කොටස් සිංහලයෙන් ඇතත් පුද්ගල ප්‍රඥප්තිය දක්වන දහම්කොටස් නැති කම පාඩුවකි. ඒ මේ පාඩුව පිරිමසාලීමක් වශයෙනි, මේ ග්‍රන්ථය රචනා කරන ලද්දේ. බුද්ධ ධර්මය සිංහලෙන් කියන්නට වන් බොහෝදෙනා ව්‍යාඛ්‍යාත ද්වාරයෙන් හෝ අනුවාද ද්වාරයෙන් කියනත් මේ ග්‍රන්ථය පුග්ගල පඤ්ඤත්තිප්පකරණය ඇසුරු කරමින් අමුතුම නිර්මාණයක් සේ රචිත හෙයින් මෙය සිංහල සාහිත්‍යයට එක්වුණු සාහිත්‍ය ග්‍රන්ථයක් සේ සලකනු සුදුසු.

රජයේ පාඨශාලාදියෙහි බුද්ධධර්මය උගන්වන්නට නියම කරතිබෙන මෙසමයෙහි මේවිදියේ ග්‍රන්ථයක් රචනා කිරීමෙන් මෙහි කර්තෘ තැන්පත් බණ්ඩාරබටවිල විද්‍යාකර පිරිවෙණේ උපප්‍රධානාචාර්ය ත්‍රිපිටකාචාර්ය පණ්ඩිත මිද්දරගම ධම්මාලඞ්කාර ස්ථවිර පාදයන් වහන්සේ බෞද්ධ ලෝකයාගේ ප්‍රශංසාවට පාත්‍රවන බව කියන අතරම, මේ ග්‍රන්ථය බුද්ධ ධර්මය ඉගැන්වීමේ නිර්දේශ පත්‍රයට ඉක්මණින්ම ඇතුළත් කළයුත්තක් බව ද කියමින.

මේවගට,
බලගල්ලේ සරස්වතී පිරිවෙන්හි
උපප්‍රධානාචාර්ය හපුවලානේ
ශ්‍රී ඥානාලෝක ස්ථවිර.

2498
1954. 4. 21 දින
බලගල්ලේ දීය.

# නිවේදනය.

අභිධර්ම පිටකයෙහි සප්ත ප්‍රකරණයන් අතර පුග්ගල පඤ්ඤත්තිය ඉතා සරල ග්‍රන්ථය වුවද, බෞද්ධයෙකු විසින් අවශ්‍යයෙන් දතයුතු දහම් කොටස්වලින් පරිපූර්ණය. බුද්ධ දෙශනාවෙහි දැක්වෙන පුද්ගල නාමයන්ගෙන් අධික ප්‍රමාණයක් විස්තර වශයෙන් හඳුන්වා තිබීම මෙහි ඇති විශේෂයයි. බුද්ධාදී ආර්‍ය්‍ය පුද්ගලයන් පිළිබඳ වූ මේ ග්‍රන්ථයෙහි දැක්වෙන තත්ත්වනිරූපණය සර්වසම්පූර්ණය. ධර්මකාමීන්ගේ මනදෙළ සපුරාලීමෙහි අත්‍යර්ථයෙන් සමර්ථය.

සූත්‍රපිටකයට අයත් අඞ්ගුත්තර නිකාය ආදී ග්‍රන්ථයන්හිද ඇතැම් පුද්ගලයෙකු හඳුන්වාතිබෙනු දක්නට හැකිය. එහෙත් මෙතරම් නිරවශේෂ විස්තරයක් ඒවායෙහි නොම සඳහනි. එබැවින් ධර්මරසිකයනට මේ ග්‍රන්ථය හස්තසාර වස්තුවකි.

**සිංහල පුග්ගල පඤ්ඤත්ති විභාගය.**

වූකලී පූර්වොක්ත අභිධර්ම ග්‍රන්ථය ආශ්‍රයෙන් ලිහිල් සිංහලයෙන් සැපයුණකි. මෙහි පුද්ගලයන් හැඳින්වීම පාලි ග්‍රන්ථයට අනුගත වනසේ උද්දෙස නිද්දෙස ක්‍රමයෙන් දැක්වෙයි. ඇතැම් තැනෙක ව්‍යවහාරොචිත පරිදි එම ක්‍රමය උල්ලඞ්ඝනය කරන්නට ද සිදුවිය. එහෙත් මූලික ග්‍රන්ථාගත කරුණුවලට හෝ ධර්මරසයට ඉන් හානියක් නොවේ. විවාදයට භාජනවූ පවත්නා තන්හි අර්ථකථා මතය අනුකරණය කරමින් අප අදහස් දැක්වූ තැනුදු ඇත. විවෙචකයන්ගේ විමර්ශනයට භාජන වියයුතු එබඳු ස්ථාන නවදුරටත් පරීක්ෂාකර බැලීම ධර්මධරයනට භාරවූවකි.

මෙම ග්‍රන්ථය පිළිබඳවූ දතයුතු දේ මොනවට පැහැදිලි කරමින් "හැඳින්වීමක්" සැපයූ අපගේ ධර්මාචාර්‍ය්‍යවරයෙකු වන **බලගල්ලේ සරස්වතී පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය පූජ්‍ය පණ්ඩිත හපුවලානේ ශ්‍රී ඥානාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** කෘතගුණ පූර්වකවූ සිහිපත් කරමු.

තවද මෙය ප්‍රකාශයට පැමිණවීමෙන් අපට උපකාර කළ මුද්දරගම "සිරිසේවනෙහි" නිවැසි රෙජිස්ත්‍රාර් තැන්පත් **වෛද්‍යාචාර්ය ආර්. ඇස්. ඒ. ඇම්. ජ්. සේනාරත්න වෛද්‍ය තිලක මුනන්දිරම්** මැතිතුමා සහ එම මැතිණිය වන **පාඨශාලාචාර්ය ඇම්. ඇස්. අනඝසෝන් හෝනා** මහත්මිය ද බෞද්ධ මහජනයාගේ ආශිර්වාදයට පාත්‍රවිය යුතුය. මෙම සත්කාර්යයෙහි උනන්දුකරවමින් අප මෙහෙයවූ සැදැහැවත් එම දෙපල උදාර කුසලයක් අත්පත් කරගත් බව පවසනුයේ බලවත් ප්‍රීතියෙනි.

මෙහි මුද්‍රණය ශෝභනලෙස හා ඉතා සැලකිල්ලෙන් කළ දෙවලපොල මුද්‍රණාලයයට අපගේ අවංක සතුතිය හිමි වේ.

මුද්දරගම ධම්මාලඞ්කාර ස්ථවිර.

සිරිනිකේතාරාමය,
මගලෙගොඩ.
වේයන්ගොඩ.
$\frac{2498}{1954}$ 5. 21

# පටුන


| පුද්ගල නාම | පිට |
|---|---|
| සමය විමුත්ත | 13 |
| අසමය විමුත්ත | 18 |
| කුප්ප ධම්ම | 19 |
| අකුප්ප ධම්ම | 20 |
| පරිහාන ධම්ම | 21 |
| අපරිහාන ධම්ම | 21 |
| චේතනා භබ්බ | 21 |
| අනුරක්ඛණා භබ්බ | 21 |
| පුථුජ්ජන | 22 |
| ගොත්‍රභූ | 25 |
| භයූපරත | 27 |
| අභයූපරත | 28 |
| අභබ්බාගමන | 28 |
| භබ්බාගමන | 29 |
| නියත | 30 |
| අනියත | 30 |
| පටිපන්නක | 30 |
| ඵලේඨිත | 31 |
| සමසීසී | 31 |
| ඨිතකප්පී | 33 |
| අරිය | 34 |
| අනරිය | 34 |
| සෙඛ | 35 |
| අසෙඛ | 36 |
| නෙවසෙඛ නාසෙඛ | 36 |
| තෙවිජ්ජ | 37 |
| ඡළභිඤ්ඤ | 38 |
| සම්මා සම්බුද්ධ | 40 |
| පච්චෙක බුද්ධ | 41 |

| | |
|---|---|
| උභතොභාග විමුත්ත | 42 |
| පඤ්ඤා විමුත්ත | 44 |
| කාය සක්ඛි | 44 |
| දිට්ඨිප්පත්ත | 44 |
| සද්ධා විමුත්ත | 45 |
| ධම්මානුසාරී | 46 |
| සද්ධානුසාරී | 46 |
| සත්තක්ඛත්තුපරම | 48 |
| කොලංකොල | 49 |
| එකබීජී | 49 |
| සකදාගාමී | 51 |
| අනාගාමී | 53 |
| අන්තරාපරිනිබ්බායී | 54 |
| උපහච්ච පරිනිබ්බායී | 55 |
| අසඞ්ඛාර පරිනිබ්බායී | 55 |
| සසඞ්ඛාර පරිනිබ්බායී | 55 |
| උද්ධංසොත අකණිට්ඨගාමී | 56 |
| සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්න | 58 |
| සොතාපන්න | 59 |
| සකදාගාමී ඵල සච්ඡිකිරියාය පටිපන්න | 60 |
| සකදාගාමී | 51 |
| අනාගාමී ඵල සච්ඡිකිරියාය පටිපන්න | 61 |
| අනාගාමී | 61 |
| අරහත්තඵල සච්ඡිකිරියාය පටිපන්න | 62 |
| අරහා | 62 |
| කොධන | 66 |
| උපනාහී | 66 |
| මක්ඛී | 68 |
| පළාසී | 68 |
| ඉස්සුකී | 69 |
| මච්ඡරී | 69 |

සඨ 75
මායාවී 75
අහිරික 77
අනොත්තප්පී 77
දුබ්බච 81
පාපමිත්ත 81
ඉන්ද්‍රියෙසු අගුත්තද්වාර 83
භොජනෙ අමත්තඤ්ඤු 83
මුට්ඨස්සති 87
අසම්පජාන 87
සීල විපන්න 88
දිට්ඨිවිපන්න 88
අජ්ඣත්ත සංයොජන 90
බහිද්ධා සංයොජන 90
අක්කොධන 94
අනුපනාහි 94
අමක්ඛී 97
අපළාසී 97
අනිස්සුකී 98
අමච්ඡරී 98
අසඨ 99
අමායාවී 99
හිරිමා 99
ඔත්තප්පී 99
සුවච 101
කල්‍යාණමිත්ත 101
ඉන්ද්‍රියෙසු ගුත්තද්වාර 103
භොජනෙ මත්තඤ්ඤු 103
උපට්ඨිත සති 106
සම්පජාන 106
සීල සම්පන්න 109
දිට්ඨි සම්පන්න 109

ද්විවිධ දුල්ලභ පුද්ගලයෝ 111
ද්විවිධ දුත්තප්පය පුද්ගලයෝ 113
ද්විවිධ සුත්තප්පය පුද්ගලයෝ 114
ද්විවිධ ආසව වඩ්ඪන්ත පුද්ගලයෝ 115
ද්විවිධ ආසව අවඩ්ඪන්ත පුද්ගලයෝ 115
හීනාධි මුත්ත 116
පණීතාධි මුත්ත 116
තිත්ත 117
තප්පෙතු 117
නිරාස 119
ආසංස 119
විගතාස 119
ත්‍රිවිධ ගිලානුපම පුද්ගලයෝ 121
කායසක්ඛි 124
දිට්ඨිප්පත්ත 124
සද්ධා විමුත්ත 124
ගූථ භාණී 124
පුප්ඵ භාණී 124
මධු භාණී 124
අරුකූපම චිත්ත 126
විජ්ජූපම චිත්ත 126
වජිරූපම චිත්ත 126
අන්ධ 128
එකචක්ඛු 128
ද්වි චක්ඛු 128
අවකුජ්ජ පඤ්ඤ 131
උච්ඡඞ්ග පඤ්ඤ 131
පුථු පඤ්ඤ 131
කාමභව අවීතරාග 133
කාමවීතරාග භව අවීතරාග 133
කාමභව වීතරාග 133
පාසාණ ලෙඛූපම 134

| | |
|---|---|
| පඨවි ලෙඛූපම | 134 |
| උදක ලෙඛූපම | 134 |
| ත්‍රිවිධ පොත්ථකූපම පුද්ගලයෝ | 136 |
| ත්‍රිවිධ කාසික වත්ථූපම පුද්ගලයෝ | 138 |
| සුප්පමෙය්‍ය | 139 |
| දුප්පමෙය්‍ය | 139 |
| අප්පමෙය්‍ය | 139 |
| න සෙවිතබ්බ | 140 |
| සෙවිතබ්බ | 140 |
| සක්කත්වා ගරුංකත්වා සෙවිතබ්බ | 140 |
| ජිගුච්ඡිතබ්බ න සෙවිතබ්බ | 142 |
| අජ්ඣුපෙක්ඛිතබ්බ න සෙවිතබ්බ | 142 |
| සෙවිතබ්බ | 142 |
| සීලෙසු පරිපූරකාරී සමාධි පඤ්ඤාසු මත්තසොකාරී | 145 |
| සීලසමාධිසු පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී | 145 |
| සීලසමාධි පඤ්ඤාසු පරිපූරකාරී | 145 |
| ත්‍රිවිධ ශාස්තෘවරයෝ | 147 |
| අපර ත්‍රිවිධ ශාස්තෘවරයෝ | 149 |
| අසප්පුරිස | 153 |
| අසප්පුරිසතර | 153 |
| සප්පුරිස | 153 |
| සප්පුරිසතර | 153 |
| පාප | 154 |
| පාපතර | 154 |
| කල්‍යාණ | 154 |
| කල්‍යාණතර | 154 |
| පාපධම්ම | 155 |
| පාපධම්මතර | 155 |
| කල්‍යාණධම්ම | 155 |
| කල්‍යාණධම්මතර | 155 |
| සාවජ්ජ | 155 |
| සාවජ්ජ බහුල | 155 |

අප්ප සාවජ්ජ 155
අනවජ්ජ 155
උග්ඝටිතඤ්ඤු 157
විපචි තඤ්ඤු 157
නෙය්‍ය 157
පදපරම 157
යුත්තපටිභාන නො මුත්තපටිභාන 159
මුත්තපටිභාන නො යුත්ත පටිභාන 159
යුත්ත පටිභාන මුත්ත පටිභාන 159
නෙව යුත්ත පටිභාන නො මුත්ත පටිභාන 159
සිවු වැදෑරුම් ධර්මකථික පුද්ගලයෝ 161
චතුර්විධ වලාහකූපම පුද්ගලයෝ 162
චතුර්විධ මූසිකූපම පුද්ගලයෝ 164
චතුර්විධ අම්බූපම පුද්ගලයෝ 166
චතුර්විධ කුම්භූපම පුද්ගලයෝ 168
චතුර්විධ උදක රහදූපම පුද්ගලයෝ 169
චතුර්විධ බලිවද්දූපම පුද්ගලයෝ 171
චතුර්විධ ආසීවිසූපම පුද්ගලයෝ 173
චතුර්විධ විපරීතග්‍රාහී පුද්ගලයෝ 175
චතුර්විධ සම්‍යක්ග්‍රාහී පුද්ගලයෝ 177
අන්‍යතර පුද්ගලයෝ සිවුදෙනෙක් 178
උට්ඨාන ඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී 180
පුඤ්ඤඵලූපජීවී නො උට්ඨානඵලූපජීවී 180
උට්ඨානඵලූපජීවීච පුඤ්ඤඵලූපජීවීච 180
නෙව උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී 180
තමොතමපරායණ 183
තමො ජොතිපරායණ 183
ජොති තමපරායණ 183
ජොති ජොති පරායණ 183
ඔනතොනත 187
ඔනතුන්නත 187

| | |
|---|---|
| උන්නතොනත | 187 |
| උන්න තුන්නත | 187 |
| චතුර්විධ රුක්ඛූපම පුද්ගලයෝ | 187 |
| රූපප්පසන්න | 189 |
| ඝොසප්පසන්න | 189 |
| ලූඛප්පසන්න | 189 |
| ධම්මප්පසන්න | 189 |
| අත්තහිත පටිපන්න නො පරහිත පටිපන්න | 192 |
| පරහිත පටිපන්න නො අත්තහිත පටිපන්න | 192 |
| අත්තහිත පටිපන්න පරහිත පටිපන්න | 192 |
| නෙව අත්තහිත පටිපන්න නො පරහිත පටිපන්න | 192 |
| අත්තන්තප | 195 |
| පරන්තප | 195 |
| අත්තන්තප පරන්තප | 195 |
| න අත්තන්තප පරන්තප | 195 |
| සරාග | 198 |
| සදෝස | 198 |
| සමෝහ | 198 |
| සමාන | 198 |
| අජ්ඣත්ත චෙතොසමථලාභී න අධිපඤ්ඤාධම්ම-විපස්සනාලාභී | 199 |
| අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී න අජ්ඣත්ත චෙතො සමථලාභී | 199 |
| අජ්ඣත්ත චෙතො සමථලාභී අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී | 199 |
| නෙව අජ්ඣත්ත චෙතොසමථලාභී අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී | 199 |
| අනුසොතගාමී | 202 |
| පටිසොතගාමී | 202 |
| ඨිතත්ත | 202 |
| තිණ්ණ | 202 |
| අප්පස්සුත සුතෙන අනුප්පන්න | 205 |

| | |
|---|---|
| අප්පස්සුත සුතෙන උප්පන්න | 205 |
| බහුස්සුත සුතෙන අනුප්පන්න | 205 |
| බහුස්සුත සුතෙන උප්පන්න | 205 |
| සමණ මචල | 208 |
| සමණ පදුම | 208 |
| සමණ පුණ්ඩරීක | 208 |
| සමණ සුඛුමාල | 208 |
| ආරභති විප්පටිසාරී | 212 |
| ආරභති න විප්පටිසාරී | 212 |
| න ආරභති විප්පටිසාරී | 212 |
| න ආරභති න විප්පටිසාරී | 212 |
| න ආරභති න විප්පටිසාරී(-ඛීණාසව) | 212 |
| දත්වා අවජානාති | 215 |
| සංවාසෙන අවජානාති | 215 |
| ආධෙය්‍යමුඛ | 215 |
| ලොල | 215 |
| මන්දමොමූහ | 215 |
| පඤ්චවිධ යොධාජීවූපම පුද්ගලයෝ | 219 |
| පඤ්ච පිණ්ඩපාතික පුද්ගලයෝ | 222 |
| ෂඩ්විධ සත්‍යාවබොධක පුද්ගලයෝ | 226 |
| සප්ත උදකූපම පුද්ගලයෝ | 231 |
| අෂ්ට ආර්‍ය්‍ය පුද්ගලයෝ | 237 |
| නවවිධ පුද්ගලයෝ | 238 |
| දසවිධ නිෂ්ඨා පුද්ගලයෝ | 238 |

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 6 10 | සඞ්ඛෙත | සඞ්කෙත |
| 5 | 20 | සඞ්ඛෙතයෙකිය් | සඞ්ඝොතයෙකින් |
| 5 | 27 | වෙළුතාදි | වෙළුවතාදී |
| 7 | 18 | යසසනුසාරෙන | යසසානුසාරෙන |
| 27 | 10 | නිතැතින්ම | නිතැතින්ම |
| 28 | 16 | වළකියනුයේ | වළකිනුයේ |
| 29 | 28 | ප්‍රතක්‍ෂ | ප්‍රත්‍යක්‍ෂ |
| 30 | 5 | තැනැන්තෝද | තැනැත්තෝද |
| 37 | 14 | කරන්නාට | කරන්නට |
| 37 | 29 | භාවාන්තර | භවාන්තර |
| 41 | 22 | තන | තැන |
| 41 | 23 | තමූදු | තමුදු |
| 53 | 16 | සක්කාදිට්ඨි | සක්කායදිට්ඨි |
| 53 | 16 | සයොජන | සංයොජන |
| 59 | 24 | සළඛ්‍යාත | සඞ්ඛ්‍යාත |
| 62 | 27 | විත් | විසින් |
| 66 | 5 | අනභිරද්ධි | අනභිරද්ධි |
| 66 | 23 | එකුද්දෙසෙයකැ | එකුද්දෙසයෙකැ |
| 81 | 32 | පයහීපන්නය | පයහීපන්නය |
| 82 | 26 | අනුසාසතිං | අනුශාසතිං |
| 100 | 13 | තෙර | තිරෙළු |
| 103 | 28 | වෙනි පෙළේ භාණ්ඩයන් යන්න 104 පෙළේ සියළු යන්න ළඟට යොදගත යුතුය. | |
| 103 | 30 | නිතැතින්ම | නිතැතින්ම |
| 106 | 10 | අනෙවෂණ | අන්වෙෂණ |
| 107 | 9 | භාණ්ඩාගාරින | භාණ්ඩාගාරික |
| 125 | 23 | කාත්තවැ | කාන්තවැ |
| 132 | 12 | ප්‍රකාස | ප්‍රකාශ |
| 139 | 2 | හෝ | හෝ ගනී |

| | | | |
|---|---|---|---|
| 162 | 1 | වලාහකොපම් | වලාහකූපම් |
| 187 | 11 | නාමාරොපණයන් | නාමාරොපණයෙන් |
| 193 | 11 | ලද්දෙක් | ලද්දක් |
| 200 | 5 | පෙළේ ශ්‍රුතා යන්න විනේතකා යන්න ළඟට යොදා ගත යුතුය. | |
| 201 | 10 | ගවජ්මානය | ගම්‍යමානය |
| 201 | 29 | ධ්‍යානයම | ධ්‍යානයට |
| 205 | 3 | ලොකාත්තගු | ලොකාන්තගු |
| 205 | 8 | යොකොචි | යෙකෙචි |
| 205 | 11 | තණ්හාධිපත්තා | තණ්හාධිපන්නා |
| 206 | 15 | දත්පමණිඳු | දත්පමණිනුඳු |
| 212 | 22 | පෙළේ දෙවැනි ඔහුට යන්න අධිකය. | |
| 213 | 3 | පැනතේ | පැනෙත් |
| 213 | 8 | ප්‍රඥවක් | ප්‍රඥවත් |
| 218 | 25 | ගීතප්පණීලිත | ගීතප්පණීත |
| 227 | 7 | කෘත්‍යකෘත්වයෙහි | කෘතකෘත්‍යත්වයෙහි |
| 231 | 23 | ගිතිවලට | ගිනිවලට |
| 233 | 28 | පත්වලට අදගා | පත්ලට අදනා |

මේ ග්‍රන්ථය

බලගල්ලේ සරසවතී

පරිවෙණාද්ධ්‍යක්‍ෂකව වැඩවුසූ

බෝධිසත්ත්ව ගුණෝපශෝභිත

මහෝපාද්ධ්‍යාය අතිගෞරවාහී

මුඩගමුවේ සිරිසුගත සාසනාලඞකාර

සිරිනිවාසාසභ මාහිමියාණන්

වහන්සේගේ ශ්‍රී නාමයට

අත්‍යන්ත ගෞරවයෙන්

පුදනු ලැබේ.

සම්පාදක.

# – සිංහල –
# පුග්ගල පඤ්ඤත්ති විභාගය.

## නමත්ථු සත්ථුනො

### දුවිධ දෙසනා

සම්මා සම්බුදු රජාණන් වහන්සේ විනෙය ජනයන්ගේ සුඛාවබොධය සඳහා සම්මුති කථාව හා පරමත්ථ කථාවත් ගෙනහැර පාමින් දහම් දෙසන සේක. සත්ත-පුග්ගල-දෙව-බ්‍රහ්මාදී ලොකව්‍යවහාරය සම්මුති නම්. අනිච්ච-දුක්ඛ-අනත්ත-ඛන්ධ-ධාතු-ආයතන-සතිපට්ඨානාදී අයුරු ව්‍යවහාරය පරමත්ථ නම්. යමෙක් සත්ත-පුග්ගලාදි සම්මුති දෙශනාව අසා අර්ථාවබොධය කෙරේද, මොහය දුරිභූත කොට විශෙෂාවබොධයෙන් අග්‍රඵලය ලබා ගන්නට සමර්ථවේද, ඔහුට භාග්‍යවතුන් වහන්සේ සත්ත-පුග්ගල-දෙව-පුරිසාදි ව්‍යවහාරයෙන් දහම් දෙසත්. යමෙක් අනිච්ච-දුක්ඛ-අනත්තාදී පරමාර්ථ ව්‍යවහාරයන් අතුරෙන් යමක් ශ්‍රවණය කොටම සිව්සස් පිළිවිදින්නට සමත් වේද, ඔහුට අනිච්ච-දුක්ඛාදී ව්‍යවහාරයෙන් දහම් දෙසති. සම්මුති කථාවෙන් ම ධර්මාවබොධය ලබන්නහුට පළමුව පරමාර්ථ කථාව දෙශනා නොකොට සම්මුතියෙන් අවබොධය ලබාදී පසුව පරමාර්ථය දෙශනා කරති. පරමාර්ථ කථාවෙන් අවබොධය ලබන්නහුටද, පළමුව සම්මුති කථා නොපවසා පරමාර්ථයෙන් අවබොධය ලබාදී පසුව සම්මුති කථාවද, දෙශනා කරත්. ප්‍රකෘතියෙන්ම පරමාර්ථ කථාව දුරවබොධ හෙයින් පළමුව සම්මුතිය වදාරා පසුව පරමාර්ථය දෙශනා කිරීම, බුදුවරුන්ගේ සාමාන්‍යයෙන් ආවෙණික වූ පවත්නා සිරිතෙකි. උන්වහන්සේලා සම්මුතිය වදාරන්නාහු ද,

සත්‍යයක් ම ස්වභාවයක් ම නිබොරුවූවක් ම දෙශනා කරත්. පරමාර්ථය වදරන්නාහුද, ඇත්තක් ම ස්වභාව සිද්ධයක් ම, බොරු නොවූවක් මදෙසත් මැයි.

"දුවෙ සච්චානි අක්ඛාසි - සම්බුද්ධො වදතං වරො
සම්මුතිං පරමත්ථඤ්ච - තතියං නූපලබ්භති.

සඞ්කෙත වචනං සච්චං - ලොක සම්මුති කාරණං
පරමත්ථ වචනං සච්චං - ධම්මානං තථ ලක්ඛණං

තස්මා වොහාර කුසලස්ස - ලොකනාථස්ස සත්ථුනො
සම්මුතිං වොහරන්තස්ස - මුසාවාදො න ජායති"

ලෝකයාගේ පහසු ව්‍යවහාරය සඳහා පැණැවුණු නාම සඞ්කේතය ඒ වූ ලෙසින් ම මහජනයා පිළිගන්නා හෙයින් සම්මුතිය ද සත්‍යයකි. කිසිකලෙකත් වෙනස් නොවී පවත්නා ස්වභාවයෙන් අවිපරිතාර්ථය ස ලකා පරමාර්ථයද සත්‍යයක්මය. එබැවින් මේ ද්විවිධ ව්‍යවහාරය තත්වාර්ථ විසින් පවත්නේ බුද්ධාදී උත්තමයන්ගේ වාග්මාලාවට නුසුදුසු වනුයේ නොවේ. සම්මුතිය කලින්කල වෙනස්වන සුළුය. පරමාර්ථයාගේ පෙරළීමෙක් නැත. ආපො-තෙජො-වායො-පඨවි-වර්ණ ගන්ධ-රස-ඕජා-යන ශුද්ධාෂ්ටකයෙන් සමන්විත ධාතු පුඤ්ජයකට "රත්රන්" සි ලොක ව්‍යවහාරයෙහි කියැවේ. එයින් කළ ආභරණයකටද 'රන්වළල්ල' යි කිහති. එය හුණුකොට "මුද්දුවක්' කළහොත් යථෝක්ත ප්‍රඥප්තිය අභාවයටගොස් එනමින් වහරට පැමිණේ. එහෙත් එහි තුළවූ ශුද්ධාෂ්ටක රූපයාගේ වෙනස්වීමෙක් නැති. කොතරම් අවස්ථානතර ප්‍රාප්තවූවද මූලික ස්වරූපය නොපෙරළෙයි. මෙසේ හෙතු ප්‍රත්‍යලාභයෙන් පෙරළෙන සුළුවනුයේ සම්මුතිය. නොඑසේ වනුයේ පරමාර්ථය යථෝක්ත ශුද්ධාෂ්ටක රූපය චිත්ත චෛතසිකාදීන් හා මිශ්‍රිතවූව, සත්ව සඞ්ඛ්‍යාවට පැමිණේ. සවිඤ්ඤාණක-අවිඤ්ඤාණක හෙදයෙන් දක්වෙන ප්‍රඥප්තීන්ගේ සම්මුති-පරමාර්ථ වශයෙන් සම්බුද්ධ දෙශනාවට ඇතුළත්වීම මේ ආකාරයෙන් සිද්ධවන බව දතයුතුයි.

## විවිධ පඤ්ඤත්ති.

**ඛන්ධ පඤ්ඤත්ති ආයතන පඤ්ඤත්ති ධාතු පඤ්ඤත්ති සච්ච පඤ්ඤත්ති ඉන්ද්‍රිය පඤ්ඤත්ති පුග්ගල පඤ්ඤත්ති යි** අභිධර්ම දෙශනායෙහි ප්‍රඥප්තිහු සදෙනෙක් වෙත්.

එහි **ඛන්ධ පඤ්ඤත්ති** යනු රූප - වෙදනා-සඤ්ඤා - සංඛාර විඤ්ඤාණ-යන ස්කන්ධ පඤ්චකය වේ. රාශ්‍යර්ථයෙන් හා කොට්ඨාසාර්ථයෙන් රූපාදීනට ස්කන්ධ නාමය ව්‍යවහාර වේ.

**ආයතන පඤ්ඤත්ති** යනු චක්ඛු-රූප-සොත-සද්ද-ඝාණ ගන්ධ - ජිව්හා-රස-කාය-ඵොට්ඨබ්බ-මන-ධම්ම - වශයෙන් පැනෙන ද්වාදශයයි. මෙම චක්ඛු සොතාදීන් හෙතුකොටගෙන චිත්ත චෛතසික ධර්මයෝ සවකීය කාර්‍ය්‍යයන්හි ආයතනය ප්‍රයත්නය කෙරෙත්නුයි ඔවුනට චක්ඛාදී නාම ව්‍යවහාරය සම්මත විණ.

**ධාතු පඤ්ඤත්ති** යනු චක්ඛු ධාතු- රූප ධාතු-චක්ඛුවිඤ්ඤාණ ධාතු-සොත ධාතු-සද්ද ධාතු-සොත විඤ්ඤාණ ධාතු-ඝාණ ධාතු- ගන්ධ ධාතු - ඝාණ විඤ්ඤාණ ධාතු- ජිව්හා ධාතු-රස ධාතු-ජිව්හා විඤ්ඤාණ ධාතු - කාය ධාතු - ඵොට්ඨබ්බ ධාතු - කාය විඤ්ඤාණ ධාතු - මනො ධතු - ධම්ම ධාතු - මනො විඤ්ඤාණ ධාතු - යන අටළොසයි. සවභාවධාරණාර්ථයෙන් මොවුනට ධාතු නාමය පැණැවිණි.

**සච්ච පඤ්ඤත්ති** යනු දුක්ඛ - සමුදය - මග්ග - නිරොධ යන චතුෂ්කයයි. ශ්‍රෙෂ්ඨාර්ථයෙන් හා අවිතථාර්ථයෙන් එනම් ව්‍යවහා-රය ලැබේ.

**ඉන්ද්‍රිය පඤ්ඤත්ති** යනු චක්ඛු - සොත - ඝාණ - ජිව්හා - කාය මන - ජීවිත - ඉත්ථි - පුරිස - සුඛ - දුක්ඛ - සොමනස්ස - දෙමනස්ස උපෙක්ඛා - සද්ධා - විරිය - සති - සමාධි - පඤ්ඤා - අනඤ්ඤාත-ඤ්ඤස්සාමි - අඤ්ඤා - අඤ්ඤාතාවී - නම්ලද ද්වාවිස්සය. ඉන්ද්‍රිය නාමය වහරට වැටෙනුයේ, අධිපති භාවය කරන් අර්ථයෙනි. චක්ෂුඃප්‍රසාදය දශීන කාර්‍ය්‍යයේදී චක්ෂුර් විඥානයට අධිපති භාවය කෙරෙයි. සෙස්සෝද එබඳු කාර්‍ය්‍ය ඇති හෙයින් ඉන්ද්‍රිය නාමය ලබත්මැයි.

**පුග්ගල පඤ්ඤත්ති** නම් එකවිධ පුද්ගල - ද්විවිධ පුද්ගලාදි වශයෙන් ඔවුනොවුන්ගේ ලක්ෂණානුකූලව සංඛ්‍යා ව්‍යවහාරයෙහි පුද්ගලයන් නිරවශෙෂයෙන් දක්වනු සඳහා කොටස් වලට බෙද දක්වීමයි.

මෙම ෂඩ්විධ ප්‍රඥප්තීන් අතුරෙන් ප්‍රථම පඤ්චකය විභඞ්ග ප්‍රකරණයෙහි නිරවශෙෂයෙන් විස්තර කොට වදාරන ල දී. එහෙත් ප්‍රඥප්ති සඞ්ගෘහිත ස්ථානයක් හෙයින් මෙහිදු ඛන්ධාදිය නාමොද්දෙස වශයෙන් එක දෙශයකින් දක්විණ. සවැනි පුග්ගල පඤ්ඤත්තිය එහි නොවදල හෙයින් මෙහි නිද්දෙස විසින් විස්තර කරන ලදුයේ වේ

අභිධර්ම දෙශනායෙහි මුඛ්‍ය වශයෙන් පරමාර්ථය වදාළ නමුදු, වෛනෙය්‍යජ්ඣාසය වශයෙන් සුඛාවබොධය සඳහා සම්මුතියද, සඳහන් කළහ. හෙද අතිධාවනය නොකිරීම වශයෙනි. එබැවින් **"පුග්ගලො අත්‍ථි"** යනාදී ව්‍යවහාරයන්හි පුද්ගලයෙක් ඇතැයි ගතයුතු නොවේ. එවැනි අදහසක් ඉන් බලාපොරොත්තු නොවන හෙයිනි. මෙහි දක්වෙන **ඛන්ධ - ආයතන - ධාතු - සච්ච - ඉන්ද්‍රිය පඤ්ඤත්තිහු පරමාර්ථයහ. පුග්ගල පඤ්ඤත්ති සම්මුතියට අයත් වේ.**

**පඤ්ඤත්තිං අනතික්කම්ම - පරමත්‍ථො පකාසිතො**
**සමඤ්ඤං නාතිධාවෙය්‍ය - තස්මා අඤ්ඤාපි පණ්ඩිතො**
**පරමත්‍ථං පකාසෙන්තො - සමඤ්ඤං නාතිධාවයෙ"**

යනු නීති හෙයින් පුග්ගල පඤ්ඤත්තිය සම්මුති සත්‍යයෙහි ගැනුණද, අභිධර්මයෙහි සඞ්ග්‍රහ නොවන්නට හෙතුවෙක් නැත. නාම ප්‍රඥප්ති ව්‍යවහාරය පරමාර්ථ ධර්මයන් සුවසේ අවබෝධ කරන්නට ප්‍රධාන තම උපාය මාර්ගයක් වන හෙයිනි. සම්මුතියෙහි පුග්ගල ශබ්දය **"ආත්ම - සත්ත්ව - ජීව"** යන් සඳහා ව්‍යවහාර ප්‍රාප්ත වේ. ශාසනයෙන් පිට බොහෝ අන්‍ය තීර්ථකයෝද, **ශාසනයට අයත් වජ්ජිපුත්තක - සම්මිතිය යන උභය නිකායිකයෝද,** යථොක්ත නාම ව්‍යවහාරය වරදවා පාවිච්චි කළහ. තීර්ථකයෝ ධර්ම ස්වභාවය නොදත් බැවිනුදු, ශාසනිකයෝ අතිධාවනයෙනුදු, අවිපරීතාර්ථයෙන් පුද්ගලයෝ සිටිති යන දෘෂ්ටියට බැස ගත්හ. වජ්ජිපුත්තකාදීහු නාම ප්‍රඥප්තියෙන් ගතයුතු නියම අර්ථය ඉක්මවා අතිධාවනය කිරීමෙන් **"අත්‍ථි පුග්ගලො අත්තහිතාය පටිපන්නො"** යනාදි සූත්‍ර පාඨයන්හි මුළාවූ පුග්ගල වාදීහු වූහ.

**"පුන්ති බුච්චති නිරයො, තස්මිං ගලන්තීති පුග්ගලා ගච්ඡන්තීති අත්‍ථො, පුං නිරයං ගලති ගච්ඡතීති පුග්ගලො".**

සනු විශුද්ධි මාර්ගාදීන්හි දක්වෙන තිඹිවන හෙයින් නිරයගාමී සවභාවයෙන් යුක්ත වූවාහු පුද්ගල නම් වෙත්. මෙහි 'පු' ශබ්දය නරකාර්ථයත්, 'ගල' ධාතුව ගමනාර්ථයත් පවසා. හේ එසේමය. බුද්ධාදී උත්තමයන්ගේ සද්ධර්ම මාර්ගාවතීර්ණ නොවූ යම් සත්ව කෙනෙක්වෙත්නම් ඔහුතුමූද්‍ දේ නොහොත් පුරුෂයෝ ලෝභද්වේෂාදී පාපයන්ගෙන් හරිතවූවාහු පූත පූනා නරකාදි සිව් අපායන්හි හෙත්මැයි. භාග්‍යවතුන් වහන්සේ පුග්ගල කථාව ගෙන හැරපාමින් දහම් දෙසනුයේ පහත දක්වෙන කරුණු අට ප්‍රධාන කැරගෙනය

i ගිරොත්තපප දීපනය
ii කම්මස්ස කතා දීපනය
iii පච්චත්ත පුරිසකාර දීපනය
iv ආනන්තරිය දීපනය
v බ්‍රහ්ම විහාර දීපනය
vi පුබ්බේ නිවාස දීපනය
vii දක්ඛිණ විසුද්ධි දීපනය
viii ලෝක සම්මුති අප්පහානය යන මොහුය.

ස්කන්ධ ධාතු ආයතනයෝ පව් කම් කිරීමට ලජ්ජා වෙත්. භයටද පැමිණෙත්, සී කියූ කල මහ ජනයා අදහස තේරුම් නොගෙන මුළාවට පැමිණ මේ කියනුයේ කිමෙක්දැයි විරෝධී වෙයි. ස්ත්‍රී පුරුෂ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි සම්මත නාමසංකේතයෙකින් හැඳින්වූව, භයටත් ලජ්ජාවටත් පැමිණෙනුවෝ මොහුයැයි තේරුම් ගනී. එහෙයින් හිරිඔතප් දක්වන්නට පුද්ගල කථා වදාරති. ස්කන්ධයෝ කර්මය සවකීය කොට ඇත්තාහ. ධාත්වායතනාදිහු ද එසේමැයැයි වදාළ කල්හි ද, පෙරසේම නොවැටැහෙනුයෙන් කම්මස්සකතා දක්වනු සඳහාද පුද්ගල කථා වදාළ මනාය. ඒ ඒ පුරුෂයන් විසින් කැරෙන දාන සඳහන් කරන්නටද පුද්ගල කථාව වදාරනසේක්මය. නොඑසේවූව වේළුනාදී මහාවිහාරයෝ ස්කන්ධයන් විසින් හෝ ධාතු ආයතනාදීන් විසින් කරවන ලදහයි වදාළ කල තේරුම් ගන්නට හැකි කෙනෙක් නැති. මාතු ඝාතක, පිතු ඝාතක, සඞ්ඝ භේද කර්මාදී ආනන්තරිය කර්මයන් කරන්නවුන් ස්කන්-ධාදි පරමාර්ථ නාමයන්ගෙන් හැඳින්වූ කල අනවබෝධ හෙයින් ආනන්තරිය පාපකර්මයන් හඳුන්වා ලන්නට ද පුද්ගල

ව්‍යවහාරය කෙරෙත්මය. ස්කන්ධයෝ මෛත්‍රී කෙරෙති. ධාතු ආයතනාදීහු බඹ විහරණයෙන් පසු වෙති යි වදළ කාලද අප්‍රකාශ හෙයින් බ්‍රහ්ම විහාර දීපනයට ද පුද්ගල කථා වදාරත්මය. ස්කන්ධාදීහු පෙර විසූ තැන පිළිවෙල සිහිකෙරෙති. ඇතැන්හිදු මෙමැ ක්‍රමයෙන් සුබාව බෝධයට බාධකනුයි පූර්වේනිවාස පවසන්නට ද පුද්ගල කථායෙන් දහම් දෙසති. ස්කන්ධයෝ දන් පිළි ගනිත්. ධාතු ආයතනාදීහුද ප්‍රතිග්‍රාහක වෙත්, ආදී දෙශනායෙන් ශ්‍රාවකයන් විමතියට පත්වන හෙයිනුදු, කාලණදහම්හි පිහිටි සිල්වත් පුද්ගලයෝ දනාදිය පිළිගනිති යි වදරනු සමගම පහසුවෙන් වටහා ගන්නා හෙයිනුදු, දක්ඛිණා විසුද්ධි පහද දෙන්නට ද පුද්ගල කථා උපයෝගිකර ගන්නාහුය. ලෝකයා අතර ශිෂ්ට සේ සම්මත වාග්මාර්ගයෙන් බැහැර නොවනු පිණිසද පුද්ගල කථායෙන් ධර්ම දෙශනා කෙරෙති. මෙසේ මෙම කාරුණ්‍ය අට හේතුකොටගෙන තථාගතයන් වහන්සේ පුග්ගල කථා වදරන බව දත යුතුයි.

මෙම ග්‍රන්ථයෙහි දක්වෙන පුද්ගලයන්ගෙන් බහුතර කොතෙක් ආර්යගණයෙහි වැටෙති. එබැවින් ඔවුනට අපායගාමී ස්වභාවාර්ථයෙන් පුද්ගල යි වහරනු නුසුදුසු නො වේ ද, **"භූත පුබ්බ ගතික න්‍යායයෙන්"** එසේ ව්‍යවහාරකිරීමට බාධාවක් නැති හෙයින් සුදුසු නොවනුයේ නොවේ. රාජකාර්යයෙකින් විශ්‍රාම ලැබූ කෙනෙකුන් පූර්වව්‍යවහාරයෙන් ම ඇමතීම ලෝක චාරිත්‍රයක් වනු මෙනි. ආර්ය තත්වයට පැමිණෙන්නට පළමු වැ වූසූ අනාර්ය ව්‍යවහාරයට අනුකූලවූ පැවැත්ම ගෙන එසේ කථා කිරීම අයෝග්‍ය නොවන හෙයිනි ඇතැම් ටීකාචාර්ය කෙනෙකුන් 'පු' ශබ්දය නිර්වාණ පර්යාය කොටගෙන නිවණ කරා යන්න හු පුග්ගල නමැයි කියන නමුදු; ඒ ප්‍රශස්ත නොවේ. නරකාග්නි කාරිකාව සූචක 'පූ' ශබ්දය මුත් නිර්වාණාර්ථය පවසන්නක් නොලැබෙන හෙයිනි. පුග්ගල පඤ්ඤත්තියෙහි පුද්ගලයන් එක් සිය සත් සාළිසක් වදළ නමුදු, යමක ප්‍රකරණයෙහි ලැබෙනුයේ දොළොස් දෙනෙක් පමණී.

**පඤ්ඤත්ති** යනු පැණවීමය. දක්වීම ප්‍රකාශ කිරීම හෝ තැබීමය. මෙයින් පණවනු ලබන දේද, පණවන නාමයෝද ගනු ලැබෙත්. නාම ප්‍රඥප්තිය ඒ ඒ ධර්මයන් දක්වයි. කොටස් වශයෙන්

ඒ ඒ ධර්‍මයන් වෙන්කොට තබන්නේද වෙයි. මෙහි ඛන්ධාදී ෂඩ්විධ ධර්‍මයන් නම් වශයෙන් පණවා කොටස් වශයෙන් වෙන්කොට තබන හෙයින් පඤ්ඤත්ති නාමය අන්වර්ථවේ.

තවද **“පකාරෙන ඤාපනං පඤ්ඤත්ති”** යනු හෙයින් ඛන්ධායතනාදිය නිරවශෙෂයෙන් ඉතුරු නොකොට දෙශනා කිරීම් වශයෙන් කොටස් වලට බෙදා දැක්වීම **පඤ්ඤත්ති** නම් වේ. එම විස්තර දෙශනා හෙතු කොටගෙන විනෙය ජනයන්ගේ සිත්-සතන් තුටු කිරීමත්, බුද්ධිය තියුණු කිරීමත්, අදහස් කරන ලද හෙයිනුදු, පඤ්ඤත්ති නාමය අර්ථානු ගත වේ. උක්ත ප්‍රකාරයෙන් බුද්ධ දෙශනායෙහි පඤ්ඤත්තීන් ෂඩ් ප්‍රකාර වුවද, මෙහි ඛන්ධාදි පඤ්චකය නාම මාත්‍රයෙන් උද්දෙස කොට පුග්ගල පඤ්ඤත්ති නිද්දෙස විසිනුදු විස්තර කැරෙන හෙයින් අර්ථානු රූපව “පුග්ගල පඤ්ඤත්ති”යි ග්‍රන්ථයට ද නම් වහර ලැබිණ.

පහත දැක්වෙනුයේ පඤ්ඤත්ති යනු කිමෙක්දැයි නීත්‍යනු කූලවූ පහදා ලන ගාථා දෙකෙකි.

**“වචී ඝොසානුසාරෙන - සොත විඤ්ඤාණ වීථියා**
**පවත්තානන්තරුප්පන්න - මනොද්වාරස්ස ගොචරා**
**අත්ථා යස්සානුසාරෙන - විඤ්ඤායන්ති තතොපරං**
**සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා - ලොක සඞ්කෙත නිම්මිතා”**

ඛන්ධා ‘යතන ඉත්ථි පුරිසාදී ශබ්දනුසාරයෙන් පහළ වන සොත විඤ්ඤාණ වීථියේ පැවැත්වීමට අනතුරුවැ උපදනා මනොද්වාර වීථියට ගොචර වන යම් අර්ථකෙනෙක් ඇද්ද? ඉන්පසු වැද යම් ප්‍රඥප්තියෙක අනුසාරයෙන් එම අර්ථයෝ දැනගත හෙත්ද, ලොක සඞ්කෙතයෙන් නිමැවුණු එය ප්‍රඥප්ති නමැයි දත්යුත්තේය. යනු එහි අදහසය.

තවද දෙශනා පාළියෙහි සඳහන් නොවන නමුදු අර්ථ කථා වන්හි එන අන්‍යවූද ප්‍රඥප්ති සයෙක් වේ.

i විජ්ජමාන පඤ්ඤත්ති
ii අවිජ්ජමාන පඤ්ඤත්ති
iii විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති
iv අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති
v විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති
vi අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති

යන මොහුය.

කුසලා' කුසල රූප වේදනාදිය පරමාර්ථ වශයෙන් ඇත්තේය. මෙම ධර්මයන්ගේ පැණවීම, මායා මරීචි ආදිය මෙන් අභූතාකාරයෙන් සිදුවූවක් සේ නො ගත යුතුය. ස්වභාවාර්ථයෙන් ලැබෙන්නකට තබනලද නාමාරෝපනයක් හෙයිනි, එසේ වනුයේ. විජ්ජමාන පඤ්ඤත්ති යි.

පරමාර්ථ වශයෙන් ඉත්ථි පුරිස භූමි පර්වතාදියක් නැති. එහෙත් ලෝකයාගේ ව්‍යවහාරයෙහි ඒ ඒ වස්තූන්ගේ ආකාරය සලකා ඉත්ථිපුරිසාදි නම් පැණවීම් ඇත. ඒ අවිජ්ජමාන පඤ්ඤත්ති යි, තීර්ථකයන්ගේ අණුව ප්‍රකෘති පුරුෂාදී නාම ව්‍යවහාර වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම අවිජ්ජමාන පඤ්ඤත්තියට අයත් වේ. එම පැණවීම් වචනයෙහි මුත් ද්‍රව්‍ය වශයෙන් නොලැබෙන හෙයිනි. ශාසනික ව්‍යවහාරයෙහි අවිජ්ජමාන පඤ්ඤත්තිය ද සම්මුති සත්‍යයට ඇතුළත් වන හෙයින් යථොක්ත අශාසනික ව්‍යවහාරය මෙයට කිසිසේත් සම්බන්ධ නොවේ.

තෙවිජ්ජො(පුග්ගලො) ඡළභිඤ්ඤො (-පුග්ගලො) ආදී ව්‍යවහාරයන්හි පරමාර්ථ වශයෙන් ත්‍රිවිද්‍යා විද්‍යමානය. ෂඩභිඥද ඇත. එහෙත් පුද්ගලයෙකැයි ගතයුතු කිසිවක් නැත්තේය. මෙසේ පරමාර්ථයෙන් ලැබෙන්නක් නොලැබෙන්නකු හා එක් කොට වහරනුයේ විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති නම්.

පරමාර්ථ වශයෙන් අවිද්‍යමානයක් හා විද්‍යමානයක් ගළපා, ව්‍යවහාර කරනුයේ අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති නම්. ඉත්ථි රූප, පුරිස රූප, යනාදී තන්හි ඒ දක්නා ලැබේ. මෙහි ස්ත්‍රී පුරුෂයෝ පරමාර්ථයෙහි අවිද්‍යමානයහ. එහෙත් රූපය විද්‍යමානය. එබැවින් එම වහරට යොග්‍ය වේ.

විද්‍යමානයක් එබඳු වූවක් හා ම සම්බන්ධ වන ලෙස පණවනු යේ විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති යි, චක්ඛු සම්ඵස්ස, සොත සම්ඵස්ස, යනු උදාහරණයි. මෙහි චක්ඛු සොතයෝ විද්‍යමානයෝය. සම්ඵස්සයද ඇත්තේය. ඇසෙහි වූ පහස ඇසින් හටගත් පහස ඇසේ ප්‍රයෝජනයවූ පහස චක්ඛු සම්ඵස්ස නම්. සොත සම්ඵස්සාදියද මෙමැ ක්‍රමයෙනි, පැණැවෙනුයේ. පරමාර්ථයෙහි දී මෙම උභය-ව්‍යවහාරය ම ලැබෙන හෙයින් විද්‍යමානයක් විද්‍යමානයක්-හා ම සැසඳීමෙක් විණි.

ඛත්තිය පුත්ත - බ්‍රාහ්මණ පුත්ත - රාජ පුත්තා දී ව්‍යවහාරයන්හි ක්ෂත්‍රිය - බ්‍රාහ්මණා දී හු පරමාර්ථ විෂයෙහි අවිද්‍යමානයහ. පුත්‍රාදීහු ද එසේමැයි. ක්ෂත්‍රියයාගේ පුත්‍රයා ආ විසින් අවිද්‍යමානයක් අවිද්‍යමානයක් සමගම ගළපා ව්‍යවහාර කිරීමය, මෙහි දක්නාලැබෙනු යේ. එබැවින් අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති යි එයට නම් වේ.

අර්ථ කථානු ගත මෙම ෂඩ්ප්‍රඥප්තීන් අතුරෙන් පළමුවැනි ත්‍රිකය මේ ග්‍රන්ථයෙහිදු ලැබේ. ඛන්ධ ආයතන ධාතු - සච්ච - ඉන්ද්‍රිය යන පඤ්ච පඤ්ඤත්ති හු විද්‍යමාන යෙහිද, පුග්ගල පඤ්ඤත්තිය අවිද්‍යමානයෙහි ද, තෙවිජ්ජෝ-ජළභිඤ්ඤ ආදී නම් පැණවීම් විද්‍යමානයෙහි හා අවිද්‍යමාන-යෙහි ද, ඇතුළත් වෙත්.

ආචාර්‍ය්‍ය වරයන්ගේ නයක්‍රම වශයෙන් ලැබෙන අනෙකුදු ප්‍රඥප්ති හු සදෙනෙක් වෙති.

i උපාද පඤ්ඤත්ති
ii උපනිධා පඤ්ඤත්ති
iii සමොධාන පඤ්ඤත්ති
iv උපනික්ඛිත්ත පඤ්ඤත්ති
v තජ්ජා පඤ්ඤත්ති
vi සන්තති පඤ්ඤත්ති යන මොහුයි.

ඒ ඒ අඞ්ගයන් ගෙන ඒ ඇසුරුකොට අඞ්ගීහු කෙරෙහි පැණැවෙන නාම ප්‍රඥප්තිය උපාදා නම් වේ. රූප වේදනාදී ස්කන්ධයෝ ජීවියෙකු තුළ පිහිටි අඞ්ගයෝය. ඔහු කාරණකොට ස්කන්ධ **පඤ්ච**කාත්මක ධාතු පුඤ්ජ සඞ්ඛ්‍යාත අඞ්ගීහු 'සත්ව' යැයි සම්මත වේ. ඒ ඒ අවයවයන්ගේ ක්‍රමානුකූල පිහිටුවිම රථ ගෙන රථය ගෘහය ආදී පැණවීම්ද, චන්ද්‍ර සූර්යයන්ගේ උදයත් අස්තයත් සලකා පුබ්බණ්හ අපරණ්හාදී කාල වාචකයන්ද, පුබ්බ - පච්ඡිමාදී දිසා වාචකයන්ද, භූත නිමිත්තත් භාවනානිශංසයත් කාරණකොට සම්මත වන ඒ ඒ ආකාරයෙන් වැටහීම ලකුණුකොට ඇති උග්ගහ නිමිත්ත - පටිභාග නිමිත්ත ආදී පැණවීම්ද **උපාදා පඤ්ඤත්ති** නම්. පළමුවැන්නකු නිසා දෙවැන්නකුද දෙවැන්නා නිසා තෙවැන්නකුද ව්‍යවහාරයට පැමිණීමද, අන්‍යොන්‍ය වස්තූන්ගේ අනෙක ප්‍රකාර විසදෘශතා හෙතුකොට උස - මිටි - දිග - කොට - ඇත සමීපාදි පැණවීම් වහරට ඇදූ ගනුයේ ද, **උපනිධා පඤ්ඤත්ති** නමැයි දන්නේය. තවද මෙම උපනිධාව ඒ ඒ ධර්මයන් අපෙක්ෂාකොට පැණැවෙන්නක් හෙයින් හෙද විසින් නන්වැදෑරුම් වේ. කියනලද්දහුගෙන් අන්‍යයා (-සමීපයෙහි වූවහු) අපෙක්ෂාකොට වහරට පැමිණි හෙයින් දෙවැන්නා - තුන්වැන්නා ආදී පැණවීම් **තදඤ්ඤ පෙක්ඛු පනිධා** නම්. ඡත්තපාණී - සත්ථපාණී ආදී ව්‍යවහාර හස්තගතයක් ඇසුරුකොට කළ හෙයින් **හත්ථගතූපනිධා** නම්. කුණ්ඩලී - සිඛරී ආදිය නමා හා සම්බන්ධ වූවක් ඇසුරින් නිපන් හෙයින් **සම්පයුත්තූපනිධා** නම්. ධඤ්ඤ සකට (වී කරත්තය)සප්පි කුම්භ(ගිතෙල් කළය)ආදිය එහි තබනලද වස්තූන් මුල්කොට කියැවෙන හෙයින් **සමාරොපිතූපනිධා** නම්. ඉන්දසාල ගුහා - පියඞ්ගු ගුහා ආදිය සමීපගතයක් මූලික කොට තබනලද නම් හෙයින් **අවිදූරගතූපනිධා** නම්. සුවණ්ණවණ්ණ - උසභ ගාමී - ගජ ගාමී ආදිය සමානාර්ථයන් සලකමින් යොදනලද හෙයින් **පටිභාගූපනිධා**

නම්. පදුමසර (–පියුම්විල) බ්‍රාහ්මණ ගාම (–බමුණු ගම) ආදිය, විලෙහි හා ගමෙහි පියුම් හා බ්‍රාහ්මණයන් මිතු නොවැ තවත් දෑ ඇතද, ඔවුන්ගේ බහුලත්වය සලකා එසේ වහරන හෙයින් **තබ්බහුල පනිධා** නම්. මණිකටක (–මැණික් වළල්ල) වජිර කටක (–දියමන්ති වළල්ල) ආදිය මණ්‍යාදියෙන් කෑරුණු විශේෂත්වය ගෙන එනමින් ව්‍යවහාර කරනුයෙන් **තබ්බිසිට්ඨ පනිධා** නම්. මෙසේ උපනිධා පඤ්ඤත්තිය අනෙකප්‍රකාරයෙන් ලැබේ. ඒ ඒ ද්‍රව්‍යයන්ගේ එක්රැස්වීම නිමිතිකොට පැණවෙන නාමය **සමොධාන පඤ්ඤත්ති** නම් වේ. තිදණ්ඩ – ධඤ්ඤරාසි – පුප්ඵරාසි ආදී වහර ලැබෙනුයේ ද්‍රව්‍යයන් සඞ්ඛ්‍යා වශයෙන් හෝ සමූහ වශයෙන් සංකලනය කොට නාම ස්ථාපනයෙනි. යමක් පළමුකොට තබා එය මූලිකකොටගෙන ව්‍යවහාරයට පත්වන දෙක-තුන – හතර ආදිය තබන ලද්දක් ඇසුරෙන් නිපන් බැවින් **උපනික්ඛිත්ත පඤ්ඤත්ති** නම් වන්නේය. ඒ ඒ ධර්ම ස්වභාවය අපේක්ෂා කොට පැණැවුණු පඨවි – තෙජො කක්ඛලතා ආදී ව්‍යවහාර ඔවුන්ගේ ගතියට අනුරූප සේ පහළ වූ හෙයින් **තජ්ජා පඤ්ඤත්ති සි** කියැවේ. සන්තති විච්ඡේදය නොමැ සිදුවූසේ පැනෙන යම් පැණැවීමෙක් වේද, ඒ **සන්තති පඤ්ඤත්ති** වේ. ආසීතික – නාවුතිකාදී නාම ව්‍යවහාර ලැබෙනුයේ ආයුෂයාගේ අතරතුර සිදීමෙක් නොවී දිගටම පැවතෙන හෙයිනි. මෙම ආචාර්‍ය්‍ය මතයන්හි පිළිගත් ෂඩ්ප්‍රඥප්තීන් අතුරින් තජ්ජා පඤ්ඤත්තිය සි කියුයේ විජ්ජමාන පඤ්ඤත්තියට මැයි. සෙසු ප්‍රඥප්තී හු අවිජ්ජමාන පක්ෂයද, අවිජ්ජමානයෙන් හා අවිජ්ජමාන පක්ෂයද, හජනය කෙරෙත්.

තවද ආචාර්‍ය්‍යවරයන්ගේම නයග්‍රාහ වශයෙන් අන්‍ය වූද ප්‍රඥප්තීහු සදෙනෙක් ලැබෙත්.

i **කිච්ච පඤ්ඤත්ති**
ii **සණ්ඨාන පඤ්ඤත්ති**

iii **ලිඞ්ග පඤ්ඤත්ති**
iv **භූමි පඤ්ඤත්ති**
v **පච්චත්ත පඤ්ඤත්ති**
vi **අසඞ්ඛත පඤ්ඤත්ති** යන මොව්හු වෙත්.

අභිධර්මය දත හදරත කෙනෙකුන් හැඳින්වීම සඳහා අභිධම්ම භාණක' සි ද, තෙවලා බුදුවදන් මොනවට ඉගෙන ධාරණ කරන වාචනාදියෙහි යෙදන්න හු හැඳින්වීමට 'තිපිටකාචරිය' සී ද, අසන්නවුන්ගේ සිත් සතන් පුබුදු කැරුමෙහි සමත්වැ නිතර බණදහම් කියුමෙහි නියැලිව වසන්නකු සඳහා 'ධම්මකථික' සි ද, ව්‍යවහාර කිරීම් ආගමයෙහි පැනෙන්නකි. මෙසේ කරනු ලබන කෘත්‍ය වශයෙන් තබන නාමය **'කිච්ච පඤ්ඤත්ති'** නම්. සිහින් සිරුරු ඇතියේ 'කිස' සි ද, නරවැ මහත්වැ පෙනෙනු යේ 'ථූල'යී ද, හැඩහුරුකම සලකා න ම් වහරනු ලෝ සිරිති. එසේ පැණැවෙන නාමය **'සණ්ඨාන පඤ්ඤත්ති'** නම්. ලිඞ්ග සඤ්ඤ වශයෙන් ව්‍යවහාරවන ඉත්ථි – පුරිස – නපුංසකා දී නාමයෝ ලිඞ්ගත්වය සැලකීමෙන් පැණැවුණහ. එබඳු වූයේ **'ලිඞ්ග පඤ්ඤත්ති' සි.** පිහිටිභූමි නාමයෙන් නම් තබනු යේ **'භූමි පඤ්ඤත්ති' සි** කාමාවචර – රූපා වචර – මාගධක මාධුරාදි හු මෙමැ ක්‍රමයෙන් නිපන්න. මගධාදී නගරයක උපත – විසීම් ආදිය ගෙනැ එයට සම්බන්ධවූවහු මාගධකාදී විසින් හැඳින්වෙයි. මෙසේ ඒ ඒ භූමීන් මූලික ස්ථානයෙහි තබා සැලකීමෙනි, මෙම පඤ්ඤත්තිය නිපදිනුයේ. තිස්ස – සුමනාදිය පූර්වෝක්ත විශේෂ කරුණක් සලකා නොවැ. හුදෙක් නම් කිරීම් වශයෙන් වහරට පැමිණි ඔවුනොවුන් හැඳින්වීමට කැරුණු සඞ්කෙතනු සි **'පච්චත්ත පඤ්ඤත්ති'** නම්. නිරෝධ – නිබ්බාණාදී නාමයෝ ප්‍රත්‍ය ධර්මයන් විසින් නොකරන ලද්ද හඳුන්වන්නට ව හ ර ට පැමිණියෝය. එසින් අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණය පැවසෙන හෙයින් **අසඞ්ඛත පඤ්ඤත්ති** නම් වේ. මෙම පැණවීම් සය අතුරින් සමහර භූමි පඤ්ඤත්තී හු ද, අසඞ්ඛත පඤ්ඤත්තිය ද, විජ්ජමාන පඤ්ඤත්තියෙ හි සඞ්ග්‍රහ වෙති.

කිච්ච පඤ්ඤත්තිය විජ්ජමානය හා අවිජ්ජමාන පඤ්ඤත්ති පඤ්ඤය භජනය කෙරෙයි. සෙස්සෝ අවිජ්ජමාන පඤ්ඤත්ති-යෙහි ලා සඞ්ගෘහිත වෙත්මය.

මෙතෙකින් **'පුග්ගල පඤ්ඤත්ති'** ශබ්දයන් පිළිබඳ විස්තරය නිමවා, ඒ ඒ පුද්ගලයන්ගේ විස්තර විභාග කිරීමට කාලය එළඹියේය. එහිදු පළමුකොට එකක පුද්ගල විභාගය ආරබ්ධ වේ.

# එකක පුග්ගල පඤ්ඤත්ති.

## සමය විමුත්තා:-

සමවත් සම්වදනට සුදුසු කාලයෙහි අෂ්ට විමෝක්ෂ-යන් උපදවා සමවත් සුව විඳුමින් ඇතැම් කෙලෙසුන් කොරෙන් මිදෙන පුද්ගලයා නාම ප්‍රඥප්ති වශයෙන් සමය විමුත්තා නම්. සමවතට එළඹෙන්නහුට එයට යොග්‍ය කාලයෙකුදු ඇත. එමෙන් ම නොකලෙකුදු ඇත්තේමය. කවර අවස්ථාවෙක වුවද සමවත් සම්වැදීමට නොහැකි කමෙක් නැත. එහෙත් සත්ප්‍රාය ධර්මයන් සම්පූර්ණවීම සමාපත්තිලාභියෙකුට අවශ්‍ය කාරණයක් හෙයින් කාල-නියමයෙක් දක්නා ලැබේ. තපස්වියෙකු උදෑසන ශරීර පිළිදැගුම් කිරීම, වත් පිළිවෙත් කිරීම, සිරිත් වශයෙන් පවත්වන්නකි. මෙම ක්‍රියාවලට ගතවන කාලය සමවත් අවදනට බාධක හෙයින් අකාලය සේ සැලකේ. උදෑසන කටයුතු වත් පිළිවෙත් අවසන් වී පිඬුසිඟා යන කාලය එළඹෙනතෙක් විනෙතකාග්‍රභාවට හපස් දහමින් බාධා නැති හෙයින් සමවතට කාලය වේ. මේ ආකාරයෙන් සෑ වැඳීම, පිඬු පිණිස ගම්හි සැරි සැරීම, දානවල් වත් පිළිවෙත් කිරීම, බණ දහම් ඉගැන්වීම, ආදී කුදු මහත් කටයුතු සඳහා ගතවන කාලය සමාපත්ති සම්වැදීමට නොහැකි - ඉඩ නැති අසමයලෙස පිළිගැනේ. මින් ඉතිරි සෙසු කාලය සමය නම් වන්නේය. මෙසේ සිත එක

අරම්මණක යොමුකරන්නට ඉඩ ඇති කාලයන් හි වේදනා -සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන නාමකාය සතරින් ප්‍රථම ධ්‍යානාදී සමාපත්තීන් ස්පර්ශ කොරෙමින් නීවරණයන්ගෙන් හා ඇතැම් ක්ලෙශයන් කෙරෙන් මිදුනු සෝතාපන්නාදී පුද්ගලයෝ සමය විමුක්තයෝය. ප්‍රථම-ද්විතිය - තෘතිය - චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත රූපාවචර ධ්‍යාන සතර හා ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතන - ආකිඤ්චඤ්ඤායතන - නෙවසඤ්ඤා නාසඤ්ඤායතන යන අරූපාවචර ධ්‍යාන සතරත් අෂ්ට විමොක්‍ෂ නම් වේ. කාමච්ඡන්දාදි විරොධී ධර්මයන්ගෙන් මිදෙන හෙයින් ඔවුනට විමොක්‍ෂ යැයි කියනු ලැබේ. මෙම අෂ්ට විමොක්‍ෂයන් පහල කරගනු කැමැති යොගාවචරයා පලමුකොට පඨවි කසිණාදී අරමුණක් මුල්කොටගෙන පරිකර්ම භාවනා කරන්නට පටන්ගනී. යම් විටෙක ඔහුගේ සිත පරිකර්ම සමාධියෙන් සමාහිතවැ යථොක්ත පරිකර්ම නිමිත්ත ඇසට පෙනෙනුමෙන් සිතටත් ආරොපණය වේද, ඒ උද්ග්‍රහණ නිමිත්ත නම් වන්නේය. එය අරමුණුකොටගෙන සමාහිත වූ චිත්තයෙන් පුන පුනා බවුන් වඩත් ම, වස්තු ධර්මයන්ගෙන් තොර උද්ග්‍රහණ නිමිත්තාකාරයෙන් අරමුණක් සිතට නැගේ. ඒ ප්‍රතිභාග නිමිත්ත නම් වෙයි. එතැන්-සිට උපචාර භාවනාව පහලවේ. එය නීවරණ උවදුරුවලින් තොරය. කාමාවචර සමාධි නමුදු වේ. මෙසේ නැවත නැවත පූර්වොක්ත ප්‍රතිභාග නිමිත්ත උපචාර සමාධි-යෙන් යුක්තව භාවනා කරනුයේ රූපාවචර ප්‍රථම ධ්‍යානය අර්පණා වශයෙන් පහල වන්නේය. එවිට කාමච්ඡන්දාදී පඤ්චනීවරණයෝ විෂ්කම්භිත වෙති. ක්ලෙශයන්ගේ උත්පත්තියකුදු නොවන්නේය. උපචාර සමාධිලාභයෙන් පඤ්ච නීවරණයන්ගේ ප්‍රහාණය වුවද, එහි අඞ්ගයෝ ස්ථිරවැ නොපවත්නාහුය. විතර්කාදී අඞ්ගයන්ගේ පහල කරගැනීමෙන් ඔවුන්ගේ ස්ථිරත්වය නිසා අර්පණා සමාධි ප්‍රතිලාභය වූවිට දවසක් මුළුල්ලෙහි වුවත් එම අර්පණා

චිත්තය පවත්වා ගන්නට හැක්කේය. ප්‍රථම ධ්‍යාන කුසල චිත්ත යැ යි කියනුයේ ද, මෙම අර්පණා චිත්තයට මැ යි. ප්‍රථම ධ්‍යානා දී රූපාවචර චිත්තයන්හි ඵස්ස - වෙදනා දී පන්තිස් චෛතසිකයන් යෙදෙන නමුදු මෙහි ධ්‍යාන නාමයෙන් සැලකෙනුයේ විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා. යන පඤ්චක ය යි. අරමුණ යථාතත්ත්වයෙන් බලන්නෝත්, විරුද්ධ ක්ලෙශයන් දවාලන්නෝත්, ඔව්හුම හෙයිනි. ඒ එසේමය. විතර්කය අරමුණට සිත නගාලන්නේය. විචාරය අරමුණෙහි සිත හසුරුවන්නේය. ප්‍රීතිය අරමුණෙන් සිත පිණවා ලන්නේය. සුඛය අරමුණු රසය සිතට අනුභව කරවන්නේය. එකාග්‍රතාව නා නා ආරම්මණයන්හි සිත විසිර පවත්නට ඉඩනොදී එක් අරමුණෙක මැ යොදලන්නේය.

තවද විතර්කය ථිනමිද්ධ නීවරණයද, විචාරය විචිකිච්ඡා නීවරණ ද, ප්‍රීතිය ව්‍යාපාද නීවරණයද, සුඛය උද්ධච්ච කුක්කුච්ච නීවරණ ය ද, එකග්ගතාව කා ම ච්ඡ න්‍ද නීවරණ ය ද, ද වා ල න් නේ ය. මෙ සේ ප්‍ර ථ ම ධ්‍යානය අරමුණ බැලීම් වශයෙන්ද, ක්ලෙශයන් දැවීම් වශයෙන්ද, සෘතෘයන් සමූහයක් සිදුකරමින් පහළ වන බව දත යුතුයි. ද්විතීය ධ්‍යානය උපදවා ගනු කැමති යෝගාවචරයා විතර්කය ඖදාරික ය යි සලකා එය දුරුකරනු පිණිස නැවත ද භාවනා කරන්නේ විතර්කය රහිත විචාරාදී අඞ්ගයන්ගෙන් සමුපලක්ෂිත වූ ද්විතීය ද්ධ්‍යාන කුසල චිත්තය පහළ කරගන්නේය. උක්ත ප්‍රකාරයෙන් එක් එක් අඞ්ගය හැර දැමීමෙන් සෙසු තෘතීයා දී ද්ධ්‍යාන සිත් උපදවා ගන්නා බව දතයුතුයි. අනුක්‍රමයෙන් රූපාවචර ධ්‍යාන ලාභිවූයේ රූපය කලහ විග්‍රහ විවාදදියට හා රොගාබාධාදී උවදුරු වලටත් භාජන වන්නේ ය යි සලකා රූපය දුරුකර ගන්නා පිණිස චතුර්ථ ද්ධ්‍යානයෙන් නැගී කිසුණු ඉගුලූ අහස අරමුණු කොටගෙන "**අනන්තො ආකාසො**"යි භාවනා කරනුයේ නීවරණොපද්‍රව දුරුවීමෙන් ආකාසානඤ්චා යතන කුසල චිත්තය උපදවා ගන්නේය.

ආකාසානඤ්චායතන චිත්තයේ දෙෂයන් දැක්මෙන් එයම අරමුණු කොට විඤ්ඤාණඤ්චායතනය ද, එහි අභාවමාත්‍රය කරුණුකොටගෙන ආකිඤ්චඤ්ඤායතනය ද, එය අරමුණුකොටගෙන ආදීනව හා ආනිශංසයන් සැලකීමෙන් **'සන්තමෙතං, පණීතමෙතං'** යි භාවනා කරනුයේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ද, පහළ වන බව සැකෙවින් දතයුතුයි. සමය විමුත්ත පුද්ගලයා අෂ්ට සමාපත්ති ලාභියෙකු පමණක් නොව ඇතැම් ක්ලේශයන් ගෙනුදු මිදුනකු හෙයින් ධ්‍යානයට සමවැද ඉන් නැගී සංස්කාර ධර්මයන් අනිත්‍යාදී වශයෙන් විමර්ශනය කොට සොතාපන්න මග්ග චිත්තාදී ලෝකෝත්තර සිතුදු පහළ කරගත් කෙනෙකි. මෙහි කිවයුතු විශෙෂයක් වෙයි. අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජනයා ද නාම කාය සතරින් සමවත් ස්පර්ශ කරයි. ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේද, අෂ්ට සමාපත්ති ලාභිවුව, යථොක්ත වෙදනාදියෙන් සමාපත්ති විමොක්ෂයන් ස්පර්ශ කෙරෙයි. එහෙත් මෙහි ඇතැම් ආශ්‍රවයන්ගෙන් මිදුනු සමාපත්ති ලාභී පුද්ගලයාම අදහස් කෙරේ. පෘථග්ජන වුව, ඇතැම් ආශ්‍රවයන්ගෙන් මිදිමකුදු, ක්ෂීණාශ්‍රව වුව, අප්‍රහීණ ආශ්‍රව ඇති බවකුදු, විද්‍යමාන නොවේ. **එබැවින් පෘථග්ජන ද නොවන ක්ෂීණාශ්‍රවද නොවූ අෂ්ට සමාපත්තිලාභී සොතාපන්න සකෘදාගාමි-අනාගාමි ආර්‍ය්‍යයෝ සමය විමුක්ත නම් වෙති.**

සමය විමුක්ත නමින් සූත්‍ර පිටකයෙහි වදාළ පුද්ගලයා සමාපත්ති ලාභී පූර්වොක්ත පෘථග්ජනයාමය. හෙතෙම මෙහි විශෙෂ ලක්ෂණ සම්පන්න ව, දැක්වුණේ විශිෂ්ට ධර්මාතිරෙක ධර්මාර්ථයන් පැවසීම අභිධර්ම ක්‍රමය හෙයිනි. පහත දැක්වෙන සටහනින් සමය විමුක්ත පුද්ගලයා ප්‍රහාණය කරන ආශ්‍රවාදිය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැක්කේය.

| ක්ලෙශාදීහු | සෝතාපන්න | සකෘදගාමි | අනාගාමි |
|---|---|---|---|
| සංයෝජන | සක්කාය දිට්ඨි<br>විචිකිච්ඡා<br>සීලබ්බත පරාමාස<br>අපායගාමිනී<br>කාම රාග පටිඝ | ඔළාරික-<br>කාම රාග<br>පටිඝ | සුඛුම<br>කාම රාග<br>පටිඝ |
| කිලෙස | දිට්ඨි<br>විචිකිච්ඡා | ——— | දෝස |
| මිච්ඡත්ත | මිච්ඡාදිට්ඨි<br>මුසාවාද<br>මිච්ඡා කම්මන්ත<br>මිච්ඡා ආජීව | ———. | මිච්ඡාසඞ්කප්ප<br>පිසුණා වාචා<br>ඵරුසා වාචා |
| ගන්ථ | සීලබ්බත පරාමාස<br>ඉදං සච්චාභි<br>නිවෙස කාය<br>ගන්ථ | ——— | ව්‍යාපාද කාය ගන්ථ |
| ආසව<br>ඔඝ<br>යෝග | දිට්ඨාසව<br>,,<br>,, | ——— | කාමාසව<br>,,<br>,, |
| නීවරණ | විචිකිච්ඡා | ——— | කාමච්ඡන්ද ව්‍යාපාද<br>කුක්කුච්ච |
| අනුසය | දිට්ඨි විචිකිච්ඡා | ඔළාරික කාමරාග<br>පටිඝ | කාමරාග පටිඝ |
| අකුසල<br>කම්මපථ | පාණාතිපාත<br>අදින්නාදාන<br>මිච්ඡාචාර<br>මුසාවාද<br>මිච්ඡාදිට්ඨි | ——— | පිසුණාවාචා<br>ඵරුසාවාචා<br>ව්‍යාපාද |
| අකුසල<br>චිත්තුප්පාද | චත්තාරො දිට්ඨි-<br>ගතසම්පයුක්තාව<br>විචිකිච්ඡා සම්ප-<br>යුත්තාව | ——— | ද්වෙ පටිඝ<br>සම්පයුත්තා |

## අසමය විමුත්ත

කලින් කල හෝ වරින්වර නාම කායයෙන් අෂ්ට විමොක්ෂයන් ස්පර්ශ කිරීමක් නොකොට ක්ලේශයන් කොරෙන් සම්පූර්ණයෙන් මිදුනු පුද්ගලයා මෙනමින් හැඳිනේ. ධ්‍යාන ලාභයක් නැති ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ මෙයට ඇතුලත් වේ. කාලභෙදයක් නොසලකා කැමති විටෙක කෙලෙසුන්ගෙන් මිදීමට මෙම ආර්‍ය්‍ය පුද්ගලයාට හැකි කමෙක් තිබේ. විදර්ශනාවක් රහිතව අට සමවත් උපදවන්නහුට යම් යම් අවස්ථාවන්හි ධ්‍යානයට බාධක කරුණු එළැඹේ. එහෙයින් ඔහුගේ ධ්‍යානයට කාලයෙකුදු ඇත. එමෙන්ම නොකාලෙකුදු ලැබේමය. මාර්ගයන්ගෙන් කෙලෙස් නසන්නාහට කාල භෙදයක් උවමනා නැත. බලවත් ශ්‍රද්ධාවෙන් විදර්ශනා වඩන කල්හි යැම් ඊම්; සිටීම්, හිඳීම්, කෑම්, පීම්, ආදිය පවත්වන විටද, මාර්ගඵල ප්‍රතිවෙධය නොවන බවෙක් නැත. ආවර්ජනා මාත්‍රයෙකින් කැමැති අවස්ථාවෙක මාර්ගඵල උපදවා ගන්නට බාධාවක් නොමැති හෙයිනි.

සමය විමූත්ත අසමය විමූත්ත පුද්ගල විභාගය මෙසේ පිරිසිඳින කල්හි ශුෂ්ක විදර්ශක වූ ම සොතාපන්න සකෘදගාමි අනාගාමීහුත්, අෂ්ට සමාපත්තිලාභී ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාත්, පෘථග්ජනයෝත් මෙම උභය පුද්ගල සංඛ්‍යාවට ම නොගැනෙත්. එසේ වුවද ක්ලේශයන් කොරෙන් මිදීම් මාත්‍රයෙන් සියළුම ආර්‍ය්‍ය පුද්ගලයෝ අසමය විමුත්ත නාම ප්‍රඥප්තියට යොග්‍ය වූ වා හු වෙත්මය. මෙසේ ගන්නා කල්හි සූත්‍ර පිටකයෙහි හා අභිධර්ම පිටකයෙහි දක්වෙන සමය විමූත්ත පුද්ගලයන්ගේ න්‍යාය විරොධයක් පැණෙන්නේ නොවේද? නොවේ. සමාපත්තිලාභී පෘථග්ජන පුද්ගලයා සමවතින් යටපත් කරනලද කෙලෙසුන්ගේ වශයෙන් සමය විමුත්ත නාම මාත්‍රයක් භජනු විනා වචනයේ පරිසමාප්තාර්ථයෙන් විමූක්ත පුද්ගලයෙකු නොවන හෙයිනි.

## කුප්ප ධම්ම:-

යම් පුද්ගලයෙකු ලබනලද සමාපත්තිය නැසෙන සවභාව ඇත්තේද ඒ කුප්ප ධම්ම නම්. රූපාවචර හෝ අරූපාවචර සමාපත්ති ලබාගත් තැනැත්තහු ඒවා තහවුරු වන්නට නැවත නැවත පුරුදු පුහුණු කළ යුතුය. ආවජ්ජන –සමාපජ්ජන –අධිට්ඨාන –වුට්ඨාන –පච්චවෙක්ඛණ යන පඤ්ච ධර්මයන්ගෙන් වශප්‍රාප්ත කරගත් කල්හි කැමති පරිද්දෙන් සමවතට සමවැදීමෙහි පරිචිතයක් ඇතිවේ. නො එසේවූයේ ධ්‍යාන චිත්තය නැසෙන සුළුය. මේ පුද්ගලයා සමවත් ලබනුයේ ඉතා දුකසේය. ක්ලෙශ විෂ්කම්භණයට පැමිණෙනුයේ ද, උපචාර අර්පණාදිය උපදවනුයේ ද, සසඞ්ඛාර සප්‍රයොගයන්ගෙන් කාලාන්තර වෙමිනි. සමවතට සමවැද ද එය කල් තබා ගන්නට අසමත් වේ. එක් දෙචිත්ත වාරයකින් ම ඉන් නැගී සිටින්නට සිදුවෙයි. යම් තැනක අසුභ-බ්‍රහ්මවිහාර – ආනාපානා දි ධ්‍යානයක් උපදවාගෙන යම්තාක් කාලයක් සමවතින් යුක්තව වාසය කරන්නට කැමති වේද, එය සිදුනොවේ. පූර්වොක්ත පඤ්ච වශිතාවයෙන් සමාපත්තිය ප්‍රගුණ කොට නැති හෙයින් ඉටාගත් කාලය තිබිය දිම අතරතුර නැගී සිටියි. මෙම කුප්පධම්ම පුද්ගලයා සමාධියට ද විදර්ශනාවට ද උවදුරු දයක ධර්මයන් මනා-කොට යටපත් නොකරන හෙයිනුදු, සුපිරිසිදු නොකරන හෙයිනුදු, ඉතා සවල්ප වූ ද ප්‍රමාදයක් සිදුවුව, සමවත නැසෙයි. ඉන් පිරිහෙන්නේ ද වෙයි. සීල භෙදයකින් හෝ ඇවතකට පැමිණීමකින් හෝ මේ පිරිහීම වනුයේ නොවේ. කළයුතුව පවත්නා සවල්ප මාත්‍රවූ ද කටයුත්තක් හෝ වත් බිඳීම් මාත්‍රයක් හෝ එයට ප්‍රමාණය. **අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජන – සොතාපන්න – සකෘදාගාමි යන ත්‍රිවිධ පුද්ගලයෝ කුප්ප ධම්ම නමිත.**

## අ කු පප ධම්ම:-

මනාකොට ප්‍රගුණකළ සමවත් ඇතියේ අකුප්ප ධම්ම නම්. මෙතෙමේ යම් කිසි ධ්‍යානයකින් නැගී සිට එහි අඞ්ග ආවර්ජනා කරයි. ජවන සතර පසකින් භවඞ්ග ක්ෂිප්පයෙකින් ඉදිරියට නොගොස් පුන පුනා ධ්‍යානාඞ්ග ආවර්ජනය කරන්නට සමත්වෙයි. ධ්‍යානයට සමවැදීමට රිසිවූවිට ම වහා එයට පැමිණෙයි. සමවත් දූගැතින් පුක්තව කැමතිතාක් කල් සිටින්නට හැකිවෙයි. එසේම කැමති වේලාවක ධ්‍යානයෙන් නැගී සිටින්නට පිළිවන් වෙයි. ආවර්ජනයට අනතුරුව ප්‍රත්‍යවේක්ෂාජවනයන් ළඳුවැ පවත්වන්නට ද සමර්ථය. මෙසේ හෙයින් ඔහුගේ සමථ විදර්ශනා උපද්‍රව මැනවින් යටපත් ව පවතී. සෝදා හළ දෙයක් මෙන් ඉතා පිරිසිදුය. භස්සාරාමතා ගණසඞ්ගණිකාරාමතා දී කෘත්‍යයෙකින් හෝ තමාට අනනුරූපනො වූ කිසියම් ප්‍රමාද විහරණයෙකින් හෝ සමාපත්තිය නොකිපේ නා·සීමක් ද නොවේ. කැමති තැනෙක කැමති ධ්‍යානයක් කැමති කාලයක් මුළුල්ලෙහි පවත්වන්නට ද සමර්ථය. ප්‍රමාද හේතුවෙකින් සමාපත්තිය නැසෙතියි කියන්නට කිසිදු අවකාසයක් ඔහු පිළිබඳව නැත. **එබැවින් මෙනම් වහරට ගොචර වනුයේ අෂ්ට සමාපත්තිලාභී අනාගාමි පුද්ගලයා ද ක්ෂීණාශ්‍රවයන් වහන්සේද යන දෙදෙනාය.**

මෙම කුප්ප ධම්ම – අකුප්ප ධම්ම යන උභය ප්‍රඥප්තියට ශුෂ්ක විදර්ශක සෝතාපන්න – සකෘදාගාමි – අනාගාමි-ක්ෂීණාශ්‍රව පුද්ගලයෝ ඇතුළත් නොවෙත්. එතකුදුවුවත් ආර්‍ය්‍ය පුද්ගලයන් සියළු දෙනාම අකුප්ප ධම්ම නාමයට යෝග්‍ය වෙති. අට සමවත් කිපීම නැසීම සිදුවන නමුදු වරක් ප්‍රතිවේධය කළ ලොකොත්තර ධර්මයාගේ එබඳු පැවැත්මක් නොලැබෙන හෙයිනි.

## පරිහාන ධම්ම, අපරිහාන ධම්ම:-

මේ පුද්ගලයන් දෙදෙනා කුප්පධම්ම අකුප්පධම්ම පුද්ගලයන් හා චරිත ලක්‍ෂණ වශයෙන් සමානයහ. නාමාරෝපණයෙන් වෙන් වුව ද අර්‍ථ වශයෙන් පරියාය (සමානතේරුම් ඇති) දෙශනාවක් හෙයිනි. හුදෙක් ඔවුනොවුන්ගේ පැවැත් ම මුල්කොටගෙන ඉෂ්ටාරම්මණයෙහි ලොභයත්, අනිෂ්ටාරම්මණයෙහි ප්‍රතිඝයත්, අසමව බැල්මෙන් මොහයත් උපදවා ප්‍රමාදව විසීමෙන් ධර්‍මයන්ගේ පිරිහීම හා නොපිරිහීම දක්වීම පමණක් විශෙෂයක් වශයෙන් ලැබේ.

## චෙතනා භබ්බ:-

අෂ්ට සමාපත්තීන් ඉතා දුකසේ උපදවාගෙන නොසැලකිල්ලෙන් ඉන් පිරිහෙනුයේ චෙතනා භබ්බනම්. ඉදින් සමවතට නැවත නැවතත් සමවදී නම් පිරිහීමෙක් නොවේ. මෙසේ සමවත ස්ථිර කැර ගැනුමට ප්‍රතිබල වුවද, උපකාරා'නුපකාර ධර්‍මයන් නොදැන උපකාර ධර්‍මයන් බැහැර කොට අනුපකාර ධර්‍මයන් සෙවනය කරමින් සමවතින් පිරිහෙයි. කුප්පධම්ම පුද්ගලයා හා මොහුගේ චෙතනා ඉතා සවල්පය. සමාපත්තීන් පිළිබඳ අල්පමාත්‍ර චිණ්ණ-වශිතාවක් ඔහුට නැතත් මොහුට ඇත. එහෙත් සමාපත්තිය ස්ථිරවීමට හෙතුවන ධර්‍මයන් තෝරා ගැනීමට ශක්තියක් නැත. එබැවින් සමාපත්තියට සම්බාධක ධර්‍මයන් සෙවනය කොට ඉන් පිරිහෙන්නේය.

## අනුරක්ඛණා භබ්බ:-

රූපා රූප අෂ්ට සමාපත්තීන් උපදවා ධ්‍යානයට විපක්‍ෂ ධර්‍මයන් දැන ඔවුන් දුරලමින් උපකාර ධර්‍මයන් සෙවනය කරමින් සමවත රැකැගනුයේ අනුරක්ඛණා-භබ්බය. ඉදින් ධ්‍යානය නනවුරු කැරලන ධර්‍මයන්හි

උදාසීන වූයේ නම් පිරිහෙන්නට ද පිළිවන. මේ පුද්ගලයන් දෙදෙනාම සමාපත්තිය සුසපිර කැරැ ගැන්මට ප්‍රතිබල සම්පන්නය. එහෙත් චේතනාභබ්බහට වඩා අනුරක්ඛණාභබ්බ බලවත් කොතෙකි. චේතනාභබ්බ ශීතොෂ්ණාදිය නොඉවසිය හැකි පාණ්ඩු රොගාදියකින් පෙළෙන රොගී ගොවියෙකු වැන්න. අනුරක්ඛණාභබ්බ කාත්‍යාකාත්‍ය විචාරණයෙහි විචක්‍ෂණ නීරොග ගොවියෙකු වැන්න. සරොග ගොවියා තමා අකාර්‍ය්‍යක්‍ෂම හෙයින් දිවාරෑ දෙක්හි කුඹුර රැක්මෙහි අපොහොසත් වෙයි. ඔහු අයත් කෙත දිවා කල්හි ගිරා මොනරාදීන්ගෙන් ද, රාත්‍රි කාලයෙහි මූවහූරු ආදීන්ගෙන් ද, නිරන්තරයෙන් විනාශ වෙයි. කොළවර වපුළ බිජුවට පමණකුදු ඔහුට උපයා ගන්නට නොලැබේ. එම ගොවිතැනින් ලාභය වෙනුවට අලාභයක් ම ලබන්නට සිදුවේ. කාර්‍ය්‍යක්‍ෂම නිරොග ගොවියා කලින්කල කළයුතු සියලු ආරක්‍ෂා සංවිධාන නොපමාව අනලස්ව කරයි. එබැවින් ඔහු ධාන්‍ය ගන්නාවිට එක් කිරියක වපුළ බිජුවටින් ගැල් හත අටක් උපයාගෙන එම ගොවිතැනින් දීර්ඝ කාලයකට පොහොනා අධික ලාභයක් ලැබගනී. චේතනාභබ්බ හා අනුරක්ඛණාභබ්බ ද යථොක්ත සරොග - නීරොග ගොවියන් දෙදෙනා මෙන් සමාපත්ති සම්බාධක හා සඞ්ඛාරක ධර්මයන් සෙවනයෙන් ඉන් පිරිහෙන්නේද, වැඩෙන්නේ ද වෙයි.

### පුථුජ්ජන:-

සංසාර දුඃඛයෙහි සත්ත්වයන් යොදා බැඳ ලන දිට්ඨි සංයොජන - සීලබ්බත පරාමාස සංයොජන - විචිකිච්ඡා සංයොජන යන බන්ධනත්‍රයය යම් පුද්ගලයෙක් ප්‍රහීණ නොකෙළේද, ප්‍රහීණ කරන්නට පිළිපන් ආර්‍ය්‍ය මාර්ගයෙක්හි ගමන් කරන්නෙකුදු නොවන්නේද හෙතෙම පෘථග්ජන නම් වේ. බොහෝ ශාස්තෘවරයන් අනුගමනය කරන

හෙයිනුදු, බොහෝ කෙලෙස් උපදවන හෙයිනුදු, පඤ්ච කාමයන්හි ඇලුණු ගැලුණු ලැගුණු හෙයිනුදු, පඤ්ච නීවරණ ධර්මයන්ගෙන් ආවෘතවැ වැසී ප්‍රතිච්ඡන්නවැ වසන හෙයිනුදු, සඞ්ඛ්‍යාපථාතීත ආර්‍ය්‍ය ධර්මයනට පරාඞ්මුඛ වූ නීච ධර්මයන්හි හැසිරෙන ජන සමූහයාට ඇතුළත් වන හෙයිනුදු, සීලාදී ගුණ ධර්මයන්ගෙන් සමන්විත ආර්‍ය්‍ය ජනයාගෙන් වෙන්ව වසන හෙයිනුදු, පෘථග්ජන නාමය යුක්ති යුක්ත සේ වහරට පැමිණේ. මෙසේ උක්ත ප්‍රකාරයෙන් බොහෝ සංසාරික තත්ත්වයන් නිපද වනුයෙන් අන්වර්ථානුගත සංඥා විසින් තන්නාමය ව්‍යවහෘතය. අන්ධ පෘථග්ජන කල්‍යාණ පෘථග්ජන වශයෙන් පෘථග්ජනයෝ දෙයාකාරයෙකින් දක්නා ලැබෙත්. ඛන්ධ ධාතු ආයතනාදිය පිළිබඳ ඉගෙනීම් විචාරීම් විනිශ්චයාදියක් නැති හෙයින් ප්‍රඥලොකය පහළ වන ආගමාවබොධයක් හෝ ප්‍රතිපත්ති පිරීමෙන් ප්‍රතිවෙධය කළයුතු ධ්‍යානාභිඥාදි ගුණ විශෙෂයක් හෝ අලබ්ධ හෙයින් අධිගමයක් නැතියේ අශ්‍රැතවත් අන්ධ පෘථග්ජනය.

තමාගේ නැණ පමණින් දහම් කොටස් ප්‍රගුණ කොටගෙන ධාත්වායතනාදිය මැනවින් දැනගෙන දත් දහම් අනුව පිළිපැදීමින් ආගමයත් අධිගමයත් පිළිබඳ සැලැකියයුතු අවබොධයක් ඇතියේ ශ්‍රැතවත් කල්‍යාණ පෘථග්ජනය කියනලද මැයි.

**"දුවෙ පුථුජ්ජනා වුත්තා – බුද්ධෙනාදිච්චබන්ධුනා,**
**අන්ධො පුථුජ්ජනො එකො – කල්‍යාණෙකො පුථුජ්ජනො"**

මෙම පෘථග්ජනයන් දෙදෙනාගෙන් අන්ධ පෘථග්ජන පුද්ගලයා සිවු අයුරෙකින් දක්නා ලැබේ.

- i **භව අනුට්ඨාන**
- ii **නිච්චනෙනාභබ**
- iii **අභිසඞ්ඛාර**
- iv **දිට්ඨි අවිභූත** යනු ඔහු සිවු දෙනය.

නියත මිථ්‍යාදෘෂ්ටි ගත් පුද්ගලයා කල්ප ශතසහශ්‍ර-ගණනක් මුළුල්ලෙහි සසර සැරිසරන නමුදු කම් භව-යන්ගෙන් නොනැගිටින්නකු වන හෙයින් භව අනුට්ඨාන නම් වේ. ඔහුට සසරින් නැගී සිටීමක් ඒකාන්තයෙන් මැ නැත. පාපකර්මයන්හි පුත පුතා යෙදෙමින් ප්‍රමාද පරවශ වැ අකුසලකර්මයන්හි ගැලී වසන්නහු හීන දීන පුද්ගලයන්ගේ සඞ්ඛ්‍යාවට ඇතුළත්ව වසන හෙයින් නීචගෝත්‍රාගධ නම් සප්තකාම සවර්ගයන්හි සැප විඳුනා තෘෂ්ණාව බලපවත් වමින් ජාත්‍යාදී දුක් ලැබීමට හේතුවන කම් රැස්කරන පුද්ගලයා අභිසඞ්ඛාර පෘථග්ජනය. හෙතෙම කාලාන්තර-යෙකින් කරන කුසලය පවා වට්ටප්‍රාණීතා මූලිකව මුත් විවට්ටය සලකා කරනුයේ නොවේ. මාර්ග ඵලයනට විපත්තිදායක සක්කායදිට්ඨිය ප්‍රහීණ නොකොළේ දිට්ඨි-අභිහතය. යථෝක්ත දෘෂ්ටිය තිබෙනතාක් මාර්ගඵලාව-බෝධයකට අවකාශ රහිත හෙයින් පෘථග්ජනභාවයෙන් මිදීමෙක් නොවේ.

ශ්‍රැතවත් කල්‍යාණ පෘථග්ජනයා ද ත්‍රිවිධ භෙදයකින් දක්නා ලැබේ.

i **සම්මා දස්සන**
ii **විනීණණ**
iii **විසෙස** යන ලෙසිනි.

නාමරූප ධර්මයන් ලක්‍ෂණ රසාදී විසිනුදු, පෘථිව්‍යා දී ධාතු විසිනුදු, රූපස්කන්ධා දී ස්කන්ධ විසිනුදු, චක්ඛායතනා දී ආයතන විසිනුදු, චක්ඛුධාතා දී ධාතු විසිනුදු, මනාකොට පිරිසිඳ දත් නුවණ ඇතියේ සම්මාදස්සනය. මෙතෙම දිට්ඨි විසුද්ධියෙන් සමන්විතය. සක්කායදිට්ඨිය යටපත් කොටගෙන සඤ්ඤා - චිත්ත - දෘෂ්ටි - විපර්‍යාසයන් තුනීකළ කෙනෙකි. එබැවින් මනා දැකුම් ඇත්තේයැ යි කියැවේ. නාමරූපයන් පහළවන හෙතු පිරිසිඳ දැන සොළොස්-

වැදෑරුම් විචිකිච්ඡා දුරුකොට කඞ්ඛාවිතරණ විශුද්ධියට පැමිණැ වසනුයේ විතිණ්ණ පෘථග්ජනය. මෙතෙම දෙසැට මිථ්‍යාදෘෂ්ටි විෂ්කම්භනය කොට නා නා නයක්‍රමයන්ගෙන් නාමරූපයන් පිළිබඳ ප්‍රත්‍යයන් දැනගෙනැ තුන් කල්හි සැක පසිඳලීමෙන් බුදුසසුනින් පිහිට ලද තැනැත්තෙකි. එහෙයින් **චුල්ලසොතාපන්න** යි ද ඔහුට ප්‍රස්තාවොචිත නමෙක් වේ. නිවන් අරමුණුකොට පවත්නා ධර්මයන්ගෙන් සමන්විත ගොත්‍රභූ චිත්තලාභී පුද්ගලයා විශෙෂ පෘථග්ජනය මෙතෙමේ පෘථග්ජනත්වයෙන් ඉක්මෙන්නට ඉතා ආසන්නය. විශෙෂ නාමයෙන් විශිෂ්ට වූයේ එහෙයිනි. ගොත්‍රභූ ඥානය නිවන අරමුණුකොටගෙන පහළවන නමුදු එයින් ක්ලෙශක්‍ෂය කිරීමෙක් නො වේ. එහෙත් පෘථග්ජන ගොත්‍රය මැඩැපියා ආර්‍ය්‍යගොත්‍රයට පමුණුවන්නේ ය. පෘථග්ජන පුද්ගල විභාගය මෙසේ නන් වැදෑරුම් වුව ද, **මෙහි එම නාමයෙන් ගැනෙනුයේ හරනාලද කමටහන් ඇති බහල ක්ලෙශාන්ධකාරයෙන් තම භාවයට පැමිණි බාල පෘථග්ජන පුද්ගලයා යි.**

**ගොත්‍රභූ:-**

සොතාපත්ති මාර්ගඥානය පහළවන්නට පෙරාතුව සපණස් කුශල ධර්මයන් හා යෙදුණු යම් විදර්ශනා ඥානයක් පහළ වේද, ඒ කුශලධර්මයන්ගෙන් සමන්විත පුද්ගල ගොත්‍රභූ නම්. නිවන් අරමුණුකැර උපදනා එම ඥානයෙන් අනතුරුවැම මාර්ගඥානය පහළ වේ. එවිට එතෙක් සමවතවැ පැවැති පෘථග්ජන ගොත්‍රය – පෘථග්ජන ප්‍රඥප්තිය මැඩැපියමින් ඉක්මවා ආර්‍ය්‍ය සංඛ්‍යාවටත්, ආර්‍ය්‍ය ගොත්‍රයටත්, ආර්‍ය්‍ය ප්‍රඥප්තියටත්, බැස ගන්නේය. ගොත්‍රභූ ඥානය වුට්ඨාන ගාමිනී විදර්ශනාවගේ කෙළවර ලැබෙයි. නිර්වාණයම ආරම්මණිකව පවතී.

**මාර්ගයට ආවර්ජනස්ථානිකව උපදනා බැවින් පටිපදා ඤාණදස්සන විසුද්ධියටද, මාර්ගනොවන බැවින්**

**ඤාණදස්සන විසුද්ධියටද, ඇතුළත් නැත.** අනුලෝම ඥානාලෝකයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යයන් වළහන ක්ලේශාන්ධකාරය පහකළ කල්හි සංස්කාරයන් කෙරෙහි සිත පැන නොයයි. එහි නොමැසිරී. නොලැගෙයි. නොබැඳෙනුයේ ද වෙයි. පියුම් පත්‍රයෙක ජලයමෙන් නොරැඳෙයි. මෙසේ සියලු අරමුණු පළිබොධ වශයෙන් හැඟුනු කල පෘථග්ජනභාවය හැරපියමින් විදර්ශනාවගේ පරමකොටිය වූ ගොත්‍රභූ ඥානය උපදනේය. හෙද මාර්ගයට **අනන්තර - සමනන්තර - ආසෙවන - උපනිස්සය - නත්‍ථි - විගත** යන ෂඩ්ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යභාවය ද සිදුකැර ලන්නේය. ගොත්‍රභූ ඥානය මාර්ගඥානයට පහළවනු සඳහා නිවන් අරමුණ ඉදිරිපත් කරමින් සංඥා කරන්නක් වැන්න. මාර්ග ඥානයද එම සංඥාව අත් නොහැරම ගෙන අනන්තාපරිමාණ කාලයක් මුළුල්ලෙහි විනාශ කළ නොහුණු ලෝභ ද්වේෂ මෝහ ස්කන්ධයන් විදාරණය කරමින් පහළ වන්නේය. අෂ්ට සමාපත්ති සඞ්ඛ්‍යාත සමථයෙන් ලත් ගොත්‍රභූ ඥානය භවත්‍රයෙහි විපාක ආමිසය දෙන බැවින් **වට්ටාමිස ගොත්‍රභූ** නම් වේ. වෘත්තාභිරත සෝතාපන්න සකෘදාගාමි පුද්ගලයන්ගේ සන්තානයෙහි ඒ පහළ වේ. දසවැදෑරුම් විදර්ශනායෙන් ජනිත ගොත්‍රභූ ඥානය භවයන්හි ඇලීම් රහිතය. එය **නිරාමිස ගොත්‍රභූ** නම් වේ. නියත විවරණ ලත් බෝධිසත්ත්වවරයන් බුදුවරයන්ගේ සමීපයෙහි පැවිදිව දශවිධ විදර්ශනාවන් වඩන නමුදු, මාර්ගඵලාවබෝධයක් නොලබනුයේ ගොත්‍රභූ ඥානය දක්වා ගොස් නවතින හෙයිනි. බුද්ධත්වයට පත්වීම ම උන්වහන්සේලාගේ ප්‍රාර්ථනාව හෙයින් මාර්ගඵලාවබෝධයට උත්සාහ ගැනීමක් නැත.

**භයූපරත:-**

භය හෙතුකොටගෙන පාපයෙන් වැළකෙනුයේ භයූපරත නම්. සත්වැදෑරුම් ශෛක්‍ෂ පුද්ගලයෝද, සිලවන්ත පෘථග්ජනයෝද භයින් පාපයෙන් වැළකෙන්නෝය. දිට්ඨධම්මික සම්පරායික දුඃඛරාශිය ඔවුන් පාපකර්‍මයන්ගෙන් දුරුකෙරෙයි. පව්කම් කරන්නකු තමා කරා එළඹෙන භය සතරකින් බියපත්ව ම එය කළයුතුය. **නරකාදි දුර්ගති භයද, ජාතිජරාදි වට්ට භයද, කාමරාග ව්‍යාපාදාදි අකුසල භයද, නින්‍දාගර්හාදි උපවාද භයද,** ඔහුවෙත නිතැතින්ම එළැඹෙයි, භයූපරත පුද්ගලයා මේ එකිනෙක භයින් වන ආදීනව සලකන්නෙකි. ආර්‍ය්‍යභාවයට නොපත් පෘථග්ජන භයූපරත වූකල "ඉදින් ඔබ පව්කම් කරන්නෙහි නම් බඩසයින් පෙළෙන පිඹුරකු කටදල්වා එකවිටම ගලනට බලා සිටිනුමෙන් මරණින් මතු සිවු අපායෙහි එකාන්තයෙන්ම හෙනු ඇත. එහි හුන කොබඳු ඝොරතිරම් දුක් විඳුනා ලබන්නෙහිදැ යි' දුර්ගති භය සිතා පව්කමින් වැළකේ. සක්පල් තෙරහු **"පමත්තස්ස ච නාම චත්තාරො අපායා සකගෙහ සදිසා"** යි කියේ භයූපරත පුද්ගලයෙකු වූ හෙයිනි. එක් දූයකදී විඳුනා ජාති ජරා ව්‍යාධි මූල්කොට හටගන්නා දුඃඛරාශිය මෙතරම් වුව, අනවරාග්‍ර වෘත්ත දුඃඛය කෙසේවේදැයි සිතා වට්ට භය හෙතුවිනුදු පව්කම් කරන්නට පසුබට වේ. සියළුම අකුසල් සිදුවනුයේ ලොභ දෙවෂ මොහාදී සිත කිලුටු කරන ධර්‍මයන්ගේ උත්සන්නතා හෙතුයෙනැයි සලකා ක්ලේශභයිනුදු පවින් දුරු වේ. ලොකයාගෙන් නින්‍දා අප්‍රසංශා ගර්හාදිය තමා වෙත එළැඹෙනු යේ පාප පැවතුම් මූල්කොටගෙනැයි උපවාද භය සලකන්නහුද පව් නොකෙරේමය. පෘථග්ජන පුද්ගලයා මේ චතුර්විධ භයින් බියට පත්ව පාපකර්‍මයන් කරන්නට උත්සුක නොවේ. සොතාපන්න-සකෘදාගාමි-අනාගාමි ත්‍රිවිධ ශෛක්‍ෂයනට දුර්ගති භයක් නැත. ඔව්හු දුර්ගතිගාමි පාපක්‍ෂය කළ හෙයින් දුගතියෙහි උපදනා ඉක්මවා සිටින්නෝය.

එතකුදවුවත් වට්ටදුඃඛාදී සෙසුභය ඔවුනට ද ඇත. එහෙයින් ඉන් වන බිය නිමිත්තින් පව් කම් නොම කෙරෙත් මාර්ගස්ථශෛක්‍ෂ පුද්ගලයෝ වට්ටාදී දුක් පැමිණෙහි යි සිතා හෝ විනාශ නොකළ උපවාදදී භය ඇති හෙයින් හෝ භයූපරත වෙති.

## අභයූපරතः-

සර්වප්‍රකාරයෙන්ම විනාශකරනලද භය ඇති පුද්ගලයා මෙ නම් වේ. රහතන්වහන්සේ එයට ඇතුලත්වේ. උන්වහන්සේ යථොක්ත සිවු වැදෑරුම් භය ඊමට හෙතුන් සමුච්ඡෙද කළ කෙනෙකුන් හෙයින් භයාගමනයට සුදුසු කිසිවක් නොම කෙරෙයි. එනිසා ම එළැඹෙන භයකුදු නැති. නිවරද කාය කර්මාදිය ඇතිහෙයින් උපවාදයට ද බියවන්නෙක් නොවේ. එහෙත් ගුණදොෂ විචාරණයෙහි අසමත් ලොකයාගෙන් එළ ඹෙන උපවාදය ඔවුන් කෙරෙහි ම සනාහයෙන් රකිතියි කියන්නට හෙතු ඇත. උන්වහන්සේ පව් කැමින් වළකියනුයේ යථොක්ත චතුර්විධ භයින් බියපත් වීමකින් නොව අනායසී අකායසී කර්මයක් හෙයිනි. මුදුන කපා හළ තාලවෘක්‍ෂයෙහි පුනරුහණ ශක්තියක් නැත්තාක්මෙන් පව්සිදුකැරලන ලොභාදී අසභාය හෙතුන් නිරවශෙෂ ප්‍රහාණයෙන් විනාශ කරන ලද චිත්තසන්තානය පාපක්‍රියායෙහි අභව්‍යස්ථානයක් හෙයින් ද වේ.

## අභබ්බාගමන:-

සොතාපත්ති මාර්ගාවතීර්ණ වීමට අභව්‍ය නුසුදුසු පුද්ගලයා අභබ්බාගමන නම්. යම් පුද්ගල කෙනෙක් කර්මාවරණයෙන් සමන්විත වූවාහු ද, ක්ලෙශාවරණ යුක්ත පැවැතුම් ඇත්තා–හු ද, විපාකාවරණයෙන් ආවෘතවූවාහු ද, ශ්‍රද්ධා රහිතවූවා හු කුසල් ස ද නැත්තා හු දුශ්ප්‍රාඥ වූවාහු වෙත්ද ඔහු සියල්ලෝ අභබ්බාගමනයහ. මාර්ගඵලාවබොධයට තිබිය යුතු උපනිශ්‍රය සඞ්ඛ්‍යාත පිහිටීම නැතිහෙයින් එම ව්‍යවහාරයට

යොග්‍යවේත්. මෙහි කර්මාවරණ වශයෙන් සැලකෙනුයේ මාතෘ ඝාතක - පිතෘ ඝාතක - අර්හන්ත ඝාතක - සඞ්ඝ භේදක ලොහිතුප්පාදක යන පඤ්චානන්තරිය කර්මයන්ගෙන් ආවෘත වීමය. මෙම කර්මකළ පුද්ගලයා අනතුරු අත්බැව්හි ඒකාන්තයෙන් ම අවීචියට යෙයි. මාර්ගඥානාවබෝධය ලබාගන්නා ශක්තිය යථෝක්ත කර්මයන් කරනු සමග මැ විනාශවන හෙයින් හේ අභව්‍යයෙක් වේ. නියත මිථ්‍යාදෘෂ්ටි නමැති මහාසාවද්‍ය පාපයෙන් යුත් පුද්ගලයා ක්ලේශාවරණය නිසා නිවන් අවබෝධයට අභව්‍යය, අහේතුක හෝ දුහෙතුක ප්‍රතිසන්ධියෙන් යුක්තවූවහු විපාකය විසින් අවුරණ ලදුයේ මාර්ගඵල ප්‍රතිවේධයට අසමර්ථය. රත්නත්‍රය විෂයෙහි ඇදහිලි රහිතවූයේ ශ්‍රද්ධාරහිත නම් සුදුසු ප්‍රතිසන්ධියෙකින් උපන් නමුදු කත්තුකම්‍යතා කුසලච්ඡන්ද නම්යුත් කුසල්දම් කරනු රිසි බලවත් කැමැත්ත නැත්තේ ද අභව්‍යයෙකි. සම්පූර්ණ නොවූ භවඞ්ග ප්‍රඥ සහිත පුද්ගල තොමේ දුශ්ප්‍රාඥ බැවින් ක්ලේශයන්ගෙන් මිදීමට නොහැකි සඞ්ඛ්‍යාවට පැමිණේ. මොවුනතුරෙන් ඇතැම් කෙනෙක් මාර්ගඵලාවබෝධක ශක්තියට උත්පත්තියෙන්ම අහිමිවූවෝය. සෙස්සෝ ඇත්තාවූ ද ශක්තිය ඉහාත්ම කර්මබලයෙන් විනාශකර ගන්නාහුය.

## භබ්බාගමන:-

කම්ම කිලෙස විපාක යන ත්‍රිවිධ ආවරණ රහිත, පෙරුවන් හදහන, බලවත් කුසල් සඳඇති, පරිපූර්ණ භවඞ්ග ප්‍රඥ ඇති පුද්ගලයෝ භබ්බාගමනයහ. මාර්ගඵලයන් ලැබීමට බලවත් උපකාරක ධර්මයන්ගෙන් ප්‍රතිෂ්ඨාලත් මෙම පුද්ගලයා බාධාරහිතව නිර්වාණාවබෝධයට භව්‍යය. සුදුස්සේය, ධර්මපද මාත්‍රයක් ඇසූපමණින් කුසලධර්මයන්හි පිහිටා ආර්ය මාර්ගයන් ප්‍රත්‍යක්ෂ කරන්නට සමර්ථය.

**නියත:-**

නිශ්චිත ගති ඇතියේ නියත නම. සිවු අපායට හා නිර්වාණයට එකාන්තයෙන් ම නියමිත වූ පුද්ගලයා මෙයින් ව්‍යවයවේ. පඤ්චානන්තරිය කර්මයන් කළ පුද්ගලයෝ ද, නියත මිථ්‍යා දෘෂ්ටිගත් තැනැත්තෝ ද, නිරය සඳහා නියමව පවත්නා හෙයින් නියතයහ. සෝතාපන්නා දී අෂ්ට ආර්ය පුද්ගලයෝ මතුමත්තෙහි සාක්ෂාත් කැර ගන්නා මාර්ගඵලයන් සඳහා ද, අනුපාදිශෙෂ පරිනිර්වාණය පිණිසද, ධර්මබලයෙන් ම නියමිත වූවන් හෙයින් නියත නාම ව්‍යවහාරයට සුදුස්සහ. අකුසල පාක්ෂික හා කුසල පාක්ෂික වූ මොවුනට නිශ්චිත ගති ඇති හෙයින් තන්නාමය අර්ථානුගත සංඥා විසින් ලැබේ.

**අනියත:-**

අනිබද්ධ ගති ඇති අනෙක් සියලු පුද්ගලයෝ අනියත ප්‍රඥප්තියට යොග්‍ය වෙති. ඔවුන්ගේ ගති පිළිබඳ නිශ්චිත නිර්ණයක් කළ නොහැක. කුසලා කුසල කර්ම දෙක්හි ම නියැලිවන ඔවුන් සුගතිගාමී වීම හෝ දුගතිගාමීවීම යදෘසන්න චෙතනාවට අනුරූපව සිදුවන්නක් හෙයිනි. අහසට දමා ගසනලද දණ්ඩක පොළොවට පළමුව පැමිණෙන කොටස නිශ්චිත කර කියන්නට නොපිළිවන. දණ්ඩ පොළොවට ගෙනුයේ අගිනැසි හෝ මුලිනැයිද නැතහොත් මැද පෙදෙසිනැයි ද; සම්රව පවසන්නට නොහැක. එමෙන් පඤ්චානන්තරියා දී නියත ගතික නොවූවන් ගැන අසුවල් භූමියෙහි උපදිතියි සිතා මතා ගන්නට හැකිකමක් නැත. මරණ මොහොතෙහි කුසල ජවන පහළවුව සුගතියෙහි ද, නොඑසේවුව දුගතියෙහි ද, ඉපදීම ධර්මතා හෙයිනි.

**පටිපන්නක:-**

සෝතාපන්නා දී සිවු මාර්ගයන්හි පිහිටි පුද්ගලයා මෙයින් අදහස් කෙරේ. මාර්ගස්ථ පුද්ගලයා ඵලප්‍රාප්තවනු සඳහා පිළිපන් ප්‍රතිපද ඇතිහෙයින් පටිපන්නක නාමයට

යොග්‍ය වේ. මාර්ගීයන්ගේ වශයෙන් පටිපන්නක පුද්ගලයෝ සිවුදෙනෙක් වෙත්.

### ඵලෙඨිත:-

සොතාපන්නා දී සිවුඵලයන් ලැබැගෙන එහි පිහිටි පුද්ගලයන් සිවුදෙන මෙනමින් හැඳිනෙත්. ඵලලාභී පුද්ගලයා සැමවිටම ඵලසමාපත්තියෙහි යෙදෙන්නෙකු නොවූවද, ඵලසථයෙකුලෙස සැලැකේ. තමහට කැමති විටෙක ඵලසමවතට සමවදනට නොහැකි බවක් නැති හෙයිනි.

### සමසීසී:-

ක්ලෙශක්‍ෂය කරනු සමගම යම් පුද්ගලයෙකුගේ ජීවිතක්‍ෂයත් පෙරපසුනොව එක්වරමසිදුවේද, හෙතෙම සමසීසී නම් වේ· ක්ලෙශයන්ගේ ශීර්‍ෂය සේ සැලකෙන අවිද්‍යාවත්, සංසාර වෘත්තයාගේ පැවැත්ම වූ ප්‍රවෘත්ති ස්කන්ධ පඤ්ච-කයාගේ ශීර්‍ෂය සේ සැලකෙන ජීවිතෙන්‍ද්‍රියයත් එකවිට ම නැසීයැම මේ පුද්ගලයා පිළිබඳව සිදුවන්නකි. සමසීසිභවය තුන් ආකාරයෙකින් ලැබෙන හෙයින් සමසීසී පුද්ගලයෝ ද තෙදෙනෙක් වෙති. **"ඉරියාපථ සමසීසී – රොග සමසීසී ජීවිත සමසීසී"** යනු ඔවුනට වහරවන නාමයෝය. යමෙක් සක්මන් කරමින් විදර්ශනා වඩා සක්මන් කරමින් ම පිරිනිවේද, සිටගෙන සිටිමින් විදර්ශනා වඩා සිටියේ ම පිරිනිවේද, හිඳිමින් විදර්ශනා පිහිටුවා හිඳිමින් ම පිරිනිවේ ද' නිදියන ඉරියව්වෙහි යෙ දී විදසුන් වඩා හොත්තේ ම පිරිනිවේද, හේ සි වු ඉරියවුවෙන් එකක් පවත්වමින් ක්ලෙශක්‍ෂය හා ජීවිතක්‍ෂය කළ හෙයින් **ඉරියාපථ සමසීසී** නම්. යමෙක් කිසියම් රොගයෙකින් පෙලෙමින් සිටිය දී ම විදර්ශනා වඩා අර්හත්වයට පැමිණ එම රොගයෙන්ම

පරිනිර්වාණය කෙරේද. හෙතෙම **රෝග සමසීසී** නම්. යමෙක් අවිද්‍යාව හා ජීවිතෙන්ද්‍රියයත් එකවිට නැසීමෙන් අනුපාදිශෙෂ පරිනිර්වාණයට පැමිණේද හේ ජීවිත සමසීසී නම්.

ශීර්ෂ වශයෙන් සැලකෙන කෙළවරවල් සත්වයෙකු පිළිබඳව තෙළෙසෙක් විද්‍යමාන වේ. සියලු පලිබෝධයන්ගේ ශීර්ෂය තෘෂ්ණාවය. බන්ධනයන්ගේ ශීර්ෂය මානයයි. පරාමාසයන්ගේ ශීර්ෂය දෘෂ්ටියය. වික්ෂෙපයන්ගේ ශීර්ෂය උද්ධච්චය ය. ක්ලෙශයන්ගේ ශීර්ෂය අවිද්‍යාවය. අධිමොක්ෂයන්ගේ ශීර්ෂය ශ්‍රද්ධාවය. ප්‍රග්‍රහයන්ගේ ශීර්ෂය වීර්‍ය්‍යය. උපට්ඨානයන්ගේ ශීර්ෂය සතිය ය. අවික්ෂෙපයන්ගේ ශීර්ෂය සමාධියය. දර්ශනයන්ගේ ශීර්ෂය ප්‍රඥාව ය. ප්‍රවෘත්තයන්ගේ ශීර්ෂය ජීවිතෙන්ද්‍රිය ය. ගොචරයන්ගේ ශීර්ෂය විමොක්ෂය ය. සංස්කාරයන්ගේ ශීර්ෂය නිරොධය ය. මොවුනතුරින් ක්ලෙශ ශීර්ෂය වූ අවිද්‍යාව ක්ෂයවනු යේ අර්හත් මාර්ගයෙනි. ප්‍රවෘත්ත ශීර්ෂය වූ ජීවිතෙන්ද්‍රියය ක්ෂයවනු යේ චුතිචිත්තයෙනි. ජීවිත සමසීසී පිළිබඳව අවිද්‍යාව හා ජීවිතෙන්ද්‍රියයත් එක්වරම ක්ෂයවෙයි. අවිද්‍යාව ක්ෂය කරන සිතට ජීවිතෙන්ද්‍රියය ක්ෂය කරන්නට හෝ ජීවිතෙන්ද්‍රිය ක්ෂයකරන චිත්තයට අවිද්‍යාව ක්ෂය කරන්නට හෝ පිළිවන් කමෙක් නැත. එතකුදු වුවත් **උභය ශීර්ෂ ක්ෂයයෙහි දී ලැබෙන වාර සමතා වශයෙන් මෙම ව්‍යවහාරය බහුට යොග්‍ය වේ.** චතුර්මාර්ගයනට පැමිණීමේ දී මාර්ග - ඵල - නිර්වාණ - ප්‍රහීණ ක්ලෙශ - සෙස ක්ලෙශයන්ගේ වශයෙන් එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂා ඥාණයන්ගි පිහිටා භවාඞ්ගයට බැස පරිනිර්වාණය කෑරෙන බැවින් වාරයන්ගේ සමත්වය ලැබේනු යි, සමසීසී නාමය අර්ථානුගත වේ. ඉරියාපථ සමසීසී - හා රෝගසමසීසී පුද්ගලයන් ජීවිත සමසීසීනයට ඇතුළත්වන බැවින් ජීවිත-සමසීසී-පුද්ගලයාම මෙහි අදහස් කෙරේ.

## ඨිතකප්පී:-

කල්ප විනාශය නවතන්නට සමර්ථ පුද්ගලයා මෙනමින් දන්නා ලැබේ. යම් ආර්‍යය පුද්ගලයෙකු මාර්ග ඥානය උපදවා ගන්නාවිට කල්පවිනාශය එළඹියේ වේද, ඔහු ඵලය ප්‍රත්‍යක්ෂ කරනතෙක් කල්පය නොදැවේ. යම් හෙයකින් දැවෙමින් තිබුණේද, නොදැවී නතර වෙයි. මාර්ග සමඞ්ගී පුද්ගලයාගේ ඵලයට අන්තරායක් කරන්නට පිළිවන් සමර්ථ කිසිවක් ලොවතුළ විද්‍යමාන නොවන හෙයින් ලොක විනාශය පවා ඵලප්‍රාප්තිය තෙක් ඇනහිටි. සිවු මාර්ගස්ථ පුද්ගලයන්ගේ චිත්තප්‍රවෘත්තිය ඵලයට පැමිණ මුත් අතරක නතරවීමක් එකාන්තයෙන් ම නැති හෙයිනි. ශාසනය ධරමාන කල්හි කල්පවිනාශයක් නොමැ සිදුවේ. කල්පය විනාශවුව ශාසනයකුදු ඉතිරි නොවේ. කල්ප විනාශය වූකලි කෙළ ලක්ෂයක් සක්වල දැවීම් වශයෙන් සිදුවන ලොක විනාශයකි. ස්වභාව ධර්මානුකූල වැ හටගන්නා එම විනාශය වැළැක්විය හැක්කක් නොවේ. එහෙත් මාර්ගසමඞ්ගී පුද්ගලයා ඵලයට පැමිණෙන තෙක් ස්වභාව ධර්මයාගේ ඒසා මහත් බලසම්පන්න මහා විපර්‍යාසය ස්වල්ප මොහොතකට වැළකෙයි. ඒද චිත්තක්ෂණ කිහිපයක් පමණි. මාර්ග වීථිය සමග මනොද්වාරාවර්ජනය උපදී. එයට අනතුරුව අනුලොම සිත් තුනක් පහළ වේ. ඊට පසු එක් ගොත්‍රභූ සිතක් ද, එක් මාර්ග සිතක් ද, ඵලසිත් දෙකක් ද, පඤ්ච ප්‍රත්‍යවෙක්ෂා ඥාණ ද, යන මෙතෙක් සිත් පහළ වේ. සිතිය නොහැකි තරම් සියුම් වූ මේ ස්වල්පකාලය තුළය, කල්ප විනාශය නතර වනුයේ. පහත දැක්වෙන උපමා කථාවෙන් ඨිතකප්පී පුද්ගලයාගේ සාමර්ථ්‍යය දැනගන්නට පිළිවන. සොතාපත්ති මාර්ගස්ථ පුද්ගලයාගේ හිස් කෙළින් අහසෙහි යොදුනක් පමණ විශාලවූ එකඝන ගල් කුළක් පොටවල් තුනකින් බැඳි ලනුවකින් එල්බෙන්නේය යි සිතුවහොත් ගලේ බරින් එක් පොටක් කැඩුණු විට දෙකකින් එල්බෙනු විය හැක.

ඉනුදු එක පොටක් කැඩුණහොත් ඉතිරි පොට ගලේ බර උසුලයි. එයද කැඩුණ වළාකුළක්මෙන් අනාධාරව අහසෙහි පිහිටයි. මාගියට අනතුරුව ලබන ඵලයට අනතුර. වනසේ යථොක්ත ගල්කුළ නොම වැටේ. හෙතුදු ඵලසථයා මින මුත් මාගීසථයා මතුයෙහි නොවේ. මෙසේ කාල්ප-විනාශය නවතාලමින් **සිතකප්පී වනුයේ සොවාන් මාගිසථයා මතුනොවේ. අනෙක් මාගීසථ පුද්ගලයෝ ද තන්නාම ව්‍යවහාරයට සුදුස්සෝය.**

## අරිය:–

ලොභ ද්වෙෂ මොහාදී ක්ලෙශයන්ගෙන් දුරුවූ යේ ආයර්‍ය නම්. හෙතෙම දෙවියන් සහිත ලොකයා විසින් වෙ නැ එළඹ පිදිය යුතු සම්මාන දක්වියයුතු හෙයිනුදු එනම් වේ. පිරිසිදු කායකර්‍මාදිය ඇතියේ ද ආයර්‍ය නාමයට සුදුස්සේය. ප්‍රධාන වශයෙන් සිවු මාගීසථ ඵලසථ පුද්ගලයන් අටදෙන ආයර්‍ය නාමයෙන් ව්‍යවහාර වෙති. රතන සූත්‍රයෙහි **"යෙ පුග්ගලා අට්ඨ සතං පසත්‍ථා"** යි දක්වෙන පරිදි ආයර්‍යයන්ගේ ප්‍රභෙද වශයෙන් 108 දෙනෙකුන් ලැබෙන නමුදු, **පුද්ගල ප්‍රඥප්තියෙහි සඳහන් වනුයේ 96 දෙනෙක් පමණි.** ඔවුන්ගේ විශෙෂ විභාග මතු පහළ වන බැවින් මෙහි උපෙක්‍ෂක වේ.

## අනරිය:–

ආයර්‍යභාව කරණ ධර්‍මයන්ගෙන් විනිර්මුක්ත පුද්ගලයෝ අනායර්‍යයෝය. සොතාපත්තාදී මාගීඵල ප්‍රතිවෙධය නොලත් සෙසු සියලුම පුද්ගලයෝ අනායර්‍ය නම් වෙත්.

## සෙඛ.–

හික්මෙනුයේ සෙඛය. අධිශීල – අධිචිත්ත – අධිප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ශික්‍ෂාවන් හි නිශ්චිත ලෙස හික්මෙන සොතාපන්න මාර්ගස්ථයා ආදිමකොට ඇති අර්හත් මාර්ගස්ථයා උපරිම කොට ඇති සප්ත ආර්ය පුද්ගලයනට සෙඛ යනු නමෙකි. මාර්ග සමඞ්ගී මාර්ගක්ෂණයෙහිත් ඵලසමඞ්ගී ඵලක්ෂණයෙහිත් යථොක්ත ශික්ෂාවන්හි ශික්‍ෂිත වේමය. මත්තෙහි ලබාගතයුතු අර්හත් ඵල සඞ්ඛ්‍යාත විශිෂ්ට ගුණය තෙක් පිරියයුතු ශීලාදී ගුණදම් සිය සිත් සතන් හි උපදවා ගැනීම් වශයෙන් හික්මිය යුතු හෙයිනි.

සීල සමාධි ප්‍රඥා අධික වන සැටි මෙසේ දතයුතුය. සාමාන්‍යයෙන් පඤ්චශීලය ශීල නම් වේ. එයට වඩා අෂ්ටාඞ්ගශීලයද, ඒ අරමුණුකොට දශ ශීලයද, දශ ශීලය සලකා ලෞකික චතු පාරිසුද්ධි ශීලය ද, එයට ලොකොත්තර ශීලය ද, අධිශීල නම් වන්නේය.

කාමාවචර චිත්තය චිත්ත නම් වේ. ඊට වඩා රූපාවචර චිත්තය ද, එයට අරූපාවචර චිත්තය ද, එයටත් වඩා ලොකොත්තර චිත්තය ද, අධිචිත්ත නම් වන්නේය.

කාමාවචර ලෙව්හි වූ ප්‍රඥාව ප්‍රඥා නම්. රූපාවචර – අරූපාවචර – ලොකොත්තර ප්‍රඥා එකිනෙකට අධි ප්‍රඥා නම් වන්නේය. ප්‍රධාන වශයෙන් සලකන විට මාර්ග ඵල සිත් වල යෙදෙන **සම්මාවාචා – සම්මා කම්මන්ත – සම්මා ආජීව** යයි නම්ලද ත්‍රිවිධ විරති චෛතසිකය අධිසීලය වන්නේය. මාර්ගඵල සිත්වල යෙදෙන **සම්මා වායාම – සම්මා සති සම්මා සමාධි** යයි නම් ලද විර්‍ය – සති – එකග්ගතා යන චෛතසික චිත්ත ශීර්ෂයෙන් සමාධියට ඇතුළත්වන බැවින් අධිචිත්ත නම් වන්නේය.

මාර්ගඵල සිත්වල යෙදෙන **සම්මාදිට්ඨි - සම්මාසඞ්කප්ප** යයි නම්ලද ප්‍රඥා චෛතසිකය හා විතර්ක චෛතසිකය අධිප්‍රඥා නම් වන්නේය. සෙඛ පුද්ගලයා මෙම නිෂ්පයනීය දෙකනාවට ඇතුළත් මාර්ගඵල සිත්වල යෙදෙන අධිසීල අධිචිත්ත - අධිප්‍රඥවන්හි හික්මෙන්නෙකැයි දතයුතුයි.

**අසෙඛ:-**

ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මීම් කෘත්‍යයක් නැති රහතන් වහන්සේ අසෙඛ නම් වේ. උන්වහන්සේ අහිත් ඵලය ලත් කෙණෙහි මතු හික්මිය යුතු ශික්ෂා විශෙෂයක් ඉතිරි වනුයේ නොවේ. හික්මියයුතු සියල්ලෙහි හික්ම් කෘතකෘත්‍යවැ අවසන් කරනලද හික්මීම් ඇති හෙයිනි. එසේ හෙයින් නිර්වාණ ප්‍රතිවෙධය සඳහා සීල සමාධි ප්‍රඥ පූරණයක් නැත්තේ නුයි අසෙඛ නම් වන්නේයි.

**නෙවසෙඛ නාසෙඛ -**

සෙඛත් නොවන අසෙඛත් නොවන පුද්ගලයා මෙනමින් දන්නා ලැබේ. එනම් ආගමාධිගම ප්‍රතිලාභයක් නැති පෘථග්ජනයා ය. සෙඛපුද්ගල විභාගය මෙසේ පසිඳනවිට සර්වඥාශ්‍රවයන් වහන්සේ අන්කෙනෙකුන්ගේ උපදෙශාශ්‍රයෙන් ත්‍රිශික්ෂාවන් පූරණයකළ බැවින් **සික්ඛිත අසෙක්ඛ** නාමයට සුදුස්සේය. බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධයන් වහන්සේලා අනෙකකු සම්පයෙහි සීලසමාධි ප්‍රඥවන්හි නොහික්ම් ස්වයම්භූඥන- යෙන් ම ත්‍රිශික්ෂාවන්හි හික්මුණු හෙයින් **අසික්ඛිත අසෙක්ඛ** වහරට ද යොග්‍යයෝය. ඉතිරි පුද්ගලයෝ අනෙකකුගේ උපදෙශයෙන් සීලාදීන්හි හික්මෙන්නාහු ද නොවෙති. තුමූමැ අවබොධකොටගෙනැ හික්මුණෝත් නොද වෙත්මය. එබැවින් නෙවසෙඛ නාසෙඛ නම් හ.

**තෙවිජ්ජ:-**

විජ්ජා යනු ක්‍රමානුකූලව ලබාගත් ඥාන විශේෂයකට ලෝකව්‍යවහාරයෙහි පවත්නා නමෙකි. එබඳු දැනුම් ත්‍රිකයෙකින් සමන්විත පුද්ගලයා තෙවිජ්ජ යි පැණවේ. සසුනෙන් බැහැර ත්‍රිවේද පාරප්‍රාප්ත බ්‍රාහ්මණයා එනමින් සැලකෙන නමුදු සසුනෙහි වනාහි **පුබ්බෙනිවාස ඤාණ-දිබ්බචක්ඛු ඤාණ-ආසවක්ඛය ඤාණ** යන ත්‍රිවිධ ඤාණයන්ගෙන් යුක්ත වූ රහතන් වහන්සේ ත්‍රිවිද්‍යා ප්‍රාප්ත ය යි සලකනු ලැබේ. එහි පුබ්බෙනිවාස ඤාණ යැ යි කියනුයේ පූර්ව ජාතීන්හි වුසු ස්කන්ධ පටිපාටිය දන්නා නුවණය. "පෙර අසුවල් අත්මයෙහි මෙ නම්ගොත් ඇතිව මෙබඳු වර්ණ-සණ්ඨාන සහිතව මෙසේ ආහාරපාන බුදිමින් සුවදුක් විඳියෙමි"යි ඈ විසින් ඒ ඒ ජාතීන්හි නාම රූපයන්ගේ පැවැත්ම සිහි කරන්නාට හැකි නුවණ පූර්වේනිවාසානු-ස්මෘති ඥානය යි. තීර්ථකයන්හට මෙම නුවණින් හතළිස් කල්පයක් තුළ පැවැති ආත්මභාවයන් ගැන තොරතුරු සිහිකර කියන්නට පිළිවන. බුද්ධ ශ්‍රාවකයන්හට කල්ප-දහසක් ද අසූ මහා ශ්‍රාවකයන් හට කල්ප ලක්ෂයක් ද, දෑගසව්වනට එකාසංඛ්‍ය කල්පලක්ෂයක් ද, පසේබුදු-වරයන්හට දෙයාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි ද, පැවති ආත්මයන් පිළිවෙළින් බලන්නට පිළිවන. සම්බුදු-වරයනට අනුපිළිවෙළින් නොබලා කැමති තැනකින් කැමති තාක් කාලයක් තුළ වූ ආත්මයන් දක්නට හැක්කෝ වෙයි. මේ **පළමුවන විද්‍යාඥානයයි.**

දෙවියන්ගේ ඇස බඳු පැවැතුම් ඇති ඥානය දිබ්බචක්ඛු නම්. දෙවතාවන්ගේ චක්ෂුව ඉතා සියුම් වේ. ගස් ගල් පර්වතාදිය පවා විනිවිදගෙන ඉතා දුරවූ ද රූපයන් දක්නට හැකිය. භාවනා බලයෙන් තියුණුවූ ප්‍රඥාවද දිව ඇස මෙන් ක්‍රියා කරයි. එයට භාවනාන්තරගතාවන සුගති දුගතිගාමී උපදින චුතවන සත්වයන් දක්නට හැකි වේ. "මේ සත්වයෝ කායාදී දුශ්චරිතයන්ගෙන් යුක්තයහ. ආර්‍යයනට උපවාද කරන සුල්ලහ. මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු ය.

එහෙයින් මරණින් මතු නිරයෙහි උපදනාහ. මේ සත්වයෝ කායාදී සුචරිතයෙන් සමන්නාගත වූවාහු, ආර්‍ය්‍යයන් උපවාද නැත්තාහු සම්‍යක් දෘෂ්ටි ගත්තාහු මරණින් මතු සුගති-යෙහි උපදනාහ'' ආදී විසින් සත්වයන්ගේ කර්මානුරූප ගති පැවතුම් දැනගන්නට හැකි නුවණ **දෙවන විද්‍යා ඥානය යි.**

ආසවක්ඛය ඤාණ යනු සකල ක්ලේශයන් ප්‍රහීණ කිරීමෙන් ලැබෙන අතිපරිසුද්ධ ඥානය යි. "මේ ස්කන්ධ පඤ්චකය දුකැයිද එය පහළ වනුයේ තෘෂ්ණායෙනැයි ද, එය නැති වනුයේ නිවන් අවබොධ වීමෙනැ යි ද එය නැති කරගන්නා ක්‍රමය අරි අටඟ මහෙහි හැසිරීම යැ යි ද දැන, කාමාදී ආශ්‍රවයන්ගෙන් මිදී මෙ අත්බැව පිණිස කළයුතු අන්කිසක් නැතැ''යි ආදී විසින් ලබන අවබෝධය **තෙවන විද්‍යා ඥානයයි.** පළමුව පුබ්බෙනිවාස ඤාණ- දිබ්බ-චක්ඛු ඤාණයන් උපදවා පැසුලු රහත්වන පුද්ගලයා ද, පළමුකොට රහත් වී අනතුරුව පුබ්බෙනිවාස - දිබ්බචක්ඛු ඤාණයන් උපදවන පුද්ගලයාද අදහස් විසින් තෙවිජ්ජ නාම-යට සුදුසු වුවද, මෙහි නිෂ්පර්‍ය්‍යාය දෙශනා වශයෙන් යථොක්ත නාමාරෝපණය කැරෙන බැවින් පළමුව ම පුබ්බෙනිවාසාදී දෙවැදෑරුම් විද්‍යාවන් උපදවා පසුව රහත් වූ පුද්ගලයාම අදහස් කරනු ලැබේ.

**ඡළභිඤ්ඤ:-**

අභිඤ්ඤ නම් විශිෂ්ට ඥානය යි. යම් පුද්ගලයෙක් එම විශෙෂ ඥාන සයෙකින් සමන්විත ද හේ ඡළභිඤ්ඤ නම් වේ. ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බේ-නිවාසානුස්සති, දිබ්බචක්ඛු සඞ්ඛ්‍යාත පඤ්චාභිඥ සමග ආසවක්ඛය ඥානයත් ගත් කල්හි ඥානෂට්කය සම්පූර්ණ වේ. ඡළභිඤ්ඤ පුද්ගලයා මෙම ඥානයන් උපදවා ගත් කොතෙකි. එහි **ඍද්ධිවිධ ඥාන** නම් භූත කසිණ සතරෙහි හා වර්ණ කසිණ සතරෙහි ද වෙන වෙනම අට සමාපත්ති

උපදවා අනුලොම පටිලොමා දී ක්‍රමයෙන් සිත පුරුදුකැරගෙන උපක්ලෙශ රහිතද කර්මණ්‍යද අවස්ථාවලද ප්‍රභාස්වරද වූ කල්හි ඍද්ධි විධි ලබාගැනීම පිණිස සිත යොමු කරවා තමා එක් කෙනෙකු වැ සියයක් දහසක් වේවා යි ඉටා එසේ පෙන්වීම, අන් වෙසකින් පෙනීසිටී ම, සිය සිරුර තුළින් අන් සිරුරක් බැහැර කොට පෙන්වීම, ආදිය කටහැකි බලය වේ. **දිබ්බසොත ඤාණ නම්** දෙවියන්ගේ කණ බඳු ඉතා දුර වූ ද ශබ්දයන් ඇසීමේ ඥාන විශේෂයක් ලැබ ගැන්මය. දෙවියන්ගේ කණ සෙම් ආදියෙන් නොවැසී අසම්බාධ වැ පවත්නේය. බවුන් වැඩීමෙන් එබඳු ශක්තියක් පහළ කැරගනුයේ දිබ්බසොත ඤාණය යි හැඳිනේ. එය උපදවා ගනු කැමති යොගියා අභිඤ්ඤාපාදකජ්ඣානයට සමවැද ඉන් නැඟී පරිකම් සමාධි චිත්තයෙන් ප්‍රකෘති කණ්යට ගොචර වන අරණ්‍යගත සිංහාදීන්ගේ පටන් කුරුකුහුඹු ශබ්ද දක්වා අසන්නේය. ඒ ඒ ශබ්ද අසුවල් දිශායෙන් පැමිණෙති යි ද, ව්‍යවස්ථා කැරගෙන ඉන් එකක් අරමුණුකොට මනොද්වාරාවර්ජනය උපදවා ගන්නේය. අනතුරුව පරිකම් උපචාර අනුලොම ගොත්‍රභූ සිත් ඉපදී. චතුර්ථධ්‍යානය අර්පණාප්‍රාප්ත වේ. එහි පවත්නා ප්‍රඥාව දිබ්බසොත නම්. එයින් ලොවපුරා පවත්නා ශබ්ද තෝරා බේරා හැඳින ගන්නට හැක්කේය. **පරචිත්ත විජනාන ඤාණ** නම් අනුන්ගේ සිත දැනගන්නා නුවණය. එය දිබ්බචක්ඛු ඤාණ වශයෙන් උපදවා ගනු ලබන්නකි. අනුන්ගේ හෘදය වස්තුව ආශ්‍රිතලෙයෙහි පවත්නා වර්ණය දිව ඇසින් බලා අධික රත්පැහැ ඇතියේ සොම්නස් සිතෙක කාලවර්ණ වූයේ දොම්නස් සිතෙක තලතෙල් බඳු පැහැ ඇතියේ උපෙක්ෂා සිතෙකැ යි දනනතී. කාමාවචර රූපාවචරා දි සිත් දැනැ ගන්නට ද මේ ක්‍රමය දියුණු වූ කල්හි පිළිවන. **පුබ්බෙනිවාස – දිබ්බචක්ඛු ආසවක්ඛය ඤාණයන්ගේ ස්වභාව තෙවිජ්ජ පුද්ගල විස්තරයෙහි දැක්වුණ බැවින් මෙහි උපෙක්ෂිතය.**

## සම්මා සම්බුද්ධ:-

යම් පුද්ගලයෙක් පරෝපදෙශ රහිතව සවයම්භූ-ඥානයෙන් එ අත්බැව්හි නො ඇසූවිරූ චතුසසත්‍ය ධර්මයන් පෙමේම අවබෝධ කොටගෙන එහි සියල්ල දන්නා බවට හා දසබලයන් හි චිණ්ණවසීභාවයටත් පැමිණේ ද, හෙතෙමේ සම්මා සම්බුද්ධ නම් වේ. පැරුම්පුරණ සෙමෙහි බෝසතාණන් වහන්සේ අන් බුදුවරයන්ගේ සසුන්හි පැවිදිවැ තෙවළා දහම් උගනී. ගොත්‍රභූ ඤාණය දක්වා සාමටහනු දු වඩයි, එහෙත් පශ්චිම භවයෙහි සිවුසස් පිළිවිදිනුයේ පරෝපදෙශ රහිතවය. යටත් පිරිසෙයින් සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක් තුළ පුරණලද පාරමිතා ඇති හෙයින් සඞ්ඛතා 'සඞ්ඛත ධර්මයන්හි මේ දුකය – මේ දුක්ඛ සමුදය ය – මේ දුක්ඛ නිරෝධය ය – මේ දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාව යැ යි පැසුළු අත්බැව්හි සිවුසස් දැනැ ගනුයේ තමහට ප්‍රත්‍යක්‍ෂ වූ ඤාණයෙනි. බුද්ධ නාමය සර්වඥයන් වහන්සේලාගේ රූපකාය සම්පත්තියට හා ධර්මකාය සම්පත්තියට ද එකසේ ව්‍යවහෘතය. ද්වාත්‍රිංශත්වර මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් සමුපශොභිත රූපස්කන්ධයත්, ඥාන සම්ප්‍රයුක්ත සතර අරූපස්කන්ධයත් ඉන් වාච්‍යවේ. **එහෙත් ප්‍රමුඛ වශයෙන් බුද්ධ යන ශුද්ධ නාමය හෙනුයේ ඥාන විලාසයෙහි මැයි.** රජ පැමිණියේ යැ යි සකල රාජපර්ෂද් පැමිණි බව එයින් හැඟෙනුමෙන් අනන්‍ය සාධාරණ ඥාන සම්පත්තිය බුද්ධ ප්‍රඥප්තියෙන් ගම්‍යමාන වන කල්හි ආනුසඞ්ගික වශයෙන් තදනුබද්ධ රූපස්කන්ධය ද කියන ලදුයේම ය. එබැවින් සුවිසුද්ධ රූපාරූප සන්තතිය සම්මාසම්බුද්ධ නම් වන්නේය. චතුසසත්‍යාවබෝධයෙන් අර්හත් මාර්ගඥානය උපදවා ගැන්ම සමග දතයුතු සියල්ල දත් බවටද, දස වැදෑරුම් ඤාණබලයන්හි විශාරද බවටද, පැමිණීම බුද්ධත්වයේ ලක්‍ෂණය වේ. සර්වඥවරයනට මෙම සර්වඥතාඥානයාගේ ද දසබල ඥානයාගේ ද අධිගමයෙහි

පටන් කළයුතු කිසිවක් නැත. සියලු කිස නිමියේ වෙයි. ක්ෂත්‍රිය කුමාරයෙකු අභිෂෙක ප්‍රාප්තවූවිට නොලබන ලද ඓශ්වර්යයක් නැත. මනුෂ්‍යයෙකු විසින් ලදහැකි සකල සම්පත්තියක්ම ඔහුට අත්පත් වෙයි. අභිෂෙකයෙන් ලබන ඔටුන්න සියලු යස ඉසුරු ලබන්නට සුදුසු බව හඟවන චිහ්නය හෙයිනි. බුදුවරයනට අර්හත් මාර්ග ඥානය පහළවනු සමග මෙතම් ගුණයක් නොපැමිණියේ ය. ප්‍රතිවෙධ හෝ නොකෙලේය. ප්‍රත්‍යක්ෂ ද නොවීය යි කියන්නට නොපිළිවන. සියලු සර්වඥ ගුණයන් උන්වහන්සේවෙත ප්‍රතිවෙධයෙනුදු ප්‍රත්‍යක්ෂභාවයෙනුදු පහළ වන බැවිනි. මෙසේ හෙයින් **පූරිත පාරමිතානු භාවයෙන් ක්ලෙශ-ක්ෂය වනු සමගම, පඤ්චවිධ ඥෙය මණ්ඩලයෙහි අප්‍රතිහත ඥානබලයෙකින් සමුපලක්ෂිත වූ, නවඅරහාදි ගුණ සමුදයයෙන් බබලමින් අප්‍රති පුද්ගල බවට පැමිණෙන උත්තමයා සම්මාසම්බුද්ධ නම් වේ.**

**පච්චෙක බුද්ධ:-**

පශ්චිම භවයෙහි පරොපදෙශ රහිතව සිවුසස් පිළිවිදිනුයේ මෙතම් වේ. සර්වඥවරයෙකුහට පමණක් දෙවැනි වන මෙතුමාට සර්වඥතාඥානයෙහි හෝ දශ ඥාන බලයන්හි පරිචිත වශීභාවයක් නැත්තේය. එහෙයින්ම උන්වහන්සේට තමාපිළිලද දහම් අන්‍යයනට අවබොධ කරන්නට ශක්තියක් නැත. එක් ලොකධාතුවක සම්බුද්ධවරයන් දෙදෙනෙකුන් එකවර පහළ නොවන නමුදු පසේබුදුවරයන් වැඩිදෙනෙකුන් හට පහළ වන්නට බාධාවක් නැත. පසේබුදුවරයනට උවැටන් කිරීමෙන් සත්‍යාවබොධයක් නොවන නමුත් ලෞකික සම්පත් සාදාගන්නට හැකිය. ලොකොත්තර සම්පත්ති ප්‍රතිලාභයට උපනිශ්‍රය සම්පතුදු ඇති කැර ගන්නට නොහැකි නොවේ.

## උභතොභාග විමුත්ත -

අෂ්ට විමොක්‍ෂයන් නාමකායයෙන් ස්පර්ශකොට මාර්ග ප්‍රඥාවෙන් ක්ලෙශක්‍ෂය කරන යම් පුද්ගලයෙක් වේද, හෙතෙම උභතොභාග විමුක්ත නම්. අරූප සමාපත්ති උපදවා රූපකාය යෙන්ද, සතර මාර්ග ප්‍රඥාවෙන් නාමකායයෙන්ද, යන දෙපසින් නාම රූපයන් කෙරෙන් මිදුණු ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ මෙයින් අදහස් කෙරේ. අෂ්ට සමාපත්ති උපදවනු සමග රූපකායයාගේ පහළවීම නැතිකිරීම නිසා එක්වරක් ද, විදර්ශනාවෙන් සංස්කාරයන්ද, මාර්ග ප්‍රඥාවෙන් චතුරාර්‍ය්‍ය සත්‍යයන්ද, දැක ආශ්‍රවක්‍ෂය කිරීමෙන් නාමකාය ප්‍රවෘත්තිය නැසීම නිසා එක් වරක්දැ යි දෙවරකදී නාමරූපයෙන් මිදීම මේ පුද්ගල ස්වභාවය යි. අරූප සමාපත්ති සතරින් එක එකකින් නැගී සිට සංස්කාරයන් සම්මර්ශනය කිරීමෙන් රහත්වන්නන්ගේ වශයෙන් සතරදෙනක්ද, නිරොධ සමාපත්තියෙන් නැගී අර්හත්වයට පැමිණෙන අනාගාමි පුද්ගලයාගේ වශයෙන් එක්කෙනෙක්දැ යි **උභතොභාග විමුත්ත පුද්ගලයෝ පස්දෙනෙක් වෙති.** නිවරණයන් කෙරෙන් මිදේනුයි, ධ්‍යානාලම්බනයන් කෙරෙහි අධිමුක්ත (ඇලුනේ) නු යි අධිමොක්‍ෂ නම්. පහත දැක්වෙන සමාපත්ති අටෙන් උභතොභාග විමුක්ත පුද්ගලයා රූපකායයෙන් මිදෙන්නේය.

i **තමාගේ ශරීරයෙහි කෙස් නිය ආදියෙහි කසිණ පරිකර්ම කොට බාහිර සුවර්ණ දුර්වර්ණ ප්‍රතිභාග-නිමිත්තෙහි ඉපද වූ රූප ධ්‍යාන සමාපත්ති**

ii **ස්වකීය ශරීරයෙන් පිටත්හි බාහිර පරිකර්ම ප්‍රතිභාග නිමිත්තෙහි ඉපද වූ රූප ධ්‍යාන සමාපත්ති.**

iii **බාහිර ඉතා පිරිසිදු නීලාදී වර්ණයෙහි කිසුණු පිරියම්කොට ලබනලද අතිපවිත්‍ර ප්‍රතිභාග නිමිත්තෙහි උපදවනලද රූප ධ්‍යාන සමාපත්ති**

iv **ආකාසානඤ්චායතන ධ්‍යාන සමාපත්තිය.**

v **විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සමාපත්තිය.**

vi **ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සමාපත්තිය.**

vii **නෙවසඤ්ඤා නා සඤ්ඤායතන ධ්‍යාන-සමාපත්තිය.**

viii **නිරොධ සමාපත්තිය.**

උභතොභාග විමුක්ත පුද්ගලයාට මෙම අෂ්ට විමොක්‍ෂයනට අනුලොම – ප්‍රතිලොම – අනුලොම ප්‍රතිලොම වශයෙන් සමවදින්නට ද නැඟී සිටින්නට ද පිළිවන.

මේ පුද්ගලයා පිළිබඳ ආචාර්‍යවාදයෝ ද වෙති. **ත්‍රිපිටක චූලනාග ස්ථවිරයන් වහන්සේ** සමාපත්තියෙන් විෂ්කම්භණ විමොක්‍ෂයෙන් ද, මාර්ගයෙන් සමුච්ඡේද විමොක්‍ෂයෙන් ද, යන දෙකොටසින් දෙවරක් මිදිණැයි සලකා උභතොභාග විමුක්තභාවය පණවයි. **ත්‍රිපිටක මහා ධම්ම රක්ඛිත ස්ථවිරයන් වහන්සේ** නාම කයින් ද රූප කයින් ද, මනාකොට මිදෙන හෙයින් යථොක්ත නාමය පණවයි. **ත්‍රිපිටක චූලාභය ස්ථවිරයන්වහන්සේ** සමාපත්තියෙන් විෂ්කම්භණ වශයෙන් එක්වරක් ද, මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් එක් වරක්ද මිදේය යි අදහස් කෙරේ. මේ ථෙරවාද ත්‍රයයම උභතොභාග විමුක්ත පුද්ගලයා පහළ වන ක්‍රම දක්වීමක්ම වන හෙයින් තන්තිනයානුගතය. මෙසේ සැලකෙනවිට රූපාවචර චතුර්ථධ්‍යානය උපදවා අර්හත්වය ලැබූ පුද්ගලයා ද උභතොභාග විමුක්ත නොවෙයි. එහි ක්ලෙශකායයෙන් මිදීමක් මුත් රූපකායයෙන් මිදීමක් නැති හෙයිනි. එබැවින් අරූපාවචර ධ්‍යාන ලබා ඉන්නැඟී විදසුන්වඩා ක්ලෙශක්ෂය කළ මහ රහතන් වහන්සේම නාමරූප දෙකින් මිදෙන හෙයින් උභතොභාග විමුක්ත නම් වන්නේය යි දතයුතුයි.

**පඤ්ඤා විමුත්ත:-**

අෂ්ට විමොක්ෂයන් ප්‍රත්‍යක්ෂ නොකොට විදර්ශනා ප්‍රඥාවෙන් මාර්ගඵලාවබොධය ලබනුයේ පඤ්ඤා විමුත්ත නම්. මෙතෙම ධ්‍යානලාභිවූව චතුර්ථ ධ්‍යානයෙහෙක් ගමන්කරයි. යම්හෙයකින් එක් අරූපාවචර ධ්‍යානයකුදු උපදවා ගතහොත් උභතොභාග විමුක්ත සඞ්ඛ්‍යාවට පැමිණේ. එක එක රූපාවචර ධ්‍යනයෙකින් නැගී අර්හත්වයට පත්වන්නන්ගේ වශයෙන් සිවුදෙනෙක් ද, එබඳු ධ්‍යානලාභයක් නොමැතිව ශුෂ්කවිදර්ශක වශයෙන් රහත්වන පුද්ගලයා ද යි **පඤ්ඤා විමුත්ත පුද්ගලයෝ පස්දෙනෙක් වෙත්.**

**කායසක්ඛි:-**

අෂ්ට විමොක්ෂයන් නාමකායින් ස්පර්ශකොට ඇතැම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රහීණ කළ ආර්‍ය්‍යපුද්ගලයා කායසක්ඛි නම්. ප්‍රථම ධ්‍යානාදිය සහජාත නාමකායයෙන් පළමුව ස්පර්ශකොට පසුව නිරොධය වූ නිර්වාණ ප්‍රත්‍යක්ෂ කෙරේනු යි හන්නාමිය සෝවාන් ඵලස්ථයා පටන් අර්හත් මාර්ගස්ථයා තෙක් ව්‍යවහාර වේ. මෙතෙම සංස්කාරයන් දුක් වශයෙන් මෙනෙහි කරමින් පස්සද්ධි බහුලව සමාධින්ද්‍රිය ලබන්නේය. පර්‍ය්‍යාය දෙශනා වශයෙන් ප්‍රථම ධ්‍යානය පටන් නෙවසඤ්ඤා නා සඤ්ඤායතන ධ්‍යානයතෙක් එක් එක් ධ්‍යානලාභියාද කාය සක්ඛි නමින් සැලකේ. මෙහි නිෂ්පර්‍ය්‍යාය දෙශනා හෙයින් ධ්‍යානය පාදක කොට එක් එක් මාර්ගයෙන් විනාශකළයුතු ආශ්‍රවයන් නැසූ අර්හත් මාර්ගස්ථයාහෙක් ලැබෙන පුද්ගලයන් සදෙන ගතයුතුය.

**දිට්ඨිප්පත්ත:-**

සියලු සංස්කාරයෝ දුඃඛයහ. ඔවුන්ගේ නිරොධය සුඛයැ යි ප්‍රඥාවෙන් දන්නාලද්දේ දූ නී මේ කෙළවරට පැමිණියේ දිට්ඨිප්පත්තය. සංස්කාර නිරොධය මනාකොට අවබොධි කරනලදය. ප්‍රත්‍යක්ෂ කරනලදය. දක්නාල දූ යි සලකා මේ ව්‍යවහාරය කරනු ලැබේ. ඒ එසේ ම ය.

මේ පුද්ගලයා පඤ්චොපාදාන ස්කන්ධය දුකැ යි ගෙන එයට වැඩිතරම් දුකෙක් නැතැ යි දනී. මෙම දුක දනවනුයේ තෘෂ්ණාවය. දුක පහළවනුයේ එයින් මැ යැ යි ගෙන දුක්ඛ සමුදය නම් තෘෂ්ණාව යැයි දනී. මේ දුක්ඛ සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධය ද, සමුදය වූ තෘෂ්ණාව ද, නිර්වාණයට පැමිණ නිරවශෙෂයෙන් නිරුද්ධවැ නොපැවැත්මට යෙති යි දත නිර්වාණය දුක්ඛ නිරොධයැ යි තත්වූ පරිද්දෙන් අවබොධ කරයි එමෙන් ම දුක්ඛ නිරොධය කරනුයේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයැ යි දැන එය දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාව සේ ඇතිසැටියෙන් පිළිගනී. මෙසේ නා නා අව-ස්ථාවන්හි දී චතුස්සත්‍යයන් පිරිසිඳිනු පමණක් නොවා, තථාගතයන් වහන්සේ බෝමැඩ දී ප්‍රතිවෙධ කෙළෙ මැනවින් ප්‍රකට කොළෙ, මෙම චතුරාර්‍ය්‍ය සත්‍යයෝ නොවෙද්දැ යි එකාවිට මැ ඉ දු රා දැන එහි නුවණ හසුරුවන්නේය. මේ පරිද්දෙන් මෙතෙම නා නා ක්‍ෂණයෙහි හා එකක්‍ෂණයෙහි සිවුසස් දැන ඇතැම් කෙලෙසුන් කෙරෙන් මිදෙන්නේය. සිවුසස් දත් පුද්ගලයාගේ අවස්ථාභෙද දක්වීමක් මින්-අදහස් කරන හෙයින් **සොතාපන්න ඵලස්ථයා පටන් අර්හත් මාර්‍ගස්ථයා තෙක් ලැබෙන පුද්ගලයෝ සදෙන ඓෂධ අයත් වෙත්.** අරූප ධ්‍යාන නොලබාම පහසුවෙන් ජීවත් පසක් කරන්නට මොහු සදෙන සමර්‍ථයහ.

**සද්ධා විමුත්ත:-**

දිට්ඨිප්පත්ත පුද්ගලයාමෙන් චතුරාර්‍ය්‍ය සත්‍යධර්මයන් අවබොධ කරන නමුත් ක්ලෙශ ප්‍රහාණය ඉතා දුකසේ සිදුකරනුයේ සද්ධා විමුක්ත නම්. දිට්ඨිප්පත්ත ප්‍රඥාධික පුද්ගලයෙකි. සද්ධාවිමුක්ත ශ්‍රද්ධාධික කෙනෙකි. මේ දෙදෙ-නාගේ වෙනස මෙපමණය. ක්ලෙශක්‍ෂය කිරීමට අනුගමනය කරන ක්‍රියාමාර්‍ගයේ නානාත්වයක් නැත. දිට්ඨිප්පත්ත ක්ලෙශ විෂ්කම්භණය ක්ලාන්ත නොවමින් නිදුකින් කරයි. සද්ධා විමුත්ත ඉතා දුකසේ ක්ලාන්තවෙමින් විලම්බයෙන් කරයි.

මිත්‍ර මාර්ගත්‍රය පිළිබඳ විදර්ශනා ඥානය දිට්ඨිප්පත්ත පුද්ගල-යාගේ තියුණුය, සූරය. එමෙන් ම ප්‍රසන්නය. සද්ධාවිමුත්තගේ එම තුන්මාර්ග ඤානය නොමුවහති, අදක්ෂය, එසේම අප්‍රසන්නලෙස සිදුකෙරේ. තියුණු මුවහත ඇති කඩුවකින් ශබ්ද රහිතව ඉක්මනින් ඔපමට්ටම් ඇතිව කෙසෙල් ගසක් කපාලනු මෙන් දිට්ඨිප්පත්තයා පූර්වභාග මාර්ග භාවනායෙහි දී බලවත් උත්සාහ නොගෙනම අදහස සමෘද්ධ කරගන්නේය. කුණ්ඨ (මොට) කඩුවකින් දෙතුන්වරක් ගසා ශබ්ද දනවමින් මට්ටම් රහිතව කෙසෙල් ගස කැපෙනුමෙන් සද්ධාවිමුත්ත බලවත් ව්‍යායාමයෙන් වෙහෙසදරා ඉතිරි තුන්මග කිස සපුරාලන්නේය. **සද්ධාවිමුත්ත පුද්ගලයෝද කායසක්ඛීන්-මෙන් සදෙනෙක් ම වෙති.**

## ධම්මානු සාරී:-

සෝතාපත්ති මාර්ග ප්‍රඥා සඞ්ඛ්‍යාත ධර්මයෙන් යුක්තව හැසිරෙනු යේ ධම්මානුසාරිය. මොහුගේ පඤ්ඤින්ද්‍රිය බලවත් ය. සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා එය යොදවයි. ප්‍රඥා පූර්වාඞ්ගමව ආර්‍ය්‍යමාර්ගය වඩන මෙම යොගාව-චරයා ඵලය කරා උසුලාගෙන යන්නකු මෙන් පමුණුවනු ලබයි. ඵලයට පැමිණෙනු සමග දිට්ඨිප්පත්ත ව්‍යවහාරයට පැමිණේ. **ධම්මානුසාරී යනු සෝතාපත්ති මාර්ගස්ථයා හඳුන්වන එක් නාමාන්තරයෙකැ යි දතයුතුය.**

## සද්ධානු සාරී:-

ශ්‍රද්ධාව පූර්වාඞ්ගම් කොට ආර්‍ය්‍ය මාර්ගයෙහි සරනු යේ සද්ධානුසාරී නම. මෙතෙම බලවත් සද්ධින්ද්‍රියයෙන් මෙහෙයන ලදුව ඵලය කරා පමුණුවනු ලබයි. ශ්‍රද්ධාව පුරේචාරික වැ බවුන් වඩා සෝතාපත්ති ඵලය සාක්ෂාත් කැර ගැනීමට යත්න දරන **සෝතාපත්ති මාර්ගස්ථ පුද්ගලයා** මෙයින් අදහස් කෙරේ. ඵලප්‍රාප්ත වූ කෙණෙහි පටන් ඇතැම් ක්ලෙශයන්ගෙන් මිදුන හෙයින් සද්ධාවිමුක්ත

වහරට යෝග්‍ය වේ. නව ලොවුතුරු දහම් පිළිවිදින්නවුන් විසින් ශ්‍රද්ධා - ප්‍රඥා දෙක ධුරස්ථානයෙහි තබා සමථ-විදර්ශනා දෙතැනින් ඇතුළුවී උභතොභාග - පඤ්ඤාසඞ්ඛ්‍යාත උභය ශිෂ්‍යයන් කාරුණුකොටගෙන ක්ලේශයන්ගෙන් මිදියයුතුය. උභතොභාග විමුක්ත පුද්ගලයා ආදිකොට සද්ධානුසාරී අන්තිම කොට ඇති අග්‍ර දක්ෂිණාර්හ වූ මේ ආර්‍ය්‍යපුද්ගලයන් සත්දෙනා පූර්වෝක්ත ක්‍රමයෙන් නිවන් පසක් කරන්නෝය. ඔවුන්ගේ නානාත්වය පහත දැක්වේ. මෙ සසුන්හි යම් භික්ෂුවක් අෂ්ට සමාපත්ති උපදවා ප්‍රඥාව ධුරය කොට ගෙන සමථ වශයෙන් භාවනා කොට අරූප සමාපත්තියක් පදස්ථානකොට විදර්ශනාව පිහිටුවා අර්හත්වයට පැමිණේද, හෙතෙම සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි ධම්මානුසාරී නම් වේ. අර්හත් මාර්ගය දක්වා ලැබෙන අනෙක් සතැන කායසක්ඛී නමින් වහර වේ. අර්හත්ඵල ප්‍රාප්තවූයේ උභතොභාග විමුක්ත නමින් පළට වේ. අනෙකෙක් ප්‍රඥාවම ධුරයකොටගෙන විදර්ශනා වශයෙන් භාවනාවට බැස ගන්නා ලද්දේ ශුද්ධ සංස්කාරයන් හෝ අරූපාවචර ධ්‍යානයක් හෝ සම්මර්ශනය කොට රහත්වේද, හෙතෙම සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි ධම්මානුසාරී ම වේ යි. සෝතාපත්ති ඵලස්ථා දී සෙසු සතැනෙහි දිට්ඨිප්පත්ත පුද්ගල සංඛ්‍යාවට යේ. අර්හත්වයට පත්වූ කල්හි පඤ්ඤාවිමුත්ත වහර ලබයි. අන්‍යතර ආර්‍ය්‍ය පුද්ගලයෙක් අටසමවත් උපදවන ලදුයේ සද්ධා ධුරයෙහි පිහිටා සමාධි වශයෙන් බවුන් වඩනුයේ යම්කිසි අරූප සමාපත්තියක් පදස්ථාන කොටගෙන විදර්ශනා පිහිටුවා අර්හත් වේද, හෙතෙම සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි සද්ධානුසාරී නම් ලබා ඉන්මත්තෙහි අත්පත් කරගන්නා සෙසු සවැදෑරුම් මාර්ගඵලයන්හි දී කායසක්ඛී ම වෙයි. රහත් වූ කල උභතොභාග විමුත්තයැ යි කියා වේ. අන්‍ය ආර්‍ය්‍ය පුද්ගලයෙක් ශ්‍රද්ධාව ම ධුරස්ථානයෙහි තබා විදර්ශනා වශයෙන් බැසගත්

භාවනා සමන්විත වූයේ ශුද්ධ සංස්කාරයන් හෝ රූපාවචර ධ්‍යානයක් හෝ සම්මර්ශණය කොට ක්ලේශක්‍ෂය කෙරේද, හෙතෙමේ සෝතාපත්ති මාර්ගක්‍ෂණයෙහි දී සද්ධානුසාරී වේ. ඉන්පසු අනුක්‍රමයෙන් ලබන සවැදෑරුම් ආර්‍ය්‍ය මාර්ග ඵලයන්හි සද්ධාවිමුත්ත වහර ලබයි, රහත් වූ කල්හි පඤ්ඤාවිමුත්ත නම් වේ. මෙපරිද්දෙන් සිවුසස් පිළිවිදින නයග්‍රාහ වශයෙන් පූර්වෝක්ත සප්ත ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ නාම ප්‍රඥප්තිය මේ ශාසනයෙහි දක්නට ලැබේ.

## සත්තක්ඛත්තුපරම:-

යම් පුද්ගලයෙක් සක්කායදිට්ඨි – විචිකිච්ඡා – සීලබ්බත පරාමාස යන සංයෝජනත්‍රය ය සමුච්ඡේදයෙන් ප්‍රහාණය කොට සෝතාපන්න බවට පැමිණ දෙව්මිනිසුන් අතර උත්පත්ති වශයෙන් සත්වරක් ම සැරිසරා දුක් කෙළවර කෙරේද හෙතෙම සත්තක්ඛත්තුපරම නම් වේ. මෙම යෝගාවචරයා නරකයෙහි ඉපදීමට හෙතුවන සංස්කාරයන් විනාශ කරනලද්දකු හෙයින් එහි උත්පත්තියක් නොලබයි. නිවන්කරා යන නිශ්චිත ගමන් ඇතියේ නිර්‍වාණාවබොධයෙහි ඇලුණේ මතුයෙහි තුන්මගින් අවශ්‍යයෙන් අවබොධ කළයුතුදෑ ප්‍රතිවෙධ කරන්නේය. කලෙක දෙව්ලොවද කලෙක මිනිස් ලොවද ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් දෙව්මිනිස් දෙගතියෙහි මිශ්‍රව උත්පත්තිය ලබන්නේය. මිනිසුන් අතරම සත්වරක් ද දෙවියන් අතරත් එසේම සත්වරක් ද සැරිසරා රහත්වන ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනෙක් ඇතත් ඔහු මෙහි ඇතුළත් නො වෙත්. **මිනිස් ලොවින් දෙව්ලොවටත් එයින් නැවත මිනිස් ලොවටත් උත්පත්ති වශයෙන් ගමන් කරන වොකිණ්ණවච්ච ජ්ඣාසය පුද්ගලයා යථොක්ත නාමයෙන් අභිප්‍රෙතය.** හෙතෙම සත්වැනි අත්බැව්හි දී රහත්වන බැවින් අටවැනි වරට උත්පත්තියක් කිසිසේත් නො ලබන්නේය. **"න තෙ භවං අට්ඨමං ආදියන්ති"**යි රතන සූත්‍රයෙහි වදළේ මේ පුද්ගලයා අදහස් කරමිනි.

## කෝලංකෝල:-

ත්‍රිවිධ සංයෝජනයන් ප්‍රහාණයකොට සෝතාපන්න බවට පැමිණ දෙතුන්වරක් දෙව්මිනිසුන් අතර උත්පත්තිය ලබා දුක් කෙළවර කොට නිවන් දක්නා පුද්ගලයා කෝලංකෝලය. මෙහි කුල යන්නෙන් අදහස් කරනුයේ භවයයි. සෝවාන් ඵලයට පැමිණි තැන්පටන් ලොක සම්මත නීච කුලික උත්පත්තියක් නොලබා උපභොග පරිභොග වස්තූන්ගෙන් පරිපූර්ණ උසස් කුලයන්හිම උපදනා හෙයිනුදු එම වහරලැබේ. දෙශනා ක්‍රම වශයෙන් දෙතුන් වරක් උපදිතැයි කියන නමුදු සවන භවයනෙක් සැරිසරන්නට ද හැකිය. මොහු භවොත්පත්තිය ලබනුයේ ද මිශ්‍රලෙසිනි. සෝතාපන්නව සත්වරක් ම ඉපද සංසාර වෘත්තිය නිවෘත්ත කරන්නා සත්තක්ඛත්තුපරම නාමය ලබන අතර සවනවර දක්වා උපත ලබන ආර්ය්‍යයා කෝලංකෝල නම් වන්නේය.

## ඒකබීජී:-

සෝවාන් ඵලයට පැමිණ ස්කන්ධබීජ සඞ්ඛ්‍යාත ඒකම ආත්ම භාවයක් මිනිස්ලොව උත්පත්තිය ලබා දුක් කෙළවර කරන ආර්ය්‍ය පුද්ගලයා ඒකබීජී නම්. පාඨාගත දෙශනායෙහි ඒකබීජී මිනිස්ලොව පමණක් උපදිනි යි සඳහන් වන නමුදු, පුද්ගල ප්‍රභෙද පිරිසිදීන ක්‍රමයෙන් ඔහු දෙව්ලොව උපදිති යි ද කියන්නට පිළිවන. ඒකම සෝතාපන්න පුද්ගලයා ඉතිරි මාර්ගත්‍රය ප්‍රතිවෙධ කරන්නට ගන්නා කාලය සලකා බුදුරජාණන් වහන්සේ සත්තක්ඛත්තුපරමාදී නාමාරොපණය කරන ලද බව පෙනේ. ඇතැම් යොතෙකුගේ විදර්ශනාව ඉතා බලවත් හෙයින් දෙව් මිනිස් දෙගතියෙන් එකක තවත් එක් වරක් ඉපද රහත්වේ. හෙතෙමේ ය, ඒකබීජී වනුයේ. එයට වඩා මද වූ විදර්ශනා ඇතියේ රහත්වනු සඳහා දෙතුන් වරක් හෝ ඉතා උඩත් පිරිසෙයින් සයවරක් හෝ කාමසුගතියෙහි ඉපද

බවින් වැඩිය යුතුය. අතිශයින් ම මඳවූවහුත් ඇතියේ සත් වරක් ම උපද ඉතිරි මාර්ගත්‍රයෙන් නැසියයුතු ක්ලේශයන් සුන් කොට රහත්විය යුතුය. සෝතාපන්න පුද්ගලයාගේ කාම සුගති භවෝත්පත්තිය සැලකීමෙන් සත්තක්ඛත්තු-පරම - කෝලංකෝල නාම ව්‍යවහාරය සාර්ථ හෙයින් එකබීජී පමණක් මිනිස්ලොව උපද රහත්වේ යැයි සැලකීම යුක්ති යුක්ත නොවේ. ඔහුගේ ඉතිරි එක් භවය දෙව්ලොව වන්නට ද වෝමිස්සක වට්ටජ්ඣාසය නයින් ඉඩ ලැබෙන හෙයිනි. සංසාරික සැපයෙහි ඇලුණු ඇතැම් සෝතාපන්න පුද්ගලයෝ සදෙව්ලොව පිළිවෙළින් වැස අකනිට්ඨා බඹලොව තෙක් උත්පත්ති වශයෙන් ගමන්කොට ක්ලේශ පරිනිර්වාණය කෙරෙති. **"අනාථ පිණ්ඩික සිටුවරයා-විශාඛා උපාසිකාව චූලරථ මහාරථ දිව්‍ය පුත්‍රයෝ - අනේක වර්ණ දිව්‍ය පුත්‍රයා - සක්දෙව් රජ - නාගදත්ත දිව්‍ය පුත්‍රයා" යන සත් සෝතාපන්න ආර්යයෝ මේ ශාසනයෙහි වට්ටාභිරත පුද්ගලයෝය.** ඔහු චාතුර්මහා රාජික දෙව්ලොව පටන් අකණිෂ්ඨ බඹලොව තෙක් ඉපද ලෞකික සම්පත් සියල්ලක් ම භුක්තිවිඳ නිවන් දක්නාහ. මොවුහු යථෝක්ත නියමයෙහි ලා නොගැනෙත්. තව ද මිනිස්ලොවහිම සත්වරක් ඉපද පිරිනිවෙන්නෝ ද, දෙව්ලොවම සත්වරක් ඉපද එහිදී පිරිනිවෙන්නෝද, සෝතාපන්නයන් අතර වෙති. ඔවුහුත් මෙයට ඇතුළත් නොවෙති. දෙව් මිනිස් දෙගතියෙහි මිශ්‍රකව උපදින සත්තක්ඛත්තුපරම කෝලංකෝල පුද්ගලයන් ම මේ නියමයෙහි ඇතුළත් වන බැවින් එක්වරක් මිනිස් දිවි ලද්දහු එකබීජී සේ ගැනිණ. සෝතාපන්න පුද්ගලයන්ගේ සංසාරික ප්‍රවෘත්තිය පිළිබඳ මෙබඳු විශදතාවයක් පැණෙන හෙයින් නා නා ආචාර්‍ය-වාදයෝද පැනනැගී තිබෙත්. සෝතාපන්නයා භූමි නියමයක් නොමැතිව භව සතකට වඩා ප්‍රතිසන්ධි නොගනිත් යි සමහරු කියති. ඇතැම් අය මිනිස්ලොව සත්වරක් ද, දෙව්ලොව සත්වරක්දැයි තුදුස්වරක් කාමසුගතියෙහි ප්‍රතිසන්ධිගෙන ඉන්පසු රූපාරූප භවයන්හි ද තුදුස්-

වරකට වඩා උපදිති යි අදහස් කරත්. තවත් සොතක් කාම සුගතීන්හි සත්වරකට වඩා නූපදිත තමුදු, රූපාරූප භවයන්හි සත්වර ඉක්මවා ප්‍රතිසන්ධි ගනිති යිද කියත්.

සොතාපන්න පුද්ගලතෙම අපාය භවයෙන් නැගී සිටියකු හෙයින් කිසිකලෙකත් අපායොත්පත්තියකට නොපැමිණේ. සොතාපත්ති මාර්ගඥනයෙන් අභිසඞ්ඛාර විඤ්ඤාණය නිරුද්ධවීම හෙතුකොටගෙන සප්තකාම සුගී-යෙහිදු භව සතක හැර අනවරාග්‍ර සංසාරයෙහි යම් නාම රූපයෝ පහළ වෙද්ද ඔහු නිරුද්ධවූවාහු ව්‍යුපසමිතයට පැමිණියාහු අස්තංගත වූවාහුමැ යි. සොතාපන්න පුද්ගලයන් කොලෙසුන් මූලසුන් කරනුයේ ප්‍රතිපද සතරෙක පිහිටා ශ්‍රද්ධාධික ප්‍රඥධික වශයෙනි. එබැවින් සඞ්ඛ්‍යා ප්‍රමාණ-යෙන් සුවිසි කෙනෙක් වෙති.

i **දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා**
ii **දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා**
iii **සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා**
iv **සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** යන ප්‍රතිපද සතරින් එකිනෙකෙහි පිහිටා සිවුසස් පිළිවිදින ශ්‍රද්ධාව ධූරස්ථානයෙහි තබා බවුන් වඩන සත්තක්ඛත්තුපරම පුද්ගලයෝ සිවුදෙනෙක, කොලංකොලයෝ සිවුදෙනෙක, එකබීජීහු සිවුදෙනෙකැ යි දෙළොස් දෙනෙක් ද, ප්‍රඥව ධූරස්ථානයෙහි තබා ලොවුතුරා දහම් පිළිවිදින ප්‍රතිපද චතුෂ්කයෙහි පිහිටි සත්තක්ඛත්තුපරමාදී පුද්ගලයෝ දෙළොස් දෙනෙක් දැ යි ශ්‍රද්ධා ධූර – ප්‍රඥා ධූර වශයෙන් **චතුර්විංශති සොතාපන්න පුද්ගලයන්ගේ සඞ්ඛ්‍යා සංකලනය ලැබෙන බව දතයුතුයි.**

**සකෘදාගාමී:-**

සක්කායදිට්ඨි ආදී ත්‍රිවිධ සංයෝජනයන් නසා රාග-දේෂ මොහයන් තුනීකොට උත්පත්ති වශයෙන් මෙම මිනිස්ලොවට එක්වරක් පැමිණ දුක් කෙළවර කරනුයේ **සකෘදාගාමී** නමි. **පටිසන්ධි වසෙන සකිං ආගච්ඡතීති සකදාගාමී** යි යූ හෙයින් මෙම පුද්ගලයා දෙව්ලොවින් සැව

මිනිස්ලොව එක් වරක් ඉපද ඔවුන් වඩා පිරිනිවෙයි.

i **ඉධ පත්වා ඉධ පරිනිබ්බායි**
ii **තත්ථ පත්වා තත්ථ පරිනිබ්බායි**
iii **ඉධ පත්වා තත්ථ පරිනිබ්බායී**
iv **තත්ථ පත්වා ඉධ පරිනිබ්බායි**
v **ඉධ පත්වා තත්ථ නිබ්බත්තිත්වා ඉධ පච්ජිත්වා පරිනිබ්බායි**

යන ක්‍රමයෙන් සකෘදගාමි පුද්ගලයෝ පස්දෙනෙක් ලැබෙත්. එයින් කෙනෙක් මිනිස් ලොවදී සෙදගැමි වී මෙහිදී ම පිරිනිවෙති. කෙනෙක් දෙව්ලොව දී සෙදගැමි වී එහිදී ම පිරිනිවෙත්. ඇතැම් කෙනෙක් මෙහිදී එම මගතැණ උපදවා දෙව්ලොවද ඉපදී එහිදී ම පිරිනිවෙත් අනෙක්කෙනෙක් එහිදී පැමිණ මිනිස්ලොව ඉපද සසර කෙළවර කෙරෙත්. තවත් සමහර කෙනෙක් මිනිස්ලොවදී සෙදගැමි වී දෙව්ලොව ඉපද ආයු ඇතිතාක් වැස නැවත මිනිස්ලොව ඉපදී පරිනිර්වාණය කෙරෙති. මේ **පස්වැදෑරුම් ශකෘදගාමින්ගෙන් අන්තිමට සඳහන් වන පස්වැනි පුද්ගලයා මමෙහි අදහස්කෙරේ.** මිනිස්ලොව ශකෘදගාමි වී නැවත උත්පත්ති වශයෙන් මෙලොවට පැමිණීම ඔහුට පමණක් අයත් හෙයිනි. නොඑසේවුව එකබීජ සෝතාපන්න හා සකෘදගාමි අතර වෙනසක් නොලැබේ. එකබීජීහට ලැබෙනුයේ එක් ප්‍රතිසන්ධියකි. සකෘදගාමීහට දෙව්ලොව එකක් ද මිනිස්ලොව එකක්දැ යි ප්‍රතිසන්ධි දෙකක් ලැබේ. මේ ඔවුන් දෙදෙනාගේ නානාත්වය යි. ශකෘදගාමි සුගතිකාම භවයෙන් එකදෙශයෙකින් මිදෙන්නෙකි. මාර්ග ඥානය පහළවනු සමගම අභි-සංස්කාර විඥානයාගේ නිරෝධය හෙතුකොටගෙන භව දෙකක හැර පඤ්චභවයෙක්හි පහළවියයුතු යම් නාම රූපයෝ වූවාහු ද ඔහු සියල්ල නිරුද්ධ වැ සංසිඳීමට පැමිණෑ අස්තංගතවෙති. භව දෙකකට වඩා ඔහු පිළිබඳ නාමරූපයන්ගේ පැවැත්මෙක් නැත.

## අනාගාමි:-

මෙ සසුන්හි යම් පුද්ගලයෙක් සක්කායදිට්ඨි විචිකිච්ඡා -සීලබ්බත පරාමාස - කාම රාග - ව්‍යාපාද යන ඔරම්භාගිය සංයෝජනයන් සමූලඝාතනයෙන් විනාශකොට පඤ්ච ශුද්ධාවාසයෙහි ඖපපාතිකව පහළ වී කාමලෝකය කරා උත්පත්ති වශයෙන් නොඑනුයේ එහි මැ ක්ලේශ පරිනිර්වා-ණය කෙරේද, හේ අනාගාමි නම් වේ. **"පටිසන්ධි වසෙන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී"**යි යු හෙයින් අනාගාමී පුද්ගලයා කාමලෝකයට නො එනුයේ උපගලැබීම් වශයෙනි. නො එසේ වැ පැමිණෙන්නට බාධාවක් නැත. බුදුන් දැකීම - භික්ෂූන් දැකීම - ධර්ම ශ්‍රවණය ආදී ආගමික කටයුතු සඳහා අනාගාමී බ්‍රහ්මයෝ මෙලොවට පැමිණීම සිරිතක් වශයෙන් පවත්වති. කාමධාතුක සංස්කාරයන් (-ඔරම්භාගීය සංයෝජනයන්) නැසෙනු සමගමැ අප්‍රවෘත්තියට පත්වන හෙයින් ඔහු කාමලෝක වාසය හළබව එයින් ගම්‍යමානවේ. සක්කාදිට්ඨි ආදි පඤ්ච සයොජන සංයුක්ත පුද්ගලයෝ කාමධාතුයෙහි ම උපදිති, රූපා'රූප ලෝකයන් හා සසඳනවිට සම්පත් විසිතුරුදු, පිහිටි ස්ථාන වශයෙනුදු, කාමලෝකය පහත්ය. යටකොටසෙහි පිහිටියේය; එබැවින් එහි උපත ලබාදෙන සංයෝජනයෝ ද ඔරම්භාගිය නම් වෙති. ඔවුන් විනාශකළ අනාගාමී ආර්යයා උද්ධම්භාගිය සංයෝජන සමන්විත හෙයින් සුද්ධාවාස වාසයට එළැඹේ. යමෙක් යථෝක්ත ඔරම්භාගීය පඤ්ච බන්ධනයෙන් නොමිදුනේද, හෙතෙම භවාග්‍රයෙහි උපන්නේ නමුදු, ඇමක් ගිලූ මසකු මෙන්ද, දික්හුයකින් පා බඳනා-ලද කාකයකු මෙන්ද, එම බන්ධනයන් විසින් අදනා ලබනුයේ ආශු සංස්කාරය පිරිහෙනු සමග මැ කාමධාතුයෙහි හෙයි. එකොළොස් වැදෑරුම් කාමලෝකයන්ගෙන් එකක උපත ලබයි. අනාගාමී උක්ත ප්‍රකාරයෙන් කාමභවයෙන් මිදුනේ අනාගාමී මාර්ගඥානයෙන් අභිසංස්කාර විඥානයාගේ

නිරෝධය හෙතුකොටගෙන එක් භවයක් හැර කාමධාතුයෙහි භවදෙක කැ පහල විය හැකි යම් නාම රූපයෝ වූවාහු ද ඔවුන් නිරෝධයට පත්කලේ සංසිඳීමට පැමිණවූ යේ අසතයට යැවූ යේ කිසාලෙකත් කාමලොකොත්පත්තියට නොඒමය. අනාගාමීන්ගේ ගති පැවතුම් අනුව අනන්තරා පරිනිබ්බා යි ඈ විසින් පුද්ගල භෙද පසක් ලැබේ. ඔවුන් ගැන වෙන වෙන මැ විස්තර වන හෙයින් මෙහි සඳහන් කිරීමෙක් නොවේ.

## අනන්තරා පරිනිබ්බා යි:-

යම් අනාගාමී පුද්ගලයෙක් අවිහාදී ශුද්ධාවාසයෙක ඉපද එහි ආයුෂයෙන් භාගයක් ඉක්මෙන්නට පළමු උද්ධම්භාගීය සංයොජනයන් ප්‍රහීණකොට ක්ලෙශ පරිනි-ර්‍වාණය කෙරේද, හෙතෙම අනන්තරා පරිනිබ්බා යි නම් වේ. ඒ ඒ ශුද්ධාවාසයනට නියමිත ආයුසංස්කාරයන්ගේ භාගයක් ගෙවෙන්නට ලංව තිබියදී ඒ අතරතුර ක්ලෙශ පරිනිර්‍වාණය කරන හෙයින් මෙම පුද්ගලයා තත්ත්වානුරූපව එම නාමය ලබයි. ඔරම්භාගීය සංයොජනයන් නැසූ නමුදු උද්ධම්භාගීය සංයොජනයන් අප්‍රහීණව පවත්නා හෙයින් අවිහඅතප්පා දී ශුද්ධාවාසයන්හි ඉපදීම එම ආයතියනට ආවෙණිකය. එහෙත් ඔවුන්ගේ චිත්තසන්තානය රූපරාග - අරූපරාග -මාන - උද්ධච්ච - අවිජ්ජා යන උද්ධම්භාගීය සංයොජන-යනුදු නසනු සඳහා පටන්ගන්නා ලද විදශීනා සමන්විතය. එබැවින් ඇතැම් කෙනෙක් තියුණු ක්ලෙශතාපන වීයර්‍ය-යෙන් යුක්තවූවා හු අවිහාදියෙහි උපතලද කෙණෙහිම ද, සමහරු එහි නියමිත ආයුෂයෙන් භාගයක් ගතවන්නට පළමු ඒ අතරද, ඇතැම් හු ආයුභාගය ගෙවුණුවිටම ද, ක්ලෙශ පරිනිර්‍වාණය කෙරෙත්. මෙසේ රහත්වීමට ගතවන කාලයාගේ වශයෙන් **අනන්තරා පරිනිබ්බා යි පුද්ගලයෝ තුන්දෙනෙක් ලැබිය හැක්කාහ**.

## උපහච්ච පරිනිබ්බායී:-

අවිහාදී ශුද්ධාවාස භූමියක නියමිත ආයුප්‍රමාණයාගේ භාගයක් ඉක්මවා කාල ක්‍රියාවට ආසන්නව සිටිය දී ක්ලේශ පරිනිර්වාණය කරන අනාගාමී පුද්ගලයා මෙනමින් හැඳිනේ. හෙතෙම කල්ප දහසක් ආයු ඇති අවිහයෙහි උපතැයි ගතහොත් මුල් ආයු භාගය ඉක්මී පසු භාගය ලැබූ සවැනි කල්ප සියය තුළ හෝ හත් අට නව වැනි සියයක දී හෝ කාලක්‍රියාවට ඉතා ආසන්න දසවැනි සියයෙහි දී හෝ ක්ලේශ පරිනිර්වාණයකොට භවයෙන් මිදෙයි. ශුද්ධාවාසයන්හි වැස ආයුෂ ගෙවීයන්නට සමාසන්න වැ තිබිය දී ස්කන්ධ පරිනිර්වාණයත්, ක්ලේශ පරිනිර්වාණයත්, සලසාගන්නා රහතන්වහන්සේ මෙයින් ගම්‍යමාන වේ.

## අසඞ්ඛාර පරිනිබ්බායී:-

ඒ ඒ භවයන්හි වාසය කරන ආයු ප්‍රමාණයාගේ සීමාවක් නොගෙන තියුණු ඉන්ද්‍රියයන් හේතුකොටගෙන අධික උත්සාහ නොකොට දුඃඛ ආයාසයක් නොගෙන ම සංස්කාරයන් අනිත්‍යාදී විසින් භාවනාවට නැගූ පමණින් කෙලෙස් පිරිනිවී අර්හත්ත්වය ලබන අනාගාමී පුද්ගලයා මෙනම් වේ. මෙම ආර්යයා ක්ලේශ පරිනිර්වාණයට ගත කරන කාල ප්‍රමාණයක් නොදැක්වෙන නමුදු, විදර්ශනාව ප්‍රඥාධික වැ කැරෙන හෙයින් ශුද්ධාවාස වාසොපගත වූ නොබෝ කලෙකින් ම රහත්වන බව සිතිය හැක.

## සසඞ්ඛාර පරිනිබ්බායී:-

අධික මහත්සි දරා දුඃඛ උත්සාහ කොට දුකසේ ක්ලේශ පරිනිර්වාණය කරන සවභාව ඇති අනාගාමි සසඞ්ඛාර පරිනිබ්බායී ය. මෙම ශුද්ධාවාස බ්‍රහ්මයාගේ විදර්ශනාව ශ්‍රද්ධාධික වැ කැරෙන හෙයින් අධික උත්සාහ දරන්නට සිදුවේ. ඉන්ද්‍රියයන් දියුණු වී නැතිනිසා රහත් වන්නට කල්ගත වේ. අකණිට්ඨාව හැර ඉතිරි ශුද්ධාවාස යන්හි දීර්ඝකාලයක් උත්පත්ති වශයෙන් සැරිසරා ක්ලේශ ස්කන්ධ පරිනිර්වාණය කරන්නේ ය යි ආගමානුකූලවැ සිතන්නට පිළිවන.

### උද්ධං සොත අකණිට්ඨගාමි:-

ක්ලෙශ පරිනිර්වාණයට ප්‍රයත්න දරමින් දීර්ඝකාලයක් අවිහාදින් හි වැස අකණිට්ඨා බඹලොව තෙක් උත්පත්ති වශයෙන් ගමන්කොට රහත්වන අනාගාමී උද්ධංසොත අකණිට්ඨගාමී නම්. මොහුගේ තණ්හා සොතය හෝ වට්ට-සොතය උඩටම වහනය වේනු යි, මාර්ග සොතය හෝ භවාග්‍රයතෙක් උඩබලායේනු යි, උද්ධංසොතය යි කියනු ලැබේ. අකණිට්ඨයතෙක් ගමන් කරන හෙයින් අකණිට්ඨගාමී නමුදු වේ. මෙම පුද්ගලයා වට්ටාභිරත කෙනෙකුන් බැවින් අවිහයෙහි කල්ප දහසක් මුළුල්ලෙහි වාසයකොටත් රහත් වීමට නොහැකි වැ අතප්පයෙහි උපදී. එහිදු කල්ප දෙදහසක් තුළ යත්න කලේවී නමුත් රහත්විය නොහී සුදස්ස බඹලොවටයෙයි. කල්ප සාරදහසක් එහි විසුව ද, ක්ලෙශ පරිනිර්වාණයක් නොවී සුදස්සී බඹලොව උපදින්නට සිදුවේ. එහිත් කල්ප අටදහසක් වෙසේ. එහෙත් කෙලෙස් පිරිනිවීමෙක් නම් නොවේම ය. එබැවින් ඉන් චුතව අකණිට්ඨයෙහි ඉපිද මුහුකරනලද ඉන්ද්‍රිය ධර්මයන් නිසා පරිභාවිත ධ්‍යාන භාවනා බලයෙන් රහත්වී නිවන්දක්නේය.

තවද උද්ධංසොත අකණිට්ඨගාමී පුද්ගලයාගේ පඤ්ච ශුද්ධාවාසවාසය සඳහා ගමන් කරන ක්‍රමය අනුව කොටස් හතරකට බෙදෙන අනාගාමි හු දක්නට ලැබෙත්.

i **උද්ධංසොත අකණිට්ඨගාමි**
ii **උද්ධංසොත න අකණිට්ඨගාමි**
iii **න උද්ධංසොත අකණිට්ඨගාමි**
iv **න උද්ධංසොත න අකණිට්ඨගාමි** යන ලෙසිනි

යම් අනාගාමි පුද්ගලයෙක් අවිහයෙහි පටන් අනුක්‍රම යෙන් එකිනෙක ශුද්ධාවාසයන්හි වැස අකණිට්ඨාවෙහි දී කෙලෙස් පිරිනිවේද, හේ උද්ධංසොත ද අකණිට්ඨගාමී ද වෙයි. යමෙක් අවිහයෙහි පටන් පිළිවෙලින් සුදස්සී බඹලොව තෙක් ගමන්කොට එහිදී පිරිනිවේද හෙතෙම උද්ධංසොත වෙයි. එහෙත් අකණිට්ඨගාමී නොවේ. යමෙක්

මෙලොවින් චුතව අකණිට්ඨයෙහිම ඉපද එහිදී පිරිනිවේද, හේ උද්ධං සොතයෙක් නොවන නමුදු අකණිට්ඨගාමි වෙයි. යමෙක් අවිහාදී සතර බඹලොවින් එකක උත්පත්තිය ලැබ එහිම පිරිනිවේද, අනෙක් ලොවකට උත්පත්ති වශයෙන් නොගොස් සංසාරික ප්‍රවෘත්තිය කෙළවර කෙරේද. හෙතෙම උද්ධංසොතයෙක් නොවනුයේම අකණිට්ඨගාමියෙකුදු නොවේමැ යි.

පුද්ගලභෙද වශයෙන් සලකනවිට අනාගාමීහු බොහෝ දෙනෙක් වෙති. අවිහ සුද්ධාවාසයෙහි උපදින අන්තරා පරිනිබ්බා යි තුන්දෙනද, උපහච්ච පරිනිබ්බා යි පුද්ගලයාද උද්ධංසොත අකණිට්ඨගාමී පුද්ගලයාද යන පස්දෙන අසඞ්ඛාර සසඞ්ඛාර භෙදයෙන් ගුණවූවිට දසදෙනෙකි. මෙපරිද්දෙන් අතප්ප - සුදස්ස - සුදස්සි බඹලෙව්හිත් දස-දෙනා බැගින් ලැබෙන හෙයින් එම සිවු සුදවස්හි පුද්ගලයෝ සාළිස් දෙනෙක් උපදිත්. අකණිට්ඨයෙහි උද්ධංසොත පුද්ගලයෙකු නොඋපදනා හෙයින් අටදෙනෙක් පමණක් පහළවෙත්. මෙසේ සියලු අනාගාමී පුද්ගලයෝ අට සාළිස් දෙනෙකැ යි දතයුතුය.

**මෙහි පඤ්ච සුද්ධාවාසය අනාගාමීන්ගේ උත්පත්ති භූමිය වශයෙන් දැක්වුණද, රූපාවචර - අරූපාවචර භූමින්හිත් ඔවුන්ගේ උත්පත්තිය නොසිදුවන්නේම නොවේ. "පඨමජ්ඣාන භූමියං නිබ්බත්තො අනාගාමී නව බ්‍රහ්මලොකෙ සොළසකප්පා මජ්ඣෙ සීතො පරිනිබ්බායි" යන්නෙන් ඒ බව පිළිගත හැක. එහෙත්** එසේ උපදිනුයේ විරල වශයෙනි. බොහෝ සෙයින් පඤ්ච සුද්ධාවාස වාසයට යැම අනාගාමීන්ගේ ධර්ම නියාමය හෙයින්ද, එය ඔවුනට වෙන් වූ ස්ථාන හෙයින්ද, භූයොවෘත්තිය සලකා අනාගාමීන්ගේ වාසස්ථානය සුද්ධා-වාසය සේ වදාරා තිබේ.

## සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්න:-

මේ වනාහි සෝවාන් ඵලය ලබාගැනීම සඳහා පිළිවෙත් පුරන ආර්ය පුද්ගලයා ය. එනම් සොතාපන්න මාර්ගස්ථය. සක්කාය දිට්ඨි විචිකිච්ඡා–සීලබ්බත පරමාස යන සංයෝජනත්‍රය හා දිට්ඨානුසය – විචිකිච්ඡානුසය යන මොවුන් ප්‍රහාණය කරන්නාය. තවද මෙම පුද්ගල සන්තානයෙහි වූ ලොභ – දෙස – මොහ – මාන – ථින – උද්ධච්ච – අහිරික අනොත්තප්ප යන අටවැදෑරුම් ක්ලේශයන්ගේ අපායගාමිනී ශක්තියද සොතාපත්ති මාර්ගඥානය පහළවනු සමගම විනාශවේ. එය අකුසල චිත්තයන්ගේ වශයෙන් සලකනවිට සොතාපත්ති මාර්ගඥානයෙන් දිට්ඨි සම්පයුත්ත අසඞ්ඛාරික සිත් දුරුකරන කල්හි ඒ හා සහජාත වූ ලොභ – දෙස මොහ – උද්ධච්ච – අහිරික – අනොත්තප්ප යන ක්ලේශයෝ සහජේකස්ථ වශයෙන් ප්‍රහීණවෙත්. දිට්ඨි සම්පයුත්ත සසඞ්ඛාරික සිත් ප්‍රහීණ වන කල්හි ඔවුන් හා සහජාත වූ ලොභ – මොහ – ථින – උද්ධච්ච – අහිරික – අනොත්තප්ප යන ක්ලේශයෝ සහජේකස්ථ වශයෙන් ප්‍රහීණ වෙති. විචිකිච්ඡා සහගත සිත ප්‍රහීණ කරන කල්හි ඒ හා සහජාත වූ මොහ – උද්ධච්ච – අහිරික – අනොත්තප්ප යන මෙතෙක් ක්ලේශයෝ සහජේකස්ථ වශයෙන් දුරුවෙත් මැයි.

මෙහි මාර්ගස්ථ–ඵලස්ථයන්ගේ වශයෙන් සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්න – සොතාපන්න පුද්ගලයන් දෙදෙනෙකු දක්වනනමුදු, ඵලස්ථයන් මුත් මාර්ගස්ථයන් ලැබීම ඉතා දුෂ්කරය. මාර්ග චිත්තයාගේ හා ඵල චිත්තයාගේ අන්තර කාලය ඉතා සියුම්ය. සිතිය නොහැකි තරම් හ්‍රස්වය. විදුලි කෙටීම ඇසිපිය හෙළීම ආදී ස්වල්ප මොහොතකිනුදු පිරිසිඳිය නොහැක්ක. උප්පාදඨිතිභඞ්ග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයයෙකින් පරිමිත මාර්ග චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ ඵලචිත්තය උපදනාහෙයිනි. මෙපරිද්දෙන් මාර්ගඵල චිත්තයන්ගේ අන්තරය අතිශූක්ෂමය මාර්ගස්ථපුද්ගලයෙකුට දන්දෙන්නට කරන යත්නයක දී එය බෙහෙවින්

දෙවෙනු යේ ඵලස්ථයෙකුටම ය. යමෙක් මාර්ගස්ථයෙකුට මී දන්දෙමියි සිතා මස්තක ප්‍රාප්ත වූ විදර්ශනා ඇති යෝගාවචරයෙකුට නිරන්තරයෙන් සිවුපසයෙන් සංග්‍රහ කරනු යේ යම්හෙයකින් එම දනය වලදා භාවිතා කරන කල්හි මාර්ගඥනය පහළවූ යේ නම් එම ලේශමාත්‍රයෙන් පමණක් මාර්ගස්ථයෙකුහට දන්දුන්නේ නම් වෙයි. අන්ක්‍රමයෙකින් එය කිරීම ඉතා අපහසු දෙයකි. මාර්ගස්ථය යි වෙන් වැ ඉරියවු පවත්වන පුද්ගල කොටසක් නොලැබෙන බැවිනි. තවද සෝතාපත්තිඵල සච්ඡිකිරියා ය පටිපන්න පුද්ගලයා මෙහි අභිධර්මනයානුකූලව උක්කට්ඨ පරිච්ඡේදයෙන් ගත් නමුදු, එම නාම ව්‍යවහාරයට යෝග්‍ය වූ තවත් පුද්ගලයෝ සත්දෙනෙක් සූත්‍ර ක්‍රමානුකූලව හෙට්ඨිම පරිච්ඡේදයෙන් ලැබෙති. ඔවුන්ගේ පුද්ගල හෙදය නම් ප්‍රකට වැ පැනේ. **තිසරණගත උපාසකයා - පන්සිල් හි පිහිටි උපාසකයා දසසිල් හි පිහිටි උපාසකයා - එදින මැ පැවිද්ද ලද සාමණේරයා-උවසපුවලද භික්ෂුව වත් සම්පන්න භික්ෂුව-පටන්ගත් විවසුන් ඇති භික්ෂුව** - යන මොවුහුත් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිපන්නෝය. මේ පුද්ගලයන්ගේ එකිනෙක තත්ත්වය අනුව කැරෙන සීල-සමාධි - ප්‍රඥ පූරණය සෝතාපත්ති ඵලෝදය ආවහනයට සමත් වෙයි. එබැවින් මේ නාමාරෝපණයෙහිලා මෙම පුද්ගලයන් ද අමුඛ්‍ය වශයෙන් ඇතුළත් වන බැව් දතයුතුය.

**සෝතාපන්න:-**

සක්කාය දිට්ඨි - විචිකිච්ඡා-සීලබ්බත පරාමාස සංඛ්‍යාත සංයෝජනත්‍රය විනාශ කෙළේ සෝතාපන්නය, මෙතෙම අපායගමනීය දිට්ඨිගත සම්පයුත්ත සිත්සතර හා විචිකිච්ඡා චිත්තය ද ඔවුන් හා සම්ප්‍රයුක්ත ධර්මයන්ද සෝවාන් මාර්ගඥනයෙන් නිරවශෙෂයෙන් ප්‍රහාණය කෙළේ මේ ශාසනයෙන් පිහිට ලද්දේ වේ. එපමණකුදු නොව අකුසල චිත්තයන් අතර ඉතිරි සත්දෙනාගේ අපායගාමී හෙතු ශක්තිය ද

නැස්සේ කිසිකලෙකත් අපායොත්පත්තියකට නොපැමිණේ. සොතාපත්ති ඵලප්‍රාප්ත ආර්‍ය්‍ය පුද්ගලයා සොතාපන්න නමින් හැඳිනෙන බව දතයුතුය.

සොතාපන්න පුද්ගලයාගේ සංසාරික ප්‍රවෘත්තිය පිළිබඳවද දත සිටීම ප්‍රයෝජනවත්ය. ධ්‍යානලාභී සොතාපන්න පුද්ගලයා මෙලෙව්හිදී ම ක්ලෙශක්‍ෂය කරන්නට අසමත් වුවහොත් රූපා'රූප බ්‍රහ්මලොකයන්ගෙන් එකක උපත ලබයි. ඔහුට කාමලොක ප්‍රතිසන්ධියක් ලැබෙති යි කියන්නට කරුණු නැත. එහිදී ම ඉතිරි තුන්මග කිස නිමවා නිවන් දැකීම ඔහුගේ සවභාවයයි. එබැවින් සත්තක්ඛත්තුපරමාදී ත්‍රිවිධ භෙද ලැබෙනුයේ ධ්‍යානලාභී නොවූ සොතාපන්න පුද්ගලයා සම්බන්ධයෙනැ යි දතයුතුයි. ධ්‍යානලාභීහුගේ පුද්ගල ප්‍රභෙදයක් ඇතැයි කිව නොහැක. මෙතෙම මිනිස්ලෙව්හි දී සෝවාන් ඵලයට පැමිණ ප්‍රථම ධ්‍යානය ද උපදවා මියගොස් බ්‍රහ්මපාරිෂද්‍යයෙහි උපදී. ඉදින් ඔහුට **පිහියේ නම් පසලොස් රූපාවචර භූමින්හි පසලොස් වරක්ද, ඉන්පසු අනාගාමීව පඤ්චශුද්ධාවාසයෙහි පස්වරක්දැයි විසිවරක් උත්පත්තිය ලබා අසාණ්ඩා බඹ ලෙව්හි දි රහත්ව පිරිනිවන් පාන්නට හැක්කේය.**

**සකෘදගාමිඵල සච්ඡිකිරියාය පටිපන්න:-**

සෝවාන් ඵලය ලබාගෙන කාමරාග පටිඝ සංයෝජනයන් තුනීකරන්නට පිළිවෙත් පුරනුයේ මෙනම් වේ. මෙහි ප්‍රධාන වශයෙන් සැලකෙනුයේ සකෘදගාමි මාර්ගස්ථ පුද්ගලයා යි කාය වාක් ද්වාරයෙහි ව්‍යතික්‍රමණයට කාරණවූ ඖළාරික පඤ්චකාම ගුණික රාගය – කාමරාග නම් වේ. එය කාම භවයෙහි සත්වයන් යොදුලන හෙයින් සංයොජන නමුදු වෙයි. අරමුණ හා ගැටීම ලක්‍ෂණකොට ඇතියේ පටිඝය. හෙද සංසාර වෘත්තයෙහි සත්වයන් ඇඳ බැඳ ලන්නට සමත්නුයි සංයොජනයෙක් වේ. මෙම සංයොජනයන්ගේ හැකි දැකි බව – බහල බව සමථ විදර්ශනා මගින් තුනීකොට කාමභවොත්පත්තිය එක්වරකට වඩා නොලබන තරම් සියුම් බවට පැමිණෑ වූ මාර්ගස්ථයා යථෝක්ත නාමයෙන් ව්‍යවහාරවේ.

## සකෘදාගාමි:-

කාමරාග ව්‍යාපාද සංයොජනයන් ප්‍රහාණය කිරීම වශයෙන් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරද ද්වේෂ සහගත සිත් දෙකද, තුනීකළ ආයර්‍ය පුද්ගලයා මෙ නම් වේ. කාම රාග පටිඝ ක්ලෙශයන්ද නොපැවැත්මට පමුණුවන්නට ධ්‍යාන භාවනායෙහි යෙදී ක්‍රියා කරන සකෘදාගාමි ඵලප්‍රාප්තයා මෙයින් කියැවෙයි.

ධ්‍යානලාභී සකෘදාගාමී පුද්ගලයා මනුලොව හෝ දෙව්ලොව ප්‍රතිසන්ධිය නොගන්නේය. හැකිවුව මෙඅත්බැව්හිම රහත්ව පිරිනිවන් පාන්නේය. ඉදින් නොහැකිවුවහොත් රූප භූමියක හෝ අරූප භූමියක ඉපිද රහත් වී නිවන් දක්නට ද පිළිවන. මොහුගේ භවජිවිතය මෙබඳු හෙයින් පුද්ගල ප්‍රභෙදයක් නොලැබේ. **"ඉධ පත්තා ඉධ පරිනිබ්බායි තත්ථ පත්තා තත්ථ පරිනිබ්බායි"** ආදී භෙද පඤ්චකය ලැබෙනුයේ ශුෂ්ක විදර්ශක සකෘදාගාමී පුද්ගලයා පිළිබඳව පමණි.

## අනාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්න

සකෘදාගාමි ඵල ලාභයෙන් තුනීබවට පත්කළ කාමරාගපටිඝ සංයොජනයන් නසන ලද්දේ මෙනම් වේ. අනාගාමි මාර්ගඥනය උපදවාගත් ආයර්‍ය පුද්ගලයා මෙයින් අදහස් කරනුලැබේ.

## අනාගාමි:-

කාමරාග – ව්‍යාපාදයන් නිරවශෙෂයෙන් ප්‍රහාණයකොට අනාගාමී ඵලප්‍රාප්ත ආයර්‍ය පුද්ගලයා මෙනමින් කියැවෙයි. මෙහෙම සන්තානයෙහි නිදගත්පාක්මෙන් පවත්නා - ඉතා සියුම් කාමරාග – පටිඝානුසයයන්ගේ. සමූලච්ඡෙදනයෙන් කාමභවොත්පාදක ක්ලෙශයන් සං සිඳ වූ යේ වෙයි. අනාගාමින් අතුරෙනුදු ධ්‍යාන ලාභියා මෙ ලෙව්හි දී රහත් නොවුවහොත් රූපා රූප භූමියක දී පිරිනිවෙත හෙයින් ප්‍රභෙදයක් නොලැබේ. ශුෂ්ක විදර්ශක අනාගාමි රහත්වන්නට දුකසේ යත්න කළයුතු බැවින් අන්තරා . පරිනිබ්බායි ආදී විශෙෂ අවස්ථාවකදී ම නිවන් දක්නේය.

සමථයෙකින් ශුෂ්කවිදර්ශක අනාගාමි ධ්‍යාන නූපදවා සිට කාලක්‍රියා කළහොත් කාමරාගය නැසූහෙයින් කාම-ලොකයෙහි ප්‍රතිසන්ධි ගන්නට නොහැකිය. ධ්‍යාන නැතිහෙයින් බ්‍රහ්මලෝක ප්‍රතිසන්ධි ගන්නට ද නොහැක්ක. එබඳු අවස්ථාවන්හි දී අනාගාමී පුද්ගලයා සමසීසි චතුර්ථ ධ්‍යාන ලාභියෙක් වන්නේය. චුතියට පූර්වභාගයෙහි චතුර්ථ ධ්‍යානය ධර්ම නියාමයෙන් ම පහළවී ඉන් චුතවැ ශුද්ධාවාසයෙක උපදින්නේය. **අනාගාමි සක්‍රියකවුව, එඅත් බැවින් චුතවනු සමග මැ ශුද්ධාවාස වාසයට නොයේ. හින අත්බැව එක් වරම අතිශ්‍රෙෂ්ඨ ශුද්ධෝ ගනම ආත්මභාව ප්‍රතිලාභයකට නොසමත් ය. එබැවින් මිනිසත්බව හරින්නට පළමුව ප්‍රථම ධ්‍යානය උපදවා සක්‍රිනට නියමිත බ්‍රහ්මපාරිෂද්‍ය බඹලොව පහළවී චතුර්ථ ධ්‍යානය උපදවා ඉන් සැව ශුද්ධාවාස වාසොපගත වනු ධර්ම නියාමය වේ.**

### අරහත්තඵල සච්ඡිකිරියාය පටිපන්න:-

අනාගාමි ඵලය ලැබගෙන රූපරාගාදී ක්ලෙශධර්මයන් සමූලඝාතනය කරන්නට පටන්ගත් කෙලෙසුන්තාවන වියර්යෙන් යුත් ආයර්‍ය පුද්ගලයා මෙනම් වේ. ඵල ලාභය සඳහා එකාන්තයෙන් පිළිපන් අර්හත් මාර්ගස්ථයා මෙහිලා-ගැනේ.

### අරහා:-

රූප රාග - අරූපරාග - මාන - උද්ධච්ච = අවිජ්ජා යන පඤ්චවිධ සංයොජනයන් අනුසය සහිතව නැසීමෙන් ක්ලෙශ සන්තාපයෙන් මුක්ත උත්තමයා අර්හත් නම් වේ. සකල ක්ලෙශයන් ප්‍රහීණ්නහොට විසුද්ධ චිත්තසන්තාන ඇතිහෙයින් ලොකයා වි න් කළයුතු සත්කාර සම්මානනාදි-යට අහි වන්නේනු යි යථොක්ත නාමය වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම යොග්‍ය වේ. අර්හත් ඵල ලාභී ආයර්‍ය පුද්ගලයා **සමථයානික - ශුෂ්කවිදර්ශක** බෙයින් ද්විධ වතුදු

මිතු ආත්මභාව ප්‍රතිලාභයක් නැතිහෙයින් සෙසු ආසයීයන් මෙන් විශෙෂ භෙදයක් නොගන්නේය. එතකුදු වුවත් ප්‍රතිපදා සතරින් එක් එක් විමොක්‍ෂයකින් මිදෙන්නවුන්ගේ වශයෙන් රහතන් වහන්සේලාගේ විශෙෂයෙක් පැනේ. එය **සුඤ්ඤත - අනිමිත්ත - අප්පණිහිත** යන විමොක්‍ෂයන්-ගෙන් විමුක්ත වූ **"දුක්ඛා පටිපදා දන්ධා භිඤ්ඤා"**දී ප්‍රතිපදා චතුෂ්කයාගේ වශයෙන් ලැබෙන්නකි. සංස්කාරයන් ශුන්‍ය වශයෙන් සලකා බවුන් වඩමින් එක් එක් ප්‍රතිපදාවෙහි පිහිටා පිරිනිවෙන රහත්හු සිවුදෙනෙක, රාගාදී නිමිති රහිත බැව් මෙනෙහි කරමින් සසරින් මිදෙන සිවුදෙනෙක, සංසාර ප්‍රවෘත්තයෙහි පැතියයුතු දුක්රහිත කිසි සැපයක් නැතැයි සලකමින් නිකෙලෙස් බවට පැමිණෙන සිවු දෙනෙකැයි ප්‍රතිපදාවන්ගෙන් නිවන් ලබන්නන් සංකලනය කළවිට **රහත් හු දොළොස් දෙනෙක් වෙති.**

සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නාදී පුද්ගලයන් අටදෙන මෙහි දක්වුණේ මාර්ගඵල ලාභීන්ගේ වශයෙනි. ක්ලෙශයන්ගේ සමුච්ඡෙදප්පහානය හා පටිප්පස්සද්ධිප්ප-හානය එයින් කියැවිණි. මාර්ගයෙන් සමුච්ඡෙදයත් - ඵල-යෙන් ක්ලෙශොපශමනය සංසිඳීමත් සිදුවෙයි. අනන්තාපරිමිත කාලයක් මුළුල්ලෙහි පරිභාවිත වැ පරිපාක බවට පැමිණැ පවත්නා ක්ලෙශ ස්කන්ධය සතර මාර්ගඥානයෙන් විනාශ වුවද, ඵලයින් දෙකක් හෝ තුනක් පහළ වීමෙන් ම නික්ලෙශී භාවය සම්ප්‍රකාරයෙන් ම තහවුරු වේ. ගිනි ගොඩක් තිබුණ තැනක අඟුරු සහිත ගින්න අස්කළ පසුද ගිනිරස්නය පොළොවෙහි පවතී. එයද නැතිකරන්නට ජලය වත්කළ යුතුයි. එමෙන් ඒ ඒ මාර්ගයන්ගෙන් වධ්‍ය වූ ක්ලෙශයන් ක්‍ෂයකළපසු ඵලයින් දෙකක් හෝ තුනක් පහළ වී ක්ලෙශ ස්වභාවය මූලොච්ඡින්නකොට සංසිඳවීමට පත්කැර ලන්නේය.

**සොතාපත්ති ආදි මාර්ගයන්ගෙන් අකුසල චිත්තයන්ගේ පැවැත්ම නසාලනසැටි මෙසේ දතයුතුය.** අනාදිමත් සසර අනුසය වශයෙන් පැවැත ආ දොළොස් අකුසල චිත්තයන්ගෙන් උද්ධච්ච සම්ප්‍රයුක්තය හැර ඉතිරි එකොළොස් චිත්තයන්ගේ අපාය ගමනීය ශක්තිය සෝවාන් මාර්ගඥානය නැමති ගින්නෙන් දැවෙයි. අනතුරුව ඵලසිත් දෙකක් හෝ තුනක් පහළවී ඒ චිත්තසන්තානගත ක්ලේශයන්ගෙන් වූ නොසංසුන්කම දුරුකොට සිහිල් බවට පමුණුවා සංසිඳවීමට පත්කෙරෙයි. ඉන්පසු සකෘදාගාමි මාර්ගඥානයෙන් දිට්ඨි සම්ප්‍රයුක්ත සිත් සතරද, දෝමනස් සහගත සිත්දෙකද අසාමර්ථ්‍ය බවට පමුණුවා විනාශකළවිට ඵලසිත් දෙකක් හෝ තුනක් පහළවෙයි. එයින් සංසිඳවීමට පැමිණෙ වූ එම සිත්වලට කාමධාතුවෙහි දරුණු දුක් විපාක දෙන්නට හැකි ශක්තිය නැතිවෙයි. කාමධාතුවෙහි සැප සම්පත් පවා දෙන්නට හැකිවනුයේ එක් අත්බැවක පමණි. එසිතික්හිති දුර්වල කාමරාගයෙන් යුක්ත වූ යථෝක්ත සිත්සය අනාගාමී මාර්ගඥානයෙන් දවා ඵලසිත් දෙකක් හෝ තුනක් ඉපද ක්ලේශ විඩාව දුරුකෙරේ. තදනන්තරව දිට්ඨි විප්‍රයුක්ත සිත් සතර හා උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතද අර්හත් මාර්ගඥානයෙන් දැවූවිට නික්ලේශි චිත්තය තුළ පවත්නා ක්ලේශෝෂ්ණය ඵලසිත් දෙකක් හෝ තුනක් පහළවීමෙන් සර්වප්‍රකාරයෙන් සංසිදී, සීතිභූත බවට පැමිණ නිර්වාපණය වී ශාන්තවන්නේයි.

**තවද රහතන්වහන්සේ ක්ලේශ පටිපාටි වශයෙන් හා මාර්ග පටිපාටි වශයෙන් අනුසය සහගත ක්ලේශයන්ගෙන් මිදෙන ආකාරය මෙසේ දතයුතුය.**

ක්ලේශයන්ගේ පිළිවෙළ අනුව සලකනවිට කාමරාගානුසය – පටිඝානුසය – දෙදෙනාගේ දුරුවීම, තෘතීය මාර්ග ඥානයෙන්ද, මානානුසයයාගේ විනාශය චතුර්ථ මාර්ග ඥානයෙන්ද. දිට්ඨානුසය – විචිකිච්ඡානුසය දෙදෙනා ප්‍රථම මාර්ග ඥානයෙන්ද, භවරාගානුසය අවිජ්ජානුසයයන් චතුර්ථ

මාර්ග ඥානයෙන් ද දුරුවන බව දතයුතු යි. මාර්ග පිළිවෙළ වශයෙන් සලකනකල ප්‍රථම මාර්ගයෙන් දිට්ඨානුසය - විචිකිච්ඡානුසය දෙදෙනාගේ නැස්ම වන්නේය. ද්විතීය මාර්ගයෙන් කාමරාගානුසය - පටිඝානුසය දෙදෙනා අකර්මණ්‍ය බවට පැමිණ තුනීවී සියුම් වෙත්. තෘතීය මාර්ගයෙන් ඔවුන්ගේ සමූලඝාතනයෙන් අභාවයට පැමිණීම සිදුවන්නේය., චතුර්ථ මාර්ගයෙන් මානානුසය - භවරාගානුසය - අවිජ්ජානුසය යන තෙවැදෑරුම් ක්ලේශයන්ගේ සිංසිදිම වන්නේයි.

උක්තප්‍රකාර සකල ක්ලේශයන්ගෙන් මිදුණු ආර්‍ය්‍ය පුද්ගලයා කෙලෙසුන්ගෙන් දුරු වැ, ඔවුන් නැසූ හෙයිනුදු, විනාශ කරනලද සංසාර චක්‍රයාගේ අරයන් ඇති හෙයිනුදු, රහසිනුත් පව් නොකරන හෙයිනුදු, දෙව් මිනිසුන් විසින් කරනුලබන පුදසත්කාරයනට අර්හ හෙයිනුදු, අර්හත් නම් වන්නේය යි දතයුතුයි.

## ඒකක පුද්ගල විභාගය නිමි.

# ද්වික පුග්ගල පඤ්ඤත්ති.

## කොධන - උපනාහී

අනිෂ්ට ආරම්මණ ලැබීමෙන් සිත දූෂ්‍ය වී චණ්ඩස්වභාවයට පෙරළීම ක්‍රොධ නම් වේ. පටිඝ ව්‍යාපාද - දෙස - රොස - කොප විරොධ - අනභිරද්ධි අනත්තමනතා දී නාමයන්ගෙනුදු, කියැවෙනුයේ මෙම ක්‍රොධ ස්වභාවය මැයි. දෙශනාකුශල වූ තථාගතයන් වහන්සේ ඒ ඒ අවස්ථානුරූපව මෙම නාමයන් සිතෙහි ප්‍රචණ්ඩකම දක්වනු සඳහා ව්‍යවහාර කළහ. සිත පිළිබඳ නොසතුටු බැව් ලකුණු කොට ඇති මෙම ඵරුෂ භාවයෙන් සමන්විත පුද්ගලයා කොධන නමැයි දතයුතුය. තමා නොකැමැති සුළු අරමුණක වුවද කැපීම් බහුලවැ විසීම මොහු හඳුනා ගැනීමට පහසු ලකුණකි.

යම් කාරුණක් හෙතුකොටගෙන පහළ වූ ක්‍රොධය නොසංසිඳුවා නැවත නැවත ක්‍රොධශීලීවනුයේ උපනාහී නම්. එය ක්‍රොධය ඇද බැඳ තබා ගැනීමක් වැන්න. සිත් දූෂ්‍යවීම් බහුලකොට ඇති චණ්ඩ ස්වභාවය ක්‍රොධය ලෙසත්, එය දෘඪකොට දීර්ඝකාලයක් පවත්වාගෙන යෑම උපනාහය ලෙසත් හඳුනාගත යුතුය. මෙසේ සලකනවිට නැවත නැවත හටගැනීමෙන් දෘඪනොවූ විරොධය ක්‍රොධය වෙයි. එහි අපරකාලය උපනාහය වෙයි. එබැවින් ක්‍රොධයත් උපනාහයත් සිතතුළ පවත්නා චණ්ඩ ස්වභාවයේ පූර්වාපර අවස්ථාවනට ව්‍යවහාරවන නම් දෙකකි. ලක්ෂණ විසින් සභාග පැවතුම් ඇත්තාහු එකුද්දෙසයෙකැ සඞ්ගෘහිත වූහ. පුද්ගලයන් වශයෙන් වෙන වෙනම දෙදෙනෙකුන් දක්නට ලැබෙන හෙයින් ද්වික පුද්ගල භෙදයෙහි ඇතුළත්වූහු. මතු පැවසෙන පුද්ගලයන්ගේ ද්විවිධතාදී භෙද ගැණෙනුයේ ද මෙම න්‍යායයෙනැයි සැලකිය යුතුය. ක්‍රොධය තරම් සත්වයාට අනර්ථකාරක ක්ලෙශ ධර්මයක් තවත් නැතැයි කියහැකිය. බොහෝ දුක් පීඩාවලට මූලික හෙතුව වනුයේ ක්‍රොධයෙන් හටගත් ක්‍රියාමාර්ගයෙකි.

උපනාහය විසින් මෙහෙයනලද පලිගැනීම් විෂයක ක්‍රියාවන්ගෙන් සකල සත්වලොකය වෙළී පවතී. වෛරයට භාජන වූවහුට තාඩන පීඩනාදිය කොට ක්‍රොධය සංසිඳවා ගැනීම එකාම සැනසීම සේ සැලකීම එයට හෙතුවය. ක්‍රොධය පහළවීමට හෙතුවන ආඝාතවස්තු දසයක් බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ. **"අනත්ථං මෙ අචරි චරති – චරිස්සතීති ආඝාතො ජායති"** ඈ විසින් එය දක්වෙයි. තමහට අනර්ථය පිණිස පෙරළ හැසිරිණ, දැනුදු හැසිරෙයි, මතුද හැසිරෙනි යි ක්‍රොධය පහළවන්නේය. තමහට පමණක් නොව තමාගේ ප්‍රියමනාප පුද්ගලයාට ද එසේ ක්‍රොධ කෙරෙනියි ද, එසේම තමා හා විරොධියාට ක්‍රොධ කාරනු වෙනුවට වැඩ පිණිස ම පෙරළ මෙන්ම දැනුත් මතුවටත් පවතිහියි ද, ක්‍රොධය පහලකරගනී. තමහට නොරිසියන අවස්ථාවන් හි එළඹෙන අව් වැසි ආදියට ද, පය පැකිලීම් ඈ තමාගේ ම නොසැලකිල්ලෙන් සිදුවන පීඩාවලටද, කොපය උපදවයි. මෙසේ අවස්ථා දශයෙක හටගන්නා ක්‍රොධය නදඹග විෂ්කම්භණා දී ප්‍රහාණයෙකින් පහනොකළහොත් බද්ධවෛරයක් බවට මුහුකුරාගොස් උපනාහි තත්වයට එළඹේ. ඉන්පසු තත්සම්බන්ධී පුද්ගලයා දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්‍රහ විවාදාදියට යොමුකොට භයානක අපරාධ වලට පොළඹවා අපමණ පීඩාවලට හෙලයි. නින්දා අලාභ අපකීර්ති අප්‍රශංසා වලට ගොදුරුවනු පමණක් නොව, සිරගෙනි වැටීම් ආදියටද භාජනවෙයි. පරලොව සතර අපායමාර්ගීය හෙළිපෙහෙළිකොට සගමොක් මඟ අවුරා නැතක් දුක් ලබාදෙන නිවරණයකුදු වෙයි. එබැවින්,

**"තස්සෙව තෙන පාපියො**
**යො කුද්ධං පටිකුජ්ඣති**
**කුද්ධං අප්පටි කුජ්ඣන්තො**
**සඞ්ගාමං ජෙති දුජ්ජයං**

යන බුදුවදන් අනුව පැවැත්ත යුතුය. යමෙක් කිපුණහුට

පෙරළා කිපේද, එයින් අවැඩ සිදුවනු යේ ඔහුටම ය. කිපියකු කෙරෙහි නොකිපෙනුයේ අපහසුවෙන් දිනියයුතු සඞ්ග්‍රාමයෙකින් දිනු යේ වේ. මලමූත්‍රාදියකින් අපිරිසිදු වූවක් ශුද්ධකරන්නට පිරිසිදු ජලය ගතයුතුය. එසේනොව මල–මූත්‍රාදියකින් ම පිරිසිදු කරන්නට යත්න දැරීම අපරි–ශුද්ධත්වය දියුණු කිරීමකි. ක්‍රොධය ක්‍රොධයකින් ම සංසිඳවිය හැකි නොවේ. ක්‍රොධ නොකිරීම ම එයට කළයුතු එකම ප්‍රතිකාරය යි. කොපයට හෙතුවන කරුණක් පැමිණි කල ආදිනව සලකා කරුණා මෛත්‍රිය උපදවා තදඞ්ග වශයෙන්වත් ක්‍රොධය සිතින් පලවාහැර දෙලොව දියුණුව සලසා ගන්නට උත්සාහ ගතයුතුයි.

## මක්ඛී – පලාසී

අනුන්ගේ ගුණයන් මකන ස්වභාවයෙන්යුත් පුද්ගලයා මක්ඛී නම් වේ. ගුණමකු ස්වභාවය හටගනු යේ අනුන් ගුණය විනාශ කිරීම් වශයෙන් වුවද, එයට පිළියෙල වීම සඳහා තමාගේ නුගුණයන් ද මැකීම එහි ලක්‍ෂණයෙකි. මක්ඛස්වභාවය තිට්ඨුරිය සාම්ම තම්නුදු ගැඳින්වෙන හෙයින් ගිහියෙක් ගිහියකු හෝ පැවිද්දෙක් පැවිද්දකු හෝ අසුරුකොට වසනුයේ ස්වල්පමාත්‍ර කරුණකට වුවද කිපී ඔබ නිසා මෙපමණ වැඩකුදු නොවිණැයි කෙළපහරක් ගසා එය පයින් මඩිනුමෙන් හෙලාතලා කථාකෙරෙයි, කෘෘර වැ දරුණුගති පෙන්වමින් කළ උදව් උපකාර පවා අමනකකොට ඇති ගුණය මකා නැති අගුණ පළට කෙරෙයි. අනුන්කළ සත්ක්‍රියා විනාශ කිරීම් ලක්‍ෂණකොට පහලවන මක්ඛස්වභාවය ජනසමාජය කෙලෙසන නපුරු දුර්ගුණයකි. කිසියම් අනුකම්පා කරන්–නකු විසින් දුඃඛිතයකු ඉන් නගාසිටුවා සුවපත්කළවිට ඔබගෙන් වූ සෙවය කිමෙක්දැයි රුදු විරුදු වැ බෙණෙමින් තමා මැ දුකින් මිදිණැයි අන්හට් ගහවමින් ක්‍රියා කරනු යේ මක්ඛීපුද්ගල තෙමේ යි.

**පලාසී:-** අනුන්ගේ ගුණයන් ගෙනහැර දක්වමින් ඔවුන් හා තමා හා වෙනසක් නැතැයි ගහවන්නට තම ගුණයන් හා සමකරයි. පලාසය සමානධුර ග්‍රහණය කරනු යේ බොහෝ වාදවිවාද පහළවීමට කරුණක් වෙයි. කෙසේ හෝ ජයග්‍රහණය කිරීම පලාසී පුද්ගලයාගේ අභිප්‍රාය හෙයින් තමාගත් මතයම ස්ථිර කරන්නට උත්සාහ ගනී. අන්‍යයාගේ අදහස් කොතරම් ශාස්ත්‍රානුකූල වුවද. නීත්‍යනුකූල වුවද, එය පිළිගන්නට නොකැමැති වේ. තමාගේ මතය කරුණු කියා සනාථ කරන්නට නොහැකිව අනාථ වුවද, අත්නොහරී. අන්‍යයාගේ බහුශ්‍රැතකම හා තම උගත්කම නොසම වුවද, අනෙක් කවර ක්‍රමයෙකින් හෝ සමානත්වයක් නැතද, දෙදෙනාගේ ගති අනියත බව හෝ සම්බන්ධයෙන් ගෙන ඔබහා මාහා කවර වෙනසක්දැයි කියන්නට තරම් සාහසික වෙයි. දෙවැන්නෙකුට ප්‍රමුඛ ස්ථානයක් දෙන්නට කැමැති නැත. සාකච්ඡාදියකදී ද, කටයුතු කර්මාන්තාදියකදී ද තමහට වඩා අන්‍යයාගේ දක්‍ෂකම ඔප්පුවුවද, එය නොපිළිගනී. දෙදෙනාගේ පරතරය ප්‍රකට වැ පැනෙද්දීත් මැදින් බුන් රතක් මෙතැයි සමානත්වයම කියාපායි. මේ ආකාරයෙන් කුම්භිලග්‍රහණයක් මෙන් ගත් මතයෙහි ම එල්බ ගන්නා තැනැත්තෙකි.

## ඉස්සුකී - මච්ඡරී:-

අන්‍යයන්ගේ සැප සම්පත් නොඉවසන - නොකැමැති වන ස්වභාවය ඉස්සා නම්. එයින් යුක්ත පුද්ගලයා ඉස්සුකීය. මෙතෙම අනෙකාකුට ලාභසත්කාරාදියක් ලැබෙනු දක්නට නොරිසිය. යසඉසුරු ආදී සියලු සැපතක් ම තමහට පැමිණේවා යන ප්‍රාර්ථනා බහුලකොට වෙසෙයි. අනෙකාකුගේ සම්පත්ති ලාභයට ඊර්ෂ්‍යා කෙරෙයි. පුරුෂ පරාක්‍රමයෙන් යුත් කිසිවකු ගොවිතැන් වෙළහෙළෙඳාමාදියකින්

ධන ධාන්‍යාදියක් හෝ යානවාහනාදියක් සපයාගත් කල එයට සතුටු නොවේ. කවරදා ඔහු එම සම්පතින් පිරිහේදැයි බලාපොරොත්තු වේ. යම්හෙයකින් ඔහුගේ එම සිතුවිල්ල සමෘද්ධ වේද, සම්පත්තියක් ලද්දක්මෙන් සතුටු වේ. මෙකල සිදුවන අපරාධයන්ගෙන් බොහෝ ගණනක් කැරෙනුයේ ඊර්ෂ්‍යා සහගත පුද්ගලයන්ගේ පරසම්පත් නොඉවසීම හේතුකොට ගෙනය. ඉස්සුකි ඊර්ෂ්‍යායෙන් දැවෙමින් තමා මැ පිරිහෙනු පමණක් නොව, අනුනුදු පිරිහෙලන්නට යත්න දරන ජනසමාජය විෂම බවට පත්කරන්නෙකැ යි දතයුත්තේය.

**මච්ඡරී**:- මේ ඉසුරුමත් බව මටම වේවා අනෙකකුට නොමවේවායි පැතුම් වශයෙන් තමාගේ සම්පත්තිය සැඟවීම ලක්‍ෂණකොට ඇත්තේ මසුරුබවය. එයින්යුත් පුද්ගලයා මච්ඡරි නම්. මෙනෙම තමා සන්තක ධනය පරහට නොදෙනු කැමැත්තේය, එහෙත් පරසන්තක ධනය බලාපො-රොත්තු වේ. අනුන් හා සාධාරණව සම්පත් භුක්තිවිඳීම මසුරු සිත රිදවන්නකි. දානාදී පින්දහම් කරනවිට හෝ අනෙකකුට උපකාරයක් කරන කල හෝ කෙනෙකුගේසිත දිගහැරුණු සවභාවයෙන් යුක්තය. ඒ ඒ වස්තු මූලිකව සිත්තුළ කැටිව තුබූ ලොභය තුනීවී තිළිණයෙන් පැහිරියයි. සවල්පමාත්‍ර වස්තුවකුදු අත්හටදීම නොරුස්නා මසුරාගේ සිත නිරන්තරයෙන් හැකුළුණ සවභාවයෙන් කිලුටුව පවතී. ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී කපණ වණිබ්බකාදීන් දක්නා කල්හි සිහ ගැස්සී හැකිළීයෙයි. යාචකාදීනට ආහාරාදියක් දෙන්නට සිදුවුවහොත් මසුරු මලින් හැකුළුණු සිතට අනුරූප සේ හැඳි අගින් අහර සවල්පයක් ගනී. හැන්ද පුරවා ගන්නටනම් නොහැකිමය. තමාගෙන් පොෂ්‍යවියයුතු දූ දරු ආදීන් ද තම තමාගේ රුචිය අනුව වස්තුපරිභොගය කරනු මච්ඡරිහට ඉවසිය නොහැක. තමා දෙනදෙයකින් පමණක් යැපෙනු දැකීම ඔහුගේ බලාපොරොත්තුවය.

හුදෙක් තමාගේ මෑ යාපනයට පමා වසතුව වැය කිරීම විනාශයක් සේ සිතන තරම් තද මසුරු ලොභය හා මිශ්‍රිත ඊර්ෂ්‍යායෙන් හරිතය. මෙබඳු පැවතුම් ඇති පුද්ගලයා මෙලච්ඡ අනාර්යයෙකැයි ශාසනයෙහි සම්මතය. කදරිය නමින් හැඳිනෙන මෙනෙම තමා නොදෙනු පමණක් නොව, අනෙකකුට දෙන අනුනුදු ඉන් වළකන්නේය.

**“කදරියො පාපසඞ්කප්පො – මිච්ඡාදිට්ඨි අනාදරො**
**දදමානං නිවාරෙති – යාචමානාන භොජනන්ති”**

යන්නෙන් තදමසුරාගේ සවභාවය දක්වේ. ගෘහස්ථයන් තුළ උපභොග පරිභොග වස්තූන් පිළිබඳ ව බෙහෙවින් මසුරු මලය බලපානු මෙන්, ප්‍රව්‍රජිතයන් තුළ කරුණු පසක් හෙතුකොටගෙන මසුරු සිත පහළවේ.

i **ආවාස මච්ඡරිය**
ii **කුල මච්ඡරිය**
iii **ලාභ මච්ඡරිය**
iv **වණ්ණ මච්ඡරිය**
v **ධම්ම මච්ඡරිය** යන පඤ්චකය යි.

ආවාස මච්ඡරී යම්තැනෙක වසනුයේ වත් සම්පන්න පෙසල භික්ෂූන්ගේ පැමිණීම නොරිසි වේ. යම්හෙයකින් පැමිණියේ නමුදු වහාම යේවායි සිතයි. තම හට ලැබෙන සිව්පසය හා සැපසේ විසීම අනෙකකු සාධාරණව ලබනු අසහනයට හෙතු වේ. ගුණවතුන්ගේ හැසිරීම තමාගේ ලාභය පිරිහීමට හෙතුවෙති යි හැඟීම එයට කරුණු වියහැක. ධර්මාමිස සම්භොගයට නුසුදුසු කාලඟ කාරක භික්ෂූන්ගේ විසීම නොඉවසනු යේ ආවාස මච්ඡරියට ඇතුළත් නැත. ආවාස පරිභොගයට විරුද්ධ අදහසක් ඔවුන් පිළිබඳව නොලැබේ. **ආවාස මච්ඡරී පාප ය යක්ෂයෙකු හෝ ප්‍රෙතයකුව උපදින්නට හෙතුවේ.** තමා ඇල්මකළ ආවාසයෙහි කැළිකසල හිසින් දරමින් හැසිරීම ඔහුගේ සවභාවය යි. නො එසේවුව ලොයොකුබු

නිරයෙහි පැසෙන්නට සිදුවේ. ගිහියන් තුළද මෙම මසුරු සිත පහළවන්නට හැකිය. තමාගේ ගෘහයකින් අන්‍යයන් ප්‍රයෝජන ගනු දක්නා කල එය නොඉවසනුයේ මසුරුකමිනි.

තමාහට උපස්ථාන කරන කුලයට හෝ ඥාතිකුලයට අනෙකකුගේ පැමිණීම නොකැමති වනුයේ කුලමච්ඡරිය. මෙහි මසුරුබව ලැබෙනුයේ කුලයන්ගේ ප්‍රසාදය වැඩීමට මුත් මැඩීමට හෙතුනොවන පෙසල භික්ෂූන්ගේ පැමිණීම නොඉවසීමය. යහපත් භික්ෂූන්ගේ ආශ්‍රය නැති ප්‍රසාදය පහළ වීමටත්, ඇති ප්‍රසාදය වැඩි තහවුරුවීමටත් හෙතුවේම ය. ශාසනාභිවෘද්ධියට කාරණක්වන එම සත්ක්‍රියාවට විරුද්ධවීම අධාර්මිකය. ප්‍රසාද භෙදයට කාරණුවියහැකි පාප-පුද්ගලයන්ගේ නොඊම රිසිවනුයේ දැහැමි හැඟීමෙනි. එය මච්ඡරියට අයත්නොවේ. කුලමච්ඡරි තමා හා සම්බන්ධකම් පවත්නා කුලයන්හි අන්‍යයන් සඳහා දනාදියක් පවත්වනු දුටහොත් බලවත් සන්තාපයට පැමිණේ. එම කුලයන්ගෙන් ලැබෙන ලාභ සත්කාරාදියෙන් පිරිහිණැයි ලෙහෙ වමනය කිරීම් ආදී පීඩාවලට ගොදුරු වේ. **ඔහුව මරණින් මතු ගූථනරකයෙහි ඉපද දුක් විඳින්නට ද සිදුවන්නේය.**

තමා හා හිත මිතුරුකම් දක්වමින් ඇසුරුකරන කුලයට අන්‍යයන්ගේ සම්බන්ධය නොඉවසීම ගෘහස්ථයන්ගේ ද සිරිති. ඒ කුලය නිසා ලබන උපකාරාදියට හානියක් වෙතියි සිතීමෙන් එය හටගනී. අන්‍යාන්‍යයන්ගේ සම්බන්ධ-යෙන් ලැබෙන ප්‍රයෝජනය අනෙකෙක් නොලබාවා යන අදහසින් එම මසුරු සිත පහළ වේ.

සීලාදී ගුණධර්මයන්ගෙන් යුක්ත අන්‍ය භික්ෂුවක් සිව්-පසය ලබන කල්හි එය නොලබන්නේ නම් මැනැවැයි සිතනුයේ ලාභ මච්ඡරියෙනි. තමාහට නොලැබෙන ලාභයක් අනෙකකු ලබනු ඉවසන්නට මසුරු සිත ඉඩනොදේ.

අනෙකකුගේ ලාභය නොකැමැති වත පහත දැක්වෙන පරිදි ධාර්මික සිතිවිලි පහළවන අවස්ථා ද ඇත. යමෙක් සැදැහැවතුන් දෙන සිව්පසය විනිපාතනය කෙරේද, පරිභොග නොකොට තැබීමෙන් හෝ නොසැලකිලිමත්ව පරිභොග කිරීමෙන් හෝ විනාශවන්නට ඉඩ හරිද, ප්‍රත්‍යගෙධයෙන් නරක්වී යන කල්හිත් අනෙකකුට නොමදේද, එබඳු පැවතුම් ඇති පුද්ගලයාගේ ලාභය නොරිසිවීම ලාභමච්ඡරියට ඇතුළත් නොවේ. මේවා මොහු නොලබා සිව්පස පරිභොගය ධර්මානුකූලව කරන අනෙක් සිලවන්තයෙක් ලබන්නේ නම් යහපතැයි හැඟීමක් ඔහුතුළ හටගන්නා බැවිනි. **ලාභමච්ඡරී පුද්ගලයා සඞ්ඝයා හෝ ගණයා සන්තක ලාභයන් පුද්ගලික දෙයක් මෙන් මසුරුකමින් පරිභොග කොට මරණින්මතු යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ මහාපිඹුරෙක් බවට පැමිණෙන්නේය. මිනිස්ලොව උපන්කලෙක අල්ප ලාභියෙක් වන්නේය.**

ගොවිතැන් වෙළහෙළඳම් ආදියකින් හෝ රැකිරක්ෂා දියකින් හෝ අනෙකකුට ලැබෙන ධනය නොඉවසීම ගෘහස්ථයන් තුළ ද පවතී. අන්‍යයන්ගේ වස්තුව තමානට වේවා යන හැඟීම මසුරුකමේ එක් අඞ්ගයක් හෙයින් අනෙකකු යමක් ලැබීම තමාගේ පිරිහීමක්සේ සලකන්නට පුරුදුවීම මෙබඳු අදහස් පහළවීමට හෙතුවේ.

අනෙකකුගේ ශරීර වර්ණය හෝ ගුණවර්ණනය නොඉවසනුයේ වර්ණ මච්ඡරී නම්. ශරීර වර්ණයෙහි මසුරු තැනැත්තේ අසුවල් අය රූප සම්පත්තියෙන් යුක්තය. සිත් පහදනා මනා පැහැසපුවෙන් සමන්විතයැයි කියනකල එය ඉවසිය නොහී තුෂ්ණීම්භූත වෙයි. එම ගුණ කථනය අසන්නට ද කැමැති නොවේ. ගුණ වර්ණනයෙහි මසුරු තැනැත්තේ අනෙකකුගේ සීලධුතාඞ්ග ප්‍රතිපදා දී වර්ණනයක් කියන්නට කැමැති නැත. තමාගේ සීලාදි ගුණයක අඩුපාඩුවක් හෝ සමානත්වයක් හෝ එසින්

මැත ගන්නම් - හැකිවීම නොසැමැත්තට හේතුවය. **වර්ණ මච්ඡරියෙන් භවයෙහි උපනුපන් කල ගුණ- කථාවට භාජන නොවන්නෙක් ද, දුර්වර්ණ ශරීර ඇත්තෙක් ද වන්නේය.**

ගිහි සමාජය ද මෙම වර්ණ මච්ඡරි පුද්ගලයන්ගෙන් පිරී ඇත. අන්‍යයන්ගේ රූසපුවට ඊර්ෂ්‍යාකරනු පමණක් නොව, තමාහට නැති ගුණ ජීවිතයක් ගෙනයනු දක්මද, තුරුස්නා අය බොහෝය.

පර්යාප්ති ධර්මය අනෙකකුට නොදෙනු රිසිවනු යේ ධම්ම මච්ඡරිය. මෙම පුද්ගලයාසැහවුණු ග්‍රන්ථයක් හෝ කථා මාර්ගයක් හෝ අනෙකකුට උගන්වන්නට රිසිනොවේ. යම් ධර්මයක් දුනිමෙන් එම පුද්ගලයාට හෝ ධර්මයට හෝ පැමිණෙන පරිහානිය දක ආදීනව සලකා ධර්මය නොඋගැන්වීම මච්ඡරියක් නොවේ. දනයුත්තක් වුවද තුසුදුස්සකුටදීම නොහොබනා හෙයිනි. මෙහි ධර්ම නාමයෙන් ප්‍රතිවේධයද ගැනේ. ආර්ය ශ්‍රාවකයෝ තමා අවබෝධ කළදේ අන්‍යයන් ද අවබෝධ කරනු උදක් ම බලාපොරොත්තු වෙති. කිසිසේත් ඒ පිළිබඳ මසුරු සිතක් ඔවුනට පහළ නොවේ. **ධර්ම මච්ඡරියෙන් කුක්කුල නිරයෙහි පැසෙන්නේයි.**

තමාදත් ශිල්ප ශාස්ත්‍රාදියක් අනෙකකුට නොඋගන්වන මසුරු සිත ගිහියන් තුළද ඇත. සිංහලයන් අතර මෙය බෙහෙවින් බලපවත්වනු පෙනේ. පෞරාණික ශිල්ප කර්මාන්තවෛද්‍ය නක්ෂත්‍ර යන්ත්‍ර මන්ත්‍රා දී ශාස්ත්‍ර අතරින් අධික ප්‍රමාණයක් නෂ්ටප්‍රාය වී තිබෙනු යේ මේ හෙතුවිනි. පහත දක්වෙන ගාථාවෙහි පඤ්ච මච්ඡරියයන්ගේ විපාක සඞ්ග්‍රහකොට දක්වේ.

**ආවාසෙන ලොහගෙහෙ – කුලෙන ගුථ නිරයෙ**
**ලාභෙන අප්ප ලාභොච-වණ්ණෙන තු අවණ්ණකො**
**ධම්මා කුක්කුල නිරයෙ – පච්චතෙ පාපමානසො**

## සඨ - මායාවි:-

තමාතුළ නැති ගුණයන් ඇතිසේ පෙන්වනුයේ සඨය. විද්‍යමාන අගුණයන් වසා නිර්දෝෂී නැතැත්තකුසේ හඟවනුයේ මායාවීය. එකකු නැතිගුණ ඇතිකර ගුණවත් විලාසයෙන් පෙනී සිටින අතර අනෙකා ඇති අගුණ නැතිකර ගුණවතකුගේ ආකාරය පෙණෙන සේ ක්‍රියා කරයි. මෙසේ දෙදෙනාගේ තත්ත්වය හා අදහස් එක්බඳු හෙයින් එක් දූකයෙක්හිලා ගැනිණ. අනුන් රවටන කෛරාටික සවභාවයෙන් යුත් සඨ පුද්ගලයා කෲරය. පිරිමැදිය නොහැකි පියුම් දඬුවක් මෙන් ඵරුෂය. පච්ඡාමි කිරීමෙහි උපාය හා ඉන් වන අපායත් දැන අදහස් සමෘද්ධ කැර ගැන්මට දක්‍ෂය. අන්‍යයන් තුළ තමාකෙරෙහි විශ්වාසය ඇතිකරවා ගුණවතුන්ගේ සමාජයෙහි ගුණවතකුසේ ද නැණැතියන් අතර නැණැතියකුසේ ද ක්‍රියා කරයි. ඒ ඒ අවස්ථාවට හා ස්ථානයට යෝග්‍ය පරිද්දෙන් හැසිරී පරිසරයට අනුරූපව තමාගේ තත්ත්වය රැකගනී. විශෙෂයෙන් මෙහි සඨ පුද්ගල සවභාවය සැලකෙනුයේ පච්ඡාමි කරමින් අන්‍යයනට නොදැනෙනසේ වළහාගෙන ගුණවතකුගේ ව්‍යාජයෙන් පෙනී සිටීම පිළිබඳවය. ඔහුගේ ඇතුළත පිටත තත්ත්වය ශූරත්වයෙන් සඟවාගෙන සිටින හෙයින් කිසිවකුටත් දත නොහැක. ඇසුරු කරන්නවුනට පෙනෙනුයේ තම තමා හා අභිශයින් ගැලපෙන කෙනෙකු ලෙසිනි.

**"වාමෙන සූකරො හොති - දක්ඛිණෙන අජාමිගො**
**සරෙන එළකො හොති - විසාණෙන ජරග්ගවො"**

යන්නෙන් දැක්වෙන එක එක පැත්තෙන් බලනවිට වෙනස් වෙනස් සතුන්සේ පෙණෙන යක්‍ෂ සූකරයාමෙන් සඨ-පුද්ගලයා ද නැනට ගැලපෙන සේ වෙස්මාරුකොට හැසිරෙන්නට පිළිවන් කෙනෙකි.

**මායාවී:-** තමාතුළ විද්‍යමාන තත්ත්වය සඟවා අනෙකක් පෙන්වයි. මායා නම් වූ සිත කිලුටු කරන ධර්මය කරන වරද වසාලන ස්වභාවයෙන් යුක්තය. මායාවී පුද්ගලයා කාය වචීමනෝ දුශ්චරිතයන් කොට කිසිවෙක් නොදකිවා නොම දනීවා යි ප්‍රාර්ථනා කරයි. කොතරම් පරපතළ වරදක් වුව ද අනෙකකුට දැනගත නොහේනම් පසුබට වීමක් හෝ පැකි-ලීමක් නොමැතිව කරයි. නිදෝෂී පුද්ගලයකුසේ පෙනී සිටින්නට ඉඩ ලදහොත් ඒ පමණැ යි ඔහුට හැඟේ. එබැවින් පාපභිරුකත්වය දුරුවී අධර්මයෙහි ගැලුණු මහා පාපියෙකු බවට පැමිණ රහසින් පව් කරමින් ඒවා වසා ගන්නට නොයෙක් උපක්‍රම යොදයි. පළමුව සැක කිරීම් වශයෙන් වත් තමා ගැන අන්‍යයන් තුළ තරක හැඟීම් පහළ නොවේවා යි සිතයි. දෙවනුව තමාගේ පරිශුද්ධත්වය වචනයෙන් පවසන්නට ඉදිරිපත් වේ. දැන දැන වරද කිරීම භයානක පාපයකැයි ද, තමා නම් එබඳු ආගම් විරෝධී - නීතිය ඉක්මවා යන වරද කරන්නෙක් නොවේ-යයි ද, පවසමින් කළවරද වචනයෙනුදු වසාලයි. තෙවනුව පාපකර්මය වැසීයන පරිදි යම් යම් වත්පිළිවෙත් ආදිය කරමින් ශරීරයද ඒ සඳහා මෙහෙයවයි. මෙලෙසින් ත්‍රිවිධ ද්වාරයම යොදවා කළවරද වසන සුළු ඇස මුළාකරන මායාවක් බඳු පැවැතුම් ඇත්තේනු යි මායාවී නාමයටම යෝග්‍ය වේ. මෙතෙම තමාගේ වරද වසාගැනීම සඳහා අන්‍යයන්හට දුශ්චරිතාදියෙහි ආදීනව කියන්නකු හෙයින් උපදෙශ දෙන්නකු මුත් ගන්නෙක් නොවේ. එහෙයින් වඩ වඩාත් පව්කම් හි නියැලිව පාපභරිත දුෂ්ටයෙකු බවට පැමිණේ. යම් හෙයකින් ඔහුගේ ස්වල්ප වරදක් දුටද අනෙකකුට එය පෙන්වා අනුශාසනා කරන්නට ඉඩක් නැත. එය පිළිගන්නට ද හෙතෙම කැමැති නොවේ. තමාගේ නියම් තත්ත්වය හෙළිපෙහෙළි වන්නට පිළිවනැ යි ඔහුතුළ

බියක් පවත්නා හෙයිනි. රහසින් පව් කරන්නෝ පාපය වසා ගැනීමේ අදහසින් ක්‍රියා කරන හෙයින් මායාවී පුද්ගල සඞ්ඛ්‍යාවට වැටෙති. ඔහු අන්‍යයන් නොදැකීම් මාත්‍රයෙන් සැනසෙන නමුදු පාපයෙන් මිදීමක් නැතැයි නොසිතති. සිතින් එකක් සිතා වචනයෙන් අනෙකක් බෙණෙමින් කයින් එයට හාත්පසින් විරුද්ධවූවක් ම කිරීම ඔවුන්ගේ සිරිති. මායාවී අලුවලින් වැසුණු ගිනි පුපුරක් මෙන්ද, වතුරින් යටව පවත්නා කනුවක් මෙන්ද, රෙදිවලින් දවටුණු ආයුධයක් මෙන්ද පැවතුම් ඇත්තේ ය.

## අහිරික - අනොත්තප්පි -

ලාමක පාපධර්මයන් කිරීමට ලජ්ජාවක් හෝ පිළිකුලක් නැත්තේ අහිරිකය. පාපයන් රුස්කිරීමට බියක් හෝ හැනිගැනීමක් නැත්තේ අනොත්තප්පිය. හිරිය නමා තුළින් තමා අරමුණුකොට පහළවන චිත්තස්වභාවයකි. ඔත්තප්පය නමා කොරෙන් පිටත් දැය මූලිකකොට හටගන්නා චිත්ත ගතියකි. තමා මැ ප්‍රධාන කැරගෙන හිරිය පවතී. ඔත්තප්පය පවත්නේ ලොකයා අධිපති කැර ගැනීමෙනි. අවනත ස්වභාවයෙන් පහළවීම හිරියේ ලක්ෂණයකි. වරදෙහි නැති ගතිමින් භය දක්නා සුළුව පහළවීම ඔත්තප්පයේ ලක්ෂණයකි. කාය දුශ්චරිතාදී පාප-ධර්මයන් කිරීමට ලජ්ජාවක් හෝ බියක් නැති පුද්ගලයා අහිරික නමිනුදු, අනොත්තප්පී නමිනුදු හැඳින් වේ. ලජ්ජාභය නැති විට නොකළ හැකි අපරාධයක් නැත. මෙලොවින් හෝ පරලොවින් වන නින්‍දා අප්‍රශංසා දුර්ගති දුඃඛාදී කිසිවක් පිළිබඳව සැලකී මක් නැති බැවිනි. සත්වලොකය දැහැමෙන් සෙමෙන් පවත්වා ගැනීමට උපකාරක ධර්මයන් අතර ලජ්ජා භය ප්‍රධානය. මේ උභය ධර්මයන් සන්තානයෙහි නැතිකල්හි

සමාජ නීතිරීතීනට අනුගත බවක් ඇති නොවේ. එහෙයින් ලොව පාලනය කරන නියම පාලකයෝ නම් හිරිඔතප් දෙදෙනාය. **“ද්වෙ මෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, කතමෙ ද්වෙ හිරිච ඔත්තප්පඤ්ච”** යනුවෙන් ඒබව තථාගත දෙශනායෙහි සඳහන් වේ.

හිරිඔතප් දෙකින් සමන්විත පුද්ගලයා සමාජය තුළ පිරිසිදු නොකිළිටි ජීවිතයක් ගතකරයි. ලොකයෙහි යහපත් හොඳදේ ශුක්ල (-සුදු) යන විශෙෂණයෙන් විශිෂ්ට වැ ව්‍යවහාරයෙහි පැවැතිම පෙරකල පටන් පැවතගෙන එන චාරිත්‍රයකි. කුසල ධර්මයන්ටද ශුක්ල ධර්ම යනු නාමාන්තරයකි. හිරිඔතප් දෙක අබුද්ධොත්පාද කාලයෙහිදු ජනසම්මත යහපත් ධර්මයක් වැ ශුක්ලධර්ම නාමයෙන් ව්‍යවහාරයෙහි පැවතිණ.

**දෙව ධර්ම ජාතකයෙහි**

**“හිරිඔත්තප්ප සම්පන්නා - සුක්ක ධම්ම සමාහිතා**
**සන්තො සප්පුරිසා ලොකෙ - දෙවධම්මාති වුච්චරෙ”යි**

දැක්වෙන පරිදි **‘දෙවධර්ම’** නාමයෙනුදු ගැනෙනුයේ මෙම හිරිඔතප් දෙකමය.

හිරිමත් පුද්ගලයා අද්ධ්‍යාත්මික ධර්මයන් අපෙක්ෂා කොට ලජ්ජා ප්‍රාප්තව පාපයෙන් වැළකෙන අතර, අහිරික එබඳු තත්ත්වයක් නැතිහෙයින් පාපයෙහි නිරතවෙයි. මිනිසත් බව ඇති නමුදු හොඳ නරක නොදක්නා තිරිසනකු මෙන් ක්‍රියා කෙරෙයි. සිත මෙහෙයැවුණු සැම දෙයක් ම කරන්නට ඉදිරිපත් වේ. මෙබඳු පුද්ගලයා පව් කිරීම එකම කෘත්‍යකොට ඇතිහෙයිනුදු, පාපයෙන් සිත නොහැකිළවීම වැටහිම කොට ඇතිහෙයිනුදු, ආත්ම ගෞරවයක් නැතිකම ආසන්න කාරණකොට ඇතිහෙයිනුදු, නැතක් පව්කම්හි නියැලෙන්නේය.

**“ජිගුච්ඡති නා'හිරිකො - පාපාගූථො'ව සූකරො”යි**

සදහන් වන පරිදි ගම්හූරකු අශුචිය පිළිකුල් නොකරනු මෙන් පාපය පිළිකුල් කොට තැකීමක් අහිරිකයා තුළ නැත. පාපභීරුකයා ලජ්ජායෙන් හා පිළිකුල් සිතින් යුක්තව ආත්ම ගෞරවය උපදවා පාපයෙන් වැළකේ. හිරිය පහළවීමට කරුණු සතරක් හෙතුවේ.

i තමා උපන් ජාතිය මෙනෙහි කිරීම
ii තමාගේ වයස ,, ,,
iii සූර භාවය ,, ,,
iv බහුශ්‍රැතකම ,, ,,

යන මේවායින් එකක් හෝ සිහිකරන්නා තුළ පාපයෙහි ලජ්ජාව හටගන්නේය. පව්කම් කිරීම ජාති සම්පන්නයන්ගේ ක්‍රියාවක් නොවේ. කුලහීනයන්ගේ පහත් පැවැත්මකි. තමා වැනි කුලීනයෙකු පාපකර්මයෙහි යෙදීම උපන් කුලයට ද නිඥා කිරීමකැ යි සිතා ප්‍රාණඝාතාදියෙන් වැළකෙනු යේ ජාතිය මුල්කොට හිරිය පහළ වීමෙනි. පව් කිරීම ජීවිතය පිළිබඳ අත්දැකීමක් නැති බාලවියෙහි සිටින්නවුනට හැකි දෙයකි. මුහුකරනලද වයස් ඇති මා වැනියකු ළාබාලයන් අනුගමනය කරන පහත් ක්‍රියා–වන්හි යෙදීම තරම් නොවේයැ යි සලකා පාපයෙන් වැළකෙනු යේ තැන්පත්විය ගැන සිතීමෙනි පාපයෙහි යෙදෙනු යේ දැහැමි ජීවිතයක් පවත්වා ගතනොහැකි කම්ෂනතාදියෙහි අදක්‍ෂ දුර්වලකම් හෙතුකොට ගෙනය. මා වැනි ක්‍රියාශිලී සූර පුද්ගලයෙකුට එය නොහොබනේය යි සිතා පව්කම් නොකරනු යේ තමාගේ දක්‍ෂකම් සිහිකිරීමෙනි. පව්පින් නොදත් අඥබාල පුද්ගලයෝම පව්කොරෙති. පාප විපාක දත් නුවණැත්තෝ ඉන් වැළකෙති. මාවැනි බොහෝ ඇසූ පිරූ තැන් ඇති උගතෙකුට, එය සුදුසු නොවේය යි සිතා තමාගේ ආගමධර්මය දත්තියාව විමසා බැලීමෙන් පවින් තොර වනු යේ බහුශ්‍රැතකම සිහි කිරීමෙනි.

තවද ඇතැම් කෙනෙක් ශාස්තෘවරයාගේ උතුම්කම, මහත් දයාදයකට හිමිකාරයෙකුවීම, ශ්‍රේෂ්ඨ ඥාති මිත්‍ර සබ්‍රම්සරුන් ඇත්තෙකුවීම, යන කරුණු අරමුණුකොට-ගෙනද පාපයෙන් වැළකෙත්. මෙසේ පාපජේගුච්ඡ පුද්ගලයා අනෙක කාරණයන්ගැන විමසීමෙන් අධ්‍යාත්ම-යෙහි ලජ්ජාව හටගන්වාගෙන පව්කම් නොකරයි. ගූථයෙන් වැකුණු යකඩය සිහිල් සුවපහස් දනවන නමුදු දුර්ගන්ධ භීතියෙන් පිළිකුල් උපදවා ප්‍රකෘති සිහියෙන් යුක්ත වූවකු නොගන්නා මෙනි.

**අනොත්තප්පී:**- ත්‍රිවිධ දුශ්චරිතයන් කිරීමට තැති ගැනීමක් නැතිවැ ලොකයාගෙන් ලැබෙන නින්දා අප්‍රශංසාදියට බිය නොවී පව්කම්හි යෙදෙයි. පාපයෙන් දුරුවීමට නම් ඔත්තප්ප සඞ්ඛ්‍යාත වරදෙහි භය දක්නා සුළු ස්වභාවය තිබිය යුතුය. එය බාහිර අරමුණු නිසා පහළවන්නකි. දරුගැබක් හටගත් වෙසඟනක මෙන් ඔත්තප්පී පුද්ගලයා පාපයෙන් දුරුවන්නට උත්සාහ කරන්නෙකි. **"වෙසි විය ඔත්තප්පං දට්ඨබ්බං"** යන්නෙන් එබව පැවසේ. වෙසඟන දරුගැබක් හටගත්විට තැතිගනී. අන්‍යයන් දතහොත් රුචි නොකරන බැව් දැන දරුගැබින් මිදෙන්නට යත්න දරයි. ඔත්තප්පීද උපවාද භීතියෙන් තැතිගෙන ගෞරව ලාභ සත්කාරාදියෙන් පිරිහෙති යි සිතා පවින් වැළකේ. එසේම,

**"ගරහිස්සන්ති නං විඤ්ඤූ - අසුචිං නාගරිකො යථා**
**වජ්ජිතො සීලවන්තෙහි - කථං භික්ඛු කරිස්සසි'ති"**

පිරිසිදු පැවැත්ම හුරුපුරුදු නාගරිකයකු අශුචි පිළිකුල්-කොට ඉන් ඈත්වනු මෙන් සිල්වතුන් විසින් ගරහමින් තොර කෙරෙතියි සිතා බාහිරවැ එළඹෙන භයින් ත්‍රස්ත වේ. ගින්ගෙන දිලිසෙන යගුලියක් දුටු භීතියෙන් නොගන්නා මෙන් පරලොවින් වන ආපායික දුඃඛයෙනුදු බියට පැමිණ දුශ්චරිතයෙහි නොයෙදේ.

i **අත්තානුවාද භය**
ii **පරානුවාද භය**
iii **දණ්ඩ භය**
iv **දුග්ගති භය**

යන කරුණු සතර ඔත්තප්පය පහළවීමට හෙතුවේ ත්‍රිවිධ දුශ්චරිතයෙහි හැසුරුණහොත් තම ආත්මය උපවාද කෙරෙතියි සිතා ඉන් භයට පැමිණ පවින් වළකිනුයේ අත්තානුවාද භය ඇතිවීමෙති. සීලය මුල්කොට අන්‍යයන් උපවාද කෙරෙති යි සිතා සුචරිතයෙහි යෙදෙනු යේ පරානුවාද භය පහළවීමෙති. ප්‍රාණඝාතාදිය කිරීමෙන් එළඹියහැකි දෙතිස් රාජ දණ්ඩනයන් ද, සිරගෙයි ලැවීම් ආදී බන්ධනයන් ද මෙතෙහි කරමින් දුසිරි දුරලනු යේ දණ්ඩන හෙතුක ඔත්තප්පය ඉපදීමෙති. මරණින්මතු අපායෙහි උපදිති යි බියපත් වැ සුචරිතයෙහි හැසිරෙනුයේ දුගීති භය හටගැනීමෙති. මෙම ඔත්තප්ප ලක්‍ෂණයන්ගෙන් දුරුවූයේ අනොත්තප්පී නමැ යි දන්නේය.

## දුබ්බච - පාපමිත්ත:-

ධර්මානුකූල අවවාදයන් නොපිළිගන්නේ දුබ්බචය. ප්‍රාණඝාතාදී අකුසල් කරන්නවුන් මිත්‍රයන්කොට වසනුයේ පාපමිත්තය. දුබ්බච අන්‍යයන්ගේ අවවාද අනුශාසනා පිළිගන්නට කැමැත්තක් නොදක්වන්නෙකි. බුද්ධ ප්‍රඥප්ත ශික්‍ෂාපදයන් සඳහන් කොට කරන වරද පෙන්වන කල්හි පවා අකීකරුවැ තුෂ්ණීම්භූත වෙයි. ඔවාදෙන්නහුගේ ගුණ දෙස් සිතමින් ආදර ගෞරවයක් නොදක්වා මුරණ්ඩු ස්වභාවයෙන් හැසිරේ. චොදනා කරන්නහුට ම පෙරළා චොදනා කරයි. අවවාද දෙන්නහු නිශ්ශබ්ද කරවන මර්මච්ඡේදක වදන් හෝ බෙණෙයි. ගුණ වෘද්ධ ඥාන වෘද්ධ වයෝවෘද්ධ උතුමන්ගේ සහධාර්මික වචනයන් නොපිළිගනී. අන්‍යයන් ගරුතන්හි හෝ දෙටු පාන්හි පබා සමග වාසයට කැමැත්තක් නොදක්වයි. දුබ්බචභාව සිතෙහි හටගන්නා පාද ගතියකි. පූර්වොක්ත සියළු පැවතුම් සිත පිළිබඳ ඒ ඒ අවස්ථාවන් නිරූපනය කරන හෙයින් දුබ්බචය සංස්කාර ස්කන්ධ පර්‍යාපන්නය.

තවද **දුබ්බච පුද්ගලයා** තමාට අවවාද දෙන්න හු බිලසම්පන්න කෙනෙකු නම් නො ඇසූ කන්ව නොදන්නාක් මෙන් එතැනින් මගහැර යැමට උත්සාහ ගනී. ඉදින් කන් යොමුකොරේ නම් එම අවවාදය නුහුරින් (-වමින්) ගන්නට අදහස් කරයි. ඔබ මාහට කුමක්හෙයින් අවවාද කොරෙහිද සුදුසු නුසුදුසු වරද නිවරද අඤ්ඤාතඤ්ඤේ තෝරා බේරා ගන්නට මම මැ සමඤ්ඤයෙමි. ඔබගේ අවවාදයෙන් කාම් කිමැ" යි බෙණෙමින් තමාගේ අසහනය දක්වාලයි. අවවාදයට නොනැමී ගුණනුවණින් පිරිහෙයි. එහෙයින් අන්‍යයන් විසින් අවවාද නොදිය යුත්තෙකු කොට සලකා වෙන්කරන ලදු යේ අනාථයෙකු බවට පත් වන්නේය.

**සුවච පුද්ගලයා**:- අවවාදයට නැමෙයි. හැඩි දැඩි වැකද ඵරුෂ ලෙසින් කියන කල්හිදු නොකිපෙයි. අවවාද දයක තත්වයෙහි සිටින්නවුන්ගෙන් නිතර අනුසාසනා බලාපොරොත්තු වෙයි. අවවාදයෙහි පිහිටා තමාගේ ස්වල්ප මාත්‍රවූද කාසිකා දි දෙෂයන් දුරලමින් ප්‍රියමනාප පැවැතුම් ඇති වැ වෙසේ. අනුන්ගේ වරදෙහි නොඑල්බී ඔවුන්ගෙන් ලැබෙන අවවාදය ම උතුම් සේ සලකමින් බසක් නොකියා අනුවතීක වෙයි. සුවචකම තමාගේ හා අනුන්ගේ වරද දුරලන පැවැත්මකැ යි සිතයි. අනුසාසනය සුදුසු අයුරින් (-දකුණින්) ඥතාන්විත වැ පිළිගෙන පිළිපදින්නට උත්සාහ ගනී. මෙතෙම අන්‍යයන්ගේ දයාපරවශ භාවයට පැමිණ තමාගේ ජීවිතයට ලබාගතයුතු අනඝතර ප්‍රතිෂ්ඨාවක් සලසා ගන්නෙකි. **"යම්පි භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහි අනුසාසනිං, අයම්පි ධම්මො නාථකරණො'ති."**

යන්නෙන් දැක්වෙන පරිදි සුවච බව නාථකරණ ධර්මයෙකැ යි දැන මිනිසත් බව සපල කරගනු කැමැත්තන් විසින් අවවාද අනුශාසනාදියට භක්තිප්‍රේමයෙන් යුක්තව අවනත භාවය දැක්විය යුත්තේය.

**පාපමිත්‍ර** පුද්ගලයා පව්කම් හි හැසිරෙන්නවුන් මිතුරන්කොට ඇත්තේය. බුද්ධාදී රත්නත්‍රය නො අදහන-ශීලාදී ගුණධර්‍මයන් නොරක්නා - අල්පශ්‍රැත - මසුරු මලින් සමන්විත දුෂ්ප්‍රාඥ පුද්ගලයන් සෙවනය ඔහුගේ පැවැත්මය. සෑම ආකාරයෙන් ම භජනයත් භක්තියත් ඔවුන් කෙරෙහිමය. ඔහුගේ සිතත් ශරීරයත් ලාමක මිත්‍රයන්වෙත නිරන්තරයෙන් නැමී පවත්නේය. පාපමිත්‍රයන් ඇති පුද්ගලයාට නොකළහැකි අපරාධයක් නැත. අනර්‍ථය සඳහා සිත් මෙහෙයවන පරිසරයක් අනායාසයෙන් ම ලැබීම එයට හෙතුවය. අශ්‍රිතයන්ගෙන් කවර තරම් දරුණු ක්‍රියාවකට වුවද ලැබෙනු යේ රුකුලක්මය. එබැවින් තව තවත් අපරාධ කරන්නට පෙළඹේ. පුරුදු පව්කම්හි නිතර යෙදෙන්නවත්, නුහුරු වැ පවත්නා බිහිසුණු ක්‍රියාවන්හි නොබිය වැ හැසිරෙන්නටත්, පාපමිත්‍රත්‍වය තරම් උපකාරක ධර්‍මයක් තවත් නැත. බුද්ධාදී ආර්‍යයන් ගමන් කළ යුතුයැයි සම්මත ආර්‍ය මාර්‍ගයෙහි යෑම පාපමිත්‍රයාට ප්‍රියවන්නක් නොවේ. හේ ඇසුරුකරන්නවුන් සමග උභයලොකාභිවෘද්ධිය පිරිහෙළන - පරාභවයට හෙතුවන - ක්‍රියාමාර්‍ගයන්හි ම ආසක්ත වේ. එහෙයින් පාපමිත්‍රයන් ඇතිබව අතිශය අනර්‍ථදායක යැ යි සැලකිය යුතුය. පුරිසාධම වූ ඔවුන් දුරින්ම දුරුකළ යුතුය. වදාළේ මැයි.

**“න භජෙ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ**
**භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ ති”**

**ඉන්ද්‍රියෙසු අගුත්තද්වාර - භොජනෙ අමත්තඤ්ඤු**

චක්‍ෂුරාදී ෂඩින්ද්‍රියයන්ගෙන් රූපාදී ෂඩාරම්මණයන් ගෙන අභිධ්‍යා දී පාපධර්‍මයන් උපදවන්නේ ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරය. ආහාර පිළිගැනීමෙහි හා පරිභොගයෙහි පමණ නොදන්නේ භොජනෙ අමත්තඤ්ඤුය. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාර පුද්ගලයා හැඳින ගැනීමට ඉන්ද්‍රිය ආරම්මණ දෙක්හි සම්බන්ධය උගත යුතුය. අප රූප බලනු යේ ඇසිනැ යි කියත නමුදු ඇසට රූප බැලීමේ ශක්තියක් නැත.

එසට සිතක් නැතිහෙයිනි. එසේනම් රූප පෙනෙනුයේ සිතටද ඒත්නැත. සිතටඇසක් නැති බැවිනි. ද්වාර ආරම්මණ දෙකගැටුණු කල්හි ප්‍රසාද වස්තුකව පහළවන චිත්තයෙන් රූපයන්ගේ දැක්ම සිදුවේ. චක්ෂුර් විඥානයෙන් රූප දකිති යි කියනුයේ මේ ක්‍රියා පිළිවෙළ දක්වනු සඳහාය. රූප ශබ්දාදි ආරම්මණයක් ඉන්ද්‍රිය ගොචර වූ කල්හි පහළවන චිත්තවීථියෙහි ජවනක්ෂණයෙහි දී අරමුණ පිළිබඳ යථාතත්ත්වය නොදන්න මූළාවන පුද්ගලයා අගුත්තද්වාර නමින් සැලකේ. හෙතෙම ස්ත්‍රී පුරුෂාදී රූපයන් නිත්‍ය සුඛ ශුභාදි ලෙසින් ක්ලෙශ වස්තුකාව දකී. ක්ලෙශයන් ප්‍රකට කරන හෙයින් අනුව්‍යඤ්ජන නමින් ගැනෙන අත් පා – කන් – නාසා, බැලීම්, සිනාසීම්, කථා කිරීම්, ආදියෙහි ආකාරය මෙනෙහි කරයි. මේ අනුමින් චක්ෂුරින්ද්‍රිය අසංවුතවූ. අපිහිත වූ පැවැත්ම නිසා අභිධ්‍යා දෞර්මනස්‍යාදි ලාමක පාපධර්මයන්ගේ පහළවීම වෙයි. චක්ෂුරාදී ඉන්ද්‍රියයන්හි ගුප්ත බවක් හෝ අගුප්ත බවක් නොලැබෙන බව දතයුතු විශෙෂ කාරණයකි. යම්විටක රූපාදී අරමුණක් චක්ෂුරාදී ඉන්ද්‍රියයකට ගොදුරු වේද එකල්හි භවඞ්ග සිත දෙවරක් ඉපිද නිරුද්ධව, කිරියා මනොධාතුව ආවර්ජනා කෘත්‍යය සිදුකරමින් ඉපද නිරුද්ධ වේ. ඉන්පසු චක්ඛු විඥානය දර්ශන කෘත්‍යයත්. විපාක මනොධාතුව සම්පටිච්ඡන කෘත්‍යයත්, විපාකා'හෙතුක මනොවිඥාන ධාතුව සන්තිරණ කෘත්‍යයත්, ක්‍රියා හෙතුක මනොවිඥාන-ධාතුව වොත්ථපන කෘත්‍යයත්, සිදුකරමින් ඉපද නිරුද්ධ වේ. ජවන් දුවනුයේ ඉන්පසුය. පළමුව පහළවන භවඞ්ග – ආවර්ජන සමයන්හි ගුප්තා'ගුප්ත බවක් නොලැබෙන නමුත් ජවන්හිදී ලැබේ. මෙම ජවනාවස්ථායෙහි අරමුණ තත්ත්වානුරූපව නොගනිමින් දුශ්ශීල බවක් හෝ සිහිමුළා බවක් හෝ වේද අගුත්තද්වාර වනුයේ එවිටය. මේ ආකාරයෙන් ෂඩින්ද්‍රියයන්හි අගුප්තව අසංවිහිත අනාරක්ඛව ක්ලෙශානු බද්ධ නිමිති ගැනීම් බහුලවූ ඉන්ද්‍රියෙසු

අගුත්තද්වාර වාසයකරයි. මෙම චිත්තස්වභාවය සත්ව සන්තාන යෙහි බෙහෙවින් බලපාන නිසාම ලෝකය ක්ලේශමිශ්‍ර වූ පවතී. ශ්‍රමණ ධර්මයට මෙය විශේෂයෙන් අහිතකරය. අගාරික ජීවිතයට වුවද, මේ හේතුකොටගෙන නැතක් අනර්ථ සිදුවේ. සත්ව සන්තානය ක්ලේශ මලිනයෙන් කිලිෂ්ට වනුයේ ඉන්ද්‍රියයන්ගේ අසංවරත්වය නොසැලකීමෙනි. ඉන්ද්‍රිය ගොචර ආරම්මණයන්ගෙන් තොරවූ වසන්නට හැකි සත්වයෙක් ලෝකයෙහි නැත. ආපාතගත අරමුණු රස විඳීම සත්වයෙකුගේ ස්වභාවයෙකි. එසේ වුවද ඉන් මුළානොවන්නට පුරුදුවිය යුතුය. කල්‍යාණ පෘථග්ජන භවයෙහි හැසිරෙන භාවිත සිතක් ඇති කෙනෙකුන්හට මුත් අනෙකකුට එය දුෂ්කර කටයුත්තෙකි. ක්‍රමානුකූලව ආරම්මණ ස්වභාවය මෙනෙහි කරන්නට සිත පුරුදු පුහුණු කිරීම එයට කළයුතු පිළියමය. නො එසේවුව, සදෙරින් ගන්නා අරමුණු වලින් ක්ලේශ කාලුෂ්‍යයෙන් භරිතවන චිත්තය භවබන්ධනයෙන් තව තවද බද්ධ වේ.

**භොජනෙ අමත්තඤ්ඤු** ආහාර සෙවීම, පිළිගැනීම පරිභෝගය යන මෙහි ප්‍රමාණයක් හෝ පිළියෙලක් නොදන නුනුවණින් ක්‍රියාකරයි. මෙහෙම ආහාර ගනුයේ ශරීරය පවත්වා ගැනීම නිමිතිකොට නොවේ. චතුර්මහාභූතික මේ රූපකාය නොසිඳිය දී දික්කලක් පවත්වාගෙන යෑම ආහාර ගැනීමේ එකම අභිප්‍රාය වුවද, ක්‍රීඩා පිණිසද, බලමද නිමිතිකොටද, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ප්‍රීණනය හේතු-කොටද, ප්‍රසන්න ඡවි වර්ණය සඳහාද ආහාර ගැනීම මොහුගේ සිරිතය. එබැවින් ප්‍රණීත ආහාර පානාදිය සෙවීම් පරිභෝග කිරීම් ආදිය පිළිබඳ ප්‍රමාණයක් නැත. ක්‍රීඩා පිණිස ආහාර ගැනීමෙන් මෝහයද මදය පිණිස ගැනීමෙන් ද්වේෂයද, ශරීරයාගේ ප්‍රීණනය හා වර්ණය සඳහා ගැන්මෙන් රාගයද වැඩෙත්. පුරිම කාරණද්වය හේතුකොටගෙන පාමාතුල සංයෝජනයන්ගේ පහලවීමද, උපරිමකාරණ ද්වයයෙන් අත්‍යන්තුල සංයෝජන හටගැන්මද සිදුවෙත්.

ආහාරය ශක්ති වඩිනාදිය පිණිසම පවත්නකැයි සලකා නුනුවණින් පිළිපැදීමෙන් කාමසුඛල්ලිකානුයෝගය දියුණු වේ.

තවද භෝජනයක් අනුභවකරනු යේ සතර ඉරියවු සුවසේ පවත්වමින් පහසු විහරණය බලාපොරොත්තුවෙති. හෙද සැලසෙනු යේ ආලෝප සතරක් හෝ පහක් අඩුව අනුභව කළ උදරයක් ඇතිවිට පමණි. ඒබව **ධම්සෙනාපති ශ්‍රී ශාරිපුත්‍ර මහා ස්වාමීහු මෙසේ පැවසූහ.**

**"චත්තාරො පඤ්ච ආලොපෙ - අභුත්වා උදකංපිවෙ**
**අලං ඵාසු විහාරාය - පහිතත්තස්ස භික්ඛුනො"**ති.

භෝජනයෙහි මාත්‍රඥ නොවන තැනැත්තේ පහසු විහරණයක් ගැන නොතකා ආහාර තෘෂ්ණාවෙහි ගෙඩව පිළිමන් තරම් අනුභව කරන්නට යත්න දරයි. ඉන්වනු යේ ශරීරය ස්වවසහයෙහි පවත්වන්නට නොහැකිවන තත්ත්වයෙකි. **"ආහරහත්ථක - අලංසාටක - තත්ථවට්ටක කාක මාසක - භුත්තවමිතක"** යන බ්‍රාහ්මණයන් එනමින් පළටවූයේ ඔවුන්ගේ ආහාර ගැන්මෙහි ප්‍රමාණය සැලකීමක් නැති හෙයිනි. ඔවුනතුරෙන් ආහරහත්ථකයා බොහෝ අනුභවකොට ස්වශක්තියෙන් නැඟී සිටින්නට නොහැකිව අතදෙව යි කියා අන්‍යකකුගේ සහායයෙන් නැගෙයි. අලංසාටකයා නැඟී සිටියේ නමුදු ඉතා මහත් බඩ ඇති හෙයින් රෙද්ද හැඳගන්නට නොහැකිව ගිලිහී යෑමෙන් කරදරයට පත්වෙයි. තත්ථවට්ටකයා බඩ උසුලාගත නොහැකිව කැනැත මැ පෙරළෙයි. කාකමාසකයා කාක්කන් විසිනුදු කැහැකි ලෙස ගිරියතෙක් පිරෙන පරිදි අහරගෙන කට දල්වාගනී. භුත්තවමිතකයා දිරවා ගන්නට නොහැකි තරම් අනුභව කොට කෑ අහර රඳවාගත නොහී එතැම වමනය කරයි. මෙපරිද්දෙන් ආහාරානුභවයෙහි පමණක් නොව සෙවීමාදියෙහිදු භොජනෙ අමත්තඤ්ඤු ප්‍රමාණාධික වැ වෙහෙසවීමෙන් බොහෝ කම්කටුලු වලට භාජන වන්නේය.

## මුට්ඨස්සති - අසම්පජාන

මුළාවූ සිහියෙන් සමන්විත තැනැත්තේ මුට්ඨස්සති නම්. සම්‍යක් ප්‍රඥ රහිතවූයේ අසම්පජාන නම්. නිරන්තර යෙන් සිහිපත් කළයුතු ධර්‍මයන් සිහියේ තබා නොගැනීම මුට්ඨස්සති පුද්ගල ස්වභාවය යි. අමතකවිය නොදී නැවත නැවත සිහියේ තබාගතයුතු ද ඉදිරියට ගමන්කොට මෙන් සිතට නංවාගත යුතුය. තිධාන්කොට තැන්පත්කර තැබීමක් මෙන් දරාගන්නට උත්සාහ ගතයුතුය. යම් ධර්‍මයක් සිතතුළ තහවුරු වන්නට මෙසේ ක්‍රියා කළයුතු වුවද, එබඳු පැවැත්මක් නැතිහෙයින් මුට්ඨස්සති අසතලද පයර්‍යාප්ති ධර්‍ම නොරඳයි. ජලයෙහි හුණු ලබු කබල් ආදියක් උඩමතුවී පාවී යන්නාසේ මෙන් අරමුණෙහි සිත පිහිටුවා නොගෙන විසම්‍ශත වන්නට ඉඩහරී. මෙපරිද්දෙන් අරමුණෙහි බැස ගන්නා ලද සිහියක් නැති, චිර කාලයක් භාවිත කිරීමෙන් සම්රකැරගත් ධම්මාරම්මණයක් නැති, තැනැත්තේ මුට්ඨස්සතිය.

**අසම්පජාන** සංස්කාර ධර්‍මයන් අනිත්‍යාදි වශයෙන් මනා නුවණින් නොම දක්නේය. ධර්‍ම සමග ඉදිරිපත්ව නොපවත්නේ ධර්‍මාවබොධයද නොකෙරේ. චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන් ප්‍රතිවෙධ කරන්නට යත්න නොකරයි. රූපාදීන් අතුරින් එක ධර්‍මයකුත් අනිත්‍යාදී වශයෙන් ගැනීමක් හෝ භාත්පසින් ඊට බැසගැනීමක් නොකෙරේමය. ධර්‍මස්වභාවය බලා එය තේරුම් ගන්නට අපෙක්‍ෂාවකුදු නැත. කුසලා'කුසල කර්‍මයන්හි විපරීත ග්‍රහණය නිසා එකම ධර්‍මයකුත් මොහුට ප්‍රත්‍යක්‍ෂ නොවේ. එබැවින් බලවත් මුළාවෙන් හා අවිද්‍යාවෙන් මඩිනු ලැබ, වාමාව හිතවූ මාර්‍ගයෙහි යා නොහි දුකට පත්වෙයි.

## සීල විපන්න - දිට්ඨි විපන්න

කායික වාචසික ව්‍යතික්‍රමණ සඞ්ඛ්‍යාත දුශ්ශීල බැවින් යුක්ත වනුයේ සීලවිපන්නය. දස වැදෑරුම් මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්විත වනුයේ දිට්ඨිවිපන්නය. සීලවිපන්න සකල නිශ්ශීල ගතින්ගෙන් යුක්තය. ප්‍රාණඝාතාදී ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ද, මුසාවාද දී චතුර්විධ වාක්දුශ්චරිතයන්ද, කරන්නකු වූ මෙතෙම කාය වාග් ද්වාරයන්ගෙන් හට– ගන්නා ආජීව අෂ්ටමක සීලයෙන් දුරුවූවෙකි. සාමාන්‍ය බෞද්ධයෙකු තුළ තිබියයුතු ශීලගුණයන්ගෙන් තොරවූ සීලසංයම රහිත පාපී පුද්ගලයා සීලවිපන්න නමින් පළට වේ.

**දිට්ඨි විපන්න** අහේතුක – අකිරිය – නාස්තික වශයෙන් වරදවා ගන්නාලද ලබ්ධි ඇත්තෙකි. යථාස්වභාවය නොදැනැ විපරීත ග්‍රහණයෙන් බැසගන්නාලද අනනයක් ඇතිකම දිට්ඨිවිපන්නගේ ලක්ෂණයෙකි. අපරිමිතදුඃඛ කාරකවූ මිථ්‍යාදෘෂ්ටිය නුවණැත්තන් විසින් පිළිකුල් කරනු ලබන්නකි. ප්‍රධාන වශයෙන් කරුණු දශයක් මුල්කොට දිට්ඨිවිපන්න නාස්තික මිථ්‍යාදෘෂ්ටියට බැසගන්නේය.

i **දුන් දෙයෙහි විපාකයක් නැත.**

ii **මහායාග වශයෙන් දුන් දෙයෙහිදු විපාක නැත.**

iii **දක්ෂිණාහීයා වෙතට පඬුරුවා දෙන දානයෙහි ද විපාකයක් නැත.**

iv **මනාවැ (කුසල) නොමනාවැ (අකුසල) කරනලද කර්මයන්ගේ ඵලවිපාක නැත.**

v **මෙලොවක් (-පරලොව සිටින්නහුට) නැත.**

vi **පරලොවක් (-මෙලොව සිටින්නහුට) නැත. (මෙලෙව් පරලෙව් වැසි හැමදෙන ඒ ඒ ලෙව් හි දිම විනාශවී යෙති. ඔවුන්ගේ අනෙක් ලොවකට ගමන් කිරීමෙක් නැතැයි යූෂ්සි.)**

vii මෑණියන් කෙරෙහි මනාලෙස හෝ නොමනා ලෙස පිළිපැදීමෙහි ඵලවිපාක විඳින්නට සිදුවීමෙක් නැත.

viii පියාණන් කෙරෙහිදු මනා-නොමනාලෙස පිළි-පැදීමෙහි ඵලවිපාක විඳින්නට සිදුවීමෙක් නැත.

ix ඔපපාතික සත්වයෝ නැත්තාහ.

x මෙලෙව්හි මනාකොට ගුණධර්මයනට පැමිණුණු මනා පිළිවෙත්හි පිළිපන් මහණබමුණෝ ද නැත්තාහ.

මේ කරුණු දශය මත මිථ්‍යාදෘෂ්ටිය බෙහෙවින් ගොඩනැඟී තිබේ. දිට්ඨිවිපන්නගේ දර්ශනය මේ කරුණු උඩ පහළ වන නමුදු දෘෂ්ටි වශයෙන් දෙසැටක් බවට පුළුල් වී පවතී. තිණ ගහන වන ගහන – පබ්බත ගහනයන් ඉක්මවීම දුෂ්කර වනු මෙන් දිට්ඨිවිපන්න බැසගත් දෘෂ්ටියෙහි බැඳී ඉක්මවා යා නොහී එහිමැ පුන පුනා ඇලෙයි. සැකය හා ප්‍රතිභය ලබාදෙන චෝරකන්තාර – වාළකන්තාර මරුකන්තාර – නිරුදක කන්තාර – දුබ්භික්ඛ කන්තාර යන් මෙන් සාසඞ්ක සප්‍රතිභයෙන් යුක්තව වාසය කෙරේ. නිවැරැදි දර්ශනය සිදුරු කෙරෙමින් විලෝමව ගෙන වැරදි දර්ශනයම පහළකර ගනී. එක් මතයෙක්හි පිහිටන්නට නොහැකිවැ ආත්මය පිළිබඳ විමති පහළ කරනුයේ කාලෙක ශාශ්වත වශයෙන් ද, අන් කාලෙක උච්ඡේද වශයෙන්ද දකී. ස්කන්ධ පඤ්චකය නිත්‍ය – සුභ සුඛ අත්තභාව වශයෙන් පරාමර්ශනය කෙරෙමින් අපාය මාර්ගයෙහි ගමන් කරන්නෙක් වෙයි.

සත්වයෙකුගේ උත්පත්තියට හෝ සංසාර ශුද්ධියට හෙතුවක් නැතැයිද. කුසලා'කුසලයන්ගේ විපාකයක් නැතැයි ද, ප්‍රාණඝාතාදියෙහි හා දානසීලාදියෙහි අකුසල හෝ කුසල වශයෙන් සිදුවන කර්මයක් නැතැයි ද, හෙතු – විපාක – කර්මයන් ප්‍රතික්ෂෙප කරන දිට්ඨිවිපන්න සංසාර වෘත්තයෙහි දැඩිවැ බැඳී සිටින්නෙකි.

නමුදු යම් නැතැත්තෙක් අහෙතුක – අකිරිය – නාස්තික දෘෂ්ටීන්ගෙන යම් අරමුණක මිථ්‍යාසමාතිය පිහිටුවයි ද, සිත එකඟ කරගෙන ජවන් දුවවයිද එහි පළමුවන ජවනය පටන් සත්වන ජවනය දක්වා සතෙකිච්ඡ(–පිළියම් කළහැකි)පුද්ගල-යෙක්වේ. නැවත සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා සසරින් ගැල-වෙන්නට ඉඩඇත. එහෙත් සප්තම ජවනයද මිථ්‍යාදෘෂ්ටි යෙහිම බැඳුනුවහොත් බුදුරජාණන් වහන්සේ විසිනුදු පිළියම් කළ නොහැකි බවට පත්වේ. නියත මිථ්‍යාදෘෂ්ටියට පැමිණි හෙතෙම ස්වර්ගාවරණ – මෝක්ෂාවරණයන්ගෙන් ආවෘතවෙයි. අනතුරු අත්බැව්හි ස්වර්ගාරෝහණයට අභව්‍ය වේ. මෝක්ෂ-ලාභය ගැන කිවයුත්තක් ම නැත. **"වට්ටඛාණුකා, පඨවිගොපකා"** යන නම්වලිනුදු හැඳින්වෙන ඔහුට බොහෝසෙයින් භවයෙන් මිදීමක් නැත්තේය.

## අජ්ඣත්ත සඤ්ඤොජන – බහිද්ධා සංයොජන

සත්වයන් ක්ලේශ – කර්ම විපාක වශයෙන් සංසාර වෘත්තයෙහි බැඳ තබන්නෝ සංයෝජන නම්හ. * සක්කාය-දිට්ඨි – විචිකිච්ඡා – සීලබ්බත පරාමාස – කාම රාග – ව්‍යාපාද රූප රාග – අරූප රාග – මාන – උද්ධච්ච – අවිජ්ජා' යන දසයට මේ නාමය ව්‍යවහාර වේ. මොව්හු සංසාරයෙහි නැවත නැවත සත්වයන් ඉපදවීම් වශයෙන් භවයෙන් භවයට [illegible]. ඉන් බැහැර යන්නට නොහැකි වනසේ භවය හා සම්බන්ධ කොට තබා ගනිති. සංයොජන-යන් අතර සක්කාය දිට්ඨිය ආදිකොට ඇති පඤ්චකය ලොක නිර්මාණයෙහි ඔර නම්වූ පහත් භූමින්සේ ගැනෙන සිව් අපාය, මිනිස්ලොව – සදිව්‍යලොකය. යන එකොළොස් වැදෑරුම් කාමභවයෙහි උත්පත්තිය දනවයි. එබැවින් **"ඔරම්භාගිය"** යනු ඔවුනට නාමාන්තරයෙකි. රූපරාගය ආදිකොට ඇති පඤ්චකය, උද්ධ සඞ්ඛ්‍යාත උඩ භූමින්සේ සැලැකෙන රූපා'රූප වීසති භූමින්හි උත්පත්තිය නිපදවන හෙයින් **'උද්ධම්භාගිය'** නම් වේ. යම් පුද්ගලයෙක්

ඔරම්භාගිය සංයෝජනයන් ප්‍රහීණ නොකෙළේද හේ අජ්ඣත්ත සංයොජන ව්‍යවහාරය ලබයි. "අජ්ඣත්ත" යි කියනු යේ කාමභවයටය එය සත්ත්වයන් ස්වකීයත්වයෙන් පරිහරණය කරන තැනකි.

කල්පය සතර කොටසකට බෙදූකල ඉන් එක් කොටසක් තුළ කාමභවය සත්ත්වාවාසයක් වශයෙන් පවත්නේය. ඉතිරි තුන්කොටසම සත්ත්ව ශූන්‍ය කාලයයි. එබැවින් කාමභවය තුළ සත්ත්වයෝ ස්වල්ප කාලයක් පමණක් වෙසෙති. රූපාරූප භවයන්හි බොහෝ කාලයක් වසත නමුදු කාමභවයෙහි මෙන් චුති ප්‍රතිසන්ධි බහුලව ලැබීමක් නැත. යම් තැනෙක චුති ප්‍රතිසන්ධි බහුල වේද, එතැන ආලයද ප්‍රාර්ථනාද අභිලාෂාද අ ධි ක ය. කාමභවය ස්වකීයත්වයෙන් සැලකෙනු යේ එබැවිනි.

**බහිද්ධා සංයොජන:-** බහිද්ධා යි කියනුයේ රූපා'රූප භවයනටය. එහි චුති ප්‍රතිසන්ධීන් ස්වල්පව ලැබෙන හෙයින් තමාගේ යැ යි සැලකෙන ප්‍රාර්ථනාවලින් බාහිරය. නැතහොත් ස්වල්ප ප්‍රාර්ථනා ඇත්තේය. එම භූමීන් හි ඉපදීම් මැරීම් වශයෙන් රූපරාගාදි සංයොජන පඤ්චක-යෙන් බැඳී පවත්නා පුද්ගලයා බහිද්ධා සංයොජන නමි. බහල ක්ලෙශමලයෙන් බැඳුණු ලෞකික මහජනයා යථොක්ත සංයොජන දශයෙන් ම බැඳුණවුන් හෙයින් මේ පුද්ගලභෙදය ඔවුන් අතරෙහි නොලැබේ. **විවටනිශ්‍රිත නොවූ දෙපසිද්දෙකින් පිරිසිඳුනා භවොත්පත්තියක් ඇති සොතාපන්න - සකෘදාගාමි - අනාගාමි ආර්යයෝ මෙහි සංග්‍රහ වෙත්.** මග වන ගහනයෙක හටගත් කිහිරිවන - සාලවනාදිය නිසුණු වැ පොරෝ ආදියෙන් මනාකොට කපා කොටා සැසගත් කල්හි කණු - යටලි පරාල ආදී නාමාන්තර ප්‍රාප්තවනු මෙනි. පූර්වොක්ත සංයොජන දශයෙන් සමන්විත ක්ලෙශ කාලුෂ්‍යයෙන් දූෂිත පෘථග්ජනයෝ කිහිරිවනසාලවනයන් වැනියහ. ගෘහකාර්‍ය්‍යා-දියට යොග්‍යසේ කම්සුම කොටගත් කණු පරාලාදිය වැනි සොතාපන්නාදීහු ම මෙයට ඇතුළත් වෙති. ඔහු

කෙලෙස්මල තුනීකොට පිරිසිදුණු උත්පත්තිභව ඇත්තාහු, විශෙෂ තත්ත්වයක පිහිටියාහුය. පහත දැක්වෙන **'වසුසාලා' උපමාවෙන්** මේ බව මැනවින් හෙළිපෙහෙළි වැ පැහැදිලි වේයි. වසුසාලාවක ඇතුළත කණු සිටුවා කඹවලින් වස්සන් බඳිති. කඹ ප්‍රමාණ නොවන කල්හි කණින් අල්වා එහි ප්‍රවෙශ කොරෙති. යම්හෙයකින් මේ දෙඅයුරින්ම ඇතුල් කරන්නට නොහැකිව වස්සෝ ඉතිරි වැ සිටිත් නම් සාලාවෙන් පිටත කණු සිටුවා බැඳීම කිරිති. ඔවුනතුරෙන් ඇතැම් වස්සෙක් ඇතුළත බඳනාලදු යේ එහිම හොවී. ඇතැමෙක් උෂ්ණයෙන් පීඩිතවැ ශාලාවෙන් පිටට අවුත් සයනය කොරෙයි. පිටත බඳනා ලද්දවුන් අතුරෙනුදු ඇතැම් හු එහිම සයනය කරන අතර සීතයෙන් පීඩිත වැ ඇතුළතට ගොස් හොවින්නෝද වෙති. මෙසේ වසුසාලායෙහි සයනය කරන්නවුන්ගේ ආකාරය චතුර්විධ වේ. කාමරූප අරූප සඞ්ඛ්‍යාත ත්‍රිවිධ භවය වසු හලක් වැන්න. අවිද්‍යාව වස්සන් බඳනා කණු මෙනි. දස සංයොජන කඹ වැන්න. තුන් භවයෙහි උපන් සත්ත්වයෝ වස්සන් වැනියහ. ඇතුළත බැඳි එහිම සයනය කරන්නවුන් වැන්න, කාමාවචර ලෙව්හි සොතාපන්න සකෘදගාමි ආයඪියෝ ඔවුන්ගේ සංයොජන ද කාමාවචර ප්‍රතිබද්ධය. විසීමද කාමලොකයෙහි මැයි. ඇතුළත බැඳුණ නමුදු පිටත සයනය කරන්නවුන් මෙන් කාමාවචර සංයොජනයන් අප්‍රහීණ වූ නමුත් රූපා'රූප භවයන්හි වසන සොතාපන්න සකෘදගාමි ආයඪියෝ දතයුත්තාහ. ධ්‍යාන බලයෙන් එහි උපත ලදුවද සංයොජන සම්බන්ධය අවිච්ඡින්න වැ පවතී. රූපා'රූප භව නිබද්ධ සංයොජන සංයුක්ත අනාගාමී ආයඪියෝ පිටත බඳනා ලදුව ඇතුළත සයනය කරන්නවුන් මෙන් කාමාවචර භවයෙහි වෙසෙත්. උත්පත්ති වශයෙන් සප්තකාම සවර්ගයෙහි වෙසෙන නමුදු තද්ප්‍රතිබද්ධ සංයොජන ඔවුන් කෙරෙහි අවිද්‍යමානය. පිටත බැඳී පිටතම සයනය කරන්නවුන් මෙනි, රූපා'රූප භවයන්හි වෙසෙන අනාගාමී ආයඪියෝ. ඔවුන්ගේ සංයොජනයෝද තද්ප්‍රති-බද්ධයහ. උත්පත්ති වශයෙන් විසීමද එහිමැයි.

යොත් ප්‍රමාණ නොවන කල හික්මුණු වස්සන් කණින් අල්වා ඇතුළත ද පිටත ද හොවින්නවුන් අනරට ලූකල දවසක් වුවද එසේ සිටීම ඔවුන්ගේ සිරිතය. නොබැඳ සිටියදී පිටත නොගොස් සිටින එම වස්සන් මෙන් කාමාවචර භවයෙහි හා රූපා'රූප භවයන්හි වෙසෙන ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා සංයොජනයන්ගෙන් අබද්ධ වැ වැඩ සිටින බව දතයුතුය. සත්ව සන්තානගත සක්කාය දිට්ඨි - විචිකිච්ඡා සීලබ්බත පරාමාස සංයොජනයෝ උපරිභවගාමී සත්වයන් ඉන් වළක්වති. යම්හෙයකින් ගියේවී නමුදු එහි ආයුස ගෙවෙනු සමග මැ ගලනා ලද බිලිය ඇති මසුන් මෙන්ද දික්හුයකින් බඳනාලද පක්ෂීන් මෙන්ද, පෙරළා කාමභවයට ම ගෙනඑත්. අජ්ඣත්ත සංයොජනයනට අයත් කාමච්ඡන්ද - ව්‍යාපාදද්වය සමවනින් යටපත් නොකොට හෝ මාර්ගයෙන් සමුච්ඡෙද ප්‍රහාණය නොකොට හෝ රූපා'රූප භවයන්හි උපදින්නට නොහැකි බව මෙහිලා විශෙෂයෙන් දතයුතුය.

නවද ධ්‍යාන බලයෙන් නවබ්‍රහ්ම ලොකයන්හි උත්පත්තිය ලබන පෘථග්ජනයෝ ආයු සොළවර එහි මැ හෝ ඉන්මතු බඹලොවෙ කැ හෝ පහත ලොවෙ කැ යෝ උපදිති. එහි උපදනා ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ වූකලී එහි මැ හෝ මතුලොවක උපත ලබනුමුත් පහත ලොවකට කිසාලෙකත් උත්පත්ති වශයෙන් නොපැමිණෙති. පඤ්ච සුද්ධාවාසයන්හි හා සිවු අරූතලයන්හි වසන ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ ක්ලෙශ පරික්ෂීණය තෙක් පළමු උපන් බඹලෙව්හි මැ හෝ මතුලොවෙ කැ හෝ උපත ලබත්. ප්‍රථම ධ්‍යාන භූමියෙහි උපන් අනාගාමී වනාහී අනුක්‍රමයෙන් නව බඹ ලෙව්හි මැ වැස පිරිනිවේ. වෙහප්ඵල - අකණිට්ඨ - නෙවසඤ්ඤා නාසඤ්ඤා යනාා යන තුන් තන්හි උපන් අනාගාමිහු එහි මැ පිරිනිවෙනු මිස උඩට හෝ පහතට උත්පත්ති වශයෙන් ගමන් නොකෙරෙත්. එබැවින් එම ස්ථානත්‍රය ශ්‍රෙෂ්ඨභව නමැයි කියැවේ.

## අක්කොධන - අනුපනාහි

ක්‍රොධය පහළවීමට හෙතුවක් ඇති කල්හි එහි ආදීනව මෙනෙහිකොට නුවණින් සලකා නොකිපෙන්නේ අක්කොධනය. ක්‍රොධයක් පහළවුවද, නැවත නැවත සිත්හි ආරොපණය නොකොට මැඩලනු යේ අනුපනාහිය අක්කොධන තරඟයෙන් සිත දූෂ්‍යකර ගන්නෙක් නොවේ. ප්‍රශාන්ත-තත්ත්වය හැරදමා අරමුණෙහි ගැටීමෙන් පුන - පුනා විරොධය නොපහළකරයි. චණ්ඩවැ හැසිරෙන තද පැවැත්ම කුදු නැත්තේය. ක්‍රොධ සමඞ්ගී සම්පූර්ණ අදහසක් ප්‍රකාශ කරන්නට අසමර්ථය.* ක්‍රොධයෙන් දිලිහී ඉක්මන් වීමෙන් වචන උච්චාරණය පැහැදිලි නොවේ. අක්කොධන කරුණා මෛත්‍රී සහගත ලයාන්විත වදන් බෙණෙනුයේ ඉක්මන් නොවැ තමාගේ සම්පූර්ණ අදහස අන්‍යයන්තුළ පිහිටවන්-නට සමර්ථය. සියලු ඉරියව්වෙහිදී ම අන්සත්නට මෙත් පතුරුවමින් වසන මෙතෙම සන්තොෂයෙන් ජීවිතය ගෙවන්නෙකි.

**අනුපනාහි** ප්‍රමාද විහරණයකින් හටගත් ක්‍රොධය බැඳතබා නොගෙන වහා දුරලයි. නොඑසේවුව එය සිමාකොටගෙන ඊට සම්බන්ධ වන සේ ක්‍රොධය උපදවා තහවුරු නොකරයි. ඔහු සිත්තුළ දිලිසෙන ගිනි පෙනෙල්ලක් මෙන් ක්‍රොධ අරමුණ හා නැවත නැවත ගැටෙන තත්ත්වයක් පහළ නොවේ.

අක්කොධන - අනුපනාහි පුද්ගලයන් දෙදෙනා පහත දැක්වෙන කරුණු පස උපයොගී කර ගැනීමෙන් ආඝාතය දුරුකරත්.

i ආඝාතය උපදින පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය වැඩීම
ii ,, ,, ,, ,, කරුණාව ,,
iii ,, ,, ,, ,, උපෙක්ෂාව ,,
vi ආඝාත වස්තුක පුද්ගලයා නොසිහි නොමෙනෙහි කිරීම
v කර්ම ස්වකීය කොට වෙසෙන බව ඉටා ගැනීම

යන මෝහය. මේ කරුණු අතුරින් එකක් නමුදු පහළ වැ පවත්නා චිත්ත සන්තානයෙන් ප්‍රමාදයෙකින් හෝ හටගත් වෛරය දුරින් ම දුරු වැ යනු එකාන්තය. බොහෝ සෙසින් ක්‍රොධය පහළ වනුයේ ඇසුරු කරන්නවුන් තුළ පවත්නා වරද දක්මෙනි. එසේ පහළ වන වෛරය දුරුකර ගන්නා ආකාරය **ධම්මසෙනෙවි ශ්‍රී ශාරිපුත්‍ර හිමියන්** විසින් මෙසේ දෙශිතය.

"යම් පුද්ගලයෙකු තුළ කායික දුශ්චරිත දක්නා ලැබෙන නමුදු වාක් දුශ්චරිත නොමැ පෙනේ නම් එම වරද නිමිතිකොට හටගන්නා ද්වේෂය, පංශුකූලිකයකු වීථියෙහි දුටු සිඳී බිඳී ගිය රෙදි කැබැල්ලක් වම් පයින් පාගා දකුණු පයින් දිගහැර පාවිච්චිකළ හැකි ප්‍රදෙශය ඉරාගෙන ගෙනැ යන්නාක්මෙන්, අපිරිසිදු කාය කර්මය නොසිතිකොට පිරිසිදු වාක් සුචරිතය මෙනෙහිකොට ඔහු කෙරෙහි ඇතිවන ආඝාතය දුරුකටයුතුය.

යම් පුද්ගලයකු තුළ වාක් සමාචාරය අපිරිසිදු නමුත් කාය සමාචාරය පිරිසිදු නම්, ඔහුගේ වාක් අසංවරය නිමිතින් හටගන්නා ක්‍රොධය, ගමනින් ක්ලාන්ත වී ග්‍රීෂ්මයෙන් තැවී පිපාසයෙන් පෙළී වතුර බොනු කැමැති පුරුෂයකු දියසෙවලින් වැසීගිය පොකුණක් වෙත ගොස් දෙඅතින් දියසෙවල පහකොට දෙතින් දිය පානයකොට යන්නාක් මෙන්, ඔහුගේ අපිරිසිදු වාක් සමාචාරය නොසිහි කොට කාය සමාචාරයෙහි පරිශුද්ධත්වයම සිතා ඒ පුද්ගලයා කෙරෙහි පහළබන වෛරය හැරදැමිය යුතුය.

යම් පුද්ගලයකු තුළ කාය - වාක් සමාචාරයන් අපිරිසිදු නමුත් කලින් කල සමථ විදශීනා සිතට ඉඩකඩ සැලසේද, රත්නත්‍රය විෂයෙහි ප්‍රසාදය පහළ වේද, ඔහුගේ දුශ්ශීලකම් නිමිතිකොට හටගන්නා ක්‍රොධය, ග්‍රීෂ්මයෙන් තැවී පිපාසයෙන් පෙළෙන්නෙක් ගව පියවරක වතුර

ස්වල්පයක් දූක ඇඳිල්ලෙන් බොන්නෙම් නම් හෝ භාජනයකින් සොලවන්නෙම් නම් හෝ වෙනලෙසකින් ගන්නට ගොස් කලඹන්නෙම් නම් හෝ එය පානය කළ නොහැක්කක් බවට පත්වෙතියි සිතා දෙදන දෙයතින් බිම පිහිටා චතුගුණ්ඩිකව ගොනෙකු මෙන් මුඛයෙන් ජලය ඇදගනිමින් බී පිපාසය සංසිඳවා ගෙන යන්නේ යම්සේද එමෙන්, යථොක්ත පුද්ගලයාගේ අපිරිසිදු කායවචී සමාචාරයන් නිමිතින් පහළවන ආඝාතය නොසිහි කොට කලින් කල ධර්මශ්‍රවණය කිරීමෙන් සිතෙහි සමථවිදර්ශනා සඞ්ඛ්‍යාත ප්‍රීති ප්‍රමෝදයක් ලබයිද එද පමණැයි එයම මෙනෙහිකොට වෛරය නිවාගත යුතුය.

යම් පුද්ගලයෙක් කායවාක් සමාචාරය අපිරිසිදුවනුයේ කලින් කලවත් සමථ විදර්ශනාවලට සිතේ ඉඩදීමක් හෝ රත්නත්‍රයකෙරෙහි ප්‍රසාදයක් හෝ නොපහළ කෙරේද, ඔහුගේ දුර්වලකම් හෙතුවින් හටගත් ක්‍රොධය, දූඩි ගිලන් කමින් දුඃඛිත වැ මහට පිළිපන් තැනැත්තකු ඉදිරි පසු දෙපසින් දුරුවැ පිහිටි ගම් ඇතිවැ ලෙඩට සත්ප්‍රාය භොජන බෙහෙත් ආදිය හෝ උපස්ථායකයෙකු හෝ නොලැබ අනාථවැ සිටිනු දුටු මාර්ගික අනෙක් පුරුෂයෙක් යථොක්ත ගිලනාට භොජනාදිය ලැබේවා යි කරුණාව උපදවනු මෙන්, මේ ආඝාත වස්තුක පුරුෂයා කාය වාක් මනො සුචරිතයන් පුරන්නේ නම් මැනව. මරණින් මතු අපායගාමී නොවන්නේ නම් යහපතැ යි ඔහු කෙරෙහි දයාව අනුකම්පාව හා මෛත්‍රිය පහළකොට උපන් ආඝාතය ඝාතනය කටයුතුය. යම් පුද්ගලයෙක් කායවචී සුචරිතයන් පුරනුයේ කලින්කල චිත්තෛකාග්‍රතාවටද පැමිණෙනුයේ සැදූහැයෙන් ප්‍රසන්නවැ වෙසේ ද, ඔහු කෙරෙහි ප්‍රමාදයෙකින් හෝ හටගත් ක්‍රොධය, ග්‍රීෂ්මයෙන් තැවී පිපාසාකුලවූවකු ප්‍රසන්න මධුර සිතිල් ජලයෙන් පිරුණු මනාතීර්ථ ඇති පොකුණකට බැස ඇනිතෙක් නහා පානයකොට ඉන් ගොඩවී රුක්සෙවනක

හිඳ හෝ නිදා කැමැති සේ වෙහෙස දුරුකොටගෙන ගමන් කරන්නාක් මෙන්, යථොක්ත පුද්ගලයා කෙරෙහි වූ කාය වාක් සුචරිතයන්ද සමාධිය හා ශ්‍රද්ධාව ද මෙනෙහි කොට ඔහු නිසා උපන් ක්‍රොධය හළයුතුය.”

මෙම උපදෙශාශ්‍රයෙන් නුවණ මෙහෙයවා උපදින ක්‍රොධය නූපදවන්නටත්, උපන් ක්‍රොධය හැර දමන්නටත් වියයි වැඩීම උභය ලොකාභිවෘද්ධියට හිතකර වේ.

### අමක්ඛි – අපලාසි:-

අනුන්ගේ ගුණයන් මැකීම් සඞ්ඛ්‍යාත දුර්ගුණයෙන් දුරීභූත වූයේ අමක්ඛී නම්. අනුන් හා තමන් හා සමකිරීම් සඞ්ඛ්‍යාත විවාද මූලික යුගග්‍රාහය දුරුකෙළේ අපලාසී නම්. අමක්ඛි අනුන්ගේ ගුණ පවසන්නට රිසි එය පිළිගන්නටද නොකැමැති නැති. පරගුණයන්ගේ විනාශය බලාපොරොත්තු නොවන ශ්‍රෙෂ්ඨපුද්ගලයෙකි. පරමාණුප්‍රමාණ අන් ගුණයන් පර්වත ප්‍රමාණ කරමින් පවසන්නට ලොභීද නොවන්නෙකි. අන් ගුණයන් උස්හඬින් පවසනු තමා අයත් යුතුකමක් සේම එය ගුණවගාවට දෙන මහත් රුකුලකැයි සිතයි. එබැවින් අන්ගුණයන් වසා තම ගුණය මතුකරන්නට ඉදිරිපත් නොවේ. අමක්ඛී පුද්ගලයා සාමය – සතුට සහයොගය නමැති දියදහර ජනසමාජ ආලවාලයෙහි උතවා නරනාරී වෘක්ෂලතාවන්හි සැප සම්පත් නමැති ඵලපුෂ්පයන් ගන්වන්නෙකැයි කිව යුතුය.

**අපලාසි** වාද විවාදයනට ගොදුරු වන පැවතුම් වලින් දුරුව වෙසෙයි. අන්ගුණයන් හා තම ගුණයන් සමීකරණයට වැර නොදරයි. තමහට වඩා ගුණාධිකයා හා ගුණහීනයාත් ඒ ඒ ලෙසින් ම පිළිගනු විනා ගුණාධිකයා තමා හා සසඳන්නටත් ගුණහීනයා පහත්සේ සිතන්නටත්, නොපෙළඹෙයි. තමාගත් මතයෙහි මැ නරවැ පිහිටා එයම සත්‍යසේ ගෙන අන්‍යයන්ගේ සකාරණ

හෙතුදාහරණ සහිත කථොපකථනයන් නොපිළිගෙන විවාදයට නොඑළඹේ. මෙතෙම ජනසමාජය සංසුන්ව විග්‍රහ විවාදාදියෙන් උත්තේජිත නොවී පවත්වන්නට රුකුල් දෙන සාමකාමී පුද්ගලයෙකි.

### අනිස්සුකී - අමච්ඡරී:-

මෙරමා සැපත් ලාභ සත්කාරාදියෙහි ඊර්ෂ්‍යා රහිතවැ ඉවසනසුළු ස්වභාව ඇතියේ අනිස්සුකිය. තම සම්පත් අනුන්ගෙන් වසන් නොකරන ගති ඇතියේ අමච්ඡරිය.

**අනිස්සුකී** අන්‍යයන්ගේ සැපසම්පත් දැක්මෙන් සතුටු වන්නෙකි. හැමදෙන මැ ධනධාන්‍යාදී භවභොග සම්පත් ඇතිව ප්‍රීතියෙන් සිටිනු දැක්ම ප්‍රාර්ථනා කරයි. නොහැකුලුණු ඇසින් හා අන්දෙසෙක නොහැරුණු මුහුණින් යුතුව අන් සැපත් දක්නට තරම් මහාත්ම ගතියෙන් සමන්විතය. මෙරමා ලාභ කීර්තිප්‍රශංසාදිය යහගුණදහමින් හෙබියනට ඉඝාත්ම විපාක වශයෙන් ලැබෙන්නකැ යි සලකා සැනසෙන්නටත්, තමාගේ සැපසම්පත් හා අන් සැපත් අවිශෙෂයෙන් දක්නටත්, රිසි ඇතියේ ද වෙයි. එසේම,

**“ඉස්සානලසිඛායෙසං - හදයෙ ජලතිව තෙ**
**නෙව විඳන්ති පාමොජ්ජං - සම්බුද්ධාදිහි සෙවිතං”යි**

දැක්වෙන ඊර්ෂ්‍යාවෙහි දෝෂයන් සමරණය කොරෙමින් සන්තොෂයෙන් වෙසේ.

**අමච්ඡරී** තමාගේ සම්පත් මෙරමා නොදකිවා යි වසාලන අභිප්‍රායක් නැත්තේය. අන්‍යයන් තම සම්පත් දැක තමා මෙන් සම්පත් සාධාගන්නට යත්න කරනු දැක්ම රිසිවෙයි. අන්‍යයන් තමන් හා ධන ධාන්‍යාදියෙන් සමවෙති යි සිතා භීතිය පහළ කරන අසාධාරණ හැඟීමත්, ඉන් හටගන්නා සිතේ හැකිළීමත් නොමසුරු තැනැත්තේ පහළ නොකෙරේ. තමාගේ යසඉසුරු සාධාරණ පරිභොග-යෙන් අනුන් හා භුක්ති විඳීම මේ පුද්ගලයා තුළ දක්නා ලැබෙන විශෙෂ ගුණයෙකි.

### අශඨ - අමායාවී:-

තමා තුළ විද්‍යමාන ගුණයක් මුත් නැති ගුණ නොදක්වනු යේ අශඨ්‍යය. වඤ්චා සහගත පැවැතුම් නැතියේ අමායාවීය. **අශඨ** පුද්ගලයා තමන්වෙත නැති ගුණයන් පවසනු තබා ඇති ගුණයන් ද දක්වන්නට කැමැති නොවන්නෙකි. ඔහුගේ ගතිගුණ අගුප්තය. සැමදෙනා විසින් දතහැකිසේ පැහැදිලිය. ආශ්‍රිතයන් ද ගුණවතුන් කිරීමට ප්‍රමාණ සමාජප්‍රිය පුද්ගලත්වයක් ඔහුට ඇත. තමා කෙරෙහි නැති ගුණයන් පෙන්වන නැනැත්තේ සමාජය විසින් පිළිකුල් කරනු ලබයි. පිපුම් දණ්ඩක හටගත් කටු එහි ස්පර්ශය වළකනු මෙන් අන්‍යයන්ගේ ආශ්‍රයෙන් ඈත්වන්නට සිදුවේ. කෛරාටික නොවනු යේ සැමදෙන විසින් ආදරයෙන් ඇසුරු කරනු ලබයි. මෙ සසුන් හි ඇති ගුණයන් පවා අන්‍යට දැනගන්නට ලැබෙන සේ හැසිරීම හෝ පැවැසීම, ගුණයෙන් පිරිහෙන්නට හෙතුවන හෙයින් අසඨ පුද්ගලයෙකුවීම දුෂ්කරය. එය උදාර චරිත ඇත්තන් විසින් පරිචිතවූද සථිර සාර ගුණ ඇත්තන් විසින් පැවැත්ත හැකිවූ ද මහ ඇඟි ගුණයෙකි.

**අමායාවී** නැනැත්තේ දුර්ලභ ගුණයක් රකින්නෙකැයි කිවයුතුය. බොහෝදෙනා දුශ්චරිතයන් වසා ගැනීම සඳහා මායාව උපයොගි කරගන්නා අතර ඉන් බාහිර වැ වෙසෙන මෙතෙම සැබවින් ම ගුණවතෙකි. දුශ්චරිතයන් වසාගෙන සත්පුරුෂයකු සේ පෙනී සිටීමට යත්න දැරීමක් මොහු කෙරෙහි නැත. මායාකාරයා සමාජය අනතුරට හෙළා තම අදහස් මස්තක ප්‍රාප්ත කරගන්නට වැරදරනු යේ ආශ්‍රිතයන් සැක සහිත ඇසින් බලනු ලබයි. එහෙත් අමායාවී විවෘත පැහැදිලිව දක්නා ගති පැවැතුම් ඇති හෙයින් කවුරුන් විසිනුත් භජනය කළහැකි නැනැත්තෙකි.

### හිරිමා - ඔත්තප්පී:—

පාපයට පිළිකුල් කිරීමද, පාපකාමීයන් රුස්කිරීමට ලජ්ජා ස්වභාවයෙන් යුක්තවීම ද ලක්ෂණකොට ඇති පුද්ගලයා හිරිමා නම් වේ. සමාජයෙන් ලැබෙන

නිසා ගර්හාදියෙන් භයට පැමිණ පව්කම් නොකරන්නේ ඔත්තප්පි නම් වෙයි. හිරිය (-ලජ්ජාව) මනුෂ්‍යයෙකු තුළ පිහිටිය යුතු ප්‍රධාන ගුණාඞ්ගයෙකි. මනුෂ්‍යයා තිරිසන් ගත සතුනට වඩා ශිෂ්ටයෙකු වීමට හිරිය විසින් සලසන සේවය ඉමහත්. එහි සත්‍යය වැටහෙනුයේ ලජ්ජාව සිත්හි නැති නැනැත්තාට කරන්නට නොහැකි දුශ්චරිතයක් නැති හෙයිනි. ලෝකය පාලනය වනුයේ ආණ්ඩුවක නීති රීති පද්ධතිය නිසාම නොව හිරිඔත්තප්ප ගුණයන්ගේ බලපෑම සම්මත නීතිරීතිනටද වඩා ජනසමාජය ශික්ෂිත කරන්නට සමත් හෙයිනි. එබැවින් ලෝකය පාලනය කරන ස්වාභාවික බලවේගය වනුයේ හිරිඔතප්පය. යම්හෙයකින් මේ ධර්මයෝ ලොව පාලනය නොකෙරෙද්ද මව, කිරිය, සොහොයුරිය ආදී භේදයනට ලෝවැස්සා නොපැමිණෙයි. එළු තෝර කුකුල් හූරු බලු කැනහිල් සතුන් මෙන් සම්භේද භේදයක් නොසලකා හැසිරෙන්නට සැරසේ. එහෙයින් තිරිසන් ලොව හා මිනිස්ලොව වෙන් කරන සමාජ ගුණය හිරිඔතප්පය. ස්වකිය බහුශ්‍රැතභාවය ගුණසම්පත්තිය ආදීන් සිහිකොට නොකටයුතුදේ කිරීම නොහොබනේයයි සිතා හිරිය පහළ වැ පාපකර්මයන්ගෙන් වැළකීම සිදුවේ. තමන් ගැනම මෙනෙහි කිරීමෙන් අකුසල කර්මයන් හැරදමා කුසල් වවන්නටත්, සාවද්‍ය දූෂ දුරුකොට නිරවද්‍යය බවන්නටත්, පිරිසිදු ආත්මභාවයක් පරිහරණය කරන්නටත් හිරිය උපයෝගී වේ. තවද හිරිමත් පුද්ගලයා තමහට වඩා සැලකිය යුතු - ගරුකටයුතු පුද්ගලයන් පුදන්නෙකි. ඔවුන්ගේ අවවාද අනුශාසනා ලබමින් ජීවත් වන්නට යත්න දරන්නෙකි. ඔවුන්ගේ හොඳහිත බලාපොරොත්තු වෙන් හැමවිටම පව්කම් දුරලන යහපත් කෙනෙකැ යි දත යුත්තේය.

ඔත්තප්පි සමාජයෙන් නින්‍දා ගර්හා ලැබෙති යි කියෙන් පාපයෙන් වැළකී හොඳ ගතිගුණ දියුණු කරයි. පරලොවින් වන දුර්ගති භයද පාපකාරී නොවන්නට හෙතුවක් සේ සලකයි. තවද පරසිත් දන්නා – දිව ඇස ඇති සෘද්ධිමතුන් තමාගේ ලාමක පාපක්‍රියාවන් දැනගතිති යි කියෙනුදු යහගුණ පුරුදු කරයි. හිරිමා – ඔත්තප්පි පුද්ගලයන් දෙදෙනාගේ සිතුම් පැතුම් හා ගති පැවැතුම් එක්බඳු වුවද, වෙනසෙක් වනුයේ යහගුණයන් පහළකර ගන්නට ඔවුන් අනුගමනය කරන අරමුණෙන් පමණි. හිරිමත් තැනැත්තේ තමා ගැනමැ මෙනෙහිකොට හිරිය පහළ කැරගෙන පවින් දුරු වේ. ඔත්තප්පි ලෝවැස්සා ශාක්ෂිකොට තබා භය පහළ කැරගෙන පාපයෙන් වැළකෙයි.

**සුවච – කල්‍යාණමිත්තතා:-**

සුවසේ අවවාද අනුශාසනා කළහැකි මනා පැවැතුම් වලින් හෙබියේ සුවචය. දෙලොවට වැඩදායක කුසල ධර්මයන්හි නිරත යහපත් මිත්‍රයන් ඇතියේ කල්‍යාණමිත්තතාය. සුවච පුද්ගලයා සකාරණව පවසන අවවාදයට අවනත වේ. බුද්ධප්‍රඥප්තිය දක්වමින් එහි ශික්ෂිය යුතුබව ප්‍රකාශ කරන කල්හි ඇලිමැලිකම් නොදක්වා බසක් නොදොඩා අනුශාසනය පිළිගනී. නොඉවසිලිමත්ව කර්කශ පරුෂ වචනයෙන් කරන අවවාදයක් වුවද මුවෙන් නොබැණ අකැමැත්තක් නොදක්වා ඉවසිල්ලෙන් විමසිලිකොට භාර-ගන්නට රිසිවේ. ලොක සම්මත නීතිරීතිනට යටත්ව විසීම ශිෂ්ට මිනිසෙකුගේ යුතුකමයැ යි සලකයි. මනුෂ්‍ය ධර්මය හෝ එයට අධික ගුණධර්මාදියක් හෝ රැකෙනුයේ වැඩිහිටියන්ගේ ආප්තොපදෙශානු ගමනයෙනි. ඔවුන්ගේ වචනානුසාරයෙන් ගති පැවැතුම් පිළියෙල කැරගැනීමෙන් තමාගේ අභිවෘද්ධිය සැලසෙන බව සුවච පුද්ගලයා පිළිගනී. එබැවින් අනෙකකුගේ කාරුණික අවවාදයට පිළිකුල් බවක් හෝ විරුද්ධ බවක් නොදක්වයි. මෙකල බොහෝ අය අවවාදයෙහි පිහිටීම තබා එය ලබන්නට ද කැමැති නොවෙත්. එහෙයින් දුකසේ ඔවා දෙන්නට සිදුවේ. තෙත් සිත් හා

කත් යොමා අවවාදක්ෂම වන්නට උනන්දුවක් නැතිකම එයට හෙතුවය. සුවච පුද්ගලයා ඔබ වැන්නවුන් අවවාද නොකරන කල්හි අන්කවුරු අවවාද කෙරෙද්දැයි අවවාද දයකයන් පොලඹවමින් බලවත් කැමැත්තෙන් අවවාද අනුශාසනා ලබන්නට ම සුහුසුළු වේ. කීකරු නම්ත් හැඳින්වෙනු යේ සුවච යාමය. **"කුම් කොරෙම්දැ යි සිළිවිෂ කරත්"** ඔහුගේ ගතිය යි. සුවච ගුණය උභය ලොකාභිවෘද්ධිය සාද ගැනීමට උපයොගීවන උතුම් පැවැත්මෙකැයි දතයුතුය.

**කල්‍යාණ මිත්‍රතා** යම් පුද්ගලයෙක් සැදැහැවත්ද සීලසම්පන්න ද බොහෝ ඇසූ පිරූ තැන් ඇතියේ ද ත්‍යාග ගුණයෙන් හා ප්‍රඥාසම්පත්තියෙන් සමන්විතද හෙතෙම කල්‍යාණ පැවැතුම් ඇත්තෙකි. එම ගතිගුණයන්ගෙන් හෙබි උත්තමයන් සෙවනය කිරීම ඔවුන් කෙරෙහි නැමීම. හා භක්තිමත් වීමද කල්‍යාණ මිත්‍ර පුද්ගලයාගේ ලක්ෂණය යි. ආශ්‍රිතයන් අහිත දෙසින් මුදවා හිත දෙයෙහි යෙදවීම කල්‍යාණ මිත්‍රයෙකුගේ ගතියකි. කල්‍යාණ මිත්‍රයෙකු නැති ජීවිතය සාක්ෂියක් නැති මරණයක් වැන්නැ යි ලොක සම්මතය. සියලු දෙව් මිනිසුන්ගේ අසහාය කල්‍යාණ මිත්‍රයා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේගේ සදුපදෙශාශ්‍රයෙන් සියළු සත්ත්වයෝ ජාත්‍යාදි සංසාර දුඃඛයෙන් මුක්ත වැ සදකාලික සුවය ලබා සැනැසෙති. **"මමංහි වො ආනන්ද කල්‍යාණ මිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති"**යි දැක්වෙන දෙශනා පාඨයෙන් ඒ බව සුව්‍යක්තය. කල්‍යාණ මිත්‍රයා තමා පිළිගත් යහමගෙහි යෙමින් ස්වීය මනොරථපූරණය කරගනු පමණක් නොව, තමාගේ වචනයෙහි පිහිටා ක්‍රියාකරන්නවුනුත් මහදභිවෘද්ධියට පත්කැරලයි. බුදුරජාණන් වහන්සේත්, ශාරීපුත්‍රාදී මහා ශ්‍රාවකයන් වහන්සේලාත්, කල්‍යාණ මිත්‍රත්වයෙන්ගෙන සුරා'සුර නරොරග බ්‍රහ්මාදී අප්‍රමාණ සත්ත්වයෝ ආශ්‍රවක්ෂය

කළහ. ඇසුරු කරන්නාගේ ගතිපැවැතුම් ආශ්‍රිතයාටද පුරුදුවීම ලොකස්වභාවය හෙයින් දෙලෝවැඩ කැමැත්තවුන් කල්‍යාණ මිත්‍රයන් ම ඇසුරු කළ යුතුය. එක් වරක් වුව ද කලණ ඇසුරක් ලදුයේ ආත්මය රැකා දෙන්නේය. චිරකලක්තුළ නොයෙක්වර ලද අකලණන්ගේ ඇසුර ආත්ම විනාශයම සලසන්නේය. තවද සුවච බව හා කල්‍යාණ මිත්‍රත්වය පුද්ගලයා සනාථයෙකු බවට පෙරළන ධර්මයෙකැයි බුද්ධ දෙශනායෙහි දක්වෙයි. බොහෝ ඤාතිමිත්‍රයන් සහිතව ජීවිතය පවත්වන්නා නාථයෙකි. පිහිට ඇති පුද්ගලයෙකි. යථොක්ත ශ්‍රෙෂ්ඨ ගුණයන්ගෙන් යුක්ත තැනැත්තේ ද හැම අතින් ම එළඹෙන රුදුරු උවදුරු දුරු කරන්නෙකි.

## ඉන්ද්‍රියෙසු ගුත්තද්වාර – භොජනෙ මත්තඤ්ඤු

ආරම්මණයක් ඉන්ද්‍රිය ගොචර වූ කල්හි තණ්හා දිට්ඨි මානාදියට සිත් සතන්තුළට ප්‍රවෙශවිය නොදී රක්නේ ගුත්තද්වාරය. ආහාර සෙවීමෙහිදු, පිළිගැන්මෙහිදු පරිභොගයෙහිදු, සුදුසු පමණ දැන ක්‍රියාකරනුයේ මාත්‍රඥය. රූප ශබ්දාදී ආරම්මණයන් දර්ශන ශ්‍රවණාදිය කිරීමෙහි අධිපතිත්වය කරන චක්ඛු විඤ්ඤාණ – සොතවිඤ්ඤාණාදිය ඉන්ද්‍රියත්වයෙන් ගැනේ. චක්ෂුරාදී ෂඩින්ද්‍රියයන්ගෙන් කොතරම් අරමුණු පැමිණියද සිහි එළවාගෙන ඒ ඒ ආරම්මණයන් සුදුසු පරිද්දෙන් හැඳින ගැනීම ගුප්තද්වාර පුද්ගලයාගේ ලක්ෂණය යි. ආරම්මණය යථාතත්වයෙන් හඳුනා ගැනීමට නුවණ මෙහෙයා ආගමානුකූල වැ සිතන්නට පුරුදුවිය යුතුය. අරමුණ ඉන්ද්‍රිය ගොචර වූ කල්හි සිහි නැමැති දොර වැසිය යුතුය. එවිට භවඞ්ග ආවර්ජනා දී වීථි සිත්ද ගොපිත වෙයි. එකල අරමුණ පිළිබඳ දුසිල් බවක් හෝ සිහිමුළා බවක් හෝ නොදැනීමක් හෝ නොඉවසීමක් හෝ පහළ නොවේ. නගරයකට භාණ්ඩයන් ප්‍රවිෂ්ටවන ප්‍රධාන දොරටු වැසූකල අභ්‍යන්තරයෙහි සියළු ආරක්ෂාවීම නිතැතින් ම සිදුවනු මෙන් ජවනක්ෂණයෙහි සතිසම්පජඤ්ඤය පහළවූවිට භවඞ්ගාවර්ජනා දී

ජීවිතාන්තයෝ ආරක්ෂිත වෙත්මැයි. මෙසේ ගොපිත ඉන්ද්‍රියයන් ඇති තැනැත්තේ රූපාදි අරමුණක් ඡන්දරාගාදී වශයෙන් නොපිළිගනී. පෘථග්ජනයාගේ චිත්ත සන්තානය අරමුණු කරා පැනයෙමින් නිතර පෙරලෙනසුළුවූ. ක්ලේශ කාලුෂ්‍යයෙන් දූෂිත වන්නෙකි. එබැවින් ගුප්තද්වාරතාව බෞද්ධයෙකුට අතිශයින් අවශ්‍ය දෙයකි. නොඑසේවූව රැස්කරන පුණ්‍ය ධර්මය පවා නිසි ආකාර නොසිදුවිය හැකි අවසථා එළැඹේ. ඉන්ද්‍රියයන් ආරම්මණයන් පිළිබඳ ක්‍රියා කාරිත්වය නොදූත හෝ නොසලකා සිටීමට පුරුදුවීමෙන් මෙකල බොහෝ බෞද්ධයන් පින්රැස් කරති යි කියමින් පාප ධර්මයන් ම සිත්සතන් තුළ ක්‍රියා කරවනු ප්‍රකට කරුණකි. එබැවින් ගුප්තද්වාරතායෙහි වටිනාකම් සාවුරුත් විසිනුත් එක්වන්ව සලකාබැලිය යුත්තකි.

**භොජනෙ මත්තඤ්ඤු** ආහාර ගනුයේ ශරීරය පවත්වා ගන්නටය. හෙද රාග ද්වේෂ මෝහයන් වඩනට නොව-මඩනටය. වැටහෙන නුවණින් කරුණු සලකා ප්‍රයෝජනය ද මෙනෙහි කොට අහර ගන්නේ භොජනය පිළිබඳ ප්‍රමාණය සලකන තැනැත්තේය. ඇතැම් අහරක් ගත්කල්හි ශරීරයෙහි ජවය දියුණු වේ. නෘත්‍ය ගීතාදිය පවත්වන්නට ද කවි සිලෝ ආදිය ගයන්නට ද උද්‍යෝගයක් පහළ වේ. එබඳු ඔජෝගුණාධික ප්‍රණීත ආහාරයන් හි ගිජු තැනැත්තා අදහස් මුදුන්පත් කරගන්නට නොසුදුසු ව්‍යාපාරයන්හි යෙදෙන්නට ද උත්සුකවීම ස්වභාව සිද්ධය. පහසුවෙන් ලබාගත නොහැකි හෙයින් අධර්මයෙනුදු, කායසමාචාරාදීන් හි විෂම පැවැත්මෙනුදු, ඔහුට අහර සොයාගන්නට සිදුවේ. මාත්‍රඥයා භොජන සේවනයෙහි එම උපාය නොඅනුගමනය කෙරේ. එමෙන් ම ඔද වැඩීමද අහරින් සිදුවන්නකි. රාජාරාජ මහාමාත්‍යාදීන් මානමද පුරිසමද වඩනුයේ පිණී බොදුන් ගැනීමෙනි. එබඳු මද වැඩුම් ගුණ වැඩුම් වළහන හෙයින් මාත්‍රඥ එඅදහසිනුදු බොදුන් නොගනී. සිරුරු සැරසුම් පිණිස ද ආ හා ර ගැනීම ඇතැම් අයගේ [illegible]රිති.

ශරීරය සිහිදුව මෘදුව සුවපහස් දනවමින් පවත්වන්නට ගිතෙල් පැණි ආදියෙන් කළ පානයන් ගැනීම, රූපයම් ජීවිතයකොට ඇති පුරාතන අන්තඃපුරික ස්ත්‍රීන් අනුගමනය කළ පුරුද්දකි. එයින් අඞ්ග ප්‍රත්‍යඞ්ගයෝ වටව මටව ප්‍රසන්න ඡවි වර්ණය ගෙන දෙමින් වැඩෙත්. හෙද රාග විරාගය පිණිස හෙතුනොවන හෙයින් මාත්‍රඥ ඉනුදු වැළකේ. මාංශ පිණ්ඩයන්ගේ විභූෂණය ද ආහාරයෙන් ඇතිකර ගත හැක්කකි. මල්ලවපොර ආදී ශරීර ශක්තිය ප්‍රදර්ශනය කරන ක්‍රීඩාවන් හි නියැලෙන්නෝ විරුද්ධ ප්‍රහාරයනට ඔරොත්තු දෙන්නට ඝනව උස්ව මස්පිඬු වැඩීම සඳහා මත්ස්‍ය මාංශාදිය නිතර බුදිමින් සිරුර පිණවත්. සසර බිය දක්නහුට එබඳු සිරුරෙකින් ප්‍රයෝජනයක් නොවන හෙයින් මාත්‍රඥ එවැනි ශරීර වර්ධනයකුදු අහරින් බලාපොරොත්තු නොවේ. හේ ආහාරාහරණයෙහි ප්‍රයෝජන කිහිපයක් දකී. මේ කරජකායයාගේ විනාශය නොසිදුවනසේ පවත්වා ගැනීම ඉන් එකකි. ජීවිතෙන්ද්‍රිය ආරක්‍ෂා කර ගැනීම තවෙකෙකි. අහර නොගැනීමෙන් ඇතිවන බඩගින්න සංඳවීම තවත් කරුණකි. ත්‍රිවිධ ශික්‍ෂාවෙහි ශික්‍ෂණය සඳහා අහර සෙවනයෙන් අනුග්‍රහයක් ලැබ ගැන්ම තවත් හෙතුවකි. අහර අපරිභොගයෙන් හටගන්නා පැරණි වේදනාව දුරුකරනු යේම අධිකමාත්‍ර භොගයෙන් නව වේදනා නූපදවීමද තවත් කරුණකි.

තවද නිවැරදි පරිභොගයද ආහාරයෙහි සැලකිය යුතු දෙයකි. ඇතැම් කෙනෙක් පරද්‍රව්‍යාපහරණ පරපීඩනා දී අධර්මයෙන් අහර සොයාගෙන එලෙසින් පරිභොග කෙරෙති. තවත් කෙනෙක් දැහැමෙන් සෙමෙන් උපයන ලද්ද වුවද ප්‍රමාණය ඉක්මවාගෙන දිරවාගත නොහැකිව වමන පාචනාදියට නිතර ගොදුරු වෙමින් නිඥු ලබත්. මේ දෙයාකාරයෙන් ම දුරුව නිරවද්‍යසේ අහර සෙවීමත් ගැනීමත්

කළයුතුය. සතර ඉරියව් පහසුවෙන් පවත්වා ගැනීම ද අහර ගැනීමේ එක් ප්‍රයෝජනයක් වූවද සමහර අය අලං-සාටක බ්‍රාහ්මණාදීන් මෙන් පමණ ඉක්මවා බොදුන් බිදීමෙන් කරදරයට වැටෙති. ඇතැම්හු මදවේලාවකට වුවද ශරීරයට පීඩා උපදින සේ බඩ ඉඩ නොතබා අහරගෙන තාවකාලිකව දුකට පැමිණෙති. මෙසේ ආහාරය නිසා දුකට නොපැමිණ ඉරියව් පවත්වන රිසින්ම එය ගතයුතුය. උක්තප්‍රකාර අඞ්ග අටකින් සමන්විත ආහාරය සෙවීමත් පිළිගැනීමත් පරිභොගයත් නුවණින් සලකා කළයුතුය. මාත්‍රඥ පුද්ගලයා ආහාරා'න්වෙෂණා'හරණාදියෙහි පමණ දැන ධර්මෝපදෙශයෙහි පිහිටා ක්‍රියා කරන්නෙකි.

**උපට්ඨිත සති - සම්පජාන:-**

එළඹ සිටි සිහියෙන් යුක්තව යෑම් ඊම් ඉදීම් සිටීම් ආදී ඉරියව් පවත්වනුයේ උපට්ඨිත සතිය. ප්‍රඥානුයාන පැවැතුම් ඇතියේ සම්පජානය. සතිය අරමුණ පිළිගන්නේය. ප්‍රඥාව එහි යථාතත්ත්වය දක්නේය. සති විරහිතවූව ප්‍රඥා සමන්විත දැක්මෙකුදු නැති. **“සතිඤ්චඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි”**සි බුදුරජාණන් වහන්සේ සිහිය සැම-තන්හි එළවාගතයුතු බව දෙශනා කළහ. සතියත් සම්පජඤ්ඤයත් නිතර සහයොගයෙන් සිටින චෛතසික ධර්මයන් හෙයින් මේ පුද්ගලයන් දෙදෙන එක් ද්විකයෙක්හිලා දෙශිතය. **ස්මෘතිමත් පුද්ගලයා** සිහිය පිහිටුවා ගන්නට අපිලාපන - උපගණ්හන සඞ්ඛ්‍යාත සිහියේ ලක්‍ෂණද්වයය උපයොගී කරගනී. සිතින් මනාකොට ගත් අරමුණ අමතක විය නොදී නැවත නැවත සිහියට නගාලනුයේ අපිලාපනය විසිනි. හිතකර අහිතකර ධර්මයන් තෝරා බේරා ගෙන හිතකරයන් ළංකර ගනිමින් අහිතකරයන් දුරුකරනුයේ උපගණ්හනය විසිනි. උවමනා අවස්ථාවක සිහියට අරමුණ නංවාලිය හැකිසේ සිතතුළ එය නැන්පත්ව

තිබිය යුතුය. ආසෙවිත භාවිත වශයෙන් පරිභාවිතනො වූ ධර්මාරම්මණයක් වහා විස්මෘත වැ යනුයේ යටි සිතෙහි තැන්පත් නොවූ කල්හිය. වියලිතණ - ලබුකබල් ආදි සැහැල්ලු දෑයක් දියට හුණුකළ ඉල්පි සිටිනු මෙන් අරමුණෙහි සිහිය ප්‍රවිෂ්ට නොවීම සාමාන්‍ය ස්වභාවයෙකි. අපිලාපන- යෙන් කරනුයේ අරමුණෙහි සිහිය කාවද්දා තැබීමය. එවිට කලකට පෙර කළ කී දේ වුවද විස්මෘත නොවේ. උවමනා අවස්ථාවක සිහියට නංවා ලන්නට හැකිය. අපිලාපනය සක්විති රජ කෙනෙකුගේ භාණ්ඩාගාරිකා- මාත්‍යයා වැනි පැවැතුම් ඇත්තේය. දිනක් පාසා රාජභාණ්ඩා ගාරයේ තැන්පත්ව පවත්නා රන්රිදී මුතු කහවණු ආදියෙහි ගණන් පමණක් නොව, රාජ්‍යයේ ඇත්-අස්-රිය-පාබලාදී සේනා ප්‍රමාණය පැවසීමත් භාණ්ඩාගාරිකාමාත්‍යයාට අයත් රාජ කාර්යයෙකි. රජතුමා ඔහුගෙන් රාජ්‍යයේ ධනශක්තිය හා සේනා බලයත් දැනගනී. අපිලාපන ලක්ෂණයෙන් යුත් සිහියද ගතවූ කාලයෙහි තමා කළ කී දෑද, වඩනාලද සමථ විපස්සනාදී ගුණධර්මයන්ද උචිතාවස්ථාවන්හි සිතට ආරෝපණය කෙරේ. යෝගාවචරයා යථොක්ත සති ලක්ෂණ යෙන් තමා එතෙක් රැස් කරනලද ලොවිලොවිතුරා සැපත් පමණ දැන සතුටු වෙයි.

උපගණ්හන ලක්ෂණ සතිය හිතා'හිත උපකාරක අනුපකාරක ධර්මයන් දැන හිතයන් හා උපකාරකයන් ලංකර අහිතයන් හා අනුපකාරකයන් අතතුරු කරුවන්සේ- දුරුකරයි. උපගණ්හන සතිය සක්විති රජකෙනෙකුන්ගේ පරිනායක රත්නය වැන්න. රජහට හා රාජ්‍යයටත් හිතාහිතයන් විමසා දැන හිතයන් ලංකොට ගනිමින් අහිතයන් බැහැරලීම ඔහු අයත් රාජකාර්යයකි. එයින් රාජ්‍යයේ නිරාකුල චිරස්ථිතිය සුස්ථිර වේ. උපගණ්හන ලක්ෂණ සතිය බැහැරලිය යුතු කාය දුශ්චරිතාදිය අහිතසේ දැන දුරුකෙරෙයි. කාය සුචරිතාදිය වැඩිය යුතු-සෙවිය යුතු හිතයන් සේ දැන ලංකොට ගනී. ඒ හෙතුවෙන් නිරවද්‍ය බෞද්ධ ජීවිතයේ පරිස්ථිතිය ස්ථාවර වේ. එළඹ සිටි සිහියෙන් යුත් පුද්ගලයා තුළම ඉන්ද්‍රිය සංවර සීලය රැකෙන හෙයින් සසර බිය දක්නේ ස්මෘති සම්පන්න වන්නේය.

**සම්පජාන:-** නුවණින් පිරිසිඳ දැන සියළු ඉරියවු පවත්වයි. යෑම් ඊම්, ඉඳීම් සිටීම්, සැම් ජම්, ඇඳීම් පැළඳීම්, කථා කිරීම් තුෂ්ණීම්භූතවීම්, නිදීම් නිදිමැරීම් ආදී හැම තන්හිද සියළු කෘත්‍යයන්හිද සති පූර්වාංගම කොට ඇති ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම මොහුගේ ලක්‍ෂණය යි. **"සාත්‍ථක සම්පජඤ්ඤ සප්පාය සම්පජඤ්ඤ ගොචර සම්පජඤ්ඤ අසම්මොහ සම්පජඤ්ඤ"** යන සිවු ක්‍රමයෙන් එක එක ඉරියව්වක් පාසා ප්‍රඥාව උපදවා ගැනීම ඒ සඳහා ප්‍රයෝජනවත් වෙයි. ඉදිරි ගමනට සිතක් පහළවූ කල්හි වහා නොගොස් එම ගමනෙන් සිදුවන අර්ථා'නර්ථ සලකා බැලීම සාත්‍ථක සම්පජඤ්ඤය. මෙහි අර්ථ නම් චෛත්‍ය - බෝධි - සථවිර සඞ්ඝ - අශුභාදී දර්ශනයට යෑමෙන් වන ධර්මයෙන් වැඩීමයි. සෑ - බෝ - දැකීමෙන් බුද්ධාරම්මණ ප්‍රීතිය පහළ වැ ප්‍රථම ද්ධ්‍යානාදිය උපදවාගෙන එයම ක්‍ෂය වශයෙන් සම්මර්ශණය කොට අර්හත්වයට පවා පැමිණිය හැකි ලාභයක් අත්කර ගත හැකිය. යම් හෙයකින් ආමිෂයෙන් හෝ වැඩීමක් වේනම් හෙද ප්‍රයෝජනයක් සේ සැලකීම නුසුදුසු නොවේ. පිළිවෙත් පිරීමට ආමිෂය උපනිශ්‍රයවන හෙයිනි. එම ඉදිරි ගමන යෑමෙහි මැ සත්ප්‍රාය අසත්ප්‍රාය දැන සත්ප්‍රාය මාර්ගය ගැනීම සප්පාය සම්පජඤ්ඤය. චෛත්‍ය දර්ශනාදිය ප්‍රයෝජනවත් දෙයක් වුවද එහි රැස්වන තාම තමාගේ සම්පත්තියට අනුරූප ආභරණාදියෙන් සැරසුණු චිත්‍රකර්ම රූපයන් වැනි ස්ත්‍රී පුරුෂයන් දැක්මෙන් ඉෂ්ටාරම්මණයෙහි ලෝභයත්, අනිෂ්ටාරම්මණයෙහි ද්වේෂයත්, අසමපේක්ඛණයෙන් මෝහයත් උපදිතියි ද ජීවිතාන්තරාදියට හෝ එළඹෙන්නට සිදුවිය හැකියිද සිතා ගමන නොසුදුසුසේ දැන ඉන් වළකිනු යේ සප්පාය සම්පජඤ්ඤය පහළ වීමෙති. පූර්වෝක්ත ගමන යෑමෙන් ලැබිය හැකි ප්‍රයෝජනය හා අන්තරාදියකට හෙතුවක් නැති බැවුත් සලකා අටතිස් කම්ටහනින් තමාගේ චරිතානුරූප රුචි ගොචර කම්ටහනක් මෙනෙහි කරමින් ගමන් කිරීම ගොචර සම්පජඤ්ඤය. මෙම සම්පජඤ්ඤයන්හි පිහිටා ගමන යන්නහු තුළ

හටගත හැකි ආත්මය ගමන් කරයි. ඈ ලෙසින් ඇතිවන මූලාවෙන් දුරුවීම අසම්මොහ සම්පජඤ්ඤය. මෙහිදී කිවයුත්තක් නම් මනුෂ්‍යයන් කෙරෙහි පවත්නා ආත්ම ව්‍යවහාරය ධර්මානුකූල නොවන අනුචිත ව්‍යවස්ථාවය. මම යෙමි, මා විසින් ගමන උපදවන ලදී" ආදී පෘථග්ජනයන්ගේ කථා ව්‍යවහාරය ප්‍රඥානුයාත නොවේ. පරමාර්ථ වශයෙන් ගමනක් ලැබෙනුයේ ධාතූන්ගේමය. ආත්මයක නොවේ. ධාතූන්ගේ හිඳීම සයනය ආදී ඉරියව්ව පැවැත්ම ඒ ඒ රූප කොට්ඨාශයන් හා ලැබෙන්නකි. කියනලද මැයි.

"අඤ්ඤං උප්පජ්ජති චිත්තං
අඤ්ඤං චිත්තං නිරුජ්ඣති
අවිචි මනු සම්බන්ධො
නදී සොතොව වත්තති."

උක්ත ප්‍රකාර එක් එක් ඉරියව්වෙක් හි යථොක්ත චතුර්විධ සම්පජඤ්ඤයන්ගෙන් සමන්විතව ක්‍රියා කරන පුද්ගලයා සම්පජාන නමින් ශාසනයෙහි සැලකේ.

## සීල සම්පන්න - දිට්ඨි සම්පන්න.

කයින් වචසින් සිදුවන පාපධර්මයන්ගෙන් දුරුව වසනුයේ සීල සම්පන්නය. සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවනුයේ දිට්ඨි සම්පන්නය. ප්‍රාණඝාතාදියෙන් වෙන්වන්නානු ගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ සිතුවිලි පරම්පරාව සීල නම් වේ. කායකර්මාදිය එක්තැන් කොට හික්මවන හෙයිනුත්, කුසල ධර්මයන්හට ප්‍රතිෂ්ඨාභූත වැ ආධාර වන හෙයිනුත්, සීල ව්‍යවහාරය යථොක්ත චෙතනා ධර්මයනට උචිත වන්නකි. සීලය වූකලී සීල අධිසීල යි ද්විප්‍රකාරය. බුදුරදුන් උපන් කල්හිදු නූපන් කල්හිදු පඤ්චසීල දස සීල ගුණයෝ ලෙව්හි පවත්නාහ. කාලවිශෙෂයෙකින් අසීමිත වැ කවරදාත් පවත්නා ඔහු සාමාන්‍ය සිලව්‍යවහාරයෙන් හැඳින්වෙති. අබුද්ධොත්පාද කාලයෙහි පසේ බුදුවරුද කර්මවාදී දෘහැමි පැවැතුම් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද චක්‍රවර්ති මහ රජවරු ද

මහා බෝධිසත්වවරයෝද පූර්වෝක්ත සීලයන්හි මහජනයා පිහිටුවත්. බුද්ධ කාලයන්හි පමණක් ශ්‍රාවකයන් හික්මවීම සඳහා පැණවෙන ප්‍රාතිමෝක්ෂ සංවර සීලය අධිසීලයකි. එය පඤ්චඞ්ග දසඞ්ග සීලයනට වඩා අධික හෙයිනුදු, උතුම් හෙයිනුදු, එම ව්‍යවහාරය ලබයි. සියලු ආලෝකයනට වඩා සූර්ය්‍යාලෝකය දීප්තිමත්ය, ප්‍රධානය. එමෙන් ලෞකික සියලු සීලයන් ඉක්මවා පවතින මෙයද උත්තමය. එසේම ප්‍රධානය. කායවාක් අජ්ඣාචාරය සිඳ දමා ඒ ඒ ව්‍යතික්‍රමණ-යනට සුදුසු පරිදි මේ සීල සංවරය පණවන්නට බුදුරජා-ණන් වහන්සේලා හැර ලොව අන්‍ය සත්වකෙනෙක් අසමර්ථයහ. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයට වඩා මාර්ග ඵල සිත් පිළිබඳ සංවරය ගුණාධිකය. මෙම ශාසනයෙහි සමථ විදර්ශනා මාර්ග ඵල නිර්වාණ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කරන්නට පළමුකොට සීල ගුණයෙහි ම පිහිටිය යුතුය. සීල සමාදානයෙන් පිරිසිදු කැරගත් චිත්තසන්තානයක් නැත්තාහුට ගුණ විශේෂයක් උපදවා ගන්නට නොහැකිය. චිත්‍රකර්මයක් කරන්නහු පළමුව භිත්තිය සුණු පිරියම් කොට සකස් කැරගෙන තදනන්තරව රූපය අඳී. නොඑසේවුව, චිත්‍රය නිසිසේ අඳින්නට නොහැකිය. එය කල් පවත්නේද, නොවේ. ශීලවිශෝධනය ප්‍රතිවේධාධිකාරයට මූලිකෝපාය යෙකි. සීල චරණයන්ගෙන් සමන්විතවූවහුම නිර්වාණ පුර ප්‍රවිෂ්ටවෙයි. සීල සමාදානයක් නැති කල්හි සුන් පා ඇතියකු ගමනෙහි අධිකාරයක් නොලබනු මෙන් සසර කතර නතර වේ. සීලය කායික වාචසික ව්‍යතික්‍රමණයනට ඉඩ නොතබා පාප ධර්මයන්ගේ ප්‍රවේශද්වාරය වසාලයි. කුසල ධර්මයන්ගේ ප්‍රතිලාභය සීලය මූලිකවැ කටයුතුය. කබලිඞ්කාරාහාරාදී සිවුවැදෑරුම් ආහාරය සත්වයන්ගේ මුඛයෙන් ප්‍රවිෂ්ඨ වී එහි රසය අඞ්ගොපාඞ්ගයන් කරා ගොස් ශරීරය වර්ධනය කරනු මෙන් සීල මුඛයෙන් පිවිසෙන චාතුර්භූමක කුසල කර්මය යෝගීනට ත්‍රිවර්ග සම්පත් දානය කරමින් අර්ථ සිද්ධිය සලසා මනෝරථ පූරණය කෙරෙයි. පඤ්ච සීල දස සීල

ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලාදියෙන් සංයමයට පත් කැරගත් ඉඳුරන් ඇති පුද්ගලයා සීල සම්පන්නය.

**දිට්ඨි සම්පන්න:** කම්මස්සකතා ඤාණ සඞ්ඛ්‍යාත සම්‍යක් දෘෂ්ටියත්, දිට්ඨි සම්පත් නම්වූ සොතාපත්ති මාර්ග ඥානයත් පහළකැරගත් පුද්ගලයා දිට්ඨි සම්පන්නය. මොහුගේ පූර්වභාග ප්‍රතිපදාව සම්‍යක්දෘෂ්ටියයි. නිර්වාණාවබොධය ලබන බලාපොරොත්තුවෙන් ගුණදම් රක්නා යොගියාහට එය බහුපකාරව පවත්නේය. දුන්දෙයෙහි ඵලවිපාක ඇතැයි පිළිගෙන නාස්තික දෘෂ්ටිය දුරුකරන හෙයින් **පඤ්ඤා පජ්ජෝත පඤ්ඤා සත්ථ** යන නාමයන්ගෙනුද එය හැඳින්වේ. යොගාවචරයා විදර්ශනා ඥානයෙන් අවිද්‍යාන්ධකාරය විධ්වංශනය කොට සැපසේ නිවණට පැමිණෙනුයේ, සම්‍යක් දෘෂ්ටිය ආදියෙහි ම පහළකැරගැනීමෙනි. තවද **කම්මස්සකත -ඣාන - විපස්සනා - මග්ග - ඵල** වශයෙන් පස්වැදෑරුම්ව බෙදීයන සම්මා දිට්ඨියෙන් යුක්ත වනුයේ ද දිට්ඨිසම්පන්න ව්‍යවහාරයට යොග්‍ය වේ. එයින් එක් අඞ්ගයෙකින් සමන්විත වූවද දර්ශන සම්බන්ධය සාධාලයි. සම්‍යක් දෘෂ්ටිය ලෞකික ලොකොත්තර වශයෙන් දෙපරිදි වැ ලැබෙතුදු මෙහි දෘෂ්ටි සම්පද් සමන්නා ගත වූයේම දිට්ඨි සම්පන්න නමැයි වදහළ හෙයින් **සොතාපන්න පුද්ගලයා හඳුන්වන අන්‍යතර නාමයෙකැයි සලකන්නේය.**

## ද්විවිධ දුලිභ පුද්ගලයෝ.-

ලෙව්හි පුද්ගලයෝ දෙදෙනෙක් දුලීභ වැ දක්නා ලැබෙති. පූර්වකාරී කෘතඥ නම්වූ ඔවුන් දෙදෙන ජනසමාජයෙහි කාලාන්තරකින් පහළ වන උත්තම ගුණයෙකින් හෙබි සත්-පුරුෂයෝය. අනුන්ගෙන් උපකාරයක් නොලබා උපකාර බලාපොරොත්තුවකුදු නොමැතිව, යම් කිසිවකුට පළමුව උදව් කරනුයේ පූර්වකාරිය. කළ උපකාරය දැන අමතක නොකොට උදව්කළහුට පෙරළා උපකාර කරනුයේ කෘතඥය.

අවිද්‍යාවෙන් හා තෘෂ්ණාවෙන් සත්ව ලෝකය වැසී පවත්නා හෙයින් පූර්වකාරී කෘතඥ පුද්ගලයෝ ලෙව්හි දුර්ලභයහ. ශබ්දාර්ථ වශයෙන් සලකනවිට යම් කිසිවක් ප්‍රථම කොට කරන්නා පූර්වකාරීය. මව් පිය ආචාර්ය උපාධ්‍යායාදීහු ස්වකීය දරුවන්ගේ වර්ධන පෝෂණාදියත් ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රාධ්‍යාපනාදියත් පෙරකළ උපකාරාදියක් නොසලකා හුදෙක් කළයුතු යුතුකමක් ඉටුකිරීම් වශයෙන් කරත්. එබැවින් දරු ශිෂ්‍යයනට මව් පිය ගුරුවරු පූර්වකාරීහුය. ඇතැම් කෙනෙක් තමහට උදව්වක් කෙරෙතියි අපේක්ෂා රහිතව අන්හට උපකාරාදිය කිරීමෙන් හිතෛෂිත්වයක් දක්වති. ඔහුද පූර්වකාරී ගුණාන්විත සත්පුරුෂයෝය. අප්‍රකාශ භාවයෙන් අන්ධකාරය වැනි පැවැතුම් ඇති, සම්පත් රහිත නීච කුලාදියක උපන්නෙක් ධනාඪ්‍ය උසස් කුලයක උත්පත්ති සාධක කුසල් කරනුයේ ද පූර්වකාරී නම් වේ.

**තමෝ ජෝතිපරායණ** නාමයෙන් හඳුන්වන හෙතෙම උසස් ජීවිත ලාභයක් අත්කර ගතහැකි පූර්වකෘත්‍ය පිං කිරීමෙන් සිදු කරයි. තම බලාපොරොත්තුව ඉටුකර ගැනීමට පළමුව කළයුතු දෙයෙහි නියැලිවන ඔහුට එම නාමය යෝග්‍ය වේ. තවද ත්‍රිවර්ග සම්පත් සාධා ගතහැකි පරිදි දහම් දෙසන්නා ද පූර්වකාරී පුරුෂයෙකි. එම සැපත් ලබා ගැනීමට පිරිය යුතු පිළිවෙත් සපුරා එයට පැමිණ, අන්‍යයන්ද එහි පමුණුවන ධර්ම මාර්ගය ප්‍රකාශ කරන හෙයිනි. **දෙව් මිනිසුන් සහිත ලෙව්හි තථාගතයන් වහන්සේ ම ප්‍රධාන පූර්වකාරී පුරුෂයා වනසේක.**

මොහු විසින් මෙබඳු උපකාරයක් කළැයි අනෙකකු කළ උපකාරය දැන එය ප්‍රකට කරන - ඔහුට පෙරළා උපකාර කරන පුද්ගලයා කෘතඥ කෘතවිද් නම් වෙයි. මව් පිය ගුරුවරාදීන් කළ උදව් දැන ඔවුන් පෝෂණය කරන වන්දනමානනාදී සැලකිලි දක්වන දූ දරුවෝද ශිෂ්‍යයෝද මෙම පුද්ගල භේදයට ඇතුළත් වෙති. තමනට ද

උදව් උපකාර කෙරෙති යි සිතා අන්‍යයනට උපකාර පිණිස ක්‍රියා කරන තැනැත්තා ද කෘතඥ යි නාමාඞ්‍ග විසින් සැලකේ. ධනාඪ්‍ය උසස් කුලයක උපත ලබා නැවතත් එබඳු උත්පත්තියක් ම ලැබීමේ බලාපොරොත්තු-වෙන් ත්‍රිවිධ සුචරිතයන් පුරන 'ජොති ජොතිපරායණ' නම්වූ සැපයෙන් සැපයට ගමන් කරන පුද්ගලයා ද කෘතඥයෙකි. තමා පෙර අත්බැව්හි කළ දාන සීලාදි කුසල බලයෙන් සැපවත් ජීවිතයක් ලබන ලදැයි දැන නැවතත් එබන්දක් ලැබීමට සුචරිත ක්‍රියායෙහි යෙදෙන හෙයිනි. දහම් දෙසන්නාගේ උපදෙශ අනුව පිළිපදනේද කෘතඥ කෘතවිද්‍ය. ආර්‍ය ශ්‍රාවකයා බුදුරදුන්ගේ අනුශාසනය පිළිගෙන ධර්මානු-කූල වැ පිළිපැද අදහස් මුදුන්පත්කරගෙන කෘතඥ බවට පැමිණෙයි. යමෙකුට කිසිවකින් සඞ්ග්‍රහ කිරීමත්, කළ සඞ්ග්‍රහය මතකතබා ගැනීමත්, තෘෂ්ණා අභිධ්‍යා අවිද්‍යාදී පාප ධර්මයන් හා සටන් කරමින් පුරුදු කරගත යුත්තකි.

## ද්විවිධ දුත්තප්පය පුද්ගලයෝ:-

ලද්ලද දෙය තැන්පත් කර තබන්නේද, ලැබෙනතාක් දෙය අනුනට දෙන්නේද, දුත්තප්පය නම්. කොහරම් ලද ද තැන්පත් කර තැබීමේ ලොභය හා දීමේ ආශාවත් තෘප්තිමත් කරන්නට නොහැකි වන හෙයින් යථෝක්ත නාමය අර්ථානු රූපව වහරට වැටිණ. මේ පුද්ගලයන් දෙදෙනා නෑ දූ බන්‍ධු මිත්‍රාදීන්ගෙන් හෝ දායක කාරකාදීන්ගෙන් හෝ ලැබෙන රන් රිදී මිල මුදල් චීවර පිණ්ඩපාතාදිය තුමූ පරිභොග නොකෙරෙති. තමන්ගේ යැපීම් පමණකට ද සවල්පයක්වත් නොගෙන කිසිවකුට නොදී තැන්පත්කර තබන්නට එක් පුද්ගලයෙකු යත්න දරන අතර, අනෙකා කිසිවක් ඉතිරිකර නොගෙන ලැබෙන සියල්ලම අන්‍යට පරිත්‍යාග කෙරෙමින් වැය කරයි. තබාගැනීමත් දීමත් පිළිබඳ සීමාවක් නොමැතිව ක්‍රියා කරන නිසා මේ දෙදෙනාම යම් කිසිවක් ලැබීමෙන් සෑහීමකට නොපැමිණෙති. එබැවින් දුත්තප්පය පුද්ගලයාට ලාභාලාභ සන්තොෂාදි විසින් ප්‍රීතිමත්

ජීවිතයක් පවත්වා ගන්නට අවස්ථාලාභයක් නැත. ඇතැම්විට තමා ලැබූ ප්‍රණීත වටිනාදෙය ලාමක කොට ද අන්‍යයන් ලද ලාමක දෙය පවා ප්‍රණීත වටිනා වස්තුවක් කොටද, ඔහුට වැටහෙයි. තම හස්තප්‍රාප්ත වූ දෙයෙහි අඩු ලුහුඬුකම් දකිමි සැමවිටම පුරුදු වී තිබීම එයට හේතුවය. එක් තැනැත්තෙක් ලොභය මූලික කොට ගෙන එක් අනාතයකට පැමිණ වස්තු ලාභය කැමැති වෙයි. හෙතෙම එම ක්‍රියායෙන් අකුසලයක්ම රැස්කරයි. අනෙක් තැනැත්තා අලොභය හෙතුකොට ගෙන එහි අනාතයටම පැමිණ කුසල් රැස්කරගනී. අහසට පොළොව මෙන් අජ්ඣාසය වශයෙන් දුරු වුවද, අතෘප්තිමත් භාවයෙන් එක්බඳුනුයි එකස්ථලයෙක්හි දක්විණ. දර ලාභයෙන් තෘප්තිමත් නොවන ගින්න මෙන්ද. මහා නදීන්ගේ ජලය කොතරම් ගලා ආ නමුදු පිරී නොයන සාගරය මෙන්ද, වස්තු ලාභයෙන් දුභනප්පය පුද්ගලයා ද සන්තර්පණය නොවන්නෙකි.

## ද්විවිධ සුභනප්පය පුද්ගලයෝ

තමන්හට ලැබෙන සියළු දෙය සඟවා තැබීමක් හෝ අන්හට දීමක් හෝ නොකරන්නා හු සුභනප්පය නම් වෙති. තමාගේ යැපීම් මාත්‍රයකට ධන ධාන්‍යාදිය කැමැති වන මේ දෙදෙන සුවසේ පහසුවෙන් තෘප්තියට පැමිණවිය හැකිය. එක් තැනැත්තෙක් ලැබෙන සියළු වස්තුව නැන්පත් නොකොට තමාගේ ප්‍රයෝජනයට ගෙන ඉතිරි දූය පමණක් අන්හටදේ. ඔහුපොෂ්‍ය කිරිම සඳහා වැඩිවියදමක් නොයයි. අනෙක් පුද්ගලයා ලැබෙන දෙය තමාම පරිභොග කරනු මිස අන්හට නොදෙයි. ඔහුට අභිනවයෙන් යමක් නොලදුවත් කාලයක් මුළුල්ලෙහි තිබෙන වස්තුව ප්‍රයෝජනයට ගතහැකිය. එබැවින් මේ දෙදෙන පහසුවෙන් තෘප්ත වෙත්. ඔවුනට අතිරේක දෙයක් ලැබීමම අතෘප්තිදායකය. කිසිවක් බලාපොරොත්තු නොවීම ඔවුන්ගේ සිරිති. එහෙයින්ම මනාකොට තෘප්තියට පැමිණෙති යි යෙති.

## ද්විවිධ ආසව වර්ධන පුද්ගලයෝ

සැක නොකට යුත්තෙහි සැක කරන්නාද සැක කට-යුත්තෙහි සැක නොකරන්නාද, යන දෙදෙනා ආශ්‍රවයන් වර්ධනය කෙරෙති. අකැප දෙය කැපවූවක්සේ දක්නා ඇතැම් අය තමන්ගේ බුද්ධිහීනතායෙන් ප්‍රඥප්ති ව්‍යති-ක්‍රමණය කොට කාමාදී ආශ්‍රවයන් දියුණු භාවයට පමුණුවා ගනිති. කැප දෙය අකැප සේ ගෙන ක්‍රියා කරන්නෝ ද, ආශ්‍රවයන් ක්‍ෂය කරන පිළිවෙත්හි නියැලිව වසන නමුත් ආශ්‍රවයන් වැඩීමක් මුත් මැඩීමක් නොකෙරෙති. වරද සහිත දෙය හා නිවරද දෙය තෝරා බේරා ගන්නට ප්‍රමාණවත් ධර්මාවබොධයක් ඔවුනට නැත. අත්තනොමතිකව තමන්හට රිසියෙන්නක් ධර්මයසේ හඟිමින් එය අනුගමනය කෙරෙත්. ආගමික නීතිරීතිනට විරුද්ධව පිළිපදනා මොහු දෙදෙන විචාර බුද්ධියක් නැති කමින් දිවා රාත්‍රි ක්ලෙශයන් වර්ධනය කෙරෙත්. සාරවත් භූමියක වෘක්‍ෂලතාදිය ශීඝ්‍රව වැඩී යනු මෙන් කෘත්‍යා'කෘත්‍ය විචාරණයෙහි අසමර්ථ සිත්හිද ආශ්‍රවයෝ වැඩෙන්නාහුය.

## ද්විවිධ ආසව අවර්ධන පුද්ගලයෝ

ප්‍රඥප්තියට විරුද්ධ දෙයෙහි සැකය පහළ කරමින් ඉන් වැළකී සිටින එක් පුද්ගලයෙක. සැක නොකටයුත්-තෙහි සැක නොඋපදවා ක්‍රියා කරන එක් පුද්ගලයෙකැයි ආශ්‍රවයන් වැඩීම පිණිස නොපිළිපන් පුද්ගලයෝ දෙදෙනෙක් වෙති. ධර්මයත් අධර්මයත් හැඳිනගන්නට සමත් පැසුණු බුද්ධියක් ඔවුනට ඇතිහෙයින් යම්කිසිවක් යථාස්වභාවයෙන් වටහා ගන්නට පිළිවන. එබැවින් වැඩෙන ආශ්‍රවයන්ගේ නැරවීමෙකුදු, නොවැඩෙනවුන්ගේ පහළවීමෙකුදු නොසිදු වෙත්. ධර්මඥතයත්, ධර්මානුලොමික පැවැත්මත් ඇතිකල්හි ආශ්‍රවයන්ගේ දියුණුවකට අවකාශයක් නොලැබෙන හෙයිනි.

## හීනාධි මුත්ත - පණීතාධි මුත්ත

හීනවූ ලාමක වූ අදහස් ඇතියේ හීනාධිමුත්තය. ප්‍රණීතවූ ශ්‍රේෂ්ඨ වූ අදහස් ඇතියේ පණීතාධිමුත්තය. **හීනාධිමුත්ත** තෙමේ නිශ්ශීල වැ ලාමක පාප ධර්මයන්ගෙන් සමන්විතවැ තමා බඳුම පැවැතුම් ඇත්තවුන් සෙවුනේ හස්තපාදාදිය යම් ක්‍රියාවක යෙදවුවහොත් එය කායික දුශ්චරිතයක්වේමය. වචනය යොමුකළහොත් වාචසික දුශ්චරිතයක් ම සිදුකරගනී. චේතනායෙන් යම් සඞ්කල්පයක් ඉපදවුව අභිද්ධ්‍යාදි මනඃ දුශ්චරිතයක් මැයි. නිරන්තර පරිචිත හීනාද්ධ්‍යාශය බලපවත්නේ අදහස් විසින් තමා බඳුවූම පැවැතුම් ඇත්ත-වුන් ඇසුරු කරයි. තමහට වඩා උසස් අදහස් ඇතියවුන්ගේ ආශ්‍රය රුචි නොකරන මෙතෙම පහත් හැඟීම් තව තවද තහවුරු කැරගෙන දෙලොවින් ම පිරිහෙයි. හීනාධිමුත්ත අදහස් ඇත්තවුන් හා සබඳකම් පවත්වන නො එසේවූවන්ද හීනජ්ඣාසයෙන් යුත් පැවැතුම් වලට ප්‍රියකරන්නන් විය හැකිය. එබැවින් මෙතෙම දුරින්ම දුරුකළ යුතු පුද්ගලයෙකි. වදාළේ මැයි.

**“යාදිසං කුරුතෙ මිත්තං - යාදිසං චූපසෙවති**
**සොපි තාදිසකො හොති - සහවාසො හි තාදිසො**
**සෙවමානො සෙවමානං - සම්ඵුසො සම්ඵුටං නරං**

**පණීතාධිමුත්ත** කුසලධර්මයන්ගෙන් පරිපූරිත ජීවිතයක් පවත්වයි. උසස් ගතිගුණ පුරුදු පුහුණු කරමින් එබඳුවූ ම අදහස් දරන්නන් හා සමාගමය රිසිවේ. මොහුගෙන් ලොවට යහපතක් ම විනා අවැඩක් කිසිවිටෙකත් නොසිදුවේ. බුද්ධාදී උත්තමයන් පෙන්වා වදාළ යහමග මගමින් ආශ්‍රිතයන්ද එමග යොදවයි. අදහස් විසින් තමා හා සැසඳෙන්නන් සෙවුනා හෙයින් දෙපක්ෂයටම සිදුවනුයේ දෙලොවින් ම මහත් වැඩෙකි. එපමණකුදු නොව යම් ශාසනයක් පණීතාධි-මුත්ති දරන්නන්ගෙන් ගහන වේද, එය නොපිරිහේ. මෙසේ සන්මාර්ගගාමීව අනුනුදු යහමගෙහි හෙළන පණීතාධි-මුත්ත පුද්ගලයා නිතොරවැ සෙවනය කළ යුත්තෙකි.

## තිත්ත - තජ්පෙතු

භාෂ්තියට අවසාන කළ කාත්‍ය ඇති බවට පැමිණියේ තිත්තය. තමා භාෂ්තියට පැමිණි අත්‍යයනුද එයට පමුණු වනුයේ තප්පෙතුය. සසර වැසි සත්වයෙක් නව ලොවුතුරාදහම් අවබෝධ කළවිට කළයුතු කෘත්‍යයන් කොට නිමියේ භාෂ්ති-යට පත්වූයේ වෙයි. ඔහුගේ පරමාධ්‍යාසය මස්තක ප්‍රාප්ත වූ ඉන් මත්තෙහි කළයුතු කිසිවක් ඉතිරි නොවේ. සත්වයෙකු විසින් පත්විය හැකි ඉතා උසස් තත්වයට පැමිණ කෘතකිච්ච වීම එයට හෙතුවය. නවලොව්තුරු දහම් ප්‍රතිවෙධය කළ පසේබුදුවරුද තථාගත ශ්‍රාවකවූ ක්ෂිණාශ්‍රවයෝද තිත්ත පුද්ගලයන. පසේබුදුවරු නවලොව්තුරු දහමින් තුමූ මැ භාෂ්ත වූ වසත තමූද අනෙකකු එදහමින් භාෂ්ත කරවන්නට අසමත්ථයහ. රහතන් වහන්සේලා නවලොව්තුරු දහමින් තුමූත් භාෂ්තවූ එමගට පැමිණෙන දහම්දෙසා අන්‍ය-යන්ද භාෂ්තියට පත්කෙරෙති. එහෙත් තප්පෙතුහු නොවෙති ශ්‍රාවක දෙශනායෙන් අප්‍රමාණ දෙව් මිනිසුන් ධර්මාවබෝධය ලබා නිර්වාණය සාක්ෂාත් කරගන්නා තමූද, එය සිදුවනුයේ තථාගත දෙශිත ධර්මය ඇසීමෙනි. ධර්මය අසන්නෝ ද තථාගතයන් වහන්සේ ප්‍රතිවෙධ කර ගත්තකැයි චිත්තිකාර උපදවාගෙනම ශ්‍රවණය කෙරෙති. එහෙයින් මෙම දෙශනා ශ්‍රාවක දෙපක්ෂයම තථාගත ප්‍රතිවෙධ ධර්මයෙන්ම භාෂ්තියට පැමිණෙනසි දතයුතුය.

**තජ්පෙතු:** මේ ශාසනයෙහි පළමුකොට නම් භාෂ්ත වූ ප්‍රතිවෙධය කළ නව ලොවුතුරු දහමින් අන්‍යයන් භාෂ්තියට පත් කරන්නට සමත් එකම උත්තමයාය. සුවිසි අසංඛ්‍යයක් සත්වයන් භාෂ්තියට පත්කළ ගෞතම තථාගතයන්වහන්සේ මේ නාමව්‍යවහාරයට යොග්‍යවෙති. සරාසැකි කප් සුවහසක් මුලුල්ලෙහි සමතිස් පෙරුම්දම් පුරාලීමෙන් යථොක්ත නාමය ලබන්නට සුදුසුවන අධිකාරය අත්පත් විණ. දීපඞ්කර දීපදෙත්තමයන්ගේ සෙමෙහි නිත්ත පුද්ගලයෙකු වන්නට ලද වාසනාවද ඉවත දමා ඝොර බිරම් සසරට අභිත වූ බවූයේ තප්පෙතු කෙනෙකුන් වනු පිණිසය. හුදෙකලාව

තෘප්ත වැ සැතසෙනු නමාබදු වීර පුරුෂයෙකුට නොතරමැයි සලකා තමා විඳුනා සුවයෙහි රස අසඞ්ඛ්‍ය සඞ්ඛ්‍යාත සත්ත්වයන් ද භුක්ති විඳිනු දැක්මට මහා කරුණායෙන් මෙහෙයැවුණු උන්වහන්සේ නව ලොව්තුරා දහම් රෙසෙන් පමණක් නොවැ උසස් දෙව්මිනිස් සැපයෙනුදු ඔවුන් තෘප්තියට පත්කරනසේකි. එබැවින් උන්වහන්සේ නිතානද තප්පෙතු ද වනසේක්මය.

## ද්වික පුද්ගල විභාගය නිමි.

# තික පුග්ගල පඤ්ඤත්ති.

**නිරාස - ආසංස - විගතාසː-**

රහත්වීමේ ආසාව - බලාපොරොත්තුව නැතියේ නිරාසය. අපේක්ෂා සහිත වැ ක්‍රියා කරනුයේ ආසංසය. පහවැ ගිය අපේක්ෂා ඇතියේ විගතාසය.

**නිරාසː** කාය වාක් සංවර රහිතය. නිශ්ශීලය. රක්නා අනෙක් ගුණයකුදු නැති පාපියෙකි. අපිරිසිදු කායකර්මාදි-යෙන්ද අන්‍යයන් විසින් සැකයෙන් සිහිකළයුතු ගතිගුණ-යෙන්ද සංයුක්තය. ශ්‍රමණ සාරූප්‍ය නොවන පැවැතුම් ඇති හෙයින් ඔහුගේ හැසිරීම අන්හට සැකා දනවන සුළුය. අන්අය එක්රැස්වී ගුප්තවැ සාකච්ඡා කරනු දුටු කල්හි තමා කළ පාපකර්මය ගැන කථාකරනු වියහැකැ යි සිතමින් තමා මැ සැකා උපදවා ගන්නේද වෙයි. කිසිඥවකුහටත් දතනොහැකි සේ ප්‍රතිච්ඡන්න පාපකර්මයන්ගෙන් යුක්තවීමද ඔහුගේ ස්වභාවයෙකි. තවද අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තීන් හි ගැලෙමින් අශ්‍රමණවැ ශ්‍රමණයෙකැ යි පිළිණ කෙරෙයි. බඹසරː වස්හි පිහිටිසේ ප්‍රතිඥ කරන නමුදු බඹසරවස් විසුමකුදු නොම කෙරෙයි. ඇතුළත කුණුවුණක් බඳු පාපකර්මයෙන් සමන්විත වැ ගුණසාර විරහිතවැ රාගාදියෙන් තෙත්වැ කෙලෙස් කසළින් පූතිභූත වැ වෙසෙයි.

යම් සීලාදී ගුණයෙක්හි පිහිටා කෙලෙස් නවන වීඝ්‍යී යෙන් යුක්බව සමථ විපස්සනා බවුන් බවමින් අර්හත්ඞය ලැබියයුතුද, එබඳු ගුණසමාධානයෙකුදු නැත්මය. එබැවින් අසුවල් භික්ෂුව කෙලෙසුන් මුලුසුන් කරමින් රහත්විණැයි අසන්නට ලැබුණ කල්හි මම ද කෙසේ හෝ රහත්වෙම්යි සිතක් පහළ නොවේ. රහත් ගුණය ලැබියයුතු ප්‍රතිපද-වෙන් හාත්පසින්ම වෙන්ව වසන ඔහුට ඒ පිළිබඳ හැඟීමෙකුදු නැත. ඔවුනු පළන් කැත් කුමරකු ගැන අසන්නට ලද කල්හි රජවීමේ අපේක්ෂාවක් සැඩොල්

දරුවකු තුළ පහළ නොවන්නා මෙනි. උත්පත්තියෙන් ම රජකමට අභව්‍ය කෙනෙකැයි දන්නා ඔහුට එම අභිලාෂය නූපදනේය. නිරාස පුද්ගලයා ද රහත් ගුණයට පැමිණීමට සුදුසු සමථ විපස්සනාදි ගුණ දහම් වැඩීමක් නොකරන හෙයින් රහත්වීමේ ආසාවක් නැත්තෙකි.

**ආසංස:** ශීලාදි ගුණ ධර්මයන්ගෙන් හොබවන ගුණ ජීවිතයක් ඇති ශ්‍රෙෂ්ඨ තැනැත්තෙකි. රහත්වනු සඳහා දිවා රෑ දෙක්හි වැර වඩමින් සමථ විපස්සනා භාවනාවන්හි යෙදී වසනුයේ කල්‍යාණ ධර්මසමන්වාගත පැවැතුම් ඇත්තේය. යම් කෙනෙකුන් අර්හත්වයට පැමිණි බව අසන්නට ලද විට කවරදා රහත්වෙම්දැයි බලවත් ආසායෙන් මඩනා ලදුව ද්විගුණ කළ ප්‍රධන් වීර්‍ය්‍යයෙන් යුක්තව අර්හත්ව අපේක්ෂා කරයි. අද අදම ලැබේවායි බලාපොරොත්තු වෙයි. රහත් බව ලැබීමට සුදුසු ගුණවැඩුම් හා නැණ වැඩුම් තමා තුළද විද්‍යමාන බව හේ දනී. තමාගේ ප්‍රාර්ථනය විඵල නොවෙනියි සිතන්නට සුදුසු කම් ඔහු වෙත ක්‍රියාත්මක ව පවත්නේය. අසුවල් රාජ කුමාරයා ඔටුනු පළඳනා ලදැයි අසන්නට ලැබුණුවිට තමා ද කවරදා රජවෙම්දැ යි රජය බලාපො-රොත්තුවන කැත් කුමරක්හු වැන්න. රජ වීමට සියලු සුදුසුකම් තමා තුළ පිහිටා තිබෙන බව දන්නා හෙයිනි, එම හැඟීම පහළවනුයේ. රහත් බවට යොග්‍ය පැවැතුම් ඇති යොගාවචරයා ද තමා බඳු අරි අංගිමඟ පිළිපන් කෙනෙකුන් රහත්වූ විට සුහුසුළු ව එය තමා තුළත් පහළ කරගන්නට යත්න දරයි. එම උත්තරීතර තත්වය ලබන්නට ප්‍රාර්ථනා ද පිහිටුවයි. එසේ හෙයින් අර්හත්වාශංසා සහිතවූයේ ආශංසා නාමයෙන් හඳුනන්නේය.

**විගතාස:** අර්හත්වයට පැමිණ වසන අදහස සමෘද්ධ වූ කෙනෙකි. යම්කිසිවෙක් රහත්බවට පැමිණියැයි ඇසුණ තමුත් රහත්වීමේ ආසාවක් පහළනොවේ. අතීත් විමුක්ති-යෙන් කෙලෙසුන් කෙරෙන් මිදෙන්නට පළමු ඒ පිළිබඳ

යම් ආසාවක් ප්‍රාර්ථනාවක් වීද, එය දැන් සංසිද්ධි තෘප්තියට පැමිණ ඇත. රාජ කුමාරයෙක් ඔටුනු පැලඳ රජවීයැයි අසන්නට ලද කල්හි රජකෙනෙකු තුළ නැවත රජවීමේ ආසාවක් නූපදනා වැන්න. කුමාර කාලයෙහි බලවත්ව තුබූ ආසාව මුදුන්පත්වී තෘප්තියට පැමිණ රජය කෙරෙමින් වසන හෙයිනි. යොගාවචර වැ බවුන් වඩන කල්හි අභිධ්‍යාය පිළිබඳ වැ පැවැති ආසාව රහත්වීමෙන් පහවැගියේනු යි මේ පුද්ගලයා විගතාස නමින් හැඳින් වෙයි.

## ත්‍රිවිධ ගිලානූපම පුද්ගලයෝ:-

ගිලන් බවට පැමිණි පුද්ගලයන් තුන්දෙනෙකුන්ගේ පැවතුම් බඳු විහරණයෙන් යුක්ත වූවාහු ගිලානූපම නම් වෙති. බුදුරජාණන් වහන්සේ දක්නට ලදුවද නොලදුවද තථාගත ප්‍රවේදිත ධර්මය අසන්නට ලදුවද නොලදුවද, කුසල් දහම්හි කෙළවරසේ සැලකිය හැකි මාර්ගයට නොම පිවිසෙන මේ ශාසනයෙහි දක්නට ලැබෙන එක් පුද්ගලයෙකු. බුදුරදුන් දැක්මක් හෝ ධර්ම ශ්‍රවණයක් ලද නොලද නමුදු කුසල් දහම්හි කෙළවර වූ මාර්ගයට පිවිසෙන එක් පුද්ගලයෙක. බුදුරදුන් දැක්මද ධර්මශ්‍රවණයද ලද කල්හි ම කුසල් දහම්හි අවසානය වූ මාර්ගයට පැමිණෙන එක් පුද්ගලයෙක, යන තුන්දෙනා තුන් වැදෑරුම් පැවැතුම් ඇති ගිලන් පුගුලන් තුන්දෙනෙකුන් බඳුනුයි ගිලානූපම නම්හ.

ලෙව්හි ගිලන් බවට පැමිණියවුන් අතරින් එක් ගිලනෙක් රෝගයට සුදුසු පථ්‍යවූ ආහාර බෙහෙත් හා ගිලන් උවැටන්හි දක්ෂ උපස්ථායකයන් ලැබුණද, නොලැ-බුණද, එම රෝගයෙන් නොනැගිටී. අපස්මාරාදි රෝග යෙකින් පෙළෙන හෙතෙම අචිකිච්ඡ සදකාලික ලෙඩෙකි. කොතරම් ප්‍රතිකාර ලද නමුත් නිරෝග නො වේ. මෙ සසුන්හි "පදපරම" පුද්ගලයා ද සමඟ වෛද්‍ය රාජයන්ගේ ධර්මෞෂධයන් ක්ලේශරෝගොත්පාදක අසහාය මූල හෙතුන් සංසිඳෙන පිණිස බෙහෙවින් සේවනය කළද

එ අත්බැව්හි ධර්මාභිසමය සඞ්ඛ්‍යාත රොගොපසමයක් නොලබයි. ඔහුට බුදුරදුන් දක්මෙන් හෝ දහම් ඇසීමෙන් සිදුවන විශෙෂ ලාභයක් නැත. නොදක්නා ලදැයි, නොම ශ්‍රවණය කළැයි, සිදුවන අවැඩකුදු නැත්මය.

ඇතැම් ගිලනෙක් රොග සංසිඳුවන ආහාරපාන බෙහෙත් ගිලානොපස්ථාන ලදුවත් නොලදුවත් එම රොගයෙන් නැගී සිටී. කැසි මුස කැසුම් ඈ සවල්පමාත්‍ර රොගයෙකින් පෙළෙන බෙහෙම් වෙදහෙදකම් නොලබාවුවද දිනගණනෙකින් සුවයට පැමිණේ. රොගය දුස්සාධ්‍ය නොවන බැවින් නියමිත කාලය ගෙවෙනු සමග මැ සංසිඳීමටයෙයි. මේ ශාසනයෙහිදු **උග්ඝටිතඤ්ඤු පුද්ගලයා** එම රොගියා බඳු පැවැතුම් ඇත්තේය. ධර්ම ශ්‍රවණය කළ කෙණෙහිම ධර්මාවබොධය වීම උග්ඝටිතඤ්ඤු ස්වභාවයයි. තථාගත දර්ශනයක් හෝ ධර්ම ශ්‍රවණයක් නොලබාම වුවත් ධර්මාවබොධය ලබන පිළිවෙත්හි යෙදෙන්නට ඇතැම් කෙනෙක් සමර්ථය. පූර්වොපචිත කුසල බලයෙන් එම හැඟීම ඔවුනට පහළ වේ. කාලාතික්‍රමණයෙන් ප්‍රතිකර්ම නොකොටම රොගව්‍යුපසමය සිදුවනු මෙනි. පූර්වාත්ම භාවයන්හි කෘතාධිකාර ඇති **නාලක ස්ථවිරයන් වහන්සේ** එබඳු කෙනෙකි. බුද්ධාන්තරයෙහි එක් වරක් පමණක් පසේබුදු කෙනෙකුන්ගෙන් අවවාද ලැබ ප්‍රත්‍යෙක බොධිඥානය අත්කරගන්නා පසේබුදුන් වහන්සේ ද මේ පුද්ගල සඞ්ඛ්‍යායෙහි ලා සැලැකෙති. සත්ප්‍රාය බෙහෙත් ආහාර පානාදිය ලදහොත් ඉක්මනින් හා පහසුවෙන් සුවය ලබන්නාට යථොක්ත ගිලනාට පිළිවන. තථාගත දර්ශනය හා ධර්ම ශ්‍රවණය උපනිශ්‍රයකොට එකෙණෙහි මගපල පිළිවිදින උග්ඝටිතඤ්ඤු එබන්දෙකි.

ඇතැම් ගිලනෙක් සත්ප්‍රාය භොජන - බෙහෙත් සුදුසු උපස්ථායකයන් ලැබුණු කල්හි රොගයෙන් නැගී සිටී. නොලබන්නේ රොගීවම වෙසේ. මෙම ගිලනාට රොගොපසමනය සලසා ගැනීමට යොග්‍ය බත් බෙහෙත් උපස්ථායකයන් කෙසේ හෝ ලැබිය යුතුමය. බුදුරජාණන්වහන්සේ

ගිලන් බෙහෙත් ගිලන් බත් ගිලානොපස්ථානාදීන් අනුදන්නා ලද්දේ මොහු උදෙසාමය. අනෙක් ගිලන් පුද්ගලයන් දෙදෙනාට බත් බෙහෙත් උපස්ථානාදීන්ගෙන් එතරම් උවමනාවක් හෝ ප්‍රයෝජනයක් නොවන නමුදු මෙම ගිලනා නිසාම ඔවුනටත් උපස්ථාන කටයුතුය. සුව නොවන රෝගියාට උවටැන් නොකරන කල්හි ඔහුගේ සිත දූෂ්‍ය වෙයි. නොසලකා හැරීමකැයි සිතයි. ඉදින් මාගේ රෝගයට කළමනා ප්‍රතිකාර හා උපස්ථානාදියත් කළහොත් රෝගය සුව වන්නේය. උපස්ථානයක් නොලැබෙන හෙයින්ම රෝගය අසාධ්‍ය වන්නේයැයි සලකා සිත දූෂ්‍යකොටගෙන මියගොස් නරකයෙහි උපදින්නට පිළිවන. සුව නොවන බව දැන දැන වුවද උවමනා වත්පිළිවෙත් හා උපස්ථානාදිය කරනකල සිත සතුටට පැමිණේ. මියැගතවිට සුව නොවූයේ කර්මවිපාකයෙකිනැයි සිත මෙත්සිත පහළකැරගෙන දෙව්ලොව උපදින්නට පිළිවන. රෝගය පහසුවෙන් සංසිඳෙන ගිලනාට උපස්ථාන කළහොත් සුවය ඉක්මන් වේ. එහෙයින් මේ දෙදෙනාටම උපස්ථාන කළයුතුමැයි.

**විපචිතඤ්ඤූ පුද්ගලයා** ද යථෝක්ත ගිලනා වැන්න. හෙතෙම ධර්මාවබෝධය ලබනුයේ තථාගත දර්ශන-ධර්මශ්‍රවණා-දිය ලද කල්හිමය. නොඑසේවුව මාර්ගඵලාවබෝධයට ශක්ති-යක් නැත. දහම් කොටස් විස්තර වශයෙන් බෙද දක්වන කල්හි ම විපචිතඤ්ඤූ පුද්ගලයා ධර්ම ප්‍රතිවේධයට සමර්ථ වේ. දහම් උදෙසුම් - පිළිවිසුම් - නුවණින් මෙනෙහි කැරුම්-කලණ මිතුරන් සෙවුම් ඈ ලෙසින් මහදුත්සාහයෙන් ක්‍රියා කොට නිවන් අවබොධ කරන **නෙය පුද්ගලයා** ද මෙයට ඇතුළත් වේ. මසකට අටවරක් ධර්මදෙශනා පැවැත්විය යුතුයැයි තථාගත දෙශනායෙහි පැනෙනුයේ මොහුට වැඩ සඳහාය. ගිලන් උවැටනින් ප්‍රයෝජන ලබන එක් ගිලනෙකු නිසා අනෙක් ගිලනුන් දෙදෙනාටද උවැටන් කරනු මෙන් දහම් දෙසිය යුත්තේ විපචිතඤ්ඤූ නෙය පුද්ගලයනට වුවද අනෙක් දෙදෙනාටද අනුග්‍රහ කළ යුතුමය. පදපරම පුද්ගලයාට

මේ අත්බැව්හි දී ධර්මානිසංසයක් නොලැබෙන නමුදු ජාත්‍යන්තරයේ දී ලැබීමට ධර්ම ශ්‍රවණය උපනිශ්‍රය වෙයි. උග්ඝටිතඤ්ඤූනට ද ධර්මාවබෝධය ඉක්මනින් ලබා ගන්නට එය හේතුවන බැවින් තථාගත දේශනයත් ධර්ම ශ්‍රවණයත් හැම පුද්ගලයනට ම අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණ ප්‍රතිලාභය සඳහා පවත්නේය.

## කායසක්ඛි - දිට්ඨිප්පත්ත - සද්ධාවිමුත්ත

එකක සඞ්ග්‍රහයෙහි වෙන වෙනම මේ පුද්ගලයන් තුන්දෙනා දක්වන ලදහ. මාර්ගඵලාවබෝධය සඳහා ක්‍රියා කරන ආකාරය පිළිබඳ නානාත්වයක් මුත් ප්‍රතිපත්ති විසින් මහදන්තරයක් ඔවුනතර නොලැබේ. එබැවින් මෙහිදු එක් සඞ්ග්‍රහයෙක්හිලා දක්වෙති. නිර්වාණාවබෝධය සඳහා ශ්‍රද්ධාධික ප්‍රඥාධික වශයෙන් උත්සාහ කිරීම මෙහි ඇති වෙනසය. මොවුන්ගේ විශේෂ විභාග එකක වර්ණනයෙහි දී දක්වුණ හෙයින් නැවත මෙහි සඳහන් කරනු නොයෙදේ.

## ගූථභාණී - පුප්ඵභාණී - මධුභාණී

අසුචියක් වැනි ඇසුවනට ජුගුප්සා දනවන මිථ්‍යාබස් බණනුයේ ගූථභාණීය. මල් දිටු කලෙක මෙන් ඇසුවන් සිත සතොස් කරන සබවස් හෙපලනුයේ පුප්ඵභාණීය. කන්හි මී ඕනා කලෙක මෙන් ඇසුවන් සිත පිනායන මිහිරි බස් වහරනුයේ මධුභාණී නම් වෙයි.

**ගූථභාණී** නිතර බොරු කියන්නට පුරුදුවූ අශිෂ්ට නැනැත්තෙකි. යම්කිසි ප්‍රයෝජනයක් නැත ද ක්‍රීඩා පිණිසවත් බොරුකීම ඔහුගේ ස්වාභාවික පැවැත්මය. සාක්ෂ්‍ය විචාරන්නට පිරිස් මැදට පමුණුවා දන්නා දෙයක් හෝ දුටු දෙයක් කියවයි කියන ලද්දේ නොදන්නා දේ දනිමැයි ද දන්නා දේ නොදනිමැයි ද, නුදුටු දේ දිටිමියි ද දිටි දේ නොදිටිමියි ද, අසත්‍ය තෙපුලක් ම බෙණෙයි.

තමාගේ හෝ අන්‍යයන්ගේ හස්තපාදාදී අවයවයක් හෙතු-කොටගෙන හෝ ධන ධාන්‍යාදියක් නිසා හෝ වෙන යම්කිසි ස්වල්පමාත්‍ර අල්ලසක් හෙතුකොට හෝ අනිඹ ගස්ජක වශයෙන් දැන දැන මුසා බෙණෙයි. ඔහුගේ වාග් ව්‍යවහාරය දෙව් මිනිසුන්හට අතිශායයක්ම එළවයි. දුටු කෙණෙහි හෝ ආඝ්‍රාණය වූවිට පිළිකුල් දනවන ගුථයක් මෙන් මුසා බණන තැනැත්තහු හැමදෙනාගේ අවඥාවට භාජන වැ සමාජයට ඇතුළත් කරගැනීමට නුසුදුසු අනභිකාරී පරිසදූසක පුද්ගලයකුසේ පිළිගැනේ.

පුප්ඵභාණී සභාවකට හෝ පිරිසක් අතරට ගියද, ඥාතීන් මධ්‍යයට හෝ සේනා මධ්‍යයට ගියද රාජ රාජ මහාමාත්‍යයන් මැද තඩු විනිශ්චයක් සඳහා ගියද, සත්‍ය වචනය ම පවසයි. තමා දන්නා දුටුදේ එලෙසම ද නොදන්නා නොදුටුදේ ඒවූ පරිද්දෙන් ම ද කියන්නට නොපැකිලෙයි. තමා හා අනුන් සඳහා හෝ ධන ධාන්‍යාදි වස්තුලාභයක් පිණිස හෝ අතිමහත් අල්ලසක් ලබාගන්නා අදහසින් හෝ අසත්‍ය තෙපුල් බණන්නට කැමති නොවේ. රාජ දඬුවම් විඳින්නට සිදුවෙති යි සිතා තමා දත් දුටු දේ ඇති සැටියෙන් කියන්නට බියපත්ව පසුබට වන්නේ ද නොවේ. කොතරම් ලාභයකදී හෝ අලාභයකදී වුව ද, සම්මානයක දී හෝ දඬුවමක දී වුවද, වෙනසක් නොදක්වා සබවස රක්නේය. සුපුෂ්පිත පියුම් මහනෙල් දෑසමන් ඈ කුසුම් දක්නහුගේ සිත පිනායෙයි. ඉෂ්ට වැ කාන්ත වැ පවත්නා පුෂ්ප දර්ශනය අව්‍යාජ සුන්දරත්වයක් ලබාදෙයි. සබවස රක්නා පුද්ගලයා ද දෙව්මිනිස්නට ඉෂ්ටවූ කාන්තවූ පුෂ්පයන් බඳු තෙපුල් තෙපලනුයේ ප්‍රිය මනාප වූවෙකැයි දන්නේය.

මධුභාණී ඇසූවන් සවන් පිණවන නිර්දෙශ වූ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුත් මිහිරි වදන් වහරන්නෙකි. ඔහුගේ වාග් ව්‍යවහාරයෙහි කණ්කටුක කඨොර භාෂාවිලා-සයක් නැත. අසන්තවුන්ගේ සියල් සිරුර පැතිරී යන

ප්‍රේමණීය හැඟීම් දනවන වචන පාවිච්චි කෙරෙයි. කිසි- විටෙකත් අන්‍යයන්ගේ සිත් රිදෙන කෝපය හටගන්වන අදහස් නොපවසයි. අනරක ගැටීමක් නොමැතිව හෘදයට වැදගන්නා ශිෂ්ට වචනයෙන් කථා කිරීම මොහුගේ ලක්‍ෂණයකි. භාෂා විරොධ නොවන ව්‍යාකරණාදී අඞ්ගයන් ගෙන් සමලඞ්කෘත මෘදු කොමල වාග් විලාසයක් ඔහුට ඇත්තේය. නගරයක වැඩුණු තරුණ ස්ත්‍රියක මෙන් ඔහුගේ භාෂාව සුකුමාර ගුණයෙන් පරිපූර්ණය. ප්‍රකෘති ප්‍රත්‍ය විභාගාදියෙන් ශිෂ්ටයන් විසින් අනුශිෂ්ට වචන ව්‍යවහාරය නිසා අසන්නවුන්ගේ රුචිය පැහැර ගන්නා භාෂණයෙන් සමන්විතය. ස්ථානොචිත කථාව්‍යවහාරයෙහි දක්‍ෂය. මව් පිය සහෝදරාදීන්සේ සැලකිය හැකි වයස්ගි පිහිටියවුන් මව්පියාදි ව්‍යවහාරයෙන් අමතමින් ඔවුන්ගේ සිතු නතු කැර ගැන්මෙහි බුහුටිය. මෙපරිද්දෙන් දිව පිනවන මධුවක් මෙන් කන් පිනවන මුදුමොළොක් ව්‍යවහාරොචිත සුමධුර බස් බණනුයේ මධුභාණී නමැයි සම්මතය.

**අරුකූපමචිත්ත – විජ්ජුපමචිත්ත – වජිරූපමචිත්ත:**

පැරණි වණයකට උපමා කළහැකි සිත් ඇතියේ අරුකූපම චිත්තය. විදුලියකට උපමා කළහැකි සිත් ඇතියේ විජ්ජුපම චිත්තය. දියමන්තියකට උපමා කළ හැකි සිත් ඇතියේ වජිරූපම චිත්තය.

**අරුකූපමචිත්ත** ක්‍රොධ බහුල විහරණ ඇත්තෙකි. අනෙකකු ස්වල්ප මාත්‍ර වචනයකුදු කියන ලදුයේ ඔහු හා ගැටෙයි. නොඉවසිය හෙන ක්‍රොධයෙන් දැවෙන්නට පටන් ගනී. ප්‍රකෘති ස්වභාවය හැරපියා යක්‍ෂාවෙශ වූවකු සේ විකෘතියට පැමිණ තදඑරුෂ ලෙස ක්‍රියා කරයි. කොපයත් දූඩ් රොෂයත් නොසතුටු බවත් පහළ කොරෙමින් ඉරියවු පවත්වයි. හටගෙන මාස ගණනක් ගතව යැමෙන් පරණ බවට පැමිණි ව්‍රණය ස්වභාවයෙන් ම ලෙයත් සැරවත් ඉස්මත් වහනය කරයි. ඇතුළත පරණ වීමෙන් කුණුවී යන

මස එම තුන් ක්‍රමයෙන් බැහැර යෑම සිදුවිය යුතු හෙයිනි. මෙසේ දුස්සාධ්‍ය බවට පැමිණි ව්‍රණයෙහි කෝටු කෙළවරක් හෝ කැබිලිති කැබැල්ලක් හෝ ගැටුණ හොත් අධිකව පූයාදිය වැගිරෙන්නට පටන්ගනී. කැක්කුමත් දැවිල්ලත් ඉදිමීමත් එකවිට හටගැනීමෙන් අධිකතර නොඉවසියහැකි තත්ත්වයක් පහළ කරයි. මෙම පැරණි ව්‍රණය මෙන් ක්‍රොධ බහුල වූ වසන පුද්ගලයාත් ස්වභාවයෙන් ම සැඩ පරුෂ බැවින් යුක්තය. යම් කිසිවකු විසින් කියැවුණු වචන මාත්‍රයක පිහිටා කොපයෙන් දිලිහෙමින් ඇන බැන ගැනීම් ආදියට පෙළඹෙයි. මා වැන්නකුගේ තත්ත්වය ගැන නොසලකා අවිනීත නිහර සර බස් තෙපලතියි වඩ වඩාත් කොපයෙන් දැවෙයි. "හොස්ස අගින් මැස්සකුටවත් යානොහැකි තැනැත්තෙකැ"යි ගැමි වහරෙහි හැඳින්වෙන මොහු ඇසුරු කිරීම දුෂ්කරය.

**විජ්ජුපමචිත්ත** යනු සොතාපන්න සකදගාමි අනාගාමි මාර්ග සමඞ්ගී යොගාවචරයා හැඳින්වෙන නාමයෙකි. මෙතෙම එක් එක් මාර්ගක්ෂණයකදී ඇස් ඇති පුරුෂයකු අන්ධකාරයෙහි විදුලි එළියෙන් රූපදක්නා මෙන් තිවන් අවබොධ කෙරෙයි. ස්කන්ධ පඤ්චකය ක්ෂයව්‍යය වශයෙන් මෙනෙහි කරමින් භාවනා කරනවිට ස්කන්ධ පරිහරණය දුකැයි ද, දුක් උපදිනු යේ තෘෂ්ණායෙනැයිද, තෘෂ්ණාක්ෂය නිර්වාණය නමැයිද, අරි අටහිමඟ නිවන් අවබොධ කරන එකම මාර්ගයැයි ද, සිවුසස් පිළිවිදිමින් සොතාපත්ති මාර්ගඥානය පහළ වේ. එය අන්ධකාරයෙහි විදුලිඑළියෙන් රූප දර්ශනයක් වැන්න. ඇස්ඇති පුරුෂයකුවැනි යොගාවචරයා සෝවාන්මගින් නැසිය යුතු කෙලෙස් නමැති අන්ධකාරය දුරිභූත කෙරෙමින් එම මාර්ග ඥානය නමැති විදුලිය පහළවනවිට ගාත්පස ඇති රූපයන්ගේ දර්ශනයක් මෙන් මාර්ගක්ෂණයෙහි නිවන දක්නේය. විදුලිය කෙටීම අවසන්වනු සමගම අන්ධකාරය පැතිරී වස්තු නොපෙනී යයි. නැවත අඳුර පැතිරියෑම සකදගාමී මාර්ගයෙන් නැසියයුතු ක්ලෙශයන් ඉදිරිපත්වීම වැන්න. දෙවැනිවර විදුලිකෙටීමමෙන්

සකෘදාගාමි මාර්ග ඥානයාගේ පහළවීම වෙයි. එකෙණෙහි රූපයන් දර්ශනය වීම සෙදගැමි මගින් නිවන් දැක්ම වන්නේය. අනැගැමි මගින් කෙලෙසුන් මුලසුන් කැරුමත් අනතුරුව නිවන් දැක්මත් සිදුවනුයේ ද, නැවත ද විදුලිය කෙටීමෙන් අන්ධකාරය නැසී රූපයන් දක්නා මෙනි. මේ ආකාරයෙන් සෝතාපත්ති සකෘදාගාමි අනාගාමි මාර්ගයන්ගෙන් න සා ලි ය යු තු ක්ලේශයන්ගෙන් මිදුණු පුද්ගලයාගේ නිර්වාණාවබෝධක්ෂණයෙහි පවත්නා චිත්තය විදුලිය කෙටීමක් බඳු ක්‍රියා කිහිපයක් එක් වරම සිදුකෙරේනුයි, ඉතා ස්වල්ප කාලක් පමණක් පවත්නේනුයි, විජ්ජුපම නමින් ව්‍යවහෘතය. **වජිරූපම චිත්ත** නමින් ගැනෙනුයේ රහතන් වහන්සේය. සකල ක්ලේශයන් ප්‍රහීණ කළ උන්වහන්සේ අර්හත් ඵල සමාධිය හා අර්හත්ඵල ඥානයද උපදවා ගනුයේ විදුරු මිණකට උපමිත පැවැතුම් ඇති චිත්ත ශක්තියෙනි. අර්හත් මාර්ගඥානය දියමන්තියක් වැන්න. එම මග නැණින් නැසියයුතු අවිද්‍යාදි ක්ලේශ ජාතය මැණික් ගල්වල කපාහළ යුතු ග්‍රන්ථිස්ථාන සේ සැලකිය යුතුය. සසර අනන්තාපරිමිත කාලයක් තුළ භාවිත බහුලීකෘත වශයෙන් ඝන බහල බවට පත් වුව ද, අර්හත් මාර්ග ඥානයෙන් නොසිඳෙන ක්ලේශයෙක් නැත. කොතරම් තද ශක්තිමත් ගල් විශේෂයක් වුවද, දියමන්තියෙන් කැපී යනු මෙනි. මැණික්වල වජ්‍රයෙන් කපා හළ ගැට පිහිටි තැන් නැවත කවර ලෙසකිනුත් සම්පූර්ණ කළ නොහැකිය. රහතන් වහන්සේගේ චිත්ත-සන්තානය තුළ නැසූ ක්ලේශයන්ගේ නොපහළවීම ද එසේය. මෙපරිද්දෙන් වජ්‍රසමාන ක්ලේශච්ඡේදක අර්හත් මාර්ගඥාන යෙන් සමූලඝාතිත ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වජිරූපම චිත්ත නම් වන්නේයි.

## අන්ධ – ඒකචක්ඛු – ද්විචක්ඛු

ඇස් දෙකම නොපෙනෙන අන්ධ පුරුෂයකු බඳු පැවැතුම් ඇත්තේ අන්ධ පුද්ගලයාය. එක් ඇසක් පමණක් පෙනෙන්නකු සමාන වනුයේ ඒකචක්ඛුය. දෑසම මනාකොට

පෙනෙන පුද්ගලයකුසේ ක්‍රියා කරන්නේ ද්වි චක්ඛුය. මෙහි චක්ඛු නාමයෙන් ගැනෙනුයේ ප්‍රඥාවය. ප්‍රකෘති චක්‍ෂුවට යථාස්වභාවයෙන් රූපයන් දක්නට ශක්තිය තිබෙනුමෙන් ඥානයට ද ධර්මයන් අවිපරිතවැ අවබොධ කොටගෙන යථාස්වරූපයන් නිරූපණය කටහැකිය.

අන්ධ පුද්ගලයා දෙලොව දියුණුව සලසා ගැනීමේ ප්‍රඥාවෙන් හීනය. දෙලොවට ම වැඩ වනසේ ජීවිතය පවත්වා ගන්නට අසමර්ථය. නෂ්ටවූ චක්‍ෂුඃප්‍රසාදය ඇති අන්ධයාට වස්තුදර්ශන සාමර්ථ්‍යයක් නැත. එමෙන් උභය ලොකාර්ථය සිද්ධකරන ප්‍රඥාචක්‍ෂුස නැත්තේ ජාත්‍යන්ධයෙකු වැනිය. යම්බඳු ප්‍රඥාපූර්වාඞ්ගම ක්‍රියා මාර්ගයෙකින් නොලබන ලද උපභොග පරිභොග සම්පත් ලබාගන්නේද, ලබනලද භොගයන් සුස්ථිර වැ පවත්වමින් දියුණුකැර ගන්නේද, එබඳු මෙලොව සම්පත් වර්ධනය කිරීමේ නුවණක් මොහුට නැත. එපමණකුදු නොව කුසල් අකුසල් වරද නිවරද අධම උත්තම ධර්මයන් ද කණ්හ ධර්ම සුක්ක ධර්මයන් මනා වැ දැන කණ්හයන් සුක්කයනට ද සුක්කයන් කණ්හයනට ද විරුද්ධයැ යි දැන-ගන්නටහැකි ඥානයක් නැත. එබැවින් පරලොව දියුණුව සලසා ගැනීමකුත් ඔහුගේ ජීවිතයෙන් සිදුනොවේ. මෙසේ රූප දර්ශනාධිකාරයක් නැති අන්ධයකු සමාන වැ දෙලොවින් පිරිහෙන පුද්ගලයා නොඅන්ධවැ මැ අන්ධයෙකැ යි කියැවේ. මෙකල ඇතැම් බෞද්ධයන්ගේ ආගම ඇදහීම ද මෙම අන්ධ පුද්ගලස්වභාවයට වඩා ප්‍රඥානුරූප යැ යි කිව නොහැක. මෙලොව දියුණුව තබා පරලොව සඳහා කරන පින් දහම් වුවද ආගම විරොධ නොවන සේ කරන්නට නොදනිත්. ලොභද්වෙෂ මොහාදිය යටපත් වන සේ කරනු ලබන ආගමික ක්‍රියා පුණ්‍ය නාමයෙන් සැලකෙන නමුදු ශුක්ලධර්ම සප්‍රතිභාග වූවක්ම පින්දහම්ලෙස කරන්නට පුරුදු වැ සිටිති. යම් පින් කිරිය වතෙක්හි යෙදෙනවිට ලොභ ද්වෙෂාදිය මැඩෙනු වෙනුවට වැඩේ නම්, එය කුසලයක් නොවන බව නොවැටහෙනුයේ ප්‍රඥාපරාධයක් බඳු නුවණැස නැති කමිනි.

ඊෂ්‍යා මානාහඞ්කාරාදිය පෙරදැරි කැරගෙන ආගමික ක්‍රියා කරන්නෝ මෙලොව ධන ධාන්‍යාදියෙනුත් පරලොව පුණ්‍ය සම්පත්තියෙනුත් පිරිහෙති යි සිතත් නම් ඔවුනටත් ශාසනයටත් වනුයේ වැඩෙක්මය.

**එක චක්ඛු** එක් ඇසක් ඇත්තෙකුට එක් පැත්තක් පෙනෙනු මෙන් මෙලොව කටයුතු ගැන පමණක් බලන්නෙකි. ධන ධාන්‍යාදිය උපයා ගන්නට සූරකමත් උත්සාහයත් නුවණත් ඔහුට ඇත. පරලොවක් නැත්තකු මෙන් මෙලොව දියුණුව සලසා ගැනීමට යත්න දරයි. හවුරුදු දහස් ගණනක් ජීවත් වන්නකු සේ ධන ධාන්‍යාදිය රැස්කර තබා ගනී. සම්පත් සෙවීමෙහි ද පරිභොග යෙහිද රැස්කර තැබීමෙහි ද තෘප්තියකට නොපැමිණේ. ඉහාත්ම සැප ලබාකර ගැනීමේ ප්‍රඥව පමණක් ක්‍රියාකාරී කරවන මෙතෙමේ එක් නුවණැසක් ඇත්තේ ය යි කියැවේ.

**ද්විචක්ඛු** ඇස් දෙකම ඇති තැනැත්තකු දෙපැත්තම දක්නා මෙන් දෙලොව දියුණුව ම සාදගනී. ඇස් පෙනීම දුර්වල නොවූවකුට නොපෙනෙන රූපයක් නැත. එමෙන් මෙලොව හා පරලොව දියුණුව සලසන ප්‍රඥව කෑමැති සැප සම්පත් සාදදෙයි. ද්විචක්ඛු ඓහලෞකිකාභිවෘද්ධියට සම්බන්ධ තැනක් දරයි ද, එයට නොදෙවැනි උත්සාහයක් පාරලෞකිකාභිවෘද්ධියට ද, යොදයි. අවිපරීත ඇස් ඇත්තේ ගමනා ගමනාදිය කිසිවක ගැටීමක් නොමැතිව කරනුමෙන් දෙලොව දියුණුව පෙනෙන්නාද පසුබැසීමක් හෝ බාධාවක් නොමැතිව සිය සිතැඟි ඉටුකර ගනී. දැහැමෙන් සෙමෙන් ධනය උපයන අතර දන සීලාදී පින් දහම්හි ද යෙදෙයි. එබැවින් දෙලොව සැප කැමැත්තවුන් විසින් ද්විචක්ඛු පුද්ගලයා ම ආශ්‍රය කටයුතුය. අනෙක් පුද්ගලයන් දෙදෙන දුරින්ම දුරුකළ යුතුය. වදාළේ මැයි.

**"අන්ධඤ්ච එක චක්ඛුඤ්ච – ආරකා පරිවජ්ජයෙ**
**ද්වි චක්ඛුං පන සෙවෙථ – සෙට්ඨං පුරිසපුග්ගලං"**

**අවකුජ්ජ පඤ්ඤ - උච්ඡඞ්ග පඤ්ඤ - පුථුපඤ්ඤ.**

මුව යටට සිටින සේ පිහිටුවන ලද කළයට ඔනා ජලයක් කළය තුළට නොවැදගන්නා මෙන් සමෘති ප්‍රඥරහිත වනුයේ අවකුජ්ජ පඤ්ඤය. ඇකයෙහි බහාලූ පලතුරු ආදියක් නැගී සිටිනවිට වැතිර ගන්නාසේ තාවකාලික සමෘති ප්‍රඥයෙන් සමන්විත වනුයේ උච්ඡඞ්ගපඤ්ඤය. උඩුමුව කළ කළයට බහාලන පැනක් මනා වැ රඳන්නා සේ චිරරාත්‍රඥ සමෘතිප්‍රඥයෙන් උපලක්‍ෂිත වනුයේ පුථුපඤ්ඤය.

**අවකුජ්ජ පඤ්ඤ** ධර්මශ්‍රවණය සඳහා නිතර භික්‍ෂූන් සමීපයට යයි. එහෙත් ධර්මය සිත්ගිලා දරන්නට උත්සාහ නොකරයි. තථාගත දෙශිත ආදි කල්‍යාණාදි ලක්‍ෂණ සම්පන්න ධර්මය ඔහුට අසන්නට ලැබෙන නමුත් එය සිහියේ තබාගෙන ධර්මානුකූලව නොහැසිරේ. සීලසමාධි ප්‍රඥවන් කුළු ගැන්වෙන පරිදි සුන්දර වැ නිරවද්‍යලෙස අවස්ථාවෝචිත දහම් දෙසුම කල්‍යාණ නමින් සැලකේ. ආදි මධ්‍ය පර්‍යවසාන වශයෙන් ධර්ම දෙශනායෙහි කල්‍යාණ-ත්‍රයයක් වෙයි. පාද සතරක් ඇති ගාථාවක පළමු පාදය ආදිය නම්. දෙවන තුන්වන පාදයන් සැලකෙනුයේ මධ්‍ය වශයෙනි. අන්තිම පාදය පර්‍යවසානය යි. එකානුසන්ධික සූත්‍රයක්වුව, නිදානය ආදියයි. අනුසන්ධිය මධ්‍යයයි. ඉදමවොචාදී වාක්‍ය ප්‍රදෙශය පරියොසානය යි. ඉදින් සූත්‍රය අනෙකානුසන්ධිකයක් වුව, ප්‍රථම පශ්චිම අනුසන්ධිහු ආද්‍යවසානයෝය. අතරවූ එකක් හෝ අනෙකවූ හෝ අනුසන්ධි ඇත ඒ සියල්ල මධ්‍යයයි. මෙපරිද්දෙන් දෙශනායෙහි පමණක් නොව ශාසනයෙහි ද ආදිමධ්‍ය පර්‍යවසානයෝ ඇත්තාහ. ශාසනයෙහි වනාහි ආදිය වනුයේ ශීලයයි. සමාධිය මධ්‍යයයි. විපස්සනාව පරියොසානයයි. නොඑසේනම් සමාධිය ආදියයි. විපස්සනාව මධ්‍යයයි. කෙළවර වනුයේ මාර්ගයයි. නවද උසස් ලෙස සලකනවිට විපස්සනා - මග්ග ඵලයෝ පිළිවෙළින් ආදි මධ්‍ය පර්‍යවසාන සේ සැලකෙත්. මග්ග - ඵල නිබ්බාණ ආද්‍යාදී ලෙසින් ගැනිම ද කෙරෙති.

දෙකක් බැගින් එක්කොට සලකන කල්හි ආදිය සීලසමාධීහු ද මධ්‍යය විපස්සනා මාර්ගයෝද-පරියොසානය ඵලනිර්වාණයෝ ද වෙත්මය. දහම් දෙසන්නහු මෙම ත්‍රිවිධ කල්‍යාණයන්ගෙන් අනූනව ම දහම් දෙසිය යුතුය.

**"ආදිම්හි සීලං දස්සෙය්‍ය – මජ්ඣෙ මග්ගං විභාවයෙ**
**පරියොසානම්හි නිබ්බාණං – එසා කථිකා සණ්ඨිති." යි**

දක්වෙනුයේ දෙශනා ක්‍රමයෙහිදු යථොක්ත ත්‍රිවිධ කල්‍යාණයන් සුදුසු පරිදි යෙදිය යුතු ආකාරයයි. මෙසේ ත්‍රිවිධ සුන්දරත්වයෙකින් සමන්විත ශ්‍රී සද්ධර්මය සාර්ථක වැ බ්‍යඤ්ජන සම්පත්තියෙන් අනූන වැ ග්‍රන්ථිස්ථානයන් විසද වැ පළට වනසේ දෙශනා කිරීම සිරිති. හෙද ශික්ෂා ත්‍රයයෙන් සඞ්ගෘහිත ශ්‍රෙෂ්ඨ චර්‍යාව යැයි කියහැකි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ප්‍රකාස කරන්නක් විය යුතුය. මෙම ලක්ෂණයන්ගෙන් පරිපූර්ණව දෙශනා කරනු ලබන ධර්මය ශ්‍රවණ මාධුර්‍ය්‍යයෙන් කර්ණරසායන වුවද, අවබොධයට පහසුවුවද, අවකුඤ්ජපඤ්ඤ පුද්ගලයා එහි ආදිමධ්‍ය අන්තයන් සිත්හිලා නො දරයි. බණ අසා නැගී සිටීයේ ඇසූ කිසිවක් සඳහන් නොකෙරෙයි. මුව යටකොට තුබූ කළයකට ජලය කොතරම් වත්කළද බැහැර යනු මිස ඇතුළතට වැදගැන්මක් නොවනු මෙනි.

**උච්ඡඞ්ගපඤ්ඤ** පූර්වොක්ත සාර්ථකාදී ලක්ෂණ සම්පන්න ධර්ම ශ්‍රවණය කරනුයේ එහි ආදිය සිහියේ තබා ගනී. මධ්‍යය ද විස්මෘත නොකෙරෙයි, අන්ත්‍යය ද මනාලෙස මතකතබා ගනී. එහෙත් ශ්‍රවණයෙන් පසු නැඟීසිටියේ ඒ කිසිවක් සිහියේ තබාගන්නට සමර්ථ නොවේ. ඉරියව්ව වෙනස්වනු සමගම එතෙක් සිහියේ තිබුණු සියල්ල විස්මෘත වෙයි. ඇකයෙහි තිලතණ්ඩුලාදියක් හෝ ඩෙබරාදී පලතුරක් හෝ මොදකාදී ඛාද්‍ය විශෙෂයක් හෝ තබාගෙන හුන් පුද්ගලයකු ඒ බව නොසඳහන්ව සිහිමුළායෙන් නැගී සිටිනවිට සියල්ල විසිරි යන්නේ යම්සේද එමෙන් උච්ඡඞ්ගපඤ්ඤ පුද්ගලයාද ධර්මය අසනතාක් සිහියේ තබාගෙන ඉන් නැගී සිටිනවිට ම විස්මෘත කෙරෙයි. එසේ හෙයින් ඇකයෙහි බහාලන ලද්දක් වැනි පැන පැවතුම් ඇත්තේයැ යි කියැවේ.

**පුථුපඤ්ඤ** යම් ආසනයක හිඳ ධර්මය අසන්නට පටන් ගත් කල්හි එහි ආදිමධ්‍ය පර්‍යවසානයන් මනාකොට සිහියේ පිහිටුවාගෙන ශ්‍රවණය කරයි. ඉන් නැඟීසිටි කල්හිද කිසි වෙනසකට නොපැමිණ ඇසූ ධර්මය මනාලෙස දරා-ගන්නට සමර්ථය. උඩුකුරු කරනලද කළයකට වත්කරන ජලය එහි රැඳෙනු මෙන් ඇසූ ඇසූ දෙය සිතෙහි තැන්පත් කරගන්නට පිළිවන් විස්තෘත ප්‍රඥාවක් ඔහුට ඇත. මෙම ත්‍රිවිධ පුද්ගලයන් අතුරින් පුථුපඤ්ඤ දහම් උගෙන ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි හැසිර නිවන්පුර වදනේයි.

**කාමභව අවිතරාග – කාමවිතරාග භව අවිතරාග– කාම භව විතරාග:-**

පඤ්චකාම සම්පත්තීන්හි ද ත්‍රිවිධ භවයන්හි ද පහනොවූ ඇල්ම ඇතියේ කාමභව අවීතරාගය. පස්කම් සැප දුරුකළ නමුදු භවාසාව පහනොවූයේ කාම විතරාග භව අවීතරාගය. කාම-භව දෙක්හි ම ඇල්ම පහකළේ කාමභව වීතරාගය.

**කාමභව අවිතරාග** රූප – සද්ද ගන්ධ රස පොට්ඨබ්බ යන පස්වැදෑරම් කාමයන්හි අනුගතය සමන්විතය. කාම රූපාරූප එක්තිස් භවයන්හි ඇලෙන ස්වභාවයෙන් යුක්ත බහුල කාම භව රාග සම්පන්න පෘථග්ජන පුද්ගලයා ප්‍රධාන වශයෙන් මෙයට ඇතුළත් වේ. එහෙත් හෙතෙම ආර්‍යයන්ගේ නතු පිරිසිඳින තැනක් හෙයින් මෙහිලා නොසැලකේ. **ස්වල්ප වශයෙන් කාමයන්ගෙන් හා භව ප්‍රාර්ථනාවන්ගෙන් මිදුන සෝතාපන්න සකෘදාගාමි පුද්ගලයෝ ම මෙයට ඇතුළත් වෙත්.** ලී ගැනීම පිණිස වන වැදුන දක්ෂ වඩුවෙක් ඉදිරියට හමුවන හැම රුකක්ම නොකපයි. ඇදකුද නැති මහත් හරබර ඇති වටනා වෘක්ෂයන් ම සොයාබලා ඒ සඳහා තෝරාගනී. නමා අදගස් කරන භාණ්ඩයන් සාදා ගැනීමට යෝග්‍ය ලී වශී එබඳු ගස්වලින් සපයා ගැනීම නුවණට හුරු හෙයිනි.

එමෙන් බුදුරජාණන් වහන්සේ සසරින් එතරවන ස්වභාවයෙන්යුත් භාජනභව්‍ය පුද්ගලයන් වෙමින් පවත්නා ආර්‍යයන් අතර දිස්වෙන ස්වල්ප වෙනස්කම් මුල්කොටගෙන මේ පුද්ගල භෙදය බෙද දක්වූහ. යථොක්ත සෝතාපන්න සකෘදාගාමීහු පඤ්චකාම ගුණිකරාගයෙන් හා භව රාගයෙන් සමන්විත වූවාහු තමුදු භවෙක දෙශයකින් මිදුනවුන් වැන්නහ. සෝතාපන්න උඩත් පිරිසෙයින් කාමභවයෙහි සත්වරක් ද, සකෘදාගාමී එක්වරක් ද, ප්‍රතිසන්ධිගෙන එහි ආලය හැර පියන හෙයිනි.

**කාම විතරාග භව අවිතරාග** පඤ්චකාම ගුණයන්ගෙන් දුරුවූ තමුදු භවාශාව පහනොවූ කෙනෙකි. කාම රාගාදිය මූලොච්ඡින්න කළ බැවින් කාම සම්පත්තින්හි ඇලයක් නැතද, රූපා'රූප භව තිකාන්තිය ඔහු තුළ බලපායි රූපරාග – අරූපරාග – මාන – උද්ධච්ච – අවිජ්ජා යන සංයෝජනයන්ගෙන් සංයුක්ත වැ වාසය කිරීම එයට හෙතුවය. කාමභවය කරා ප්‍රතිසන්ධි වශයෙන් කිසිකලෙකත් නොපැමිණෙන අනාගාමී ආර්‍යයා මේ නාමයෙන් අදහස් කෙරෙයි.

**කාම භව විත රාග** පඤ්ච කාමයන්හි ද ත්‍රිවිධ භවයන්හි ද පවත්නා ඇල්ම අර්හත් මාර්ගඥානයෙන් මූලොච්ඡින්න කළ රහතන් වහන්සේය. කාම භව බන්ධනයන් ඡින්න භින්න කළ උන්වහන්සේ තුළ කාම භවයන් පිළිබඳ තෘෂ්ණා ඒකාන්තයෙන් ම නැත.

**පාෂාණ ලෙඛූපම–පඨවි ලෙඛූපම–උදක ලෙඛූපම:–**

ගලෙහි කොටන ලද රේඛාවක් මෙන් බොහෝකල් පවත්නා ක්‍රොධයෙන් යුක්ත පුද්ගලයා පාෂාණ ලෙඛූපමය. පොළෝතෙලෙහි අඳිනලද රේඛාවක් ඉක්මනින් මැකියනුමෙන් හටගත් ක්‍රොධය ස්වල්ප කලක් පවත්නා පුද්ගලයා පඨවි ලෙඛූපමය. ජලයෙහි අඳිනලද රේඛාවක් එකෙණෙහිම මැකී යනුමෙන් හටගත්විට ම සංසිඳියන ක්‍රොධයෙන් යුත් පුද්ගලයා උදක ලෙඛූපමය.

**පාසාණ ලෙඛූපම** නිරන්තරයෙන් ක්‍රොධ බහුලව වසන්නෙකි. අන්‍යයන් හා නොගැලපෙන ස්වල්පමාත්‍ර කාරණයක් එළඹිකල්හිද ක්‍රොධයෙන් පිපිරෙමින් දිලිහෙයි. යම් කෙනෙකුන් හා වෛර වූවහොත් එය දීර්ඝකාලයක් මුළුල්ලෙහි ඇතුළත පැසවමින් පවත්වාගෙනයයි. ක්‍රොධයට භාජන වූ පුද්ගලයා පිළිබඳ අරමුණක් පහළවූවිට අනුසය වශයෙන් සන්තානය තුළ පිහිටි වෛරය නැඟී එයි. ගලෙක කොටනලද රෙඛා වාතයෙන් හෝ ජලයෙන් හෝ විනාශයට නොපැමිණ අනාරතුරෙක නොමැකී කල්ප විනාශය තෙක් පැවතිම ස්වාභාවිකය. එමෙන් මොහු තුළ හටගත් ක්‍රොධයද දෙවන දිනයෙහි හෝ අනෙක් දිනයක හෝ නොසංසිඳේ. දීර්ඝකාලයක් මුලුල්ලෙහි පවතී. ඇතැම්විට ආයුෂ් කල්පයාගේ විනාශයෙන් පමණක් නැතිවයෙයි. "සාඤ්ඤපුට" වෙළෙඳහුගේ මෙන් ජාති සතසහස්‍රයෙක්හි පවා පවතින්නට ද නොහැකි නොවේ.

**පඨවි ලෙඛූපම** නිතර කිපෙන්නෙකු වුවද, එම ක්‍රොධය වැඩිකාලයක් නොපවත්වයි. ක්‍රොධහෙතුන් නුවණින් සලකා බලා ඉක්මන් කමින් කිපියේ වරදකැ යි සිතා ක්‍රොධාදීනව මෙනෙහි කොට එය හැර දමයි. මොහුගේ ක්‍රොධය පොළොවෙහි ඇඳී ඉරක පැවැත්මක් වැන්න. වාත වෙගය-කින් හෝ ජල පහරකින් හෝ පසෙහි අඳින ලද රෙඛාව මැකී යනු මෙන් මෙම පුද්ගලයා ද තමා තුළ පහළවූ ක්‍රොධය කරුණු සැලකිමෙන් කල්නොගෙවා සංසිඳවා ගනී.

**උදක ලෙඛූපම** ක්‍රොධ ප්‍රහාණය කළ කෙනෙකුන් මෙන් ශාන්ත පැවැතුම් ඇත්තේය. කියිවකු මර්මච්ඡෙදක නද වචනයෙන් හෝ කණට අමිහිරි ඵරුෂ වචනයෙන් හෝ සිතෙහි සන්තොෂය දුරුවන නොකත්කලු වචනයෙකින් හෝ දොෂාරොපණ මුඛයෙන් බණන කල්හි නොකිපෙයි.

යම්හෙයකින් ක්‍රොධය පහළවුවද එවිගසම නිවාගනී. ක්‍රොධය හටගන්නා දේ කොතෙකුත් කියුවද විරූදුව බණින්නා හා සිතින් සැසඳෙයි. යෑම් ඊම් ආදී කායික ක්‍රියාවන්හිදී ද ඔහු හා ගැලපෙයි. මුවෙන් බණන නොපුලිනුදු වෙන්නොවැ එකී භාවයෙන් සම්බන්ධවෙයි. තවද යම් වැඩක යෙදී සිටියදී ක්‍රොධොත්පාදක දෙයක් සිදුවුවද එක්වම ක්‍රියා කාරීන් සැසදී එහි යෙදෙයි. එම ක්‍රියායෙහි භාගයක් නිමවනවිටද සම්බන්ධය නොහරී. එහි කෙළවරතෙක් නොනවතිනුයේ මිතුරන් මෙන් සතුටුවම ක්‍රියාකෙරේ. ජල රේඛාවක් ඇඳගෙන යනවිට ම මැකීගෙන යනුමෙන් මොහුගේ සන්තානයෙහි ස්වල්ප ප්‍රමාදදෙෂයකින් හටගත් ක්‍රොධය පහළවනු සමගම නිවීයන්නේය.

## ත්‍රිවිධ පොත්ථකූපම පුද්ගලයෝ:

හණ වැහැරින් කළ පිළියකට උපමා කළහැකි ගතිගුණ සම්පන්න පුද්ගලයෝ තුන්දෙනෙක් මෙ සසුන්හි දක්නා ලැබෙති. හණ පිළියක අවස්ථා තුනක් දක්ක හැකිය. අලුත වියනලද පරිභොග නොකළ පිළිය. පරිභොග කිරීමෙන් අලුත් ස්වභාවය ඉක්මගිය නමුදු ජීර්ණභාවයට නොපැමිණි පිළිය. පරිභොගයට නුසුදුසු විලස දිරාගිය පිළිය යන වශයෙනි. හණ පිළිය මේ අවස්ථාත්‍රයෙන් කවර අවස්ථාවක පිහිටියත් වුවද දුර්වර්ණය. දුඃඛස්පර්ශයෙන් යුක්තය. වටිනාකමින් අඩුය. ඉතා අගනාවිටකදී ද කහවණුවකට වඩා වටනේ නොවේ. මේ අන්දමින් හණ පිළිය ස්වභාවයෙන්ම වර්ණයෙනුදු, ස්පර්ශයෙනුදු, වටිනා කමිනුදු, සැලකිය යුතු තත්ත්වයක් නොලබයි. එමෙන් මෙසසුන්හි කොලෙසුන් මූලසුන් කරන්නට පිළිපන් භික්ෂූන් අතර ලාමක ස්වභාව ඇති දුශ්ශීල භික්ෂුව නවකවුවද මධ්‍යම වුවද ථෙරභාවයට පැමිණියෙකුවුවද යථොක්ත හණ පිළියක පවත්නා තත්ත්වය හා සමානය. උත්පත්තියෙන් සැටවයස්ගිය කෙනෙකුත් නමුදු උපසම්පදාව ලබා පස්වසක් නොයික්මවූයේ නම් එම

භික්ෂුව නවකයෙකුසේ සැලකේ. හණ පිළිය අලුත්වූවද දුර්වර්ණ වනුමෙන් නවක භික්ෂුව දුශ්ශීලවූයේ දුර්වර්ණ බවට පැමිණේ. පිරිස් මැදට ගියේ ගුණ තෙජස් නැතිහෙයින් ශරීරවර්ණ-යෙනුදු පිරිහෙයි. ගුණ ශරීරයක් අවිද්‍යමාන හෙයින් ගුණ වර්ණය පිළිබඳ කියයුත්තක් ම නැත. යම් ඤාති මිත්‍ර උපස්ථායකාදී කෙනෙක් ඔහු සෙවනය කෙරෙද්ද ඔහුගේ දෘෂ්ටියට අනුව හැසිරෙත්ද ඔවුනට එම සෙවනයෙන් ජනිත අකුසල විපාකය දීර්ඝකාලයක් අහිත පිණිස දුක්පිණිස පවත්නේය. **“දෙවදත්ත”** ස්ථවිරයන් ඇසුරු කිරීමෙන් **“කෝකාලික”** ස්ථවිරාදීනට මහත් ව්‍යසනයට පත්වන්නට සිදුවූවා මෙනි. හණ පිළියේ ස්පර්ශය දුක් වේදනා දනවනු මෙන් දුශ්ශීල පුද්ගලයාගේ ස්පර්ශ සඞ්ඛ්‍යාත සෙවනය දුක් උපදවනුයේ මේ ආකාරයෙනැයි දතයුතුය. හණ පිළියේ සැලකියයුතු වටනාකමක් නැත්තේ යම්සේද මේ පුද්ගලයාට පිළිගැන්වූ චීවරාදී සිවුපසයෙන් උපදනා පිනද මහත් ඵල මහානිශංස නොවන්නේය. උපසම්පදාවෙන් පස්වසේ පටන් නවවස් දක්වා වූ දුශ්ශීල මජ්ඣිම භික්ෂුවද දසවසේ පටන් ස්ථවිර භාවයට පැමිණි දුශ්ශීල භික්ෂුව ද දුර්වර්ණදුඃඛස්පර්ශ අල්පාර්ඝ වනුයේ මෙලෙසිනි. අන්‍යයනට අවවාද අනුශාසනා කරන්නට සුදුසු උත්පත්තියෙන් හා පැවිදි කම්නුත් මහළු (-ස්ථවිර) බවට පැමිණි භික්ෂුව වුවද දුශ්ශීල වැ වෙසේ නම් ඔහුගේ අවවාදදියෙහි පිහිටන්නෝ නැති. සඞ්ඝයා මැද යුක්ති විචාරණයට පැමිණ යම් කථාවක් කරනවිට නොප-වැති බාල පැවැත්මෙන් යුත් අව්‍යක්තයෙකුගේ කථායෙන් කිම? තොපිම අන්‍යයන් විසින් කිවයුතු වන්නහුයැ යි ඔහුගේ කියමන නොපිළිගැනේ. එයින් කොපයටපත් හෙතොම උක්ඛෙපනීය කර්මය කරන්නට සුදුසු වචන පාවිච්චි කරයි. ඒ හෙතුවෙන් සඞ්ඝයාගෙන් වෙන්ව වසන්නට ඔහුට සිදුවේ. දිරාගිය හණපිළිය හැළිවළං පිසීමට හෝ කසළ ගොඩට හෝ දමා ඒ පිළිබඳ ආසාව හැර පියන්නා මෙනි.

## ත්‍රිවිධ කාසික වස්ත්‍රෝපම පුද්ගලයෝ:

ඉතා සියුම් වස්ත්‍රයක් වූ කාසිසළුව පරිභොගයට නොගත් අලුත් එකක් වුව ද, මදක් පරිභොග කරනලද්දක් වුව ද, කලක් මුළුල්ලෙහි ප්‍රයෝජනයට ගැනීමෙන් දිරාගිය එකක් වුවද, නෙත් සිත් පැහැර ගන්නා මනා වර්ණයෙන් යුක්තය. එකාකාරව සුවපහස් දනවන සුළුය. කාසි සාටකය අභිනවයෙන් වියනලද්දක් නම් එහි වටිනාකම මෙතෙකැයි පිරිසිඳිය නොහැකි තරම්. මදක් පරිභොග කිරීමෙන් පරණ බවට පත් වස්ත්‍රයක්වුව විසිහිස් දහසක් වටනේය. පරිභොග නොකළහැකි තරම් දිරාගියේ අට දහසක් හෝ දසදහසක් හෝ අගනේය. මේ ආකාරයෙන් කාසි සළුවෙහි වර්ණය ද ස්පර්ශය ද සැමවිට එක්ලෙසම පවතිනු පමණක් නොව අගය වෙනස් වනුයේ ද ස්වල්ප වශයෙනි. මේ ශාසනයෙහිද යථොක්ත කාසි සළුවට උපමා කළහැකි පුද්ගලයෝ තුන්දෙනෙක් විද්‍යමාන වෙති. නවක මජ්ඣිම ථෙර වශයෙන් අවස්ථාත්‍රයක වෙසෙන ඔවුන්ගේ සිලගුණයත් කල්‍යාණධර්මයන්ගෙන් හොබනා කමත් කාසි-සළුවෙහි සුවර්ණතාව වැන්නැයි කිවහැක. ඇසුරුකරන්නවුනට දිඝී කාලයක් හිත සැප පිණිස පැවතිම සුඛ ස්පර්ශය වෙයි. ඔවුනට සිවුපසයෙන් සඞ්ග්‍රහ කරන්නවුනට අත්පත් වන මහත්ඵල මහානිශංසය මහ'ඇඟි බව වෙයි. **ශාරිපුත්‍ර මහා මෞද්ගල්‍යායනා' දි** මහා ශ්‍රාවකයන් තිස්‍ස සවර්ගී'පවර්ගී දී සැප සම්පත් සාධාගත් සත්වයන්ගේ ප්‍රමාණයෙක් නැත. අද දක්වාම උන්වහන්සේලා අනුගමනය කරමින් ගුණදහම් සපුරා සසරින් එතර වන්නෝ බොහෝය.

මෙම කාසික වස්ත්‍රෝපම පුද්ගලයන් අතුරෙන් ස්ථවිර භික්ෂුව සඞ්ඝයා මැද අවවාද අනුශාසනා මුඛයෙන් කථා කරන්නට පටන්ගනුත් ම **"ආයුෂ්මත්නි; නිශ්ශබ්දවවු, ස්ථවිර භික්ෂුව ධර්මයත් විනයත් කියති"**යි අනෙක් භික්ෂුහු ගරු බුහුමතින් යුක්තව උන්වහන්සේගේ අර්ථ නිශ්‍රිත වචනයනට කන්යොමු කෙරෙත්. එය ධැරිය යුත්තක් කොට ගනිත්. කාසි සළුව පරිභොගයෙන් දිරාගියේ නමුදු මැණික්

ආ දී රත්නවර්ගයක් ඔ තා තබන්නට හෝ සුගන්ධ කරණ්ඩකයෙක්හි ලා ප්‍රවේශමට තබන්නට හෝ කිසිසේත් බැහැර ලීමෙක් නොවේ. එමෙන් කොතරම් මහළු වැ ගියද සිල්වත් භික්ෂූන් වහන්සේගේ ධර්මප්‍රතිසංයුක්ත කථාව මුදුනින් පිළිගෙන හෘදයෙහි තැන්පත් කරගත යුත්තක් බවට පැමිණේ.

**සුප්පමෙය්‍ය – දුප්පමෙය්‍ය – අප්පමෙය්‍ය**

කවුරුන් විසින් වුවද මැනගත හැකි අගුණයන්ගෙන් ගහන හෙයින් සුවසේ පහසුවෙන් ප්‍රමාණ කරන්නට පිළිවන් පුද්ගලයා සුප්පමෙය්‍යය. අගුණයන්ගෙන් තොර වැ වසන හෙයින් දුකසේ අපහසුවෙන් මැනැගත හැකි වනු යේ දුප්පමෙය්‍යය. ගුණ ප්‍රමාණයාගේ මහත්ව හෙතුයෙන් කිසිලෙස කිනුත් මැනගත හැකි නොවනුයේ අප්පමෙය්‍යය.

**සුප්පමෙය්‍ය** බැලූ බැල්මටම ඔහුගේ ප්‍රමාණය – නියම තත්වය අන්‍යයන් විසින් දතහැකි සේ හැසිරෙයි. හේ උඩඟුය. හිස් මාන්නයෙන් එසවුණු පැවතුම් ඇත්තේය. සමීරගතියක නොපිහිටන චපල කමින් යුක්තය. සැර පරුෂ නොහික්මුණු වදන් බණන සුළුය. හැතිගත් මුවදෙනක ගව දෙනක මෙන් එක් අරමුණක පිහිටුවා ගත නොහැකි සිතැත්තේය. ස්වල්ප ජලයක ප්‍රමාණය පහසුවෙන් අවබෝධ වනු මෙන් යථොක්ත දුර්ගුණ ගහනයෙන් ගැවසිගත් හෙතෙම නිරායාසයෙන් ම මැනේ. අන්‍යයන් විසින් ඔහුගේ සම්පූර්ණ තත්වය අනාවරණය කැරගැන්ම දුෂ්කර නොවේ.

**දුප්පමෙය්‍ය** යථොක්ත සුප්පමෙය්‍ය ලක්ෂණයන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙන්ව ක්‍රියා කරන්නෙකි. එබැවින් අනෙකකු විසින් මැනගත හැකි වනුයේ දුකසේ අපහසුවෙනි. සුප්පමෙය්‍යයාට හාත්පසින් ම ප්‍රතිපක්ෂ පැවැතුම් ඇත්තෝ අනුද්ධතාදී ගුණයන්ගෙන් අනූනය. ප්‍රමාණ කරන්නවුන්හට අනාගාමී සොතොක්ද නොඑසේ නම් ක්ෂීණාශ්‍රව කෙනෙක්දැයි සැක දනවයි. ඇතැම්විට අනාගාමී ආර්යයෙකැ යි හැගේ.

තවත් වරෙකදී රහත් කෙනෙක්මයැ යි තීරණයට බසින්නට සිදුවේ. සාගර ජලය දූකසේ අපහසුවෙන් ප්‍රමාණ කරනු මෙන් ගුණ ප්‍රමාණය ප්‍රමිත කරන්නට අපහසු වනුයේ දුප්පමෙය්‍ය නමැයි දන්නේය.

**අප්පමෙය්‍ය** ප්‍රමාණයකට බැසගත නොහැකි ගුණයන් ගෙන් හෙබියේය. අහසෙහි ප්‍රමාණය මෙතෙකැයි පරිච්ඡෙද වශයෙන් දැනගත හැකිනොවේ. ප්‍රමාණාතීත ප්‍රදෙශයෙක්හි අහස පැතිර තිබෙන හෙයිනි. එමෙන් සකල ක්ලෙශයන් විධ්වංසනය කොට අග්‍රඵල සමාධියත්, අග්‍රඵල ප්‍රඥාවත් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොටගෙන එයට පැමිණ වසන අප්පමෙය්‍ය පුද්ගලයා සඞ්ඛ්‍යාපථාතීත ගුණොප- ශොභිතය. උන්වහන්සේගේ ගුණසමුදයය මැන ප්‍රමාණ කරන්නට සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයෙකුට තබා නමාබදු අග්‍රීන් ගුණ සමන්නාගත කෙනෙකුත් හටද අපහසුය. ලොකයෙහි කවර මැනුම් ක්‍රමයකට වුවද ලොකොත්තර ගුණයන් ප්‍රමිත කරන්නට ශක්තියක් නැත.

### නසෙවිතබ්බ - සෙවිතබ්බ - සක්කච්ච ගරුකච්ච සෙවිතබ්බ:

තමහට වඩා සීලසමාධි ප්‍රඥාවන්ගෙන් හීන පුද්ගලයා දයාවෙන් හා අනුකම්පාවෙන් මුත් සෙවනය කිරීමෙන් අභිවෘද්ධියක් නොවන හෙයින් න සෙවිතබ්බය. සීලාදී ගුණයන්ගෙන් සමාන වනුයේ සෙවිතබ්බය. අධික සීලාදි ගුණසම්පන්න වනු යේ සත්කාර සම්මාන පූජාඞගව ව සෙවිතබ්බය.

**න සෙවිතබ්බ** සීලසමාධි ප්‍රඥාවන්ගෙන් හීන තැනැත්තෙකි. යහගුණයන්ගේ වැඩීමක් ඔහු කෙරෙහි නැත්තේය. පඤ්චශීල අෂ්ටාඞ්ගශීල චතුපාරිශුද්ධි ශීලාදී උතුම් ගුණයක් හෝ සංඥන් ඉඳුරන්ගෙන් පු ත් විශෙෂකාග්‍රභාවයක් හෝ ලෞකික ලොකොත්තර ප්‍රඥසම්පත්තියක් හෝ ඔහු තුළ අවිද්‍යමානය. අභිමතාර්ථ සාධක උත්තම ගුණයන්ගෙන් හීනවූවහු සෙවනය භජනය පර්‍ය්‍යුපාසනය නොකට යුත්තෙකි.

ඔහුගේ ආශ්‍රයෙන් රක්නා සීලාදී ගුණ නැසෙයි. නොරක්නා ගුණ කිසිසේත් නූපදියි. පඤ්ච ශීලය රක්නා කැනැත්තකු එම සීලයෙන් තොරවූවකු ද, දසසිල්හි පිහිටියකු පන්සිල් රකින්නකු ද, සිවුපිරිසිදු සිල් රකින්නකු දසසිල් රකින්නකුද ඇසුරු කිරීම නොකළ යුතුය. තමහට වඩා සීලසමාධි ප්‍රඥාවන්ගෙන් හීනයන් ඇසුරු කිරීම ඒ ඒ ගුණයන්ගෙන් පිරිහීමට හෙතුවන හෙයිනි. එසෙත් හුදු පිරිසිදු අදහසින් තමාගේ ප්‍රයෝජනයක් ගැන නොසලකා ඔහුට වැඩක් ම වේවා යි දයාවෙන් හා අනුකම්පාවෙන් හරිත සිතින් යුක්තව තම් සෙවනය කරන්නට වටනේය.

සෙවිතබ්බ: සෙවනය කරන්නට සුදුසු තත්ත්වයක් ඇති කෙනෙකි. සීල සමාධිප්‍රඥ ගුණයන්ගෙන් ඇසුරු කරන්නා හා සමාන ස්ථානයක් භජනය කරන මෙනෙම හමුවූවිට කථාකරනුයේ සීලාදී ගුණයන් පිළිබඳවමය. අන්‍යෝන්‍යයන් සමාන ගුණයන්ගෙන් සමන්විත හෙයින් එක්කෙනෙකුන් කරන කථාව අනෙකා සන්තොෂයෙන් පිළිගනියි. අදහස් වශයෙන් ගැටීමක් පහළ නොවේ. එසකුදුස්සීල වැ සීල ගුණයන් පිළිබඳ වැ කරන කථාව අනුචිත කථාවක් මුත්සීල කථාවක් නොවේ. එබදු කථාවෙන් පහසු විහරණයට බාධා පැමිණේ. බොහෝ වෙලාවක් පවත්නේ ද නොවේ. සීලගුණ සම්පන්න පුද්ගලයා එයට කන්යොමු කරන්නට මැලිවෙයි. සමාන සීල-සමාධි ප්‍රඥාවන්හි පිහිටා කරනු ලබන කථාව කොපමණ කාලය ගියද අවසන් නොවන සුළුය. සමහරවිට රෑ දවල් දෙක ඉක්ම ගිය නමුත් ඒ බවක් නොදනම කථාව නවදුරටත් පැවැත්වේ. අන්‍යෝන්‍යයන් අතිශයින් රුචිකරන දෙයක්වීම එයට හෙතුවය.

සෙවිතබ්බ පුද්ගලයා ඇසුරු කරන්නවුනට සීලාදී ගුණදහම් වඩා ගන්නට පහසුකම් සැලසේ. සිතෙහි පසු බැසීමක් හටගත් කළ ධෛර්‍යවත් වනසේ උපදෙස් දීමෙන් හෙතෙම උපකාර කරයි. අවවාද දයක ස්ථානයෙහි පිහිටා

ක්‍රියා කරන ඔහු ඇසුරු කළ යුතුය. සම්බන්ධකම් පැවැත්වීය යුතුය. සම්පාවචර වැ කථා කරනු සඳහා නැවත නැවත ඔහුවෙත එළඹිය යුතුය.

**සක්කච්චා ගරුකච්චා සෙවිතබ්බ** ගරු බුහුමන් පෙරටු කොට ආශ්‍රය කළයුතු අධික සීලාදී ගුණදහමින් හෙබි කෙනෙකි. ඇසුරු කරන්නහුට වඩා සීල සමාධි ප්‍රඥාවන්ගෙන් අධිකවූ ඔහුගේ සම්පාශ්‍රය නොපිරුණු සීලාදිය පුරන්නට ද දතගතයුතු ධර්මයන් දතගන්නට ද හෙතුවේ. තමා රක්නා ගුණයනට අසත්ප්‍රාය අනුපකාරක ධර්මයන් දතගත හැකි වනුයේ ගුණාධික පුද්ගලයකු ඇසුරු කිරීමෙනි. හැරදැමිය යුතු දැය දුරුකොට සත්ප්‍රාය උපකාරක ධර්මයන් සෙවනය කොට අදහස් මුදුන්පත් කරගන්නට සදුපදෙශයක පිහිටා ක්‍රියා කළ යුතු හෙයින් ගරුබුහුමන් පෙරටුකොට සෙවනය කළයුතු පුද්ගලයාගේ ආශ්‍රය දෙලොව දියුණුවට ඉවහල් වේ. මෙම පුද්ගලයන් තුන්දෙනාගෙන් හීනතරයා ඇසුරු කිරීමෙන් ආශ්‍රිතයා නිරන්තරයෙන් පිරිහේ. සමානයා සෙවනය කරනුයේ හානියෙක් නොවේ. ශ්‍රෙෂ්ඨයා සෙවුනේ ඉක්මනින්ම අභිවෘද්ධිය ළඟා වේ. එහෙයින් වදාරන ලදී.

"නිහීයති පුරිසො නිහීනසෙවී
න ච හායෙථ කදාචි තුල්‍යසෙවී
සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං
තස්මා අත්තනො උත්තරිං භජෙථා"ති.

## ජිගුච්ඡිතබ්බ න සෙවිතබ්බ - අජ්ඣුපෙක්ඛිතබ්බ න සෙවිතබ්බ - සෙවිතබ්බ

කැලිකසළ ගොඩක් බඳු පැවැතුම් ඇති දුස්සීල පුද්ගලයා පිළිකුල් කොට සෙවනය නොකළ යුතු බැවින් ජිගුච්ඡිතබ්බ න සෙවිතබ්බ නම් වෙයි. ස්වල්ප දෙයකින් කිපෙන සුළු ක්‍රොධ ශීලීව වසන්නහු මධ්‍යස්ථව සිටිමින් සෙවනයට නොගත යුත්තකු හෙයින් අජ්ඣුපෙක්ඛිතබ්බ නසෙවිතබ්බ නම්. සීලාදී ගුණයන්ගෙන් සමන්විත ප්‍රියශීලී පුද්ගලයා සෙවනය කළයුතු බැවින් සෙවිතබ්බ නමැයි සම්මතය.

**ජිගුච්ඡිතබ්බ න සෙවිතබ්බ:** පිළිකුල් කරමින් ආශ්‍රයෙන් බැහැර කළයුතු පුද්ගලයෙකි. හෙතෙම දුස්සීලය. ලාමක පාපධර්මයන්ගෙන් සමන්විතය. සැකකටයුතු අපිරිසිදු කාය සමාචාරාදියෙන් ගහනය. අනෙකකු විසින් පහසුවෙන් නොදතහැකි කාය කර්මාදියෙන් යුක්තය. අශ්‍රමණ වැ ශ්‍රමණයැ යි පිළිණ කරනුයේ අබ්‍රහ්මචාරි වැ බඹසරවස් හි පිහිටි සේ හඟවනුයේ ඇතුළත කුණුවුණු රාගාදී කෙලෙස් කසළින් පිරුණේය. මෙපරිද්දෙන් පාපයෙන් හරිත වැ වසන මොහු ආසෙවනය භජනය පර්‍ය්‍යුපාසනය නොකළ යුතුය. ශිලාදි ගුණ සම්පන්න කෙනෙකුන් මොහුගේ ආශ්‍රය ලදහොත් දෘෂ්ටානුගතියට යා හැකිය. ඔහුගේ අදහස් අනුමත නොකළද, පාපයන්හට සහාය වන පාපයන්ගේ අදහස්වලට නැමුණු පාපමිත්‍රයන් ඇති කෙනෙකැයි අපකීර්තියක් ලොවැ පහළවැ යෙයි. අශුචිවලෙක වැටුණු සර්පයකු ගොඩගන්නා කල දෂ්ට නොකෙළේ වුවද, සිරුරෙහි ස්පර්ශ වීම් මාත්‍රයෙන් අශුචි තැවරී දුර්ගන්ධ වහනය වනු මෙනැ යි සැලකිය යුතුය. දුස්සීලයාගේ අදහස්වලට අවනතවීම හෝ ඔහු අනුගමනය කිරීම හෝ නොකළ ද ලෝවැස්සාගේ ගර්හාව ආශ්‍රය කළ පමණෙකින් ලැබෙයි.

**අජ්ඣුපෙක්ඛිතබ්බ න සෙවිතබ්බ:** සෙවනය පිණිස අභ්‍යන්තරයට නොගෙන මධ්‍යස්ථව පැවැත්විය යුතු පුද්ගලයෙකි. මෙතෙමේ අන්‍යයන් නො ඉවසන ස්වභාවයෙන් යුක්තය. තමා නොරිසි වන ස්වල්ප දෙයක් කියන ලද්දේ වුවද, කොපයත් ද්වෙෂයත් පහළකෙරේ. කවරාකාරයකිනුත් ආශ්‍රය කිරීම දුෂ්කරය. ලේ සැරව වැගිරෙන පැරණි වණයක කැට කැබිලිති ආදියක් ගැටුණුවිට වඩාලාත් ලේ සැරව වගුරුවන්නාට පටන්ගැනීම වැන්න. තවද ගිනි පුපුරු විසුරුවන සුළු කිහිරි ගිනි පෙතෙල්ලක් කැට කැබිලිත්තකින් පහර ලද්දේ චිටි චිටි යන අනුකරණය නික්මවමින් පුපුරු විසුරුවීම අධික කෙරෙයි. මේ පුද්ගලයාගේ පැවැත්මද එසේය. ගූථ කූපයක් කාෂ්ඨාදියකින් කැලඹූකල දුර්ගන්ධය

අධික තර වැ හමයි. ස්වාභාවිකව හැරෙන දුර්ගන්ධ වහනය වැඩිවීමට ඇවිස්සීම හෙතුවේ. මෙම පුද්ගලයාද ක්‍රොධ හෙතුක ස්වල්ප දෙයකින් ඉවසිය නොහී ඵරුෂ නෙපුල් බණනු සිරිතක් වශයෙන් පවත්වයි. උද්ධතවැ චණ්ඩවැ හැසිරෙන ඔහුට මද ඇවිස්සීමක් වුව අධික කොපය පහළවීමට ප්‍රමාණය.

ගිනි තපින කෙනෙකු ඉතා ළංවුවහොත් ශරිරය දවන ඈත්වුවහොත් ශීත සමනය නොවන පිදුරු ගින්නක් මෙන් ක්‍රොධශිලි පුද්ගලයා උපෙක්ෂක වැ ඇසුරු කළයුතුය. අධිකව සෙවනය කිරීමත් නිරන්තරයෙන් සමීපයට පැමිණීමත් නොකළ යුතුය. පිදුරු ගින්නට ඉතා ළංවීම හෝ ඈත්වීම නොකොට මධ්‍යම ප්‍රමාණයෙන් සමීපස්ථව සිට ශීත සමනය කරගන්නා මෙන් මොහු වෙතට එළඹීම හෝ ඈත්වීම අනර්ථදායක බැව් සලකා මධ්‍යස්ථ වියයුතුය.

**සෙවිතබ්බ:** සීල ගුණ සම්පන්නය. කල්‍යාණ ධර්මයන්ගෙන් හොබනේය. සෙවනය සඳහා තිබියයුතු ගුණ ධර්මයන්ගෙන් අනූනය. ඇසුර සඳහා වෙතැ එළඹෙන්නට සුදුස්සේය. නැති ගුණයන් පහළවන්නටත් ඇති ගුණයන් තහවුරු වැ වැඩෙන්නටත් මොහුගේ ආශ්‍රය අතිශයින් උපකාර වේ. තමහට වැඩිසිටියන්ගේ උපදෙශානුගමනය දෙලොව දියුණුව සලසන්නේය යි සලකා සත්පුරුෂයෝ ඔවුන්ගේ ඇසුර රුචිකෙරෙති. යම්හෙයකින් සෙව්‍ය ගුණ යුක්ත පුද්ගලයාගේ දෘෂ්ටානුගතියට නොපැමිණියද, එය වැඩදායකය. යහපත සහායකොට ඇති යහපත කෙරෙහි නැමුණු කල්‍යාණමිත්‍රයන්ගෙන් යුක්ත මනා පැවැතුම් ඇති පුද්ගලයෙකැ යි කිර්තිරාවයක් ජනසමාජය තුළ පැතිර යෑමට ආශ්‍රය පමණක් වුවද සෑහේ.

## සීලෙසු පරිපූරකාරී සමාධි පඤ්ඤාසු මත්තසොකාරී,- සීලසමාධීසු පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී,-

## සීලසමාධි පඤ්ඤාසු පරිපූරකාරී:

ආර්‍ය්‍ය මාර්‍ගයට බට ඇතැම් ආර්‍ය්‍ය ශ්‍රාවක කෙනෙක් සිවු පිරිසුදු සිල් සම්පූර්‍ණ කරන්නාහු. සිවු පරිජි ඇවැත් නො අවදනාහු නමුදු, සමාධි ප්‍රඥාවන්හි අසම්පූර්‍ණ කාරිහුය. නොහොත් කොටසක් පමණක් සපුරා ලන්නෝය. ඔහු සීලෙසු පරිපූරකාරී සමාධි පඤ්ඤාසු මත්තසොකාරිහු නම් වෙත්. තවත් කෙනෙක් සිලසමාධීන්හි කළයුතුතාක් කිස නිමවා සම්පූර්‍ණ කරන නමුදු ප්‍රඥා ප්‍රදෙශයක් පමණක් වඩත්. ඔහු සීලසමාධි පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී නම්හ. සමහර කෙනෙක් සීලසමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිශික්‍ෂාවන් සම්පූර්‍ණයෙන් වඩනය කොට අශෛක්‍ෂභාවයට පැමිණෙත්. ඔහු සීලසමාධි පඤ්ඤාසු පරිපූරකාරී නමැයි ව්‍යවහාර ප්‍රාප්තය.

**සීලෙසු පරිපූරකාරී සමාධි පඤ්ඤාසු මත්තසොකාරී:** නමින් ගැනෙන්නාහු සොතාපන්න සකදාගාමී පුද්ගලයෝය. මෙම ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ මාර්‍ග බ්‍රහ්මචර්‍ය්‍යාවට ආදියෙහි පිරියයුතු ආදි බ්‍රහ්මචරියක වශයෙන් සැලකෙන සතර පාරාජිකා නමැති මහාසීල ශික්‍ෂාපදයන් මනාකොට ආරක්‍ෂා කෙරෙත්. යම්හෙයකින් බුද්දනුබුද්දක ආපත්තිනට පැමිණියද වහාම නැගී සිට සීලගුණයන් ආරක්‍ෂා වීමට කළයුතු සියල්ල මනාවැ සම්පූර්‍ණ කෙරෙති. එහෙත් සමාධියට උවදුරු සිදුකරන කාමරාගව්‍යාපාද සංයෝජනයන් නොනැසූ හෙයින් සමාධිය පිළිබඳ කළයුතු සියල්ල සම්පූර්‍ණකොළේ නොවේ. සමාධිය සපුරන නමුදු අවසන් කිස නොසැපයුණ හෙයිනි. ප්‍රඥාවට උවදුරක්වූද, සත්‍ය ඥානය වසාලනසුළුවූද, මෝහය සම්පූර්‍ණයෙන් විනාශ නොකළ හෙයින් ප්‍රඥාවද සම්පූර්‍ණවූයේ නොවේ. එය දියුණු කරන නමුදු ඉන් ප්‍රදෙශ මාත්‍රයක්ම වැඩුනේ වෙයි. ප්‍රඥාව සම්පූර්‍ණවනුයේ අර්හත් මාර්‍ග ඥානයෙන්ම හෙයිනි.

**සීලසමාධීසු පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී නම්** වනුයේ අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයාය. මේ ශාසනයෙහි පිරියයුතු යම්පමණ සීලසමාධිහු වෙත්ද ඒ සියල්ල සම්පූර්ණ කොට අවසන් කිරීමෙන් අනාගාමි ආර්‍ය්‍යභාවය ලැබේ. මේ පුද්ගලයා මත්තෙහි සම්පූර්ණ කළයුතු වනුයේ ප්‍රඥාව පිළිබඳ එකදෙශයක් පමණි. සීල සමාධීන් ඒ ඒ තත්ත්වයෙහි ගුණ දහම් රකින්නවුන් විසින් සපුරාලන ආකාරය මෙසේ දතයුතුය. සප්තාපත්ති ස්කන්ධයෙන් එක් දුෂ්කටාපත්ති මාත්‍රයකට පවා නොපැමිණ මහත් ශ්‍රද්ධාවෙන් හා උත්සාහයෙන් සිල් සපුරාලීම උපසම්පන්න භික්ෂූන්ගේ සීලය පිළිබඳ පරිපූරකාරී භාවය වේ.

**දසසිල්-දසපරිජී-දසසිඛා-දසනාසනා-දසදඬුවම්** යන සම්පණ්ණ සංවර සීලයෙන් යුක්තව වත්තක්ඛන්ධකයෙහි දැක්වෙන සෙඛියාදී සකල සීලයන්ගේ සංරක්ෂණය සාමණේර වරුන්ගේ සීල පරිපූරිත්වය යි. පඤ්ච සීලය රකිමින් දස වැදූරුම් අකුසලයන්ගෙන් වෙන්වීම ගෘහස්ථයන්ගේ සීල පරිපූරිතාව වේ.

තවද භික්ෂුශ්‍රාමණේරයන් විසින් චක්ෂුරාදී ෂඩින්ද්‍රියයනට ගොචරවන රූපාදිය නිසා පහළවන ලෝභ ද්වේෂාදී පාප ධර්මයන්ගෙන් දුරිභූත ව ඉන්ද්‍රියගොපනය කිරීම ඉන්ද්‍රිය සංවර සීලය පූරණය කරනුයේ නම්, **අෂ්ටකුල දූෂණ හා එක්විසි අන්වේෂණයන්ගේ** මාර්ගයෙන් සිවුපසය නොසොයා දැහැමෙන් සෙමෙන් තිපයන සිවුපස පරිභොගය කිරීම ආජීවපාරිශුද්ධි සීලය වේ. ගෘහස්ථයන් විසිනුදු ත්‍රිවිධ කායකර්ම හා චතුර්විධ වාග් කර්මයන සප්ත දුශ්චරිතයෙන් ද **සත්ථවණිජ්ජා-සත්ත වණිජ්ජා දී** පඤ්චැදෑරුම් අධාර්මික ධනොපායනයෙන් ද දුරිභූතව දිවි පැවැත්වීමෙන් ආජීවය පිරිසිදු කරන්නේ සීල ගුණයක පිහිටීමෙති. ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුපස පරිභොග කිරීමෙන් භික්ෂු ශ්‍රාමණේරයන් විසිනුත්, ආහාර පටික්කූල සඤ්ඤාදියෙන් යුක්තව තෘෂ්ණා විරහිත පරිභොගයෙන් ගෘහස්ථයන් විසිනුත් ප්‍රත්‍ය සන්නිශ්‍රිත

සීලය සම්පූර්ණ කළ හැකි වේ. මෙසේ චතුර්විධ වූ සීලය මනාකොට රක්නේ සීල පරිපූරකාරි නම් වේ. **උපචාර-අර්පණා** සමාධීන්ගෙන් කාමච්ඡන්දාදි පඤ්චනීවරණයන් විෂ්කම්භණ ප්‍රහාණ වශයෙන් යටපත් කොට සිත පිරිසිදු කිරීම සමාධි පරිපූරණය යි. අනාගාමි සීල සමාධීන් උක්ත ප්‍රකාරයෙන් සම්පූර්ණ කරන නමුදු සත්‍ය ප්‍රතිච්ඡාදක මොහය බහුතුළ තවමැ ඉතිරි වැ පවත්නේ පඤ්ඤායමත්ත-සොකාරි නාමය ලබයි.

**සීල සමාධි පඤ්ඤාසු පරිපූරකාරී** වනුයේ සකල ක්ලේශයන් ප්‍රහීණ කළ රහතන් වහන්සේය. කෘත කෘත්‍යවූ උන්වහන්සේ ත්‍රිශික්ෂාපූරණය පිළිබඳ කළයුතු සියල්ල නිමවා මනොරථපූරණය කළ කෙනෙකි. ක්ෂීණවූ ආශ්‍රවයන් ඇති හෙයින් නැවත උත්පත්තියක් නොලබන මේ උත්තමයා සිරුරක් දරනුයේද අන්තිම වරටය. අපරිමිත කාලයක් මුළුල්ලෙහි භවයෙන් භවයට සැරිසරමින් ඔසවාගෙන පැමිණි ස්කන්ධභාරයත්, ක්ලේශ භාරයත්, අභිසංස්කාර භාරයත්, නැවත නුසුලන ලෙස බහා තබන ලද්දේය. අනුක්‍රමයෙන් ශික්ෂා පූරණයෙන් ලබාගත් ස්වියාජීවය දේ නොහොත් අර්හත්වය ඇත්තේය. මූදනලද භව බන්ධන ඇත්තේ මනා හෙතුයෙන් දැනැගෙන දුරුකළයුතු ක්ලේශයන් මුද හළේය. එබැවින් උන්වහන්සේ විසින් පිරියයුතු සීලාදීන් පිළිබඳ කිසිවක් නැත.

## ත්‍රිවිධ ශාස්තෘවරයෝ:

කාමයන්ගේ ප්‍රහාණය පණවන රූපවෙදනා ප්‍රහාණයන් නොම පණවන, එක් ශාස්තෘවරයෙක. කාම ප්‍රහාණය හා රූපප්‍රහාණයද පණවන නමුත් වෙදනා ප්‍රහාණය නොපණවන එක් ශාස්තෘවරයෙක. කාම රූප වෙදනා යන ත්‍රිවිධ ප්‍රහාණයන්ම පණවන එක් ශාස්තෘවරයෙකැයි මේ ලොකයෙහි ශාස්තෘවරයෝ තෙදෙනෙක් වෙති. ඇතැම් තීර්ථක කෙනෙක් කාමයන්ගේ ප්‍රහාණය-ඉක්මවීම රූප භවයැයි කියති. ප්‍රථම ධ්‍යානාදියෙන් කාමලොකොත්පාදක ක්ලේශයන් යටපත්වූ

පමණින් කාමප්‍රහාණය වියැයි ඔවුන්ගේ පිළිගැනීමය. අරූප භවය රූපයන්ගේ ප්‍රහාණය සේ භවත් තීර්ථක කොටසක් සලකත්. අසඥ්ඥ භවය වේදනා ප්‍රහාණය ලෙස ප්‍රකාශ කරන්නෝද වෙති. රූපාවචර අරූපාවචර සමාපත්ති ලද පමණින් ඔවුන් එසේ උගන්වන නමුදු, එපමණකින් ම කාමරූප වේදනා ප්‍රහාණයක් නොසිදු වේ. කාමච්ඡන්දාදිය තාවකාලිකව යටපත් වීමක් මුත් සමුච්ඡේදයක් නොවූ හෙයින් නැවත කාමරාග රූපරාගාදිය ධ්‍යානයෙන් පිරිහෙනු සමගම පහළවන හෙයිනි. බ්‍රහ්මයන්ගේ ආයුෂ්කල්පය දීර්ඝ හෙයින් ප්‍රමාණකොට ගත නොහී මෙනුදු, ඔවුන්ගේ ආයු සංස්කාරය අවසන් විමෙන් නැවතත් කාම රූප ලෝකයන්හි උපදනා බව නොදනී මෙනුදු, අන්‍ය තීර්ථක ශාස්තෘවරයෝ යථෝක්ත ප්‍රහාණයන් පණවත්.

භාග්‍යවතුන් වහන්සේ කාමයන්ගේ ප්‍රහාණය අනාගාමී මාර්ගයෙන්ද, අර්හත් මාර්ග ඥානයෙන් රූපවේදනාවන්ගේ ප්‍රහාණය ද පණවති. ඒ ඒ මාර්ගඥානයන්ගෙන් වන කාමාදීන්ගේ ප්‍රහාණය නැවත කිසිකලෙක නූපදින සේ සිදුවන්නකි. එබැවින් මෙම ශාස්තෘ ප්‍රඥප්තිය අන්‍යයන් හා අසාධාරණය. සර්වඥවරයෙකුහට පමණක් සම්මතකළහැකි ප්‍රඥප්තියෙකි. අන්‍ය ශාස්තෘන්ගේ පැණවීම් ලෙශ මාත්‍රයකින් යහපතැයි හැඟුනද, එය සදාකාලිකව නොපැවති වෙනස් වන්නකි. එබැවින් නියම පැණවීමෙකැයි සැලකිය නොහැක.

ඇතැම් දේශනයෙක්හි තථාගතයන් වහන්සේද විනෙය ජනානුග්‍රහ පිණිස ප්‍රථම ධ්‍යානයෙන් කාම පරිඥ්ඥාවත්. අරූප ධ්‍යානයන්ගෙන් රූප පරිඥ්ඥාවත්, අනුපාද පරිනිර්වාණයෙන් වේදනා පරිඥ්ඥාවත්, වදාරා තිබේ. කාමරූප පරිඥ්ඥාවන් මෙලෙසිනුදු පැණවුණේ ධ්‍යාන සමන්විත මාර්ග චිත්තයන්ගේ වශයෙනි. සියළු වේදයිතයන්ගෙන් වෙන්වන හෙයින් චවනයේ පරිසමාප්තාර්ථයෙන් ම වේදනා ප්‍රහාණය වනුයේ රහතන්වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණයෙනි.

## අපර ත්‍රිවිධ ශාස්තෘවරයෝ:

මේ අත්බැව්හිද මතුඅත්බැව්හිද ආත්මය සථිරය. නිත්‍යයැයි පණවන ශාස්තෘ කෙනෙක. මේ අත්බැව්හිම ආත්මය සථිරය. නිත්‍යය. මතු අත්බැව්හි ආත්මය අසථිරය. අනිත්‍යයැයි පණවන ශාස්තෘ කෙනෙක. මේ අත්බැව්හිත් මතු අත්බැව්හිත් සථිර නිත්‍යසේ සැලකිය හැකි ආත්මයක් ඇතැයි නොම පණවන ශාස්තෘ කෙනෙකැයි තුන් වැදෑරුම් ශාස්තෘ කෙනෙක් ලොවැ වෙති. මෙම ශාස්තෘවරයන් අතරෙහි දෙ අත්බැව්හිම ආත්මය ඇතැයි පණවනු යේ ශාසවත දෘෂ්ටිගත් ශාස්තෘවරයාය. හෙතෙම කිසියම් උපක්‍රමයකින් නසාලිය නොහැකි භවයෙන් භවයට ගමන් කරන සදාකාලික වැ පවත්නා එක්තරා ශක්ති විශෙෂයක් ආත්ම නාමයෙන් පණවයි. වාද ප්‍රභෙද වශයෙන් ශාසවතවාදීහු **"කෙවල-එකත්‍ය"** ලෙසින් දෙදෙනෙක් වෙති. එහිදු **කෙවල වාද සතරෙකි.**

i ඇතැම්කෙනෙක් ධ්‍යාන බලයෙන් පෙර උපන් ජාතීන් සිහිකරන්නාහු සිය දහස් ගණන් ජාතීන් දකිත්. ඒ ඒ ජාතියෙහි රූපාදීන් අතුරෙන් කිසිවක් අනෙක් භවයට පැමිණි හෙයින්ම දහස් ගණන් උත්පත්ති හු සිදුවූහයි සලකා එසේවූයේ සදාකාලිකව පවත්නා ආත්මය නිසායැයි දෘෂ්ටි ගනිත්.

ii ඇතැම්කෙනෙක් කල්පයෝ පටන් කල්ප දශය දක්වා පූර්වෝක්ත ක්‍රමයෙන් අතීත ජාතීන් සිහිකොට ආත්මය සදාකාලිකායැයි තීරණයට එළැඹෙත්.

iii කල්ප දශයේ පටන් සතලිස කෙක් අතීත ආත්ම භාවයන් දූක ආත්මය නිත්‍යයැයි දෘෂ්ටියට බැසගත් ඇතැම්අය දක්නා ලැබෙත්.

iv තර්කණයෙන් විමසාබලා ජාතියෙන් ජාතියට ගමන් කරන රූපාදි ධර්මයක් ඇතැයි අදහා එය ආත්මය සේ පිළිගන්නා එක් කොටසෙකැයි කෙවල ශාසවතවාදී හු සිවුකොටසක් වැ බෙදෙති.

සදකාලික වැ ලැබෙනුයේ එක් කොටසක් පමණකැ යි දෘෂ්ටි ගන්නාහු **'ඒකත්‍ය ශාශ්වතවාදී'** නමු. ඔවුන්ගේ ද වාද ප්‍රභේද සතරෙක් දක්නා ලැබේ.

i මෙම පෘථිවිය පහළ වූ අලුත ආභස්සර බඹලොවින් චුතව ශූන්‍ය විමානයක උපන් බ්‍රහ්මයෙක් හුදෙකලාව වසනුයේ තවත් සත්වයෝ ඇත්නාහු නම් යෙහෙකැයි සිතමින් සිටි. කල්ගතව යැමෙන් ඔහු මෙන්ම යථොක්ත බඹලොවින් චුතවූ බ්‍රහ්මයෝ එහි උපදිත්. එවිට පළමුව උපන් තැනැත්තේ තමාගේ සිතුවිලි අනුව සෙස්සෝ උපන්හයි සලකා ඔහු තමන් විසින් මැවුණහයි දෘෂ්ටිගෙන තෙමේ මහා බ්‍රහ්මයයි සිතයි. පසුව උපන්නවුන් තමාහට වඩා ආයුවර්ණ සැප බල ප්‍රඥා යන මේවායින් හීන බවද දකී. තමන්ගේ සැප සම්පත් හි අඩුබව දක්නා පසුව උපන්නෝ ද තුමූ පළමුව සිටියහු විසින් මවනලදහයි සිතත්. ඉන් චුතවැ මිනිස්ලොව උපන් ඇතැම් කෙනෙක් ධ්‍යාන වඩා පෙර උපන් අත්බැව බලන්නාහු තුමූ බඹලොව ඉපද සිටි බවත්, එහි තමන් උපත ලබන්නට පළමුව සිටි මහා බ්‍රහ්මයා තවම ජීවත්වන බවත් දැක ඒ මහා බ්‍රහ්මයා නිත්‍යය සදකාලිකය, සෙස්සෝ අනිත්‍යයෙහයි ගත් දෘෂ්ටි ඇත්තෝ වෙත්. මෙය එක් කොටසක් නිත්‍යය යි වරදවා ගැන්මේ එක් ශාශ්වත වාදයක.

ii දෙව්ලොව ඇතැම් දෙවියෝ ප්‍රමාණය ඉක්මවා ක්‍රීඩායෙහි ඇලී ආහාර ගතයුතු වේලාව විස්මෘත කොට දිවි පවත්වා ගත නොහී ක්ලාන්ත වැ මියැයෙත්. යම් හෙයකින් ඔහු මිනිස්ලොව උපත ලදහොත් ධ්‍යාන වඩන්නට අවකාශ ලැබ පෙර අත්බැව සිහිකරන්නාහු තමන් මළ නමුදු, තමන් හා එකට විසූ දෙවිවරුන් තවම ජීවත්වන බව දැන සාරුණු වරදවා තේරුම් ගෙන එම දෙවිවරු නිත්‍යයහ. සදකාලිකයහ, තුමූ අනිත්‍යයහ, අස්ථිරයහ යි දෘෂ්ටියට බැස ගනිත්. මේ එක් ශාශ්වත වාද විශේෂයෙකි..

iii චාතුම්හා රාජික දෙව්ලොව දෙවියන්ගෙන් ඇතැම් කෙනෙක් අනුන්ගේ යස ඉසුරු ඉවසිය නොහී කොප ගින්නෙන් දැවී මියැයෙති. ඔහු මිනිස්ලොව ඉපද ධ්‍යානවඩා පූර්‍වාත්මභාවය සිහිකොට තමන් හා විසූ දෙවියන් තව දක්වාත් ජීවත්වනු දැක තුමූ අනිත්‍යයහ යි ද, දෙව්ලොව සිටින්නෝ නිත්‍යයහ යි ද දෘෂ්ටි ගනිත්. මේ එක් ශාසවත වාදයෙකි.

iv තාවද මිනිස්ලොව මැ වසන ඇතැම් පුද්ගලයෙක් කුරුල්ලකු වෘක්ෂයෙන් වෘක්‍ෂයට පියහඹා යනුමෙන් ද, පැරණි ගෙයක් හැර අනෙක් අභිනව ගෘහයකට ගමන්කිරීමක් මෙන් ද ආත්මය සිරුරෙන් සිරුරට මාරුවෙමින් පවත්නා දෙයකැයි තර්කමාත්‍රයෙන් තීරණයට බැස රූපය අනිත්‍යය මේ ආත්මය වූ කලී නිත්‍යමැයැ යි දෘෂ්ටි ගනී. මේ එක් ශාසවත වාදයෙකි.

මෙලෙසින් මෙලෞවිහි ද පරලෞවිහි ද ආත්මයැයි ගත යුතු කිසිවක් ගැන අනුශාසනා කරන ශාස්තෘවරයා ශාසවතවාදි තමැයි දතයුතුය.

මෙම ආත්මභාවය මෙයින් මත්තෙහි සිඳීමට යන්නේය. මරණයෙන් පසු නැවත භවෝත්පත්තියක් නැත. කළ-යුතුතාක් සියල්ල මේ අත්බැව්හිදී ම කළයුතුයැ යි අනුශාසනා කරනුයේ **උච්ඡෙදවාදි ශාස්තෘවරයාය.** ඔහුගේ ඉගැන්වී-මෙහිදු සවල්ප වෙනස්කම් ඇති **ප්‍රභෙද** සතකි.

i මෙම ශරීර භෙදයෙන් මතු උත්පත්තියක් නැත. භවෝත්පත්තිය මරණයෙන් කෙළවර වේ. යනු එකෙක.

ii ආත්මය මෙතෙකින් ම නො නැසී කාමාවචර දෙව්-ලොව් අන්‍ය දිව්‍යාත්මයක් ලබා ඉපද එහි ආයුෂවිඳ මැරී අවසන්වන්නේය යනු එකෙක.

iii මේ ආත්මය දිව අත්බැව් ලද පමණකිනුත් සුන් නොවී සම්පූර්ණ ඉන්ද්‍රියයන් ඇති මනොමය වූ අන්‍ය ආත්මයක් ලබා ඉන් මියගොස් සොළවර වේ, යනු එකොසා.

iv මේ ආත්මය ආකාසානඤ්චායතනයට පැමිණ එහි දී මියැගොස් ශූන්‍ය වේ, යනු එකොසා.

v මේ ආත්මය විඤ්ඤණඤ්චායතන තලයට පැමිණ එහි දී මැරී උත්පත්තිය නැතිකෙරේ, යනු එකොසා.

vi මේ ආත්මය ආකිඤ්චඤ්ඤයතන තලයට පැමිණ ඉන් මියගොස් උච්ඡින්න වේ, යනු එකොසා.

vii මේ ආත්මය නෙවසඤ්ඤනාසඤ්ඤයතන තලයට පැමිණ භවොත්පත්තිය මූලොච්ඡින්න කොරේ යනු එකොසා.

මෙසේ සත් ක්‍රමයෙකින් ආත්මභාව විනාශය පණවයි,

භවයක් පාසා ගමන්කරමින් සදකාලිකව පවත්නාවූ හෝ මේ අත්බැවින් මතු නොපැවති සිඳියන සුළුවූ හෝ ආත්මයැයි කිවහැකි කිසිවක් නැතැයි අනුශාසනා කරන ශාස්තෘවරයා නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය. රූපාදීන් විෂයෙහි ආත්මයැයි දෘෂ්ටියටබැසගත් පරසමය වාදීන්ගේ විසිවැදූරුම් මඤ්ඤනාවන් මූලොච්ඡින්න කළ හෙයිනුදු, භවයක් පාසා ගමන්කරමින් සඛ්‍යාව සුවදුක් විඳුවන ආත්ම නාමයෙන් ගතයුතු කිසිවක් නැතැයි සවයම්භූ ඥානයෙන් අවබොධකොට අනාත්මවාදී වූ හෙයිනුදු, **ආත්ම ප්‍රඥප්ති රහිත ශාස්තෘවරයා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේමය.**

## ත්‍රිකපුද්ගල විභාගය නිමි.

# චතුක්ක පුග්ගල පඤ්ඤත්ති.

**අසප්පුරිස - අසප්පුරිසතර - සප්පුරිස - සප්පුරිසතර:-**

ලාමක අධම පැවැතුම් ඇතියේ අසප්පුරිසය. තෙමේ ලාමක පැවැතුම්හි හැසිරෙමින් අන්‍යයනුදු එහි යොදවනුයේ අසප්පුරිසතරය. අලාමක උසස් ජීවිතයක් පරිහරණය කරනුයේ සප්පුරිසය. ඇසුරු කරන අන්‍යයනුත් ඒ සඳහා මෙහෙයනුයේ සප්පුරිසතර නම් වේ. මිනිසා ස්වභාවයෙන්ම අන් සත්තට වඩා උසස් ජීවිතයක් පවත්වන්නෙකි. හොඳ නොහොඳ විමසා ගැන්මට පොහොසත් බුද්ධියක් තිබීම එයට හෙතුවකි. එසේ වුවද ඔහුතුළ ඇති ඇතැම් පහත්ගති තිරිසන් ගත සතුනට ද වඩා ඔහු පහත් බවට හෙළාලයි. බුදුරජාණන් වහන්සේ මිනිසා අතිශයින්ම ලාමක බවට පමුණන ප්‍රාණඝාතාදී පඤ්චවිධ දුශ්චරිතයන්හි යෙදීම අසත්පුරුෂ ලක්‍ෂණයකැයි වදාළහ. ප්‍රාණඝාතාදිය කරන්නා ජනසමාජය අයහපත් බවට පත්කරන හිංසා පරවශ පැවතුම් ඇතිකෙනෙකි ඔහුගෙන් සඛ සන්තතියට වනුයේ අවැඩෙකි. හුදෙක් තමා පමණක් දුසිරිත්හි යෙදීමෙන් තෘප්තියට නොපැමිණ අනුන්ද එහි මෙහෙයැවීම අපරාධයකි. දුසිරිත්හි ගැලී සිටින බොහෝ අය අන්‍යයන් ද තමන් වැනි පැවතුම් පවත්වනු රිසිවෙති. නොයෙක් උපක්‍රමයන්ගෙන් දුසිරිතට නුපුරුදු වූවන් පොළඹවා ගැනීම ඔවුන්ගේ සිරිතය. එය ජන සමාජයට කරන මහත් හානියක් ද, සමාජය දුරාචාරයෙන් දූෂ්‍ය කිරීමක් ද වෙයි. මෙහි හෙතෙම අසප්පුරිසතර නමින් හැඳින්විණ. සත්පුරුෂ පුද්ගලයා පඤ්ච දුශ්චරිතයෙන් වැළකී අනෙකුට ප්‍රාණවධාදි දුකක් නොපමුණුවා දැහැමින් සෙමෙන් වෙසේ. එවැනි පුද්ගලයන්ගෙන් ජනසමාජයට වනුයේ ශාන්තියෙකි. සප්පුරිසතර පුද්ගලයා තමා ගෙන යන උසස් ජීවිතයට අන්‍යයන්ද පුරුදු කිරීම යුතුකමකැයිද තමාගෙන් සිදුවිය යුතු සේවයකැයි ද සලකා සුචරිතයන්හි අන්‍යයන් ද යොදවයි.

ඒ සඳහා සවකිය කාලයද ධනයද කායික වාචසිකාදී පරිශ්‍රමයද නොපසුබට වැ වැය කෙරෙයි. දුර්ලභව දක්නට ලැබෙන මෙම උදාරපුද්ගලයා නිසාම ලොකය වාසයට සුදුසු තැනක් බවට පැමිණේ. **මේ පුද්ගලයන් සිවුදෙනා පඤ්චවෙර විශයෙන් බෙදලූ බව සැලකිය යුතුය.**

**පාප – පාපතර – කල්‍යාණ – කල්‍යාණතර:–**

සිත කිලිටි කරන ධර්මයන්ගෙන් කෙලෙසුණු පුද්ගලයා **පාප** නම්. මිනිසකු කෙලෙසෙනුයේ ප්‍රාණඝාතාදී දස අකුසල කර්මයන්හි ගැලුණු කල්හිය. සවභාවයෙන්ම පිරිසිදුව පවත්නා සිත දස අකුසලයන්හි යෙදීමෙන් කිලුටුවේ. තෙමේ දස අකුසලයන්හි ඇලී ගැලී සිටිමින් අන්‍යයන්ද ඒ සඳහා මෙහෙයනුයේ **පාපතරය**. මෙහෙයුම් ලදහු කළ අකුසලයෙන් කොටසක් ඔහු කරාද පැමිණීමෙන් පාපය අධිකවන අතර අනෙකකු පාපයක යෙදවීමක් ද එයින් සිදුවන බැ වි නි.

සොඳුරු භද්‍රධර්මයන්ගෙන් සමන්විත වනුයේ කල්‍යාණය. නිරවද්‍ය යහපත් කෙනෙකුන් වන්නට සිත කිලුටු කරන ධර්මයන්ගෙන් දුරුවී සවසන්තානය පිරිසිදු කරන දස කුසල කර්මයන්හි යෙදිය යුතුය. එබැවින් කල්‍යාණ පුද්ගලයා දස කුසලයන් රැස්කරන්නෙකැයි දත යුත්තේය. දසකුසල කර්මයන්හි අන්‍යයන්ද යොදවා අක්ලිෂ්ට ජීවිතයක් පවත්වනුයේ කල්‍යාණතරය. ඔහුගේ උවදෙස් අනුව බොහෝදෙනෙකුන් යහමගෙහි යන හෙයිනුදු, ඔවුන් රැස්කරන කුසලයට මෙහෙයූ වහු කොටස්කරුවකු වන හෙයිනුදු, කුසලය අධික වේ. එබැවින් කලණ දහම්හි පිහිටියන් අතර අධිකතර කල්‍යාණත්වයක් ඇත්තෙකැයි කියැවේ. **මේ පුද්ගලයන් සිවුදෙනාගේ අන්‍යෝන්‍යය දස අකුසලයන්ගේ වශයෙන් සැලකිණ.**

## පාපධම්ම - පාපධම්මතර - කල්‍යාණධම්ම කල්‍යාණධම්මතර:-

මේ පුද්ගලයන් සිවුදෙන බෙදන ලද්දේ පාපී ස්වභාවය හා කල්‍යාණ ස්වභාවය භේදය වශයෙන් සැලකීමෙනි. පාප නාමයෙන් දස වැදෑරුම් අකුසලයනුත්, කල්‍යාණ නාමයෙන් දස විධ කුසලයනුත්, අදහස්කරන හෙයින් පූර්වෝක්ත පාපාදි පුද්ගලයන් හා මොවුන්ගේ නාමෙක දෙශයකින් මුත් ස්ව-භාව ලක්‍ෂණ වශයෙන් කිවහැකි විශෙෂයක් නැත. දස අකුසලයන් රැස්කරන ස්වභාවයෙන් යුක්තවීම හා ඉන් වැලකීමේ ස්වභාවය බහුලවූ විසීමත් සලකා පුද්ගල තත්වය අනුව දෙශනා කරන ලද්දකැයි දතයුතුය.

## සාවජ්ජ - සාවජ්ජබහුල - අප්පසාවජ්ජ - අනවජ්ජ:-

කායවචී මනොකර්මයන් දෙස් සහිතව පවත්වනුයේ සාවජ්ජය. තුන්දෙරින් රැස්කරන යම්පමණ කර්මයෝවෙද්ද ඒ සියල්ල ප්‍රාණඝාතාදී වශයෙන් වරද සහගත වම සිදුකි-රීම මොහුගේ ලක්‍ෂණය යි. අශුචි කුණපාදියක් ඇති ප්‍රදෙ-ශය දුගඳ වහනය වෙයි. එය දකින්නන්හට පිළිකුල දනවයි. එමෙන් මෙහෙමේ සත්පුරුෂයනට ජුගුප්සා පහළ වන දෙයක් ම කරයි. ආශ්‍රය කිරීම් වශයෙන් සමීපස්ථ විය නොහැකි නිඤජනක පැවතුම් වලින් ගහනව වෙසෙයි. **බහලවූ මොහාන්ධකාරයෙන් කුසලච්ඡන්දය වැසීගිය බාල පෘථග්ජන පුද්ගලයා සාවජ්ජ නාමයෙන් හැඳිනේ.**

අනවද්‍ය කායික වාචසිකා දී කුසලකර්මයන් ස්වල්ප වශයෙනුත්, අවද්‍ය වූ ප්‍රාණඝාතා දී පාපකර්මයන් බහුල වශයෙනුත්, රැස්කරනුයේ සාවජ්ජ බහුලය. මෙහෙම බොහෝසෙයින් පව් කරන්නෙකු වුවද, කලින් කල පින් දහම් කරන්නට ද ඉදිරිපත් වන්නෙකි. කුසලච්ඡන්දයක් නැතත්. පරිසරයේ බලපෑම අනුව පිංකම්වලට සහභාගිවෙයි. කිසිවිටෙක පෙහෙවස් සමාදන්ව සීලාදී ගුණයන් සපුරාලයි.

දන්දීම් ආදි සත්ක්‍රියාවලට ඉදිරිපත් වෙයි. ආශ්‍රිතයන්ගේ වශයෙන් කුසලක්‍රියා කරත නමුදු බහුලව කරනුයේ පාපකර්මය. දුම්ණි වැ දුගඳ වහනය වෙමින් පවත්නා කුණුවූ මල් රුසෙක තැනින් තැන වැටී තිබෙන සුහඳ පැතිරෙන දෑසමන් ආදි මල්වලින් යුත් ප්‍රදෙශයකට මේ පුද්ගලයා සමාන කළ හැක. **කලින් කල කුසලයන් ද රැස්කරන ලෞකික පෘථග්ජන පුද්ගලයා සාවජ්ජ බහුල නාමයෙන් ව්‍යවහාරයටයේ.** සවකිය ජීවිතයතුළ තිවරද කායකර්මාදිය කරත අතර කාලාන්තරයෙකින් වරදෙහිද බැඳෙනුයේ අප්පසාවජ්ජය. මෙතෙම යහපත් තැනැත්තෙකි. වරද සම්මත දෙයක් කරන්නෙකැයි නොකිවයුතු. තරමට පිරිසිදු කාය කර්මාදියෙන් සමන්විතව කාලක්ෂෙපය කෙරේ. පාපමිත්‍ර සෙවනාදියෙකින් පව්කම්හි යෙදෙන්නට සිදුවුවද එය පුරුද්දක් කරගන්නේ නොවේ. වරදෙහි ආදීනව සලකා පිළිවන් තරම් ඉන් තුරන්වන්නට යත්න දරයි. දෑසමන් ආදී සුගන්ධ වහනය වන මල් රුසක්උඩ තන්හි තන්හි දුම්ණිවූ ද දුගඳ හමන්නාවූ ද ඩෙබර මල් ආදියක් පතිතවැ පවත්නා තැනක් වැන්න. එහි දුර්ගන්ධය අල්පය. සුගන්ධය ම බහුලය. **ක්ලෙශයන්ගෙන් අධික ප්‍රමාණයක් විනාශ කල සොතාපන්න සකෘදාගාමි අනාගාමි පුද්ගලයෝ අප්ප සාවජ්ජ නාමයෙහිලා සඞ්ගෘහිත වෙත්.** වැරදි සහිත කායකර්මාදියක් එකාන්තයෙන් ම නැත්තේ අනවජ්ජය. මෙතෙම තිදෙරින් රුස්කරන සියලු කර්මයන් දෙෂ රහිත වැ කරන්නෙකි. **වරදට පොළඹවන සකලාශ්‍රවයන් ක්ෂයකල රහතන්වහන්සේ මේ පුද්ගලභෙදයෙහි ඇතුළත් වේ.** වතුමධුර පිරුණු රන් පාත්‍රයක් මෙන් ක්ලෙශ කාලුශ්‍යයෙන් දූරීභූත වැ සුපිරිසුදු ත්‍රිවිධද්වාරයෙකින් සමලඞ්කෘත වැ වැජඹෙන උන්වහන්සේ සපුන් වැසි අනවද්‍ය උත්තම පුද්ගලයෙකැයි දතයුතුය.

**උග්ඝටිතඤ්ඤූ - විපචිතඤ්ඤූ - නෙය්‍ය පදපරම:**

යම්කිසි දහම් පදයක් කණවැකී ඤාණය හා ගැටුණු පමණින්ම චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධයෙන් නිවන් පසක් කරන්නට සමත් ප්‍රඥපාටවයෙකින් යුක්තවනුයේ උග්ඝටිතඤ්ඤූය. සංක්‍ෂෙපයෙන් කියන ලද්ද විස්තර වශයෙන් ශ්‍රවණය කරනවිට නිර්‍වාණාවබොධය ලබනුයේ විපචිතඤ්ඤූය. අසාගත් ධර්‍මය අනුව උදෙසීම් විචාරීම් ඈ ක්‍රමයන්ගෙන් උත්සාහකොට මහත් යත්නයෙන් සිවුසස් අවබොධය කරනුයේ නෙය්‍යය. කොතරම් ධර්‍මශ්‍රවණය කළද ධර්‍මානුරූපව වෙසෙමින් දහම් පිළිවිදිනට දුස්තර වැ යත්න කළද, එ අත්බැව්හි නිවන් ලබන්නට නොහැකිවනුයේ පදපරමය.

**උග්ඝටිතඤ්ඤූ** මොහු සතර සතිපට්ඨානයෝය, මොහු සප්ත බොජ්ඣංගයෝය ආදී වශයෙන් ඉතා සංක්‍ෂෙපයෙන් මාතෘකාව තබනවිට එම දෙශනාව අනුව ඥනය මෙහෙයවා නවලොවුතුරු දහම් පිළිවිදිනට සමර්‍ථ නිපුණ නුවණින් සමන්විතය. වචන ශ්‍රවණයත් සමගම එහි අදහස දැනගැනීමට තරම් මුහුකුරාගිය පූර්‍වොපචිත කුසල බලයෙන් තීව්‍රවූ ප්‍රඥ සම්පත්තියක් ඇත්තේය. **සුතමයී-චින්තාමයී ප්‍රඥාවන්ගෙන් යුක්ත තැනැත්තේ මෙම විශෙෂ නාමයෙහි සඞ්ග්‍රහවෙයි.** මෙ සසුන්හි අස්සජි මහ රහතන් වහන්සේගෙන් **"යෙ ධම්මා හෙතුප්පභවා"** ආදී ගාථාවෙහි අර්‍ධයක් ශ්‍රවණය කළ විගස මැ **උපතිස්ස බ්‍රාහ්මණයා ද** ඔහුගෙන් එම ගාථාව සම්පූර්‍ණයෙන් ඇසූවිට **කොලිත බ්‍රාහ්මණයා ද** සෝවාන් මාර්‍ග ඥනය ලදුයේ ඔවුන් දෙදෙන උග්ඝටිතඤ්ඤූපුද්ගලයන් වූ හෙයිනි.

තවද උග්ඝටිතඤ්ඤූ ධර්‍ම දෙශනා වශයෙන් අක්‍ෂරොච්චාරණය කරනවිට ම සුතමය චින්තාමය ඤාණයන්ගෙන් ආශය ප්‍රබොධය ලබා ධර්‍මාර්‍ථය දැනගැන්මෙහි සමර්‍ථය. තථාගතයන් වහන්සේ

ඔහුට දෙශනා කරනුයේ **නිස්සරණ සූත්‍රයකි.** එපමණකින්ම අභිසිද්ධිය ලඟාකර ගන්නට පිළිවන් ශක්තියක් ඇත්තේය. හෙතෙම දිට්ඨි චරිත සම්පන්නය. එමෙන්ම උළාර ප්‍රඥා සම්පත්තියෙකින් ශොභිතය. සූර්‍ය්‍ය කිරණ ස්පර්‍ශය ලබනු සමගම පද්ම ප්‍රබොධය වන්නා සේ පර්‍ය්‍යාප්ති ධර්‍මය සොතද්වාරයට වැටෙන විට විමර්‍ශිත ඥානයෙන් ප්‍රතිවෙධය පහළකර ගැනීම් මොහුගේ ලක්‍ෂණය වෙයි.

**විපචිතඤ්ඤූ** මාතෘකාර්ථය විස්තර කළවිට විලම්බයෙන් ධර්‍මාවබොධය ලබයි. චින්තාමය ඥානයෙන් ආශය ප්‍රබොධය ලබන්නට ශක්තියක් නැති හෙයින් උද්දෙස නිද්දෙස විසින් ධර්‍මය ඇසිය යුතුය. එබැවින් විස්තර කරන ලද්දක් ම දැනගනහෙයි. නො එසේවුව, සූත්‍රාර්ථය වටහා ගන්නට පිළිවන්කමක් නැත්තේය. ඉතා සියුම්ලෙස බෙදා දක්වමින් විස්තරකරදෙන කල්හි සිවුසස් දැන ප්‍රතිවෙධ ඥානය ලැබගනී. නාතිසංක්‍ෂෙප නාතිවිස්තාර දෙශනා ශ්‍රවණයෙන් අභිසිද්ධිය අත්කරයි. **ආදීනව නිස්සරණාර්ථ සූචක සූත්‍ර** දෙශනාවන්ගෙන් ධර්‍මාවබොධය ලැබේ. ප්‍රඥාධික තණ්හා චරිතයන්, මොහාධික දිට්ඨි චරිතයන්, විපචිතඤ්ඤූ කෙරෙහි විද්‍යමානය. **සුතමයී ප්‍රඥාව ඇති නමුදු චින්තාමයී ප්‍රඥාසම්පත්තිය නැති පුද්ගලයා මෙසින් අදහස් කැරෙයි.**

**නෙය්‍ය** බලවත් උත්සාහයෙන් ම ධර්‍මාවබොධය ලබයි. උදෙසීම්, පැන පිළිවිසීම් අසා දැනගත් දේ නුවණින මෙනෙහි කිරීම් කල්‍යාණ මිත්‍රයන් සෙවනය කිරීම් ආදී නා නා විධීන්ගෙන් යත්න දරා ධර්‍මාවබොධය ලැබගෙන අනුක්‍රමයෙන් අභීෂ්ටයට පත්වීම මොහුගේ ස්වභාවය වේ. ඉතිරිනොකොට අනවසෙස දෙශනා ශ්‍රවණයෙන් අභිසිද්ධිය වන බැවින් තථාගතයන් වහන්සේ **අස්සාද ආදීනව නිස්සරණාර්ථ සූචක සූත්‍රයන්ගෙන්** මොහු හික්මවන බව දතයුතුය. මොහය අධිකනොකොට ඇති තණ්හා චරිතයෙකින් මෙතෙම උපලක්‍ෂිතය. **සුතමයී චින්තාමයී ප්‍රඥා කිසිවකුත් නැති බලවත් වීර්‍ය්‍යයෙන් මැ ධර්‍මාවබොධය ලබන පුද්ගලයා මෙසින් ගම්‍යමානය.**

**පදපරම** ව්‍යඤ්ජන පදයන්ගේ දැනීමක් මිස අර්ථාව-බෝධයෙන් සිවුසස් පිළිවිදීමක් එම අත් බැවිනි නොලබන්-නෙකි. කොතරම් ධර්මශ්‍රවණය කළ ද, මනාකොට දැරුවද, වාචනය කළද, එයින් ඔහුට සැලකිය යුතු ප්‍රයෝජනයක් නොසැලසේ. ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ මාර්ගඵලාදියක් හෝ නිපදවා ගන්නට නොහැකිය· එහෙත් පදපරම පුද්ගලයාගේ ධර්මය දැරීම් ආදී යථොක්ත ක්‍රියාමාර්ගයෝ අනෙක් ආත්මයකදී උග්ඝටිතඤ්ඤු තත්වයට පත්කරන්නට උපනිශ්‍රය වෙත්මය. එබැවින් ඔහුගේ නිස්සරණයට උපයෝගිවීම සඳහා **සංකිලෙසභාගිය වාසනාභාගිය සූත්‍රයන්** තථාගත දෙශනාවෙහි පැනෙන බැව් සැලකිය යුතුය.

**යුත්ත පටිභාන නො මුත්ත පටිභාන, මුත්ත පටිභාන නො යුත්ත පටිභාන, යුත්ත පටිභාන මුත්තපටිභාන නෙව යුත්ත පටිභාන නො මුත්ත පටිභාන:-**

ප්‍රශ්න විචාරීම් ආදියකදී උත්තරදෙන ක්‍රමය සලකා මේ පුද්ගල භේදය වදාරනලදී. පටිභාන ශබ්දයෙන් ඥාණයත් ඥාණයට වැටහෙන වචනයත් කියැවේ. එහෙත් මෙහි අදහස් කරනුයේ යුත්තස්ථානයෙහි ඥානාන්විත වචන පාවිච්චිකරමින් පිළිතුරු දීම පිළිබඳවය.

ප්‍රඥාගොචර වචන පාවිච්චිකරනුයේ යුත්තපටිභානය. ශීඝ්‍රව පිළිතුරු දෙනුයේ මුත්තපටිභානය. යම්කිසි ප්‍රශ්නයකට පිළිතුරු දෙනවිට අර්ථසමන්විත කාරණයට ගැලපෙන වචනවලින් උත්තරදෙන නමුදු එය ඉක්මනින් අවබොධ-කොටගත නොහී විලම්බයෙන් පවසනුයේ යුත්තපටිභාන නො මුත්තපටිභානය. විවාදයට භාජන වැ පවත්නා අර්ථ කථාවියන් විසඳන්නකු වශයෙන් ප්‍රසිද්ධියක් ඉසිලූ **ත්‍රිපිටක චූලනාග ස්ථවිරයන් වහන්සේ** එබන්දෙකි. ප්‍රශ්නයකට උත්තර සැපයීමෙහි සවල්ප වේලාවක් විමංසනය කොට

නැතට සුදුසු වචනයෙන් තමාගේ අදහස පැවසීම උන්වහන්සේගේ සිරිතය. දෙවැනි පුද්ගලයා ප්‍රශ්නයට අනතුරුව ම ඉක්මනින් පිළිතුරු දෙයි. එහෙත් එම උත්තරයෙහි කාරණයට යොග්‍ය බවක් නැත. වචන වහා පිටකිරීමක් මුත් නියම උත්තරදීමක් නොසිදු වේ. විමංසනය කළ ද යුතුන වචනයෙන් පවසන්නට හේ අසමර්ථය. **චතුනිකායික පණ්ඩිතතිස්ස ස්ථවිරයන් වහන්සේ** එබඳු ප්‍රත්‍යුත්තර දෙන්නෙකි. අසන ප්‍රශ්නය අවසන් වන්නටත් පෙරාතුව ම උත්තරදීම උන්වහන්සේගේ සිරිතය. වචනාර්ථය විමසන්නට නතර වීමක් නැත. තෙවැනි යුත්ත මුත්ත පටිභාන පුද්ගලයා විචාරනු සමග මැ යොග්‍යාර්ථය වටහා ගෙන එකෙණෙහි මැ පසුබැස්මක් නැතිවැ උත්තර දෙයි. අර්ථ කථාර්ථයන් නිරණය කිරීමෙහි අතිදක්ෂයකු වන **ත්‍රිපිටක චූලාභය ස්ථවිරයන් වහන්සේ** එබඳු උත්තර සපයන කෙනෙකි. ඉක්මනින් උත්තර දීමෙහිත්, කාරණානුකූල වචන පාවිච්චි කිරීමෙහිත්, උන්වහන්සේ ප්‍රසිද්ධය. සතර වැනි පුද්ගලයා යුත්ත මුත්ත පටිභාන ලක්ෂණ ද්වයයෙන් මැ දුර්බලයෙකි. හෙතෙම නැතට සුදුසු වචන පාවිච්චි කරන්නට නොදනී. සකාරණ වැ උත්තර දී ප්‍රශ්න කාරකයා ප්‍රතිබාහනය කරන්නට ද අසමර්ථය. ඔහුගෙන් ප්‍රශ්නයක් විචාළ කල බහලාන්ධකාරයක ගැලුනකු මෙන් චින්තන ශක්තියක් හෝ වචන ශක්තියක් නොමැතිව භ්‍රාන්තවෙයි. මඞ්ගලස්ථානයෙහි අවමඞ්ගලයට කියයුතු ධර්මයත්, අමඞ්ගල ස්ථානයෙහි මඞ්ගලයට කියයුතු ධර්මයත් දෙශනා කිරීමෙහි ප්‍රසිද්ධියක් ඉසිලූ **ලාළුදායි ස්ථවිරයන් වහන්සේ** එබන්දෙකි. මෙම පුද්ගලයන් සතරදෙනාගෙන් යුත්ත මුත්ත පටිභානවත් නැතැත්තහු ප්‍රශ්න විසර්ජනයෙහි නයග්‍රහණයෙන් ජයග්‍රහණය කරන බව දත යුත්තේය.

## සිවු වැදෑරුම් ධර්ම කථික පුද්ගලයෝ:

මෙ සසුන්හි ඇතැම් ධර්මකථිකයෙක් අර්ථ සමන්විත නොවූ ස්වල්ප ධර්මයක් දේශනා කරයි. ධර්මශ්‍රවණය සඳහා පැමිණි පිරිස ද සුදුසු නුසුදුසු කරුණු නොකරුණු දෙය තෝරා ගන්නට නොදනිත්. එහෙත් මෙම ආගම ධර්මය නූගත් ධර්මකථිකයා, එම නූගත් පිරිසෙහි ධර්මකථිකයෙකැයි පිළිගැනේ. පැමිණි පිරිසෙහි දැන උගත්කම්වලට ඔහු නොගැළපෙන්නකු නොවන හෙයිනි. දෙවැනි පුද්ගලයා ද ධර්මය ස්වල්පයක් ම කියන නමුදු එය අර්ථවත් ලෙස පවසයි. එමෙන් ම ධර්මශ්‍රවණය සඳහා පැමිණි පිරිස ද අර්ථානර්ථ දැන්මෙහි දක්ෂය. එබැවින් එම පිරිසෙහි ධර්ම කථික නාමය ඔහුට හිමිවේ. තෙවැනි පුද්ගලයා බොහෝ කාලය ගෙවමින් දීර්ඝ දේශනා පවත්වන්නෙකි. එසේවුව ද සාර්ථවත් දෙයක් කියන්නට අසමර්ථය. ඔහුගේ ධර්මදේශනාව ශ්‍රවණය කරන්නට පැමිණි පිරිසද අර්ථානර්ථ නොදනිත්. එහෙයින් ඔහුට තමා බඳුවූ ම පිරිසක ධර්ම කථික නාමය ලබන්නට නොහැකිකමක් නැත. සිවුවැනි පුද්ගලයා බොහෝ දේශනා කරයි. හෙද අර්ථ සහිතය. පැමිණි පිරිසද අර්ථානර්ථදැන්මෙහි බුහුටිය. ධර්මකථික නාමය එම පිරිසෙහි පහසුවෙන් ලබන්නට ඔහුට හැකිය. මෙම ධර්මදේශක පුද්ගලයන් සිවුදෙනා අතර අර්ථ සහිතව ස්වල්පයක් හෝ වැඩියක් බණන දෙදෙනා ධර්ම කථික නාමය ලැබීමට අභ්‍යර්ථයෙන් නිස්සහ. අනෙක් දෙදෙනා ධර්ම දේශනා කරන්නන් වශයෙන් පෙනී සිටින නමුදු එයට නුසුදුස්සෝය. න්‍යායානුගත සුදුසු කමක් ඔවුනට නැත ද ධර්මකථිකයන්ගේ ගණයට පිවිසුණු බැවින් ඔවුන් දෙදෙනාද එනමින් ව්‍යවහාර ප්‍රාප්ත වෙති.

## චතුර්විධ වලාහකොපම පුද්ගලයෝ

මහත්සේ ගර්ජනා කොට වැසි නොවස්නා වලාහකයෝ ද, ගර්ජනයක් නොමැතිව ම වස්නා වලාහකයෝ ද, ගර්ජනා සහිතව වස්නා වලාහකයෝ ද, ගර්ජනයක් ද වර්ෂණයක් ද නොමැති වලාහකයෝ ද යි මේඝයෝ චතුර්විධ වෙත්. මෙම මේඝයනට බඳු පැවැතුම් ඇති පුද්ගලයෝ සතර දෙනෙක් ද ලොවැ විද්‍යමාන වෙත්.

i **පුද්ගලයා** කියන්නකු මිස කිම අනුව ක්‍රියා කරන්නෙක් නොවේ. හෙතෙම භික්ෂුවක් වුව, ග්‍රන්ථ ධුරය පුරන්නෙමි. විදර්ශනා ධුරය පුරන්නෙමි. ධුතඞ්ග සමාදන් වන්නෙමි. අරන් සෙනසුන්හි ඇලෙන්නෙමි. ඈ විසින් පිරිය යුතු ගුණදහම් ගැන නිතර කථා කරයි. එහෙත් ඔහුගේ කියමන අනුව උද්දේශ ග්‍රහණයක් හෝ විදර්ශනා වැඩීමක් හෝ නොකරයි. ත්‍රිශික්ෂාවන් පූරණයෙහි තමාගේ මහත් ඕනෑකම දක්වමින් අන්‍යයන්ගෙන් සැලකිලි ලැබීම ඔහුගේ පරමාර්ථය හෙයින් කිම කිරීමක් බවට නොපෙරළේ. ගෘහස්ථයෙකු වුව, අසුවල් දින දානයක් දෙන්නෙමියි සඞ්ඝයා නිමන්ත්‍රණය කොට නියමිත කාලය පැමිණි කල එයට ඉදිරිපත් නොවී මගහරී. වෙහෙර විහාරාදී ආගමික අනෙක් කටයුතු පිළිබඳවද ඔහුගේ කිම හා කිරීම සිදුවනුයේ මෙමැ ආකාරයෙනි. මේ පුද්ගලයා පිනෙන් පිරිහෙනු පමණක් නොව භික්ෂු සඞ්ඝයා ද ලාභයෙන් පිරිහෙළයි. මේඝ ගර්ජනා ඇසූ ගොවියන් වැසි වසිනැයි සිතා අටු කොටු වලින් බීජයන් ගෙන වපුරා අවර්ෂණය හේතුකොටගෙන දුර්භික්ෂයකට ගොදුරු වනු මෙනි. වැසි නොවට බැවින් කෙතෙහි වපුළ බිජුවට එහි නැසේ. ගෙහි වූ බිජුවට කාලය ඉක්ම යෑමෙන් නැසේ. මෙසේ දෙතන්හිම වූ බීජයන් විනාශ වීමෙන් දුර්භික්ෂය ළඟාවේ. දායක ප්‍රතිග්‍රාහකයන්ගේ පුණ්‍ය ලාභ පරිහානිය මෙම පුද්ගලයා නිසා සැලසෙන සැටි ද උක්ත ප්‍රකාරයෙන් දතයුතුය.

ii **පුද්ගලයා** කරන්නෙකු මිස කියන්නෙක් නොවේ. කළයුතුදේ කරනු විනා කියමින් කාලය ගෙවීමට හෙතෙම කැමති නැත. කරන්නට පළමුව ම කියනුයේ කීර්ති ප්‍රශංසා බලාපොරොත්තු වන්නෙකි. තමාගෙන් සිදුවියයුතු යුතුකම ඉටුකිරීම මොහුගේ අදහස හෙයින් කරන දේ කියන්නට ඉදිරිපත් නොවේ. කරන දෑය කිය කියා සිටීම නුසුදුසු වුව ද, සැමතැනටම එය උචිත නැත. කියයුත්තනට නොකියා යම් යම් කටයුතු කිරීම ඇතැම්විට පාඩු සිදුවීමට හෙතුවේ. මෙම පුද්ගල භේදය ප්‍රත්‍යය දායකයාගේ වශයෙන් බෙදන ලද්දක් බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීමෙන් ප්‍රත්‍ය දායකයාගේ අදහස් මුදුන්පත් කර ගන්නට නොලැබේ. යථොක්ත ගතිගුණ සම්පන්න තැනැත්තේ පළමුව ආරාධනය කිරීම උවමනා නැතැයි සලකා දානය පිළියෙලකොට ගෙන සඞ්ඝයා වැඩමවා ඒමට විහාරස්ථානයට යෙයි. සඞ්ඝයා අනෙක් තැනක ආරාධ-නයක් පිළිගෙන තිබුණහොත් ඔහුගේ පිංකමට ඉඩ නොලැබේ. ඉන් වනුයේ ඔහු පිනෙන් පිරිහෙන අතර සඞ්ඝයාද ලාභයෙන් පිරිහීමය. මෙබඳු තැනැත්තාගේ අන් කවර වැඩක් වුව ද, සිදුවනුයේ මෙලෙසය. අදහස් ඉටුකර ගන්නට අවකාශයක් නොමැතිව පසුතැවිලි වීමට අපරීක්ෂාව නිසා ඔහුට සිද්ධවීම එකාන්තය. වර්ෂණය ප්‍රයෝජනදායක දෙයක් වුවද, ගර්ජනා නොකොට වැසීම ඇතැම්විට අනර්ථදායකය. ගොවියෝ ගර්ජනා කිරීම් ආදි වැසි ලකුණු නැති හෙයින් වැයි නොවසිතැයි සිතා පහත් මඩවගුරු බිම්හි වපුරන්නට පෙළඹෙති. බලාපොරොත්තු රහිතව වැසීමෙන් ඔවුන්ගේ ධාන්‍ය විනාශ වේ. මෙතෙමේ ද කල්තබා පිළියෙලවීමක් නැතිව යම් යම් කටයුතු කරන්නට යැමෙන් දෙලොව දියුණුවෙන් පිරිහෙන්නෙකි.

iii **පුද්ගලයා** කියන ආකාරයෙන් ම නොවරදවා ක්‍රියා කරන්නෙකි. කළයුතු දෙයක් අදහස් ඉටුවන සේ තිබී අඥමින් කරන පුද්ගලයා මොහුය. දනක් දෙන්නට ඉදිරිපත් වුවහොත් චාරිත්‍රානුරූපව පළමුකොට සඞ්ඝයාට ආරාධනයකර ඉන්පසු දෙය්‍ය ධර්‍මය පිළියෙල කොට නියමිත දිනයෙහි කිසි බාධාවක් නොමැතිව සඞ්ඝයා වැඩම්වා දන් දී පින් සිදුකර ගනී. සාමාජික ක්‍රියාවක් වුවද භිවිසගෙන භාරගත් අඥමින් ඔහුට නියමිත වැඩ කොටස කොට නිමවයි. මෙපෙම වැසි වසින බව දන්වන්නාක් මෙන් පළමුව ගර්ජනා කොට ඉන්පසු වර්‍ෂණය ද කරන වලාහකයක් වැන්න. සුදුසු කල්හි නිසිලෙස වසින වැස්සෙන් ගොවියන්ගේ අදහස් සපුරාලන්නාක් මෙන් මෙම පුද්ගලයාගෙන් ද සිදුවනුයේ වැඩෙක්මය.

iv **පුද්ගලයා** නොකරන්නෙකු මෙන්ම නොකියන්නෙක්ද වේ. මෙතෙම දන්දිමක් පාබා ආරාධනාදියකට ද ඉදිරිපත් නොවේ. තමාගේ කටයුතු කෙරෙහි ඇලී ඇත්මම්හරියකු ලෙස ජීවත්වේ. සාමාජික සාමයික කටයුතුවල යෙදී යුතුකම් ඉටුකොට රටෙහිත්, ආගමෙයහිත්, දියුණුවක් සලසන්නට අදහස් නො කරයි ඔහුගෙන් ලොවට වන වැඩෙක් නැත. වර්‍ෂණයක් පාබා සිත් සතුටුවම් මාත්‍රයකටවත් ගර්ජනයකුදු නැති වලාකුලෙකින් ගොවිජනයාට අභිසිද්ධියක් නොවනු මෙනි.

**චතුර්විධ මූසිකූපම පුද්ගලයෝ:**

ගුල ගැඹුරට සාරාගෙන එහි විසීමක් නොකරන මීයා ද, ගැඹුරු ගුලක් සාරානොගත් නමුදු එබඳු තැනකම වසන මීයා ද, ගුල ගැඹුරට සාරාගෙන එහිම වසන මීයාද, ගැඹුරු ගුලක් නොසාරාගන්නාසේ ම එබඳු තැනක නොවසන්නාදැයි මූසිකයෝ සිවුදෙනෙක් ඇත්නාහ. මෙසඳුන්හිදු යථොක්ත මූසිකයන් බඳු පැවැතුම් ඇති පුද්ගලයෝ සිවුදෙනෙක් පැනෙන්නාහුය.

i **පුද්ගලයා** සූත්‍රගෙය්‍ය වෙය්‍යාකරණාදි නවාඞ්ග ශාස්තෘ ශාසනය මනාසේ උගනී. එතකුදු වුවත් ඉගෙනගත් පර්‍ය්‍යාප්තිය අනුව නුවණ මෙහෙයවා චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මාවබොධයක් නොලබයි. වාසය පිණිස සාරාගත් ගුලක් ඇති නමුත් එහි නොම වෙසෙමින් බාහිර ස්ථානයක වාසය කරන මූෂිකයා බිළාර නාගාදීන්ගේ ගොදුරු බවට පහසුවෙන් ම පත්විය හැකිය. ශරීරාරක්ෂාව සඳහා යොග්‍ය ස්ථානයක නොවිසීම එයට හෙතුවය.

මෙම පුද්ගලයා ද ධර්මය ඉගෙනගත් නමුදු ඒ අනුව පිළිපදින්නට යත්නයේ නොවේ. හෙතෙම භික්ෂුවක වුව චීවරාදි සිවුපස ලාභ සඞ්ඛ්‍යාත ලොකාමිෂයෙහි ම ගැලී වෙසෙයි. ප්‍රත්‍ය ලාභයක් මුත් ප්‍රතිවෙධ ලාභයක් උපයා ගන්නට උත්සාහ නොගනී. ගිහියකු වුව උපභොග පරිභොග සම්පත් සාධා ගැන්මෙහි තියැලි වනු මිස දත් ධර්මයක් අනුව කායා දී ද්වාරත්‍රය හික්මවා ලන්නට අදහස් නොකරයි. එබැවින් තමා නොදැනුවත්ව ම මෘත්‍යුමාර - ක්ලෙශමාර දෙවපුත්‍රමාර සඞ්ඛ්‍යාත සතුරන්ගේ වසඟයට අනායාසයෙන් ම පැමිණ නැතාක් දුකට භාජන වන්නේය.

ii **පුද්ගලයා** සූත්‍රගෙය්‍යාදී පර්‍ය්‍යාප්ති ධර්මය නිසිලෙස නුගත් නමුදු දැනගත් ස්වල්පමාත්‍රවූ ද ධර්මය ආරක්ෂා කරගනිමින් ධර්මානුකූලව ජීවිතය පවත්වයි. හෙතෙම බලවත් උත්සාහයෙන් ක්‍රියාකොට කල්යැමේ දී සිවුසස් දහම් පිළිවිදින්නට සමත් වේ. උගත් ධර්මය අනුව කායා දී ද්වාරත්‍රය මෙහෙයැවීමෙන් නුවණ තියුණුවන හෙයිනි. තමා විසින් ම සාරාගත් බිලයක් නැතද අනුන් කළ බිලයක වෙසෙමින් දිවි රැකගන්නා මීයා මෙන් මෙතෙම අන්‍යයන්ගේ ධර්මකථා ශ්‍රවණය කොට තදනුකූලව පිළිවෙත් පුරා චතුරාර්‍ය්‍ය සත්‍යධර්මය ප්‍රතිවෙධකොට තුන් මරුන්ගේ ප්‍රභූත්වය ඉක්ම වන්නේය.

iii **පුද්ගලයා** නවාඞ්ග ශාස්තෘ ශාසනය ඉගෙන තදනුරූප සේ නුවණ මෙහෙයවා සිවුසස් දහම් දැන මාර වසඟය ඉක්මවා නිර්වාණාධිගමය කෙරෙයි. තමාමැ සාරාගත්

ගැඹුරු ගුලෙක වෙසෙමින් දිවි සුවසේ පවත්වන මූෂිකයා හා මොහුගේ පැවැත්මෙහි නානාත්වයෙක් නැති. මෙතෙම පර්‍ය්‍යාප්ති ශාසනය මනා සේ ඉගෙන එයට අනුරූප පිළිවෙත්හි කායාදි ද්වාරත්‍රයය යොදවා ප්‍රතිවෙධ ශාසනය ප්‍රත්‍යක්‍ෂකොටගෙන සංසාරාර්ණවයෙන් එතර වන්නේය.

iv **පුද්ගලයා** සූත්‍රාදි දහම් ද නොම උගනී. සිවුසස් පිළිවිදීමකුදු නොම කෙරෙයි. සාරාගත් බිලයක් නොමැතිව අනාරක්‍ෂක ස්ථානයෙක වාසය කරන මූෂිකයා බිළාර නාගාදි සතුනට පහසුවෙන් ම ගොදුරු වී නැසෙනු මෙන් මෙම පුද්ගලයාද ප්‍රතිවෙධයක් තබා පර්‍ය්‍යාප්තියකුදු නොම දත් හෙයින් ක්ලෙශ වසනවූ ත්‍රිවිධ මාරාරීනට ගොදුරු වැ සසර මැ වෙසෙන්නේය. මාරධෙය සඞ්ඛ්‍යාත වෘත්තත්‍රයය ඉක්මවිය නොහී ජාත්‍යාදී සංසාර දුඃඛාර්ණවයෙහි ගැලෙන්නේය.

## චතුර්විධ අම්බූපම පුද්ගලයෝ:-

පිටත ඉදුණු පැහැය ඇති නමුත් ඇතුළත නොම ඉදුණු අමු අඹය, පිටත නොඉදුණු පැහැය ඇති වුවද, ඇතුළත ඉදුණු අඹය, පිටත නොඉදුණු බැව් දක්වෙන නිලවර්ණයෙන් යුක්තවන්නා සේ ම ඇතුළත පැසුණු බවක් නැති අමු අඹය, පිටත ඉදුණු පැහැය පෙනෙනු මෙන්ම ඇතුළත ද මනාසේ පැසීගිය ඉදුණු අඹයයි ලොවැ අඹවර්ගී සතරක් දක්නා ලැබේ. මෙම අඹ වර්ගී සතරට සමාන පැවැතුම් ඇති පුද්ගලයෝ සිවුදෙනෙක් ද ලොකයෙහි විද්‍යමාන වෙත්.

i **පුද්ගලයා** දුටුවන් පහන් බවට පමුණුවන ආනන්ද-ජනක යැම් ඊම් බැලීම් අත් පා හැකිලැවීම් දිගහැරීම් ආදී ඉරියව් පැවැත්මෙන් සමන්විතය. එනකුදුවුවත් අභ්‍යන්තරිකාව චතුරාර්‍ය්‍ය සත්‍ය පිළිබඳ තත්ත්වාවබොධයක් නැත. බාහිර ඉරියව් පැවැත්වීම දෙස බලන්නෙකුට මෙතෙම ආර්‍ය්‍ය පුද්ගලයෙකැයි නිරායාසයෙන් හැඟෙන තරම් ආචාර සමාචාර සම්පන්නය.

ශාන්ත දාන්ත බැවින් ශොභිතය. සමාහිත ඉන්ද්‍රියයන්ගෙන් යුක්තය. එහෙත් හේ අනාර්‍ය්‍ය පුද්ගලයෙකි. ක්ලේශයන්ගෙන් හරිත වූ පෘථග්ජනයෙකි. මෙතෙම ඉදුණු ගෙඩියක පැහැය පිටතින් පෙනෙන ඇතුළත පැසීමක් නැති ආමකත්වයෙන් යුත් ආම්‍රඵලයක් වැන්න. මේ පුද්ගලයා තුළ පිහිටි පෘථග්ජනත්වය අමු බව වශයෙනුත්, ආර්‍ය්‍ය භාවය ඉදීම වශයෙනුත්, අදහස් කරන බව සැලකිය යුතුය.

ii **පුද්ගලයා** යැම් ඊම් ආදී ඉරියව් ප්‍රසාදවහ ලෙස නොපවත්වන තමුදු සිවුසස් පිළිවිදි කෙනෙකි. ඇතුළත මනාසේ ඉදුණු පිටහ අමු පැහැය නිසා ඉදුණු බවක් නොපැනෙන අඹයක් වැන්න; බොහෝ සෙයින් සිත් සතන් තුළ කෙලෙස් සංසිඳුණු බැව් පැනෙනුයේ ආලෝකන විලෝකනාදී ඊර්‍ය්‍යාපථ පැවැත්වීමේ ආකාරයෙනි. පූර්‍ව වාසනා බලයෙන් ආර්‍ය්‍ය භාවය ලදුවද, ඇතැම් කෙනෙකු තුළ අන්හට ප්‍රසාද එළවන ඉරියව් පැවැතුම් නැත. බාහිර පෙනුමෙන් කිසිසේත් ආර්‍ය්‍යයෙකැයි සිතන්නට නොපිළිවන. සමීප ආත්මයක වාතර ජන්මය ලැබ සිටි හෙයින් වාසනා ගුණ හේතුකොටගෙන ජල මාර්‍ගවලින් පැන පැන ගොස් ලාභයෙන් පිරිහෙන්නට ගිය රහතන් වහන්සේ මෙම පුද්ගල සඞ්ඛ්‍යාවට ඇතුළත් වන්නෙකි.

iii **පුද්ගලයා** තුළ අන්‍යයනට ප්‍රසාදෝත්පාදක ඉරියව් පැවැත්මක් නැත්තාසේ ම ඇතුළත ආර්‍ය්‍ය ගුණයකුදු අවිද්‍යමානය. නොපැසුණු ගතිය පැහැදිලි ලෙස තේරුම් ගතහැකි අමු අඹය වැනි පැවැතුම් ඇති මොහුවෙත රැකෙන ගුණයක් නැත. ක්ලේශ කාලුෂ්‍යයෙන් පිරුණු චිත්ත සන්තානයට අනුරූපසේ පැවැත්වෙන බාහිර ඉරියව්වෙන් හා හැඬි දූඞි ගමනා ගමනාදියෙන් ඔහුගේ පෘථග්ජනත්වය හෙළිපෙහෙළි වෙයි.

iv **පුද්ගලයා** දකුම්කළු ප්‍රසාද ජනක ඉරියව් පැවැත්මෙන් යුක්තය. එමෙන් ම ප්‍රතිවේධය කළ චතුරාර්‍ය්‍ය සත්‍යය ඇත්තේය. ඇතුළත මනාලෙස පැසීමෙන් ඉදුණු බව පිටත පෙන්වන ලක්‍ෂණය වූ පැහැය ද ඇති අඹය මෙන් මෙතෙම පහළ කරගත් අභ්‍යන්තරික ගුණයනට අනුරූපසේ ඉරියව් පවත්වයි. නුසුදුසු ඇලුම් බැලුම් හෝ හස්තපාද විකාරාදියක් හෝ නැති හෙයින් බලන්නවුනට ආර්‍ය්‍යගුණයන්ගෙන් හෙබි උත්තමයෙකැයි නිරායාස යෙන් අවබොධවේ. ඇතුළත ආර්‍ය්‍ය ගුණ ඇති නමුත් පිටත අනාර්‍ය්‍යයකුසේ පෑනෙන පුද්ගලයාට වඩා මොහුගෙන් ලෝකයාට සිදුවනුයේ මහත් වැඩකි. ඉරියව් දක්මෙන් ගුණදොෂ විචාරණය කිරීමත්, පහන් නොපහන් බැව් පහළ කැරගැන්මත්, ලොකස්වභාවය හෙයිනි.

## චතුර්විධ කුම්භූපම පුද්ගලයෝ.

වසන ලද ඇතුළත හිස් කළය, නොවසනලද පිරුණු කළය, නොවසන ලද හිස් කළය, වසන ලද පිරුණු කළය, දැයි කුම්භ සතරක් ඇති විය හැක. මෙම කළ බඳු පැවැතුම් ඇති පුද්ගලයෝ සතරදෙනෙක්ද ලොකයෙහි දක්නා ලැබෙත්.

i **පුද්ගලයා** යැම් ඊම් ආලොකන විලොකනාදී ඉරියව් මනාලෙස පවත්වයි. දර්‍ශනය කරන්නන්ගේ සිත් සතන් පැහැර ගන්නට සමත් සමිත දමිත ඉන්‍ද්‍රියයන් ඇත ද ඔහු තුළ චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධයක් නැත. අභ්‍යන්තරයෙහි තිබියයුතු සීලාදී ගුණසාරයෙන් තොරය. එහෙත් ගුණසම්පන්නයෙකු තුළ පිහිටන ආචාර සමාචාර දක්නට ලැබෙන හෙයින් වසානිබීමෙන් පිරුණු කළයක ස්වරූපය ගන්නා ජලයෙන් හිස් වූ කළයකට උපමා කළ හැකිය.

ii **පුද්ගලයා** දුටුවන් පහදින සුළු ඉරියව් පැවැත්මක් නැති නමුදු චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධ සඞ්ඛ්‍යාත ගුණ සාරයෙන් සම්පූර්ණ කෙනෙකි. ජලයෙන් පිරීතිබෙන වැස්මක්

නැති කළය මෙම පුද්ගලයා හා තත්ත්වයෙන් සමානය. කළයෙහි ජලය පිරිසිදු වුවද වැස්මක් නැති හෙයින් පරිශුද්ධත්වයෙන් පිළිගෙන පැන් පවස් සංසිඳවා ගන්නට ලෝකයා මැලිකම් දක්වයි. එමෙන් විසුරුණු ඉන්ද්‍රිය යන්ගෙන් යුත් ආර්‍ය පුද්ගලයාගේ ගුණය පිළිබඳ සැක පහළ කරන්නට අනෙක් ලෝකයා පුහුසුළු වීම ස්වාභාවිකය. ආර්‍ය භාවයක් ලද කෙනෙකැ යි හැඟෙන පැවැත්මක් නොපැනෙන හෙයිනි.

iii **පුද්ගලයා** තුළ කෙලෙස් සංසිඳීමෙන් ශාන්ත බැව් වැටහෙන ප්‍රසාද දනවන ඉරියවු පැවැත්මක් නැත්තේය. එම ලක්ෂණය බාහිර ඉන්ද්‍රියයන් තුළ ක්‍රියා කරවන ගුණ ප්‍රතිලාභයකුදු අභ්‍යන්තරයෙහි අවිද්‍යමානය. ඇතුළත ජලයෙන් හිස්වූ එම තුච්ඡභාවය මනාකොට පෙනෙන පිධානයකුදු නැති කළය මොහුට සමාන කළ හැකිය.

iv **පුද්ගලයා** ආලෝකන විලෝකන සම්මිඤ්ජන පසාරණාදී ඉරියවු දැකුම්කළු ලෙස පවත්වයි. එමෙන්ම චතුසත්‍යාවබෝධය ලැබ අභ්‍යන්තරික ආර්‍ය ගුණයන්-ගෙන්ද පරිපූර්ණය. එබැවින් ගුණානුරූප පැවැත්මත්, ඉන්ද්‍රිය විහරණයට අනුකූල ගුණයත් ඔහුට ඇත. ජලයෙන් පුරවා මනාලෙස වසා තිබෙන කළය සර්වප්‍රකාරයෙන් පරිභොගයට යොග්‍ය වූ ප්‍රයෝජනවත් එකක් වනුමෙන් මෙතෙමේ ද ගුණසාරයත් තදනුරූප ඉරියවු පැවැත්මත් ඇති හෙයින් පූර්වෝක්ත සියලුදෙනා අතුරෙන් උත්තරීතර වන්නේයයි දතයුතුය.

## චතුර්විධ උදක රහදූපම පුද්ගලයෝ

ගැඹුරු සේ පෙනෙන නොගැඹුරු ජලය ඇති විලය, ගැඹුරු නමුත් නොගැඹුරුසේ පෙනෙන ප්‍රසන්න ජලයෙන් යුත් විලය, නොගැඹුරු වූ එපරිද්දෙන් ම පෙනෙන ජලයෙන් යුත් විලය, ගැඹුරු වූ එලෙසම පෙනෙන ජලයෙන් යුත් විලයයි තඩාග සතරෙක් වෙයි. මෙම තඩාග සතරාකාර පැවැතුම් ඇති පුද්ගලයෝ සතරදෙනෙක් ද ලෝකයෙහි විද්‍යමාන වෙත්.

i **පුද්ගලයා** ප්‍රසාද ජනක ඉරියවු පවත්වයි. එහෙත් ප්‍රතිවේධය කළ ආර්‍ය සත්‍යයක් නැත්තේය. ගුණයෙන් ගැඹුරුවූවන් තුළ සංසුන් ඉඳුරන් ඇති බව බාහිර වශයෙන් දක්නට ලැබෙන ලක්‍ෂණයෙකි. එය මෙම පුද්ගලයා කෙරෙහි ද විද්‍යමාන නමුදු තදනුරූප ගුණ ප්‍රතිවේධයක් අභ්‍යන්තරික වශයෙන් නැත. උත්සන්න රාග ද්වේෂා දී ක්ලේශ ශ්ලේෂිත චිත්ත සන්තානයෙකින් හෙබියේ වෙයි. එබැවින් මෙතෙමේ ගැඹුරුසේ පෙනෙන ස්වල්ප ජලයෙකින් යුත් නොගැඹුරු වූ විලක් වැන්න.

ii **පුද්ගලයා** බාහිර පෙනුමෙන් ගුණ සම්පන්න-යෙකැයි දතහැකි සංසුන් ඉරියවු පැවැත්මක් නැති නමුදු චතුරාර්‍යසත්‍යයන් පිළිවිදි කෙනෙකි. ගුණයෙන් ගැඹුරු වුවද, ප්‍රසාදවහ ඉරියවු පැවැත්මක් නැතිකම මොහුගේ එකම අඩුපාඩුවය. සාමාන්‍ය ලොකයා අපාර ගුණැතියකු සේ පිළිගැනෙන්නට ශාන්ත ඉන්ද්‍රියයන් තිබියයුතු හෙයින් එය බාධාවකි. මෙහෙම ජලයේ පිරිසිදු භාවයෙන් ගැඹුර මැනගත නොහැකිව නොගැඹුරුව පෙනෙන ගැඹුරු විලක් වැන්නැයි කිවහැකිය.

iii **පුද්ගලයා** යැම ඊමාදී ඉරියවු පැවැත්වීම් නිසිලෙස නොකරයි. එසේම ශාන්ත දාන්ත හැසිරීමට හෙතුවන අභ්‍යන්තරික ගුණයක් ද ලබාගෙන නැත. පියෙවි මිනිස්-ගතියෙන් හෙබි හෙතෙම ශාස්ත්‍රාගමාදියෙකින් පහළ කර ගතයුතු ගුණ විශෙෂයක් හෝ ශික්‍ෂා සම්මත චාරිත්‍ර වාරිත්‍රා-දියක් හෝ නැති හෙයින් පහසුවෙන් ම ක්ලෙශ වසඟ වැ තදනුකූල පැවැත්මෙන් ද යුක්ත වෙයි. නොගැඹුරු බව පැහැදිලිව පෙනෙන නොගැඹුරුවූම තඩාගය මෙම පුද්ගලයා හා සමසේ සැලකේ.

iv **පුද්ගලයා** අභ්‍යන්තරයෙහි ගම්භීර ආර්‍ය්‍ය ගුණ-සාරයෙන් හරිතය. පිටත්හිදු යථොක්ත ගුණයනට සරිලනසේ පවත්වන දුටුවන් තුටුකරවන ආලෝකන විලෝකනාදී ඊර්‍ය්‍යාපථයෙන් සංයුක්තය. ප්‍රතිවේධය කළ ආර්‍ය්‍ය ගුණයන් බාහිර පැවැත්මෙන් ද පැනෙන මෙතෙම ගැඹුරුවූ ද එය මනාලෙස පෙනෙන්නාවූ ද භාජනයක් වැන්නැයි කිවහැක. මෙහි දැක්වූ පුද්ගල චතුෂ්ක කිහිපය ලක්‍ෂණ විසින් සලකනවිට එක් බඳුය. අභ්‍යන්තර බාහිර ලක්‍ෂණයන්ගේ නානාත්වයක් නොම පෙනේ. ස්වල්ප වෙනසක් දැක්වෙනුයේ උපමානය සඳහා ගත් වස්තූන්ගේ වශයෙනි. විනෙය ජනයන්ගේ සුඛාවබෝධය පිණිස එකම කාරණය අවසර්‍ථානුරූපව යථොක්තාකාරයෙන් දේශනා කරනලද බව සැලකිය යුතුයි.

### චතුර්විධ බලිවද්දූපම පුද්ගලයෝ:

ස්වකීය ගවරැලෙහි ගවයනට චණ්ඩවූ පරකීය ගවයනට චණ්ඩනොවූ ගවයාය, පරකීයයනට චණ්ඩවූවද ස්වකීයයනට චණ්ඩ නොවූ ගවයාය, ස්වකීය පරකීය හැම ගවයනට ම සැඩ ඵරුෂ වූ ගවයාය, ස්වකීයයනට මෙන්මැ පරකීය-යනට ද සැඩ ඵරුෂ බවක් නැති ගවයාදැයි බලිවද්දියෝ සතර දෙනෙක් වෙති. එපරිද්දෙන් ම ඔවුන් හා සංසන්දනය වන පැවැතුම් ඇති පුද්ගලයෝ සිව්දෙනෙක් ද ලෝකයෙහි විද්‍යමාන වෙත්.

i **පුද්ගලයා** ස්වකීය ඥාතිමිත්‍ර පිරිස සමග ගැටෙන්නෙකි. ඔවුන් හා කලකෝලාහල කරන්නට ඉදිරිපත් වෙයි. ඔවුන් නිතර තැතිගන්වයි. කවර මොහොහක පීඩාවක් කෙරේදැයි සැකයට භාජන කරයි. මෙසේ සිය පිරිසෙහි සැඩ ඵරුෂවැ හැසිරෙයි. එහෙත් පරපිරිස්හි ඇලෙයි. ඔවුන් ලාලනය කෙරෙයි. යටහත් පහත් පැවැත්මෙන් යුක්තව ඔවුන් හා හැමතන්හිම ක්‍රියා කෙරෙයි. මෙතෙම ස්වකීය ගවරැලෙහි චණ්ඩ ප්‍රචණ්ඩ වැ හැසිරෙමින් ඔවුන් බියගන්වන තමන් පරගවයනට ඇලුම්කම් දක්වන ගවයකු වැන්නැයි කිවහැකිය.

ස්වකීයයන්ගේ ස්වල්පමාත්‍ර දෝෂයක් දුටද මහත්සේ කිපී රුදු විරුද්‍ධව රොස් පරොස් බස් තිණුම ද තර්ජනයෙන් බිය ගැන්වීමද මොහුගේ ස්වාභාවික පුරුද්ද හෙයිනි.

ii **පුද්ගලයා:** ස්වකීයයනට හිතෛෂීව රක්ෂාවරණ ගොපනය කෙරෙමින් සෙත සලසාලයි. සිය පිරිසෙහි දියුණුවට කළහැකි සියලු ක්‍රියා මාර්ගයන් ආරම්භ කෙරෙමින් තමාගේ දියුණුව නොසලකා පිරිසෙහි දියුණුවට ම කටයුතු කරයි. ස්වකිය පිරිසෙහි ශක්තිය තමාගේම ශක්තිය කොට සලකා හැම අතින් ම ස්වකියයන් නගාගන්නට උත්සාහ කෙරේ. එහෙත් පරකියයනට අහිතයක් ම සැඩ පරොස් බවක් ම පෙන්වයි. මෙතෙම තම ගව පට්ටිය රැක බලා ගනිමින් අන් ගවයන්හට භය ජනක සේ තර්ජනීය විලාසයෙන් හැසිරෙන ස්වකියයන්ගේ ම රැකවරණත් දියුණුවත් පතා ක්‍රියා කරන ගවයෙකු මෙනැයි කීවහැක්කේය.

iii **පුද්ගලයා** සිය පිරිස්හිදු පරපිරිස්හිදු විශෙෂයක් නොතකා සැඩ ඵරුෂ වැ ක්‍රියා කරන්නෙකි. ඔහුට කිසිවෙකුත් ඇසුරු කළ නොහැකිය. අකාරණයේ කොපවීම මොහු තුළ ස්වාභාවික වැ පිහිටි ගතියක් හෙයින් අනෙකකුගේ දර්ශනය පවා අඩදබරාදියෙන් ඉමහත් ව්‍යසනයනට පාත්‍රවීමට හෙතුවේ. ආශ්‍රිතයන් භෙදකොට පිරිස් වනසන ඊර්ෂ්‍යා-යෙන් හරිත ඊර්ෂ්‍යාපථ පැවැත්වීම මොහුගේ සන්තොෂය පිණිස වෙයි. කොතරම් බන්‍ධුමිත්‍රාදී පරිවාර ජනයා සිටියද මොහු වසනුයේ හුදෙකලාවමය. ආශ්‍රය නොකළ හැකි හෙයින් නිතර අන්‍යයන් විසින් බැහැර කරනු ලබයි. යටත්පිරි-සෙයින් දෙමාපිය කෙනෙකුදු අසුරු කරන්නට අසමර්ථය. අසමාදනය. අසන්තොෂය ඔහු තුළ රජයමින් බලපවත්වයි. එබැවින් සිය පර දෙපිරිස්හිම ඔළුමොළහාම් දක්වන ගවයෙකු මෙනැයි කියැවේ.

iv **පුද්ගලයා:** ස්ව පර දෙපිරිස්හි මැ නොසැඩව වෙසේ. කවුරුන් කෙරෙහිත් සමසිත් ඇති වැ සම්මෙත් පතුරමින් නිවාත වෘත්තිවැ හැසිරේ. ශක්ති හීනතායෙන් හෝ නීචමතතායෙන් කිසිවකුන්හටත් ඔහුගෙන් ගැහැට කරදර පීඩාදියක් නොසිදු වේ. පක්ෂ භේදයක් නොගෙන හැමදෙනම ආත්මීයත්වයෙන් සලකා අනුග්‍රහයත් අනුකම්පාවත් සහයොගයත් එකසේ ක්‍රියායෙහි යොදවමින් අන්හට වැඩ වැඩීම මොහුගේ සිරිතය. හැමදෙනාගේ ආදර ගෞරවයට භාජනවැ පිරිවර සම්පත්තින් අනූන වැ වෙසෙන මෙතෙම ස්වකීයයන් හා පරකීයයන් අතර අවණ්ඩ වැ අතර්ජනීය ස්වභාවයෙන් යුක්ත වැ දිවිරක්නා ගවයෙකුගේ ස්වරූපය නිරූපණය කෙරේ.

## චතුර්විධ ආසිවිසූපම පුද්ගලයෝ:

දෂ්ට කළ කෙණෙහි වහා විෂ පැතිරී යන නමුත් විෂය දරුණු නොවන සර්පයෙක. දරුණු විෂ ඇති වුවද එය වහා පැතිරී නොයන ගතියෙන් යුත් සර්පයෙක. වහා විෂ පැතිරී යන්නාසේම දරුණු පීඩා ගෙනදෙන විෂයෙන් යුත් සර්පයෙක. විෂය ඉක්මනින් පැතිරී නොයන්නාක් මෙන්ම දරුණුද නොවන විෂ ඇති සර්පයෙකැයි ආශිවිෂයෝ සිවුදෙනෙක් වෙති. මෙම සර්පයන් බඳු ගති පැවැතුම් ඇති පුද්ගලයෝ සතර දෙනෙක්ද ලෝකයෙහි විද්‍යමානයහ.

i **පුද්ගලයා** නිරන්තරයෙන් කිපෙන ස්වභාවයෙන් යුක්තය. තමහට රුචි නොවන අරමුණක් ඉන්ද්‍රිය ගොචර වනු සමගමැ ද්වේෂයට කාරණයක් නැතද මොහු තුළ කොපය පහළ වෙයි. එහෙත් එම ක්‍රොධය සන්තානයෙහි නොරැඳී ඉක්මනින් ම නිවීමට යෙයි. ක්‍රොධය හටගන්නාගාම සංසිඳීමට පැමිණේ. ඇතැම්විට ක්‍රොධහෙතුක වචන පාවිච්චියක් හෝ පහරදීමක් හෝ කළද එය එපමණකින් නතර කොට අමතක කර දමයි. දිගින් දිගට වෛර බැඳ ගෙන පවත්වා ගෙන යන්නට අදහස් නොකරයි. මෙතෙම වහා විෂ පැතිරෙන නමුත් දරුණු පීඩා නොදී බැසයන විෂ ඇති සර්පයා වැනි වේ.

ii **පුද්ගලයා** නිතර නොකිපෙයි. සිත ගැටෙන දෙයක් සිදුවුවද ක්‍රොධ වසඟ නොවේ. යම්හෙයකින් කිපුණයොත් එම ක්‍රොධය බොහෝකලක් පවත්වයි. මොහු සසාරණයේ කිපෙන්නකු හෙයින් කලාතුරකින් උපන් ක්‍රොධය සංසිඳුවා ගන්නට අසමර්ථය. ක්‍රොධයට භාජන-වූවහු දුරුකිරීම් වශයෙන් පිළිකුල මූලික වැ කොපය පවත්වා ගෙනයෑම මොහුගේ සවභාවය හෙයින් එය දුරිභූත වීමට කල්ගතවෙයි. ඉක්මනින් පැතිරෙන විෂ නැති නමුත් දරුණු විෂ ඇති සර්පයා හා මොහුගේ පැවැත්ම එක්බඳු යැයි කිවහැකිය.

iii **පුද්ගලයා** ඉක්මනින් කිපෙයි. එමෙන් ම එය බොහෝ කලක් මුලුල්ලෙහි බද්ධවෛරයක් බවට පමුණුවා ගෙන පවත්වයි. පලිගැනීමට අවසථාවක් බලමින් ක්‍රොධ-යෙන් වෙළී වාසය කිරීම මොහුගේ ගතියකි. අභිප්‍රායානු කූලව ක්‍රොධගොචර තැනැත්තා හට පීඩාවක් කරන්නට ඉඩක් ලදද මෙවැනි පුද්ගලයන්ගේ ක්‍රොධය නොනිවෙයි. ජාත්‍යන්තරයෙහි දී පවා පලිගන්නට තරම් බද්ධවෛරයක් බවට පෙරළෙනුයේ මෙම පුද්ගලයාගේ ක්‍රොධයය. මෙනෙම දරුණුවූ ද වහා පැතිරෙන්නාවූ ද විෂයෙන් යුත් සර්පයා වැන්න.

iv **පුද්ගලයා** ඉක්මනින් කිපෙන්නෙක් නොවේ. යම්විටක කිපිය ද එය කාලයක් මුලුල්ලෙහි වෛරබැඳගෙන නොපවත්වයි. ක්‍රොධාදීනව මෙනෙහි කරමින් ප්‍රමාදයෙකින් හෝ හටගත් ක්‍රොධය වහා නිවාගනී. මොහු තුළ පහළ වන ක්‍රොධයෙන් ඔහුට හෝ අනෙකකුට එතරම් හානියක් නොවේ. මෙනෙම දරුණු නොවන පැතිරෙන විෂයක් නැති සර්පයෙකු හා උපමාකළ හැකිය.

## චතුර්විධ විපරිතග්‍රාහි පුද්ගලයෝ

වණ්ණාවට නුසුදුස්සාගේ ගුණ කියන්නෙක. වණ්ණාවට සුදුස්සාගේ අගුණ කියන්නෙක. ප්‍රසාදය නොදක්විය යුතු කරුණෙහි පහදින්නෙක. පැහැදිය යුතු කරුණෙහි නොපහදින්නෙකැ යි පුද්ගලයෝ සතරදෙනෙක් ලොවැ වෙති.

i **පුද්ගලයා** තොරතුරු නොදත කරුණු සංසන්දනයෙන් විනිශ්චයකට නොපැමිණ නුවණ මෙහෙයවා විද්‍යමාන ගුණයන් සොයා නොබලා වණ්ණාවට නුසුදුසු අයගේ ගුණ වණ්නය කරයි. යම්කිසිවකුගේ ගුණයක් කියන්නහු ඔහු ගැන මනාකොට සොයා බලා ප්‍රත්‍යක්ෂ ශාස්ත්‍රවලින් ඔප්පුවූ ගුණයක් ම කිය යුතුය. හෙද ලොකයෙහි වැඩිදෙනා ගුණයක් වශයෙන් පිළිගන්නක් ම විය යුතුය. ගුණකථකයා තුළ තිබියයුතු යුතුකම් එසේවුව ද ඇතැම් කෙනෙකු ගුණ කියන්නට ඉදිරිපත් වනු යේ බොහෝ සෙයින් ප්‍රයෝජනයක් බලාපොරොත්තු වෙති. එබැවින් නුගුණයක් ගුණයක් සේ පවසන්නට පවා මැලි නොවෙති. මෙම පුද්ගලයාද වරදවා පිළිපන් පැවැතුම් ඇති තීර්ථකයන්ගේත් තීර්ථක ශ්‍රාවකයන්ගේත් ගුණවණ්නු යේ ඔහු සුප්‍රතිපන්නයහ. මනාපිළිවෙත්හි පිහිටියහයි ආරක්ෂිවිමාත්‍රයෙන් ගුණකියන්නට සුහුසුළුවෙයි. ඔහුගේ එම විපරීතග්‍රාහක ගුණ කථනයෙන් අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තීන්හිම සෙ දි සිටින්නවුනට අනුබලයකුත් නොදත් ජනයා මුළාබවට පැමිණවීමකුත් සිද්ධවනු ඇත. ඉන් වනුයේ දෙලොවින් පිරිහෙන මහදන ජීයෙකි. **සුනක්ඛත්ත භික්ෂුව මෙම පුද්ගල භෙදයට ඇතුළත් වන්නෙකි.**

ii **පුද්ගලයා** නොදන්මත් ගුණ පරීක්ෂාවක් නැති කමත් නිසා වණ්ණාහීයාගේ අවණ්නයම බෙණෙයි. සුප්‍රතිපන්න මනා පිළිවෙත්හි පිහිටා ගුණ දහම් රක්නා බුදුවරුන්ගේ ත් බුද්ධශ්‍රාවකයන්ගේ ත් අගුණ කියයි.

වරදවා ගත් පිළිවෙතක පිහිටියහ යි ගුණ සොයා බැලීමක් නොකොට අඥානයෙන් දෝෂාරෝපණය කෙරෙයි. **කොකාලික භික්ෂුව** අග්‍ර ශ්‍රාවකයන්ගේ නුගුණ දෙව්දත් තෙරුන් හා කියූයේ මෙම පුද්ගල ස්වභාවය ඔහු තුළ බලපෑ හෙයිනි.

iii **පුද්ගලයා** කරුණු නොදත පරීක්ෂාවකුදු නොකොට චිත්තප්‍රසාදය නොපහළ කරගත යුතු කරුණෙහි තත්ත්වාවබෝධයක් නොමැතිව පැහැදෙයි. මිථ්‍යාප්‍රතිපදාව යහපත් දෙයකැයි ගෙන මුළාවෙයි. බුදුරජාණන් වහන්සේ-ගෙන් දෙව්දත් තෙරුන් ඉල්වූ වර පස ගුණදහම් රක්නට ඉවහල් වන දෑ වුවද ශාසනික සියළු භික්ෂූන් විසින් එහි හැසිරිය යුතුයයි අණකිරීම නුසුදුසුවූ ද, ක්‍රියායෙහි නොයෙදිය හැක්කාවූ ද, එකකි. එතකුදු වුවත් ශ්‍රද්ධාධික නවක භික්ෂූන් පන්සියයක් දෙනා වහන්සේ දෙව්දත් තෙරුන් කෙරෙහි පැහැද ඔහුවෙත වසන්නට පැමිණියේ නුවණින් පිරික්සා බලා ප්‍රසාදය පහළ කරගන්නට අසමර්ථ වූ හෙයිනි.

iv **පුද්ගලයා** නුවණින් විමසා නොබැලීමෙන් සත්ප්‍රති-පදාව මිථ්‍යා ප්‍රතිපදාවෙකැයි ගෙන පැහැදිය යුත්තෙහි නොපැහැදෙයි. ප්‍රසාදය දැනවිය යුතු සම්‍යක් ප්‍රතිපදාව වරදවා වටහාගෙන එහි නොපැහැදෙමින් මිථ්‍යා පිළිවෙත් හි පැහැදෙයි. **කොලිත උපතිස්ස බ්‍රාහ්මණයන්** සත්පිළිවෙතෙහි පැහැද එයට ඇතුළත්වන කල්හි **සඤ්ජය පිරිවැජියා** නමැගත් මතයෙහිම පිහිටියේ ගතානු ගතිකව සත් ප්‍රතිපදාව දුෂ්ප්‍රතිපදාවක් සේ පිළිගත් හෙයිනි. මෙසේ මේ පුද්ගලයන් සිව්දෙනා කරුණු නිශ්චයකොට ගත නොහී නොවැතිය යුතු නො පැහැදිය යුතු දෑයෙහි ගුණ කථනයත් ප්‍රසාදයත් පහළ කරමින් වැනීම කළයුත්තෙහි හා පැහැදීම දැක්විය යුත්තෙහි අවර්ණනයත් අප්‍රසාදයත් ඇති කරමින් විපරීතග්‍රාහී වන්නාහ.

## චතුර්විධ සම්‍යක්ග්‍රාහී පුද්ගලයෝ

ගුණකීමට නුසුදුස්සාගේ අගුණ කියන්නෙක. ගුණ කීමට සුදුසු හැ නැත්තාගේ ගුණ කියන්නෙක. නොපැහැදිය යුත්තෙහි නොපහදින්නෙක. පැහැදිය යුත්තෙහි පහදින්නෙකැ යි යුක්ත්‍යනුකූල වැ මනා ගැනුම් ඇති පුද්ගලයෝ සිවුදෙනෙක් වෙති.

i **පුද්ගලයා** නපුරු මිථ්‍යා පිළිවෙත්හි පිහිටා ක්‍රියාකරන තීර්ථකයන්ගේ හා එම ශ්‍රාවකයන්ගේත් නුගුණ කියයි. ඔවුන් ජාත්‍යා දීසංසාර දුක්හිම් සත්‍වයා බැඳ තබන කිසිකලෙකත් සසරින් එතරවීමක් නොවන දුපිළිවෙත් හි යෙදී සිටින්නවුන් බව නුවණින් විනිශ්චයකොට දැනගනී. ඔවුන් තුළ සීලාදී ගුණයක් අවිද්‍යමාන බව පරීක්‍ෂාකොට බලා අවර්ණතාවට ම සුදුසු සේ දැන නුගුණ කියන්නට ඉදිරිපත්වේ.

ii **පුද්ගලයා** බුදුරජාණන් වහන්සේ හා උන්වහන්සේගේ ශ්‍රාවකයන් සම්‍යක් ප්‍රතිපදාවන්හි පිහිටා තුමූ පළමු වැ මැ සංසාර විමුක්තියට පැමිණ අනෙක් සත්‍වයන් ද එයට පමුණුවන සත් පිළිවෙතක යොදවන බව නුවණින් විමසා දැනගනී. සීල සමාධි ප්‍රඥාදී ගුණයන් උන්වහන්සේලා තුළ විද්‍යමාන හෙයින් වර්ණනාවට සුදුසු බව දැන ගුණ කථනය කෙරෙයි.

iii **පුද්ගලයා** අජවූත ගොවූතාදී මිථ්‍යා ප්‍රතිපදා නපුරු විපාක සලසන්නක් මුත් සංසාර විමුක්තිය සඳහා නොපවතින්නකැ යි කරුණු පරීක්‍ෂාවෙන් දැන නොපැහැදිය යුතු දුෂ්ප්‍රතිපදාවෙහි අප්‍රසාදය උපදවයි. නුවණින් සලකන විට කායචිත්ත පීඩාදායක ව්‍රතචර්‍ය්‍යාවකින් ශුද්ධියක් බලාපොරොත්තු නොවිය හැකි හෙයිනි.

iv **පුද්ගලයා** චිත්ත සන්තානගත ලෝභ ද්වේෂාදිය යටපත් කැරලමින් සිඳ බිඳ ලන යහපත් ප්‍රතිපදාව සැප විපාක සලසන්නක් බව ප්‍රත්‍යක්‍ෂලෙස නුවණින් දැන එහි පැහැදෙයි. ලෝභාදීනට ප්‍රතිපක්‍ෂ ප්‍රතිපදාවෙකින් ම

ඉෂ්ටාර්ථ සාධනය කටහැකි බව කරුණු සසඳා බලන්නෙකුට වැටහෙන්නකි. එබැවින් ප්‍රසාදමය කරුණෙහි පැහැද සම්‍යක්ග්‍රාහී තැනැත්තකුවීම අනුචිත නොවන බැව් සැලකිය යුතු ය. අවිද්‍යාන්ධකාරයෙන් වැසී පවත්නා ලෝවැස්සන් අතර සම්‍යක්ග්‍රාහී පුද්ගලයෝ විරලව පහළ වෙති.

## අන්‍යතර පුද්ගලයෝ සිවුදෙනෙක්

යමෙකු කෙරෙහි සත්‍ය වශයෙන් විද්‍යමාන අගුණය කියමින් එසේම පවතින ගුණය නොකියන්නෙක. ගුණය පවසමින් ඇත්තාවූ ම අගුණය නොකියන්නෙක. ගුණයත් අගුණයත් දෙකම කියන්නෙක. කිසිවකුගේ ගුණා'ගුණයන් ඒකාන්තයෙන් ම නොකියන්නෙකැයි අන්‍යතර පුද්ගලයෝ සතර දෙනෙක් වෙත්.

i **පුද්ගලයා** කිසිවකු තුළ පිහිටි ගුණය යටපත් කැරලමින් අගුණය ම පවසන්නෙකි. පෘථග්ජනයා ගුණ අගුණ දෙකින් මිශ්‍ර ජීවිතයක් ගෙනයන කෙනෙකැයි කියනු යුක්ති යුක්තය. විටෙක සද්ගුණයනුත්, සමහර කලෙක අසද්ගුණයනුත්, නිඛිව පෘථග්ජනත්වයෙහි ස්වභාව සිද්ධ ලක්ෂණයෙකි. කල්‍යාණමිත්‍ර ආශ්‍රයක් ලද කල්හි ගුණදහම් රැකීමට පෙළඹෙන අතර අසත්පුරුෂාශ්‍රයෙන් පාපකර්මයන් කිරීමට ඉදිරිපත් වීම ඔහුගේ ගතියකි. එබැවින් ගුණාගුණයන්ගෙන් යුක්තවීම පුදුමයක් නොවේ. ගුණදෝෂ විචාරණයට සුදුසු අවස්ථාවක් එළඹුනවිට සත්‍ය වශයෙන් ඇති ගුණය හෝ අගුණය පැවසීම කළ යුතුය. එහෙත් මෙතෙම නුගුණ කියනු මිස ගුණ කියයුතු තන්හි එයට ඉදිරිපත් නොවේ. අනෙකකු දෙස් කියනු අසන්නට ලදහොත් පෙමේද ඊට සම්බන්ධවීම් වශයෙන් තමා දන්නා අගුණය පවසයි. අවර්ණනයෙහිදී ඔහුගේ පිළිපැදීම මෙසේ වුවද වර්ණනයෙහිදී තුෂ්ණීම්භූත වෙයි. ඊර්ෂ්‍යාවත් ගුණමකු බවත් හේතුකොටගෙන මෙම ද්විවිධ ප්‍රතිපත්තිය මොහු-තුළ පවත්නේ යැ යි දතයුතුය.

ii **පුද්ගලයා** අන්‍යයෙකු තුළ දක්නා නියම ගුණය සුදුසුකාලයෙහි කියයි. එහෙත් විද්‍යමාන අගුණය ප්‍රකට ලෙස පැනෙන තමුදු පක්ෂග්‍රාහිත්වයෙන් කියන්නට උත්සුක නොවේ මෙතෙමේ ගුණදෝෂ විචාරණයට නුසුදුස්සෙකි. ගුණය මෙන්ම නුගුණයද කීම සාධාරණ අදහසින් කළයුත්තකි. ඡන්දාදියකින් අගතිගාමී වීම නිසා ගුණයම පවසනවිට ඔහුගේ දෝෂයන් යටපත් කිරීමක් වනබව නොසලකයි. ඉන් වනුයේ දෝෂයෙන් දූෂිත චරිත ඇත්තවුනට එහි නැවත නැවත යෙදෙන්නට අනුබල දීමෙකි.

iii **පුද්ගලයා** අනෙකකු තුළ පවත්නා ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නට ලැබෙන ගුණා'ගුණද්වයයම සුදුසු කාලයෙහි කියන්නෙකි. හෙද පවසනුයේ යොග්‍ය අවස්ථාව එළඹුන කල්හි පමණි. යම්කිසි ප්‍රශ්න විසර්ජනයකදී තොරතුරු දැනගැනීම සඳහා තමාගෙන් විචාළ දෙයක් නොකියයුතු බව පැනේනම් නො කියන්නටත්. කියයුතු බව පැනේ-නම් පැකිළීමක් නොමැතිව නොවළහා කියන්නටත් ඉදිරිපත්වේ. කියනුයේ ඇත්තක් වුවද අවස්ථාවට අනනුරූප වුව, අනර්ථදායක වියහැක. මොහුගෙන් ජන සමාජය මනා අන්දමින් සකස් වේ. ගුණවණ්නා රිසියවුන් ගුණදම් රක්නටත්, සවාපරාධ එළිපෙහෙළිවනු නුරුස්නවුන් ඉන් වැළකෙන්නටත්, යත්න දරන හෙයිනි.

vi **පුද්ගලයා** කිසිවකුගේ ගුණයක් හෝ අගුණයක් කියන්නට ඉදිරිපත් නොවේ. ඇති ගුණය පැවසීමත් නැති අගුණ නොපැවසීමත් හැමදෙනා විසින් අනුගමනය කළ යුතු යුතුකමක් වුවද මෙතෙම ගුණා'ගුණ දෙක්හිම මධ්‍යස්ථවැ වෙසෙයි. අනුන් ගැන සෙවීම පසෙක තබා තමා ගැනම සොයයි. ඇතැම් දෑ ගැන මෙසේ සිටීම උචිත වුවද, සැම තැනටම එය ගැළපෙනුයේ නොවේ. විශෙෂයෙන් ගුණ දොස් පවසන්නට සුදුසු තත්ත්වයෙහි සිටින්නවුනට මධ්‍යස්ථ ප්‍රතිපත්තිය නොහොබනේමය. "**වුද්ධා න තෙ යෙ න වදන්ති ධම්මං**" යම් සොහොත් ගුණදෝෂ විචාරීම් සඞ්ඛ්‍යාත ධර්මය නොපවසත් නම් ( ඔහු වෘද්ධවුවද )

වෘද්ධභාවයෙහිලා නොසැලකෙති" යන සදුක්තියෙන් ඒ බව සුව්‍යක්තය.

**උට්ඨානඵලූපජීවි නො පුඤ්ඤඵලූපජීවි, පුඤ්ඤඵලූපජීවි නො උට්ඨානඵලූපජීවි, උට්ඨානඵලූපජීවි ච පුඤ්ඤඵලූපජීවි ච, නෙව උට්ඨානඵලූපජීවි නො පුඤ්ඤඵලූපජීවි.-**

සුරනර බ්‍රහ්මාදීන් ජීවිතය පවත්වා ගන්නා ආකාරය වෙන් වෙන් වශයෙන් දක්වනු සඳහා මෙම පුද්ගල භේදය විභජිතය. ලොකයෙහි ඇතැම් කෙනෙක් උත්සාහයෙන් උපයාගත් දෙයකින් දිවි රැකගනිති. තවත් කෙනෙක් පින් බෙලෙන් පහළවන දෙයින් දිවි පවත්වති. සමහරු මෙම උභය ක්‍රමයෙන් ම ජීවිතය ගෙන යන නමුදු තවත් කෙනෙකුට ඒ එකකිනිදු දිවිපවත්වන්නට හැකිකමක් නැත.

i. **උට්ඨාන ඵලූපජීවි නො පුඤ්ඤඵලූපජීවි** පුණ්‍ය ශක්තියක් නැති උත්සාහයෙන් ම ජීවිතය රැකගන්නා කෙනෙකි. හෙතෙම දවස මුළුල්ලෙහි ගොවිතැන් වෙළ හෙළඳම් ආදි ජීවනොපාය මාර්‍ගයෙක උට්ඨාන වීර්‍ය්‍යයෙන් යෙදී යම්කිසිවක් උපයාගෙන ජීවිකාව කෙරෙයි. යම් දිනෙක රැකියාව නොකළහොත් එදින නිරාහාරව සිටින්නට ඔහුට සිදුවේ. කොතරම් වීර්‍ය්‍ය කළද පුරාකෘත පුණ්‍යබලයක් නැතිහෙයින් එදිනෙද ජීවිතය පවත්වා ගනු විනා වැඩිමනත් දෙයක් සම්භකර ගන්නට නොලැබේ. උත්සාහයේ තරමට සවල්ප වශයෙන් වුවද දියුණුවක් සැලසෙන්නට නම් පිනකුදු තිබිය යුතුය. පුණ්‍ය සම්පත්තියක් නොමැතිව ගන්නා මහන්සිය ආහාරපානමාත්‍රයකට ප්‍රමාණ වනු මිස සැපවත් ජීවිතයක් ගෙවන්නට ඉඩ සලසන්නේ නොවේ· යම් හෙයකින් සවල්පසම්පතක් මතු දියුණුව සඳහා නොකා නොබී හෝ ඉතිරිකරගත් නමුත් ලෙඩරොග සොර සතුරු කරදරාදියෙන් එය වැය වේ. මෙකල ලොකයෙහි වැඩිදෙනෙක් මෙම පුද්ගල සඞ්ඛ්‍යාවෙහි සඞ්ගෘහිත වෙති,

උපයන ධනයෙන් ජීවිකාවපවා නිසිලෙස කරගන්නට නොහැකිවූවන් ගෙන් ලොකය පිරී පවතී. ජීවිත කාර්‍යය සාර්ථක වන්නට උත්සාහය මෙන්ම පුණ්‍ය ඵලයත් තිබිය යුතුය. එබව නොදන්නා බොහෝදෙනා උත්සාහයේ ප්‍රතිඵල ලැබෙන විට කර්මය විශ්වාස නොකරන්නට තරම් සැහැසි වෙති. ඇතැම්විට ස්වල්ප යත්නයක මහත් ප්‍රතිඵල දක පුණ්‍යඵලයට අවඥ කරන්නටද ධර්මතත්ත්වය නොදන්නා කමින් ඉක්මන් වෙති. සමහරවිට ආගමානුකූල දැහැමි දිවිපෙවෙතක් ගෙන යන්නහුට වඩා පාපකාරිවූ ආගමික කටයුතුවලින් බැහැරවූ වසන්නහු සුකර සුහර සුඛිත ජීවිතයක් ගෙනයනු පෙනේ එය එක්තරා කුසල විපාකයක් භුක්තිවිඳීමකැ යි කිවහැකිය. දුස්තර ව්‍යායාමයක් නො කළද, ඔවුනට කෑම් පීම් ඇඳීම් පැලඳීම් වලින් අඩුවක් නැත. පෙර පිනක විපාකයත් ස්වල්ප වූද උත්සාහයත් සම්බන්ධවූවිට මෙබඳු ජීවිත යාත්‍රා ඇතිවීම ධර්ම ස්වභාවයක් මුත් පුදුමයට කරුණක් නො වේ. මෙවැනි ජීවිත දක්නා ධර්මචාරී ඇතැම්අය කුසල විපාකය කෙරෙහි සැක කරනු බොහෝවිට අසන්නට ලැබෙන කරුණකි. තමාගේ කර්මවිපාකයක රුකුලක් නොලත් උත්සාහයෙහි ඵල අඩුවියහැකි බවද, කුසල විපාකයක අනුග්‍රහයක් ලද උත්සාහයෙහි ඵල මහත්විය හැකි බවද සිතත් නම් මෙම දුර්මත දුරුවී යනු නියතය.

### ii. පුඤ්ඤඵලූපජීවී නො උට්ඨානඵලූපජීවී -

ජීවිතය පවත්වා ගැනීමට උත්සාහයෙන් කර්මාන්තාදිය කිරීමක් උවමනා නොකරන්නෙ කි. පෙර අත්බැව්හිදි කරන ලද දානශීලාදී පුණ්‍යකර්මයන්ගේ ඵල භුක්තිවිඳීම ඔහුගේ සිරිතය. ජීවිත වෘත්තිය සඳහා කෘෂිවණික් කර්මයකින් නිපයන දෙයක් ඔහුට අවශ්‍ය නො වේ. උත්පත්තිය ලබන ලද ආත්මභාවයෙහි යාපනය පිණිස ධන ධාන්‍යාදියකින් ප්‍රයොජනයක් නැති හෙයිනි. ආහාරපානාදියක් භුක්තිවිඳීමට රිසිය හට ගැනෙනු සමග ම පින් බෙලෙන් උවමනා දෑය

පහළවීම ධර්මනියාමය හෙයින් මෙතෙම හුදෙක් පුණ්‍යඵල-යෙන්ම දිවිගෙවන්නෙකැයි කියැවේ. පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ පටන් මතු මත්තෙහි ජීවත්වන බ්‍රහ්ම පාරිෂද්‍යාදී බ්‍රහ්මලොකොපගත වැ වසන සකල දිව්‍ය බ්‍රහ්මයෝ මෙම පුද්ගල සඞ්ඛ්‍යාවට වැටෙති.

iii **උට්ඨානඵලූපජීවි පුඤ්ඤඵලූපජීවි**:- උත්සාහයෙන් නිපදවා ගත් දෙයින් ද පින්බෙලෙන් පහළවන දෙයින් ද ජීවිකාව කෙරෙයි. මෙතෙම ඒ ඒ ආත්ම භාවයට යොග්‍ය සේ උත්සාහය හා මහන්සිය යොදවමින් ආජීවය පවත්වන විට පිනද යොමුවීමෙන් එතරම් කරදරයක් නොමැතිව දෙව්මිනිස් සැපත් අනුභව කෙරේ. අල්පමාත්‍ර ව්‍යායාමයකින් ම පොහොනා තරම් ධන ධාන්‍යාදිය උපයා ගැනීම මොහුට අසිරු කරුණක් නොවේ. පුණ්‍ය ඵලය විසින් මෙහෙයන ලද්ව ස්වල්ප වෙහෙසක් ගත් පමණකින් අදහස් මුදුන්පත්කරගන්නට ඉඩ සැලසේ. මෙලෙව්හි සුඛිත මුදිත ජීවිතයක් පවත්වනුයේ මොහු පමණි. මිනිස්ලොව පිනැති ක්ෂත්‍රිය බ්‍රාහ්මණ රාජරාජමහාමාත්‍යාදීහුත්, දෙව්ලොව භූමාටු දෙවියන්ගේ පටන් අනුක්‍රමයෙන් නිම්මාණරති දෙව්ලෝ වැසි දෙවියන් දක්වාත් ජීවත්වන සියලු දෙව් මිනිස්හු මෙම පුද්ගල භෙදයට අන්තර්ගත වෙත්. පරනිර්මිත වසවර්තිහු දෙව විශෙෂයක් ම වුවද අනුන් මවනදෙයින් ප්‍රයෝජන ගන්නවුන් හෙයින් පුඤ්ඤඵලූපජීවී සඞ්ඛ්‍යාවට යෙති. ඇතැම් අටුවාවෙක සියලුම දෙව්වරුන් පුඤ්ඤඵලූපජීවීන් ලෙස දක්වුණ ද වචනයේ පරිසමාප්තාර්ථය ගන්නාවිට එය ගැලපෙනි යි කිය නොහේ. වසවර්තීන් හැර අනෙක් දෙවියන් ජීවිත යාපනය සඳහා එක්තරා උත්සාහයක් ගත යුතු හෙයිනි.

iv **නෙවඋට්ඨාන ඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී**:- ජීවිත යාත්‍රාවට පින්ඵලයක් හෝ උත්සාහයෙන් උපයාගත් දෙයක් හෝ උවමනා නොකරන්නෙකි. නිරයෙහි පැසෙන නිරිසත්තු මේ කොටසට ගැනෙත්. ඔවුනට එම ජීවිතය

පවත්වන්නට පූර්වෝක්ත කිසිවකුත් උවමනා නොවේ. පාප කර්මානුරූප විපාක විඳින ජීවිතයක් ලැබ තිබෙන හෙයිනි. නරකයෙහි උත්සාහයෙන් ආජීවයක් උපදවන්නට නොහැකි වනු මෙන්ම පුණ්‍යඵලයෙකින් නිපයෙන ආජීවයකුත් නැත.

**අඞ්ගුත්තර නිකායයෙහි** මෙම සූත්‍රය ස්වල්ප වෙනසකින් යුක්තව දක්වේ. පුඤ්ඤඵලූපජීවී නාමය වෙනුවට **කම්මඵලූපජීවී සි** ගැනීම එහි ඇති එකම වෙනසය. පුග්ගලප්ඥප්තිය ලෙස එහි එසේ දෙශනා කර තිබෙන නමුදු කම්මඵල යනු පුඤ්ඤඵලයට ම අන්‍යතර අභිධානයෙකි. එබැවින් අදහස් විසින් අන්‍යථාත්වයක් නැත.

**තමො තම පරායණ, තමො ජොතිපරායණ, ජොති තම පරායණ, ජොති ජොති පරායණ:-**

අන්ධකාරය වැනි දීප්තියක් නැති පහත් ජීවිතයක් ලබා දුකසේ කල්ගෙවමින් යළිදු එබඳු ජීවිත ලාභයකට හෙතුවන දුශ්චරිත පරායණ ජීවිත වෘත්ති ඇතියේ තමො තම පරායණය. උත්පත්ති වශයෙන් ලොක සම්මත පහත් දිවියක් ලදුවද අකුසීත වැ සුචරිත සම්බන්ධී වැ වෙසෙමින් යහ දිවි වැටුම් ඇතියේ තමොජොති පරායණය. ලොකයා පිළිගත් උසස් කුලයක ජනිත වැ ධන ධාන්‍යාදියෙන් අඩුවකුදු නොමැති වැ වෙසෙන නමුදු දුසිරිත්හි ගැලෙමින් මතු අත්බැව දුඃඛිත අඳුරුවූවක් බවට පත්කැරලනුයේ ජොතිතමපරායණය. හිරණ්‍යසුවර්ණාදී ධනාඪ්‍ය උතුම් කුලයක උත්පත්තිය ලැබ පින්පැතින් බැබැලෙමින් ජීවිත යාත්‍රාව ගෙනයන අතර සුචරිත ක්‍රියාවන්ගේ මාර්ගයෙන් කුසල් දහම් රැස්කොට ගෙන ලබන අත්බැව ද ජොතිමත් බවට පෙරළා ගනුයේ ජොති ජොතිපරායණය.

i **තමො තම පරායණ** (අඳුරෙන් අඳුරට යන) පුද්ගලයා නිච යයි ලොක සම්මතවූ සැඬොල් කුලයක හෝ වැදි කුලයක හෝ සොම්මර කුලයක හෝ කසල ශොධක කුලයක හෝ ඉපදී සිටින අල්පාහාර භොජන ඇති දුක් පැවැතුම් සහිත දිළින්දෙකි. එපමණකුත් නොව දැවුණු කාණුවක් වැනි පංශු පිශාචක ස්වරූප ඇත්තේ වැදූ මවට පවා අප්‍රියජනක දකුම් ඇත්තේ මිටිවූයේ බොහෝ ආබාධයන් ගෙන් සම්බාධ වූ සිරුරු ඇතියේ වෙයි. තවද කාණෙක් හෝ අන්ධයෙක් වෙයි. වක්වූ අත්පා ඇඟිලි ඇති කොර කුදු පිළු ලක්ෂණයන්ගෙන් යුත් ශරීරාවයව ඇත්තෙක් හෝ වෙයි. ආහාරපාන වස්ත්‍ර යාන වාහන මල්ගඳ විලවුන් ශයනාසනාගාර පදීපූපකරණ නොලබන්තෙක් වෙයි. මෙබඳු ජීවිතයක් ලබා තිබෙන හෙතෙම උපහම විපතක් කොට ගෙන පහළ වී ජීවිතයේ පැවැත්ම පිළිබඳ විපත්ති, ආජීවය පිළිබඳ විපත්ති, උපභොග පරිභොග පිළිබඳ විපත්ති, ආදියෙන් යුක්තව සිටිමින් කාවිසි මනසින් දුසිරිත් හි හැසිර මරණින් මතු නරකයෙහි උපදී. මෙතෙමේ දුකින් බරවූ අඳුරු ජීවිතයක් ලද හෙයින් තම නම්ද, දුශ්චරිතයන් කොට මරණින් මත්තෙහි නරකයම ආශ්‍රය ස්ථානයකොට ඇති හෙයින් තම පරායණ නම් ද වෙයි.

තවද ඇතැම් පුද්ගලයෙක් මව්කුස පිළිසිඳ ගෙන මිනිස් ලොව ආලොකයක් නොදක කුසතුළෙහිම මියගොස් අපායෙහි ඉපද කල්පය මුළුල්ලෙහිම එහි හැසිරෙයි. ඔහුගේ එම ජීවිත කාලය අන්ධකාරයෙහිම ගතවන්නක් හෙයින් හෙතෙමේද තමො තමපරායණ සඞ්ඛ්‍යාවට වැටේ. මෙසේ ආලොකයක් නොදක අඳුරෙහිම වසන්නට සිදුවනුයේ කුශක කම්හි විපාකයෙනැයි දෙශනායෙහි සඳහනි. මෙකල ජන සමාජය තමොතම පරායණ පුද්ගලයන්ගෙන් ගහන වැ පවතිනු දක්ක හැකිය. ජීවිතය පවත්වා ගැනීමේ දුෂ්කරතා අධිකවන තරමට දුශ්චරිතයන්හි හැසිරීම බහුලවන බව

පෙනේ. සමාජ පරිසරය දුශ්චරිතයට අනුබල දෙන්නක් වීමත් දුසිරිත් මගින් දිවි පැවැත්වීමේ පහසුකම් බහුලවීමත්, මෙසේවීමට හේතු වී තිබේ.

ii **තමො ජෝතිපරායණ** (අන්ධකාරයෙන් ආලෝකයට යන) පුද්ගලයා පූර්වෝක්ත තමන්ධය ලක්ෂණකොට ඇති තැනැත්තහු මෙන් ආගමන විපත්ති ආජීවූපාය විපත්ති අත්තභාව විපත්ති ආදී උවදුරුවලින් ගහන දුඃඛ ජීවිතයක් ගතකරන්නෙකි. එහෙත් දන සීලාදී කුසල් දහම් කොට මරණින් මත්තෙහි දෙව්ලොව දෙවියෙක් වී ආලෝකවත් ජීවිතයක් ලැබ ගනී. මිනිස් ලෙව්හි ඉතාම පහත් දුඃඛදායක ජීවිතයක සිට කාමලෝකයෙහි ලදහැකි උසස් ජීවිතයක් අත්පත් කරගත් හෙයින් මෙතෙමේ අන්ධකාරයෙන් ආලෝකයට යන්නෙකැයි කියැවේ. ජීවිතය නීරසවන කම්කටොළුවලින් පසුබට නොවී අනල්පෝත්සාහයෙන් ජීවිතයද රැකගන්නා අතර අප්‍රමාදව කුසල්කිරීම මොහුගේ ස්වභාවයයි, එළඹෙන දුක් ගැහැට වලින් කම්පා නොවී කම්පල සැලකීමෙන් මෙලොවද සැනසීම ලබාගෙන කර්මානුරූපව පැමිණෙන පීඩාව හෝ බාධාව සිනාමුසු මුහුණින් ඉවසා වඩ වඩා සත්ක්‍රියාවන්හි නිරතවැ දුක් ජීවිතයක් ලද පමණින් බැගෑබවට නොපැමිණි දෙවන ආත්මය සැපවත් කරගන්නේය

(iii) **ජෝති තමපරායණ** (ආලෝකයෙන් අඳුරට යන) පුද්ගලයා මිනිසුන් අතර උසස්සේ සම්මත ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාර කුලයක ජනිත වූ උපභෝග පරිභෝග වස්තූන්ගෙන් අනූන බොහෝ සම්පත් ඇත්තෙකි. එසේම එයට සරිලන දුටුවන් මනනුවන් පිනවන දැකුම්කලු රූපශ්‍රීයෙන් සමන්විතය. ආහාරපාන වස්ත්‍ර යානවාහන මල්ගඳ විලවුන් ශයනාසන පහන් උපකරණාදිය ලාභියෙක්ද වෙයි. ඔහුට ජීවිතයකට උවමනා සියලු දෑයින් අඩුවක් නැතද, කම් කම්ඵල සැලකීමේ ඌනතාවය නො අඩුව ඇත. එහෙයින් කායාදි

දිවාරාත්‍රයෙන් දුශ්චරිතයෙහි හැසිරී මරණින් මතු නරකයෙහි උපදනෝය. රූප ධනාදියෙන් මත්ව මොහයෙන් මුළා බවට පැමිණ පරලොවක් නැතිසේ සිතමින් පව්කම් කරන්නෝ මේකල්හිදු බහුලව දක්නට ලැබෙත්. ඔහු ජොතිමත් උත්පත්තියක් ලැබ මෙලොව ඉසුරුමත් ජීවිතයක් ගත කළ ද මරණින් මත්තෙහි නරකාන්ධකාරයට එළඹෙතැයි නොදනිත්

(iv) **ජොති ජොතිපරායණ** (ආලොකයෙන් ආලොයට යන) පුද්ගලයා පූර්වොක්ත ජොතිමත් තැනැත්තහු මෙන් ආගමන සම්පත්ති ආජීවූපාය සම්පත්ති අත්තභාව සම්පත්ති ආදී සුඛිත ජීවිතයකට උවමනා සියල්ලෙන් පරිපූර්ණ වැ උපන්නෙකි. හෙතෙමේ ආලොකය බඳු ප්‍රසිද්ධ ජීවිතයක් ගෙනයමින් ත්‍රිවිධ සුචරිතයන්හිද හැසිරෙයි. ලද ජීවිතයටද වඩා ප්‍රණීත සම්පත් භුක්ති විඳිය හැකි උත්පත්තියක් ලබන්නට පොහොනා දානසීලාදී කුසල ක්‍රියාවන් ධන මදදියෙන් අමත්ත වැ අප්පමත්ත වැ සම්පාදනය කරයි. මෙලොව හැමදෙනාහට නයන රසාඤ්ජනයක් වැ දීප්තිමත් වාසනාවන්ත භව සම්පත්තියක් අනුභව කොට මරණින් මතු චාතුර්මහාරාජිකාදි සදෙව්ලෝහි අනුලොම ප්‍රතිලොම වශයෙන් දිවසැපත් වළඳයි. කුලීනත්වය ධනසම්පත්තිය හා රූප සම්පත්තියත් එක්කෙනෙකු තුළ පිහිටනුයේ කලාතුරකිනි. යම් හෙයකින් එම ත්‍රිවිධ ශක්තීන්ගේ සමායොගයක් දක්නට ලැබුණද, සුචරිතය හා අනලස් වැ කැරෙන කුසල සම්පාදනයත් එබන්දෙකු තුළ දැකීම අතිශයින්ම දුර්ලභය. යථොක්ත සම්පත්තීන්ගෙන් එකකුදු ඇතිකල්හි පෘථග්ජන චිත්තසන්තානය බෙහෙවින් නැඹුරු වනුයේ අකුසලයට ම හෙයිනි. එබැවින් මෙතෙම විරල වැ දක්නට ලැබෙන්නෙකි.

## ඔනතොනත, ඔනතුන්නත, උන්නතොනත, උන්නතුන්නතඃ-

මේ අත්බැව්හි නීච උපතක් ලබා පව්කම් කොට මතු අත්බැව්හිද නීචවූ මැ උපදිනුයේ ඔනතොනතය. මේ අත් බැව් නීච වුවද කුසල්දම් කිරීමෙන් උසස් ලෙස කුල ධන රූප සමෘධ වැ උපත ලබනුයේ ඔනතුන්නතය. මේ උපන් අත්බැව් කුල ධනාදීන් ආඪ්‍යවැ උසස් වුවද පව්කම් කැරැ ලබන ආත්මභාවය නරකාදී නීචස්ථානයක උපත වනුයේ උන්නතොනතය. මෙලෙව්හි හා පරලෙව්හිත් සජි සම්පූණි උපතක් ලැබගෙන උසස් සම්පත් අනුභව කරනුයේ උන්නතුන්නතය. මෙම පුද්ගලයන් සතරදෙනා නාමාරොපණයන් අන්‍යතරයන් ලෙස දක්වුණි ද, ලක්‍ෂණ විභාග විසින් තමො-තමපරායණාදීන් හා වෙනසක් නැත. විනෙය ජනානු-ග්‍රහය සඳහා ස්ථානොචිත පරිද්දෙන් දෙසනා විලාසය නානා ස්වරූප නිරූපණයෙහි සමත් බැවින් මෙසේ දෙශිතය.

### චතුර්විධ රුක්‍ඛූපම පුද්ගලයෝ.

වෘක්‍ෂයනට උපමා කළහැකි පැවැතුම් වලින් යුත් පුද්-ගලයෝ රුක්ඛූපම නම්හ. ලොකයෙහි හර ඇතිරුක් මෙන් ම නැති රුක්ද ඇති. එසේ මැ හර ඇතිවැ නැතියවුන් පිරිවර කොටද හර රහිත වැ ඇතියවුන් පරිවර කොට ද පවත්නා වෘක්‍ෂයෝ ඇත්තාහ. මෙම රුක් වැන්නැයි කිව හැකි පුද්ගලයෝ සිවුදෙනෙක් ලොව විද්‍යමානවෙති.

i පුද්ගලයා ඵෙග්ගුසාරපරිවාර නම්වේ. වැඩක් සඳහා ගතහැකි හරයක් නැති නමුත් සාරහර ඇති වෘක්‍ෂයන් පිරි-වරන ලද වනස්පතී වෘක්‍ෂයෝ වනයෙහි වෙති. කිහිරි ආදී වෘක්‍ෂයන් මැද පිහිටි හෙයින් හර ඇති වෘක්‍ෂයෙකැ යි දකින්නන් මුළාකරන්නට අවට පරිසරයේ උදව්වෙන් මෙම වෘක්‍ෂයට හැකිය. එමෙන් මෙම පුද්ගලයා සීලාදී ගුණධම් නමැති හරයක් නැති පාපියෙකි. ත්‍රිවිධ දුශචරිත පුරමින්

නිස්සාර ජීවිතයක් ගෙනයන දුශ්ශීලයෙකි. එහෙත් ඔහු ඇසුරු කරනුයේ කල්‍යාණ ධර්‍ම සමන්විත සිල්වත් පිරිසකි. හර ඇති වෘක්‍ෂයන් මධ්‍යයෙහි හරනැති වෘක්‍ෂය බැබලෙනු මෙන් මෙතෙමේද පරිවාර ජනයාගේ මුවාවෙන් සම්මාන ලබයි. ඇතැම්විට සීලවන්තයෙකැයි ලොකයා විසින් පිළිගැනෙනු විය හැකිය. මොහුගේ ආශ්‍රයෙන් පිරිසෙහි ගුණ වගාවක් හෝ දියුණුවක් සැලසෙන්නට ඉඩෙක් නැත.

ii **පුද්ගලයා** සාර ඵෙග්ගු පරිවාර නම්. මොහු ශීලාදි ගුණධර්‍මයන් රකිමින් කල්‍යාණ ස්වභාවයෙන් යුක්තව හරබරවැ වෙසෙතුදු පිරිවරාගෙන සිටින්නෝ දුශ්ශීල භාවයෙන් අසාරවූ පුද්ගලයෝය. එසේහෙයින් නිස්සාර වෘක්‍ෂයන් විසින් පිරිවැරූ හර සහිත ඛදිරාදී වෘක්‍ෂයකට සමානය. ආශ්‍රිතයන්ගේ නිශ්ශීලත්වය නිසා මොහුගේ සුරක්‍ෂිත ශීලය වැඩෙන්නට වඩා මැඩෙන්නට ඉඩ ඇත. ලොකයාගේ සැකයටද ඔහුගේ සීලය ගොදුරු වියහැක. පරිවාර සම්පත්තිය අනුව යමෙකුගේ තත්ත්වය මැන ගැනීම ලොක ස්වභාවය හෙයිනි.

iii **පුද්ගලයා** ඵෙග්ගු ඵෙග්ගුපරිවාර නම්· මෙතෙම දුශ්ශීලය. පාපී ස්වභාවයෙන් යුක්තය. ඇසුරු කරන පරිවාර ජනයාද තමා බඳුම පැවැතුම් ඇති පිරිසෙකි. වටා පිටාවෙහි හර රහිත ගස් ඇති එවැනීම ගසක් මෙන් මෙම නැතැත්තා තමාගේ ගති ගුණ අනුව ක්‍රියා කරන පිරිසක් ඇසුරු කරන්නෙකි. ගස් සොයන්නෙකු නිස්සාර වූ වැඩකට යොදගත නොහැකි වනයක් දැක දුරින්ම දුරුකරනු මෙන් කායාදි දුශ්චරිතයන්හි ගැලී වසන මෙතෙම පිරිවර සමගම, සත්පුරුෂයන් විසින් ඇසුරු කිරීම් වශයෙන් නොළංවැ දුරින් දුරු කර හැර දමනු ලැබේ.

iv **පුද්ගලයා** සාර සාරපරිවාර නම්. තෙමේ ශීලාදි සාරධර්මයන්ගෙන් හොබනා ගුණ ජීවිතයක් ගෙන යමින් තමාබඳු පැවැතුම් ඇති පිරිසකුද්‍ පිරිවරකොට ඇතියේ මෙතමින් සැලකේ. හරය සහිත ගස් සමූහයක් මධ්‍යයෙහි පවත්නා අරටුවෙන් යුක්තවූ ගසක් මෙනි. හරයෙන් ශක්ති මත්වූ ගස් වටා ඇතිහෙයින් වනසතුන්ගෙන් හෝ වාත කම්පනයකින් හෝ පීඩාවකට නොපැමිණ සුවසේ වැඩෙන්නට මෙම වෘක්ෂයට හැකිවනු මෙන් ගුණ ගරුකයන් පිරිවරකොට ඇති මෙතෙම අබ්‍යන්තර බාහිර වශයෙන් එළඹෙන ගුණනාශක උපද්‍රවයන්ගෙන් සීලවිපත්තියකට නොපැමිණෙන සීලසමාධි ප්‍රඥසාරයෙන් හරිත උසස් ජීවිතයක් ඇති තැනැත්තෙකි.

උපධිසම්පන්නා

**රූපප්පසන්න, ඝොසප්පසන්න, ලූඛප්පසන්න, ධම්මප්පසන්න :-**

රූපය කිතීතිය රූක්ෂ ප්‍රතිපදාව ධර්මය යන මේවා ප්‍රමාණ කොට ගෙන පැහැදෙන පුද්ගලයෝ සිවුදෙනෙක් ලොකයෙහි විද්‍යමාන වෙති.

i **රූපප්ප සන්න** කිසිවෙකුගේ රූපසම්පත්තිය දැක ප්‍රසාදය පහළ කැරැ ගැන්මට එයම ප්‍රමාණභාවයෙන් සලකයි. රූපසම්පන්න ශරීරයාගේ උස්බව ඉතා කෘෂ හෝ ඉතා ස්ථූල නොවූ සමප්‍රමාණය, අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගේ යථොචිත සේ හැඩ ගැසුණු දිගකොට වට මටා දී පිහිටීම්, අඞ්ග ලක්‍ෂණයන්ගේ පිරිපුන් බව, යන මෙතෙක් දැ සවානිප්‍රාය පරිදි පිහිටා තිබෙනු දැක එයම පැහැදීමට කාරුණුකොට ගනියි. ඔහු තුළ කායික දුශ්චරිතාදී වරදක් තිබුණද, රූප ගරුකයාගේ පැහැදීමට එය බාධාවක් නොවේ. හොඳ නොහොඳ බව මැනගන්නා තුලාව සේ ප්‍රමාණභාවයෙන් ගෙන සලකනුයේ රූපසෞන්දර්‍යයී මාත්‍රයම හෙයිනි. ලොව වසන සියලු සත්ත්වයන් කොටස් තුනකට බෙදා වෙන්කළ හොත් ඉන් දෙකොටසක් ම රූප ප්‍රමාණිකයෝය. රූපගරුකයන්ගේ බහුල භාවය කොතරම් දැයි එයින් සිතාගත හැකිය.

ලොව 2/3 රූපප්පසන්නයෝය.

ii **ඝොසප්පසන්න** අනෙකකුගේ විද්‍යුධනාදිය පිළිබඳ කීර්තිඝොෂය අසා එය ප්‍රමාණ කොට ගෙන ඔහු කෙරෙහි පහදියි. ගුණ වර්ණනාවක් හෝ ගුණ වර්ණනාත්මක ව නිබද්ධ ස්තුති ගීතිකා හෝ ප්‍රශංසාවක් කරනු ඇසීම හෝ පරම්පරා වශයෙන් කටින්කට පවතින වර්ණනාවක් හෝ මොහුට ප්‍රමාණය. වර්ණිතයා ප්‍රසාදය දක්වීමට යොග්‍යදැයි සෙවීමක් නො කොට මැ ගුණසූචන ශ්‍රවණයෙන් ම ප්‍රසන්න වැ ඇසුරු කිරීම් ආදියට එළැඹෙයි. ඔහු පරප්‍රශංසා ලබන්නට අභිරුචියක් ඇත්තකු වීම ගුණ ඝොසයම පැහැදිය යුතු ප්‍රමාණයක් සේ සලකන්නට හෙතුවය. ලොව සත්‍වයන් පස් කොටසක් වැ බෙදුහලහොත් ඝොසය පැහැදීමට ප්‍රමාණකොට නොම ගනුයේ එක් කොටසක් පමණි. අනෙක් සිවු කොටසම ඝොසරුචිකයෝ වෙති. 4/5

iii **ලූඛප්පසන්න** අනෙකකුගේ කාටුක රූක්ෂපැවැත්ම පැහැදීමට කාරණක්කොට සලකයි. භික්ෂුවක් ගැන සලකත් හොත් ඔහුගේ සිවුරු පිරිකර ආදියෙහි දුර්වර්ණභාවය වද, පාත්‍රාදියෙහි වර්ණසණ්ඨානය පිළිබඳ රූක්ෂ බවටද, සෙනසුන්හි වාම් බවට ද පැහැදෙයි. ගෘහස්ථයෙකු වුව ඔහුගේ සියලු ඉරියවු පැවැතුම්හි නිරහඞ්කාර බව, ඇඳීම් පැළඳීම් ආදියෙහි සැහැල්ලු බව නො අගනා පරිභොගොපකරණ පරිහරණය, විද්‍යුරූප ධනාදියෙන් උඩඟුනොව විසීම ආදිය සලකා ප්‍රසාදය එළවාගනී. තවද නිගණ්ඨාදීන්ගේ අචෙලකත්වයෙහි හා සිරුර තවන නොයෙක් තපොවෘත්තීන්හිද මනා පිළිවෙතකැයි ගෙන ප්‍රසන්න බවට පැමිණ ඔවුන් අනුගමනය කරන්නෝ බෙහෙවින් රූක්ෂ ප්‍රතිපදගරුකයෝය. ලොභාධික හැඟීම් බහුලකොට ඇති ; අය තමාගේ චිත්තාචාරය අනුව හැසිරෙන අන්‍යයන් දැක ඔවුන්ගේ රූක්ෂ ප්‍රතිපත්තියට පැහැදෙති. ලොකයෙහි ජනගහනයෙන් දහයෙන් නවදෙනෙක් ලූඛප්පසන්නයහ. අලඞ්කාර භාණ්ඩාදිය පරිහරණයෙහි පහදින අය දහයෙන් එක්කොටසක් පමණි. 9/10

iv **ධම්මප්පසන්න** අත්‍යයන්ගේ සීල සමාධි ප්‍රඥාවන් අතුරෙන් එකක් තිමිතිකොට පැහැදෙන්නෙකි. ලොව වෙසෙන්නවුන්ගෙන් ලක්‍ෂයෙන් කොටසක් පමණ ධර්‍මයට රුචිකරන බව පෙනේ. ධර්‍ම ගරුක ගුණයට රුචිකරන පුද්ගලයන්ගේ දුර්ලභභාවය ක්ලේශවසඟ කාමලොකයෙහි සවභාව සිද්ධියක් වුවද, මෙය අනුකම්පා සහගතව සලකා බැලිය යුත්තකි.

තවද මෙම සිවුදෙනා අතුරෙන් රූපප්පසන්න ඝොසප්පසන්න පුද්ගලයෝ පැහැදීමට ලක්‍ෂවූවහු පිළිබඳ සාධව'-සාධුතා කිසිවක් නොදැන ඡන්දරාගය මුල්කොට ගෙන පැහැදෙත්. ඡන්දරාගයෙන් හාත්පසින් වැසුණු තැනැත්තේ යමෙකුගේ අධ්‍යාතම ගුණය නොදැනැ බාහිර ප්‍රතිපත්තියකුදු නොදැක මුළාවීමෙන් කිතීතියෙන් ප්‍රමාණකෙරේ. අධ්‍යාත්ම ගුණය නොදත් තමුදු බාහිර ප්‍රතිපත්තිය දැක අනුන් කරන සත්කාර ඵල මාත්‍රයෙනුදු ඝොස ප්‍රමාණය කරන්නට යුහුසුළු වේ. අද්ධ්‍යාත්ම බාහිර දෙක්හි පවත්නා ගුණය විවෘතව දක්නා සුළු තැනැත්තේ ඝොසය ප්‍රමාණයක් කොට නොගනී. එහෙයින් වදරන ලදි.

**"යෙච රූපෙන පාමිංසු – යෙච ඝොසෙන අන්වගූ**
**ඡන්දරාග වසූපෙතා – න තෙ ජානන්ති තං ජනං,**

**අජ්ඣත්තං ච න ජානාති – බහිද්ධා ච න පස්සති**
**සමන්තාවරණො බාලො – ස වෙ ඝොසෙන වුය්හති,**

**අජ්ඣත්තඤ්ච න ජානාති – බහිද්ධා ච විපස්සති**
**බහිද්ධා ඵල දස්සාවී – සොපි ඝොසෙන වුය්හති.**

**අජ්ඣත්තඤ්ච පජානාති – බහිද්ධා ච විපස්සති**
**විනීවරණ දස්සාවී – න සො ඝොසෙන වුය්හති'ති"**

මිනිසුන්ගේ ප්‍රසාදයට භාජනවත්තවුන්ගෙන් බුදුරජාණන් වහන්සේම අග්‍රගණ්‍යය. උන්වහන්සේ කෙරෙහි නොපහදින්නෙක් නැතිනරම්. බුද්ධශරීරයට වඩා ප්‍රසාදවහ රූපකුදු, බුදුගුණ ගායනයට වඩා උසස් ගුණ කිතීනය කුදු, ලොව

අවිද්‍යමානය. කසීසළු. මහඇඟි රත්බදුන්, තුන්සෘතුවට සුදුසු සේ කැරුණු ප්‍රාසාද යනාදිය හැරපියා බුදුවී පංශුකූල චීවර, සෙලමය පාත්‍ර, රුක්ඛමූල සෙනාසනාදිය පරිහරණය කරන උන්වහන්සේගේ රූක්ෂ ප්‍රතිපදාවට වඩා එහි පිහිටි කෙනෙක්ද නැති. දෙව් මිනිස්නට අසාධාරණ වූ සීලාදි ගුණදහම්හි පිහිටි බුදුරදුන්ගේ සීලසමාධි ප්‍රඥාවනට උත්තරිතර ප්‍රසාදාවහ ගුණධර්මයෙකුදු නැත්මය. එබැවින් සර්වඥයන් වහන්සේ මෙම සිව්‍ ප්‍රමාණය මිම්ම වශයෙන් ගෙන ප්‍රසාදයට එළඹෙන ලොක සන්නිවාසය මිටින්ගෙන මෙන් තම වෙත නතුකැරගෙන වැඩවෙසෙන සේක.

**අත්ත හිත පටිපන්න නො පරහිත පටිපන්න, පරහිත පටිපන්න නො අත්තහිත පටිපන්න, අත්ත හිතපටිපන්න පරහිත පටිපන්න, නෙව අත්ත හිත පටිපන්න නො පරහිත පටිපන්න:-**

i **අත්තහිත පටිපන්න නො පරහිත පටිපන්න:-** තමහට වැඩ පිණිස මුත් පරහට වැඩ පිණිස නො පිළිපන් පැවැතුම් ඇතියේ මෙනම් වේ. මෙහෙම මෙ සසුන්හි දක්‍ෂ වෙන සීල සමාධි ප්‍රඥාවන්හි හික්මී අභීත්ඵල විමුක්තියත් විමුක්තිඥාන දර්ශන නම්වූ එකුන් විසි පස්විනුම් නැණන් ප්‍රත්‍යක්ෂකොට ගෙන වෙසෙයි. ලෞකික ලොකොත්තර සියලු ගුණයන් පූරණය කෙරෙයි. එහෙත් ඒ සඳහා අනුන් නො මෙහෙයයි. අත්බැව සපල කැරුම් පිණිස සීලාදිය රැක්ක යුතු යයි අනුශාසනා මාත්‍රයකුදු කාරුණ්‍යපරවශ දයාපන්න සිතින් නොම කෙරෙයි. තමාගේ යහපත ම විනා අන්කෙනෙකුගේ දියුණුවක් ගැන සොයා නොබලයි. එහෙයින්ම ඔහුගෙන් ලොවට වන වැඩෙකුදු නැති. **වක්කලි සථවිරයන් වහන්සේ** අත්තහිත පටිපන්න පුද්ගලයෙකි. මෙකල ජනසමාජයෙහිදු මෙබඳු අය බහුලය. වචනයෙකිනුත් අන්‍යයන්ගේ යහපතට වැඩකිරීම බොහෝදෙනාගේ සිරිත නොවේ.

පර වැඩ නුරුස්නා ඊර්ෂ්‍යායෙන් පෙළෙන දනන් අතර අත්-වැඩ මුත් පරවැඩක් කොයින්ද?

ii **පරහිත පටිපන්න නො අත්තහිත පටිපන්න**.- අන්‍යයන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කරන නමුදු තම යහපත ගැන නොසලකන තැනැත්තෙකි. තෙමේ සීල සමාධි ප්‍රඥ පූරණයට ස්වල්ප මාත්‍ර උත්සාහයකුත් නොකොට අන්‍යයන් ඒ පිණිස උනන්දු කරවමින් යොදවයි. **උපනන්ද ශාක්‍යපුත්‍රයෝ** මෙම පුද්ගල සඞ්ඛ්‍යාවෙහි ගැනෙත්. අන්‍ය-යනට සීලාදි ගුණදහම් රක්නට අනුශාසනා කරන්නා පළමු ව තෙමේ එහි පිහිටිය යුතුය, තමා නොරක්නා එසේමැ ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දෙක් ගැන අන්හට කියනුයේ ලොකා-යාගේ නින්දාවට භාජන වේ. විශෙෂයෙන් සීලාදී ගුණධර්මයන් පිළිබඳ අනුශාසනා කරන්නා එහි පිහිටීමෙන්ම මෙරමා සමා-දන් කරවීමට ඉදිරිපත්විය යුතුය. නොඑසේවනුයේ අනුශා-සකත්වයට නුසුදුස්සේය.

"අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථ'ඤ්ඤ මනුසාසෙය්‍ය නකිලිස්සෙය්‍ය පණ්ඩිතො"

යනබුදුවදනින් ඒබව මනාවැ ඔප්පුවේ. තවද ඇතැම්කෙනෙක් තමන්ගේ යහපත නොතකා පරනට වැඩ කරන්නට ඉදිරිපත්වෙති. හෙද යහපත් පැවැත්මක් වුවද ආත්මාර්ථ සාධනයක් නැතිවැ නිශ්ශරණාද්ධ්‍යාශයෙන් පරාර්ථ-සෙවයක යෙදීම සුදුෂ්කරය. පරවැඩ නිසිලෙස කරන්නට නම් අත්වැඩද සැහෙන ප්‍රමාණයකට සම්පූර්ණ විය යුතුය. ආත්මාර්ථ සාධක නො වන පරාර්ථයක් නැතැයි කියැවෙන සිද්ධාන්තයද සිහිපත් කරනු වටී.

iii **අත්තහිත පටිපන්න පරහිත පටිපන්න**:- ආත්මාර්ථ පරාර්ථ සඞ්ඛ්‍යාත උභයාර්ථය ම සිදුකරන්නෙකි. සීල සමාධි ප්‍රඥාවන් ලෞකික ලෝකෝත්තර වශයෙන් වඩා අදහස් මුදුන් පත්කරගත් මෙතෙම එහි වටිනාකම අන්‍යයනටද නොයෙක් අයුරින් පසක් කරමින් ඔවුනුදු එහි යොදවයි. මොහුගෙන් ලොකයට සිදුවන මෙහෙය මෙතෙකැයි ප්‍රමාණකළ නොහේ. මිනිස් ජීවිතය කම්කටුළුවලින් ගහනවූවක් වුවද මද සැනසීමක් අත්වනුයේ මෙම යහගුණයෙන් හෙබි සත්පුරුෂයන් තැතින් ගැනවත් සිටින හෙයිනි. ආත්මාර්ථය මුදුන්පත් කරගත් කල්හි පරාර්ථය සඳහා කාලයත් ධනයත් අනෙක් බලහලත් යොදවන උතුමෝ පෘථග්ජන යන් අතර මේ පුද්ගල භෙදයෙහි සඞ්ග්‍රහ වෙත්. සාසනයෙහි **සැරියුත් මුගලන් දෙ අග සව්වන් වහන්සේ** ආත්මාර්ථ පරාර්ථ දෙක්හි යෙදුනවුන් ගෙන් අග්‍රවෙති. උන්වහන්සේලාගේ උපදෙශයෙන් හා ආදර්ශයෙන් ලොව්ලොවුතුරා සැපත් සාධා ගත්තාහු අප්‍රමාණයහ.

iv **නෙව අත්තහිත පටිපන්න නො පරහිත පටිපන්න**:- අත්වැඩ පරවැඩ දෙකම නොකරන්නෙකි. සීලාදී ගුණදහම් රැකීමක් නොකරන මේපුද්ගලයා අන්‍යයන්ද එහි නොයොදවයි තෙමේ නොරක්නා යහ ගුණයන්හි අනුන් යොදවන්නා එක්තරා සත්පුරුෂ ගුණයක් රක්නෙකැයි සිතිය හැකිවුවද, මොහුගෙන් එපමණකුදු වැඩක් නොසිදුවේ. තමාගේ ජන්ම ලාභ යෙන් ප්‍රයෝජන නොගන්නා මෙතෙමේ අන්‍යයනට සාරදරයක් වනු මෙන්ම නරක ආදර්ශයක් දෙමින් ලොක සන්නිවාසය අධික දුඃඛිත ස්ථානයක් බවට පත්කෙරෙයි. **දෙව දත්ත ස්ථවිරයන් වහන්සේ** මේ පුද්ගල කොටසට ඇතුළත් වන්නෙකි. තමහට අහිත පිණිස මුළු ජීවිතය මෙහෙයවූ දෙව්දත් තමා අනුගමනය කළවුන්ගේ අර්ථසිද්ධිය නසා ආත්ම ඝාතක විනාශකාරි පිළිවෙතක යොදවා තෙමේද දුකට පත්විය.

## අත්තන්තප, පරන්තප, අත්තන්තප පරන්තප, න අත්තන්තප පරන්තප:-

තමහට හා පරහට දුක් උපදවන ව්‍රතචාරිත්‍රාදියෙහි යෙදෙන්නවුන් බෙදදැක්වීම් වශයෙන් මෙම පුද්ගල භේදය දර්ශිතය. එකල දඹදිව ඇතැම් පුද්ගලයන් අත්තකිලමථානුයොගය පිරූ සැටි මෙයින් මොනවට විස්තර වෙයි.

i **අත්තන්තප:-** තම සිරුරට දුක්දීම් තපසෙකැයි සිතා පිළිවන් තරම් ආතාපන පරිතාපන ක්‍රියාවන්හි යෙදෙයි. ඒ සඳහා රෙදි පිළි හැඳීම ප්‍රතික්ෂෙප කොට නග්නයෙකුව ශීතොෂ්ණාදියෙන් ශරීරය පෙළයි. ලොක සම්මත නීතියට පටහැනිව මලමූත්‍ර පහකිරීමත්, කැම් පිම් ආදියත් සිටගෙන කරයි. අහරගෙන අවසන්හි අත නැවරී තිබෙනදුය දිවෙන් ලෙවකයි. අනෙකකු විසින් භික්ෂාව ගැනීමට එනු මැනව. අහර ගෙනෙන තෙක් සිටිනු මැනව යනාදීන් කරනු ලබන ආරාධනය නොපිළිගනී. තමා උදෙසා ගෙනෙන ලද උදෙසා කළ ආරාධිතභික්ෂා නොඉවසයි. සැලි පැස් ආදියෙන් ගත් බතද, එළිපත, - දඬු - මෝහොල් අතර සිට දෙන බතද, දෙදෙනකු අනුභව කරමින් සිට නැගී දෙන බතද, ගැබිනිය - කිරිපොවන්නිය - පුරුෂයෙකු වෙත ගිය නැතැත්තිය - යන මොවුන් පිළිගන්වන බතද, තමන් උදෙසා සම්මාදම් කොට පිළියෙල කළ බතද, බත්රියි සුනඛයෙකු සිටියදී ඔහුට නොදී දෙන බතද, අවට මැස්සන් සරන සැලියෙන් ගත් බතද, යන මෙතෙක් බත් හා මත්ස්‍ය මාංශද, නොපිළිගනී.

තවද සුරාව හා මෙරයද, සියලු ශෂ්‍යයන් බහාකළ පානයද නොබොයි. හෙතෙම එක්ගෙය - එක් ආලොපය - එක් පාත්‍රයකිනුදු යැපෙයි. පිළිවෙළින් ගෙවල් - ආලොප - පාත්‍ර සත දක්වා වැඩිකොටගෙන යැපෙනුයේද වේ. එක් දින කට - සත් දිනකට - අඩමසකට - වරක් ගෙනෙන ලද බතද බුදී. අඹුපලා - නොයෙක් වී වගී - ලියු හම් කැබලි - සෙවෙල මැලියම් - දංකුඩ - ගොම - වන මුල් හා වැටුණු කොළ ගෙඩි

ආදියද අහර කිස සඳහා යොදගනී. හන වැහැරි -මිනීඑතු වස්ත්‍ර - පංශුකූල - රුක් සුඹුලු සම්, කුර සහිත සම්, කුසතණ පොතු-රුක් පතුරු-කෙහෙ - අස්ලොම් බකමූහුණු පියාපත් ආදියෙන් කළ වස්ත්‍ර දරයි. හිස රැවුල් උදුරා දමයි. ආසන ප්‍රතික්ෂෙප කොට සිටගෙනම සිටී. නැතහොත් උක්කුටිකව හිඳිමේ වීයර්‍ය රකිමින් යන එන විටද උක්කුටිකවම පැන පැන යෙයි. යකඩ හෝ ප්‍රකෘති කටු තිම පිහිටුවා ඒවා උඩ සම් අතුරා හිඳිම් සක්මන් කිරීම් ආදිය කෙරෙයි. උදෑසන මධ්‍යාහ්න - සායණහ යන තුන් වේලෙහි පව් සෝද හැරී-මට ජලයට බසියි. මෙසේ අනෙක කාරයෙන් ශරීරය හාත්-පසින් තවන ක්‍රියාවන්හි අත්තන්තප නියැලිව වෙසෙයි.

ii **පරන්තප**:- අන්‍යයන් පීඩාවට පමුණුවන පැවැතුම් ඇත්තෙකි. මෙතෙම එළු - හූරු - මුව - ශකුන මත්ස්‍යාදී සතුන් මරා කැම් පීම් සඳහා යොදු ගැනීමෙන්ද වෙළෙඳම් කිරීමෙන්ද දිවිපවත් වන ක්‍රූර පුද්ගලයෙකි. එමෙන්ම සොරෙක් හෝ චොරඝාතකයෙක් ද බන්ධනාගාර ගොපකයෙක් ද වෙයි. ලොකයෙහි යම් පමණ දරුණු ක්‍රියා වෙත් නම් ඒවා කරන්නෙක් වෙයි. ජීවිකා වෘත්තිය සඳහා හෝ විනොදය පිණිස හෝ අන් සත්ත්වයනට පීඩා කිරීම සැනසීමක් කොට සලකන දරුණු පැනැත්තෙකි.

iii **අත්තන්තප පරන්තප**:- තමා තැවෙන ක්‍රියා-වන්හි යෙදෙන අතර අනුනුදු තවයි. මෙතෙමේ ඔටුනුපලන් රජෙකි. නැතහොත් බ්‍රාහ්මණ මහාසාර කුලයක උපන් බමු-ණෙකි. මෙම නාම සම්මුතිය පහළවීමට හෙතු වනුයේ රජ බමුණු දෙදෙනා එක්වැ කරන මහායාගයෝය. ඒ සඳහා රජතුමා නගරයට පැදුම්දිග අභිනව යඥශාගාරයක් කරවා හිස රැවුල් හරවා ඛුර සහිත අඳුන් සම් හැඳ ගිතෙල් සහිත තෙල් වගිවලින් සිරුර ගල්වා කැසිය යුතුවූ විට මුව අගින්

පිට කසමින් මෙහෙසිය හා පෙරෙවි බමුණාද සමග යඥශා- ගාරයට පිවිස යාගහොම පැවැත්වීමට පිළියෙල වී යාගස්ථා- නයට ගොස් ඇතිරිලි නොඅතුල තිල් තණකොළයෙන් ගහන භූමියෙහි සයනය කෙරෙයි. ඉන්පසු සමාන වස්සකු ඇති දෙනකගේ එක තනයක කිරෙන් රජ යැපෙයි. දෙවැන්- නෙන් රජ බිසවද තෙවැන්නෙන් පෙරෙවි බමුණුද යැපෙන්- නාහු සිවුවැනි තෙනෙන් ගන්නා කිරෙන් ගිනි පුදත්. වස්සා යැපෙනුයේ ඉතිරි තනවල කිරි පානය කිරීමෙනි. ඉන්පසු රජතෙම යාගය සඳහා මෙපමණ ගවයන්ද, තගඹ වස්සන් හා වැස්සියන්ද දෙනුන් හා එළු තිරෙළුවන්ද මරත්වා. යාග වැම් සඳහා මෙපමණ රුක් සිඳිත්වා. යාග ශාලාව වටකිරීම පිණි- සත් යාගබිම ඇතිරීම පිණිසත් මෙපමණ කුසතණ කපත්- වා යි දාසි දස් කම්කරු ආදීනට අණකරයි. ඔහු රාජ දඬු- වම් භයින් තර්ජනය කරනු ලබන්නාහු කඳුළු මුසු මුහුණින් දුක්තව හඬමින් නියමිත කටයුතු කෙරෙත්. මෙබඳු යාග හොම කරනුයේ තෙමේද ශරීර තාපනයෙන් දුකට පැමිණෙයි. ඒ සඳහා දහස් ගණන් සතුන් මරන අතර අන්‍යයන්ද බලාත්- කාරයෙන් එහි යොදවා පීඩාවට පත්කරයි. එහෙයින් අත්ත- න්තප පරන්තප නමින් සැලකෙනුයේ මෙවැනි යාග හොම කරන තැනැත්තේය.

iv **න අත්තන්තපෘ පරන්තප** තෙමේද නොම නැවෙන ආත්මයක් පරිහරණය කරමින් අනුනුද ඒ සඳහා මෙහෙයා ශාන්තිය සලසන්නෙකි. තථාගතයන් වහන්සේ මෙයින් අද- හස් කරනුලැබේ. මෙඅත්බැව්හිම තෘෂ්ණාව නසා නවන දවන සියලු කෙලෙසුන් මුලුසුන්කොට නිවී සිසිල් භාවයට පැමිණ ධ්‍යාන මාර්ග ඵල නිර්වාණ සුඛයන් විඳිමින් ශ්‍රේෂ්ඨ ආත්මයක් පරිහරණය කරන උන්වහන්සේ සියලු තැවිලි නැසූසේක. අන්‍යයන්ගේ ක්ලේශ සන්තාප නරකාග්නි සන්තාපයන් සංසිඳුවනු සඳහා මරුන් බඹුන් සහිත දෙව්මිනිසුන්ගේ ආශ- යානුශයයන් දැන ඔවුනට ද අනත්තන්තප අපරන්තප වනු

පිණිස දහම් දෙසති. යම් ගෘහපතියෙක් එම ධර්මය අසා උන්වහන්සේ කෙරෙහි පැහැද ගිහිගෙය හැරපියා මහණව සීල සමාධි ප්‍රඥාවන් පූරණය කොට ධ්‍යානාභිඥාවන් ලබා සකල ක්ලේශයන් ප්‍රහීණ කොට මහරහත් බවට පැමිණේද, හෙතෙම එතෙක් පීඩා කරමින් තිබුණ සියළු සන්තාපකර ධර්මයන් ගෙන් දුරීභූතව නිවී සැනසී යෙයි. ඉන්පසු හෙමේද නොනැවෙයි. අනුත්තුද්‍ර නොනවනුයේ ශ්‍රෙෂ්ඨ ආත්මයක් පරිහරණය කරයි. තම ජීවිත යාපනය අන්‍යයන් පිළිබඳවවුවද කිසිවකුටත් හිරිහැර නොවනසේ එය පවත්වයි. අන්‍ය තිර්ථකයන් දායකයන් මඩිමින් ප්‍රත්‍යලාභය උපදවන නමුදු ශාසනික භික්ෂුව සිවුපසය පවා ලබනුයේ දායකයනට නොදැනෙන සේය. පුෂ්පයක වර්ණය හෝ සුගන්ධය නොපෙළමින් රොන්ගන්නා මීමැස්සා යම්සේ තම අදහස ඉටුකරගනීද, එමෙන් මුනිවරයාද ශරීරයාපන මාත්‍රයට මාත්‍රඥ වැ ජසය උපයයි. එහෙයින් වදළහ.

**"යථාපි භමරො පුප්ඵං වණ්ණ ගන්ධං අහෙඨයං**
**පලෙති රසමාදය එවං ගාමෙ මුනී චරෙ"**

**සරාග – සදෙස – සමොහ – සමාන:–**

රාග ද්වේෂ මෝහ මාන යන ක්ලේශ ධර්මයන්ගෙන් සමන්විත වනුයේ ඒ ඒ නාමයන්ගෙන් හැඳින්වේ.

**රාගය** යනු සිත්කලු රූපාදී ආරම්මණයන් හෙතුකොට ගෙන සිත්සතන් තුළ පහළවන රැඳීම් වශයෙන් සැලකෙන බලවත් ඇල්මයි.

**දෙසය** යනු මන නොවඩනා අනිටු අරමුණු මුල්කොට ගෙන සිත්හි හටගන්නා දුෂ්ට චණ්ඩ ස්වභාවයයි. මෙය මනුෂ්‍යයාගේ සකල අභිවෘද්ධියක්ම වළහා ලන නීවරණයකුදු වෙයි. ද්වේෂයෙන් දුෂ්ටවූ සිතැත්තේ සගමොක් මග අවුරා පව්කම් සපුරා නිරා දුකට භාජන වෙයි.

**මොහය** යනු සිතට ඇතුල්වන අරමුණ පිළිබඳ යථා තත්ත්වය මුවහ කරන ස්වභාවයයි. සතර දුඃඛාදි ආර්‍ය්‍ය සත්‍යයන් නොපිළිවිදිනුයේ මෙම මොහ චෛතසිකය විසින් සංසාරික ස්වභාවය වළහන හෙයිනි. **"අවිජ්ජා"** නමිනුදු ගැනෙනුයේ මෙම මොහයමැයි.

**මානය** යනු අන්‍යයන් හා තමන් අතර ගුණාගුණාදිය මැනීම් වශයෙන් සිත්හි පහළවන උඩඟු ස්වභාවය යි. එය සෙය්‍ය – සදිස – හීනාදී භෙද කල්පනා වශයෙන් නවාකාරයකින් හටගනී. මෙහි දැක්වුණ රාගාදී පාපධර්ම කාමාවචර කුසල සම්පාදනයෙහිදී තදඞ්ග වශයෙන්ද, රූපාරූප කුසල චෙතනා පහළවනවිට විෂ්කම්භණ වශයෙන්ද' ලොකොත්තර කුසල් සිත් පහළ කරගන්නා විට සමුච්ඡෙද වශයෙන්ද ප්‍රහීණ වෙයි. කාමාවචර රූපාවචරාදී කුසල් සිත්වලින් තාවකාලිකව හෝ කලකට හෝ රාගාදිය බැහැර ගියද, යථොක්ත කුසල් සිත් නිරුද්ධවනු සමගම නැවත පහළ වේ. පුන පුනා හටගැනීමක් නොමැතිව සමූලඝාතනයෙන් දුරුවනුයේ සොතාපත්ති මග්ගාදී ලොකොත්තර කුසල් සිත්වලිනි. එබැවින් ආර්‍ය්‍යමාර්ගීයන්ගෙන් අප්‍රහීණවූ රාගාදියෙන් යුක්තවනුයේ සරාග සදොසාදී පුද්ගල ව්‍යවහාරයට යොග්‍ය වේ.

**අජ්ඣත්ත චෙතො සමථලාභී න අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී, අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී අජ්ඣත්ත චෙතොසමථලාභී,,**

**අජ්ඣත්ත චෙතො සමථලාභී අධිපඤ්ඤාධම්ම විපස්සනා ලාභී,–නෙව අජ්ඣත්ත චෙතො සමථලාභී අධිපඤ්ඤා ධම්ම විපස්සනාලාභී:–**

**i අජ්ඣත්ත චෙතො සමථලාභී න අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී:-** තමාගේ සිත්සතන්හි රූපාරූප සමාපත්ති උපදවා ගත් නමුදු ලොකොත්තර මාර්ගයක් හෝ ඵලයක් ප්‍රත්‍යක්ෂකොට නොගෙන සිටිනුයේ මෙනම් වේ. ග්‍රාම්‍යකාම ච්ඡන්දාදි ප්‍රත්‍යනීක ධර්මයන් විතෛනකායෙන් සංසිදුවනුයේ සමථය. රූපාරම්මණයන් නිමිතිකොට උපදනා රූපාවචර සමාපත්ති සතරද, අරූපාරම්මණයන් හෙතුකොට උපදනා අරූපාවචර සමාපත්ති සතරදැයි රූපාරූප විසින් සැලකෙන සමාපත්ති අට මෙහි **'චිත්ත සමථ'** නමින් හැඳින්වේ. මෙම සමවත් සමවත් කල චිත්තයෙහි කම්පනය අරමුණු කරා පැනයෑම සංසිඳෙයි.

ස්කන්ධ පඤ්චකය අනිත්‍යාදී වශයෙන් විවිධාකාරයෙන් දක්නේ විපස්සනාය. එම විශිෂ්ට දර්ශනය අධික ප්‍රඥා ප්‍රභාවයෙන් සිදු වේනු යි **'අධිපඤ්ඤා'** නමිනුදු හැඳින්වේ. **චිත්ත සමථය මුත් විදර්ශනා ප්‍රඥාවක් නැති අෂ්ට සමාපත්තිලාභී පෘථග්ජන පුද්ගලයා මෙසින් අභිප්‍රෙතය:-** මෙතෙම මාර්ගයාගේ පූර්වභාග කෘත්‍ය වශයෙන් විදර්ශනාවට පාදකවූ ලෞකික අෂ්ටසමාපත්ති වඩා සමථබලය අධිකකොට ගෙන විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් කෙලෙසුන් යටපත් කළ කෙනෙකැයි දත්නේය.

**ii අධිපඤ්ඤාධම්ම විපස්සනාලාභී න අජ්ඣත්ත චෙතො සමථලාභී** අෂ්ටසමාපත්ති ලාභයක් නැති ආර්‍යශ්‍රාවකයා හඳුන්වන නාමයෙකි. මෙතෙම සමථයට වඩා විපස්සනා බලය අධිකකොට ගෙන ස්කන්ධ පඤ්චකය අනිත්‍යාදී විසින් සම්මර්ශනය කරනුයේ ලොකොත්තර මාර්ගක්ෂණයෙහි සමථවිපස්සනාවන්ගේ බල සමායොගය ඇතිකොට අනුත්පාද නිරොධයෙන් සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් කෙලෙසුන් නසයි. මෙම ආර්‍යශ්‍රාවකයා රූපාදී ආරම්මණ යථාතත්ත්වයෙන් දූත ඛය වය වශයෙන් ඔවුන්ගේ භඞ්ග ස්වභාවයද සලකා සංස්කාරයෝ ම කිඳෙත්. ඔවුන්ගේ භේදය

මරණයවේ. මෙහි නිත්‍ය සුඛශුභ ආත්මාදි වශයෙන් ගතයුතු
අන් කිසි සාරයක් නැතැයි ශූන්‍යබවයෙන් ඔවගාගෙන අඩිඹුණුව
සපුරාලයි. එසල මෙම පඤ්ච ස්කන්ධය නිත්‍යවූවක් නොව
නිරන්තරයෙන් වෙනස්වනසුළු අනිත්‍යයකැයිද, සුවදායකවූවක්
නොව දුක් එළවන්නෙකැයිද, සදාකාලිකවූ පවත්නා ආත්-
මයක්නොව ඒරාත්මනම්වූ ආත්මසංඥාරහිතයකැයිද අවබෝධ
කොට ගෙන එහි නොසතුටුවූ කලකිරෙයි. රැදීම්වශයෙන්
නොඇලී හැරදමයි. මෙසේ අනිත්‍යවශයෙන් දක්නේ නිත්‍ය
සඤ්ඤාවද, දුක්වශයෙන් දක්නේ සුඛ සඤ්ඤාවද, අනාත්ම
වශයෙන් දක්නේ ආත්ම සඤ්ඤාවද, කලකිරෙනුයේ බැඳීමද,
නොඇලෙනුයේ රාගයද, වළහනුයේ සමුදයද හැරදමනුයේ
දැඩිව ගැනීමද, දුරුකරයි. සංස්කාරයන් පිළිබඳ උක්ත-
ප්‍රකාරයෙන් දෝෂදර්ශනය කරන මෙම ආර්‍යශ්‍රාවකයා ස්කන්ධා-
භිසංස්කාරයන් සමග ක්ලේශයන් තදඞ්ග වශයෙන් හැර
දමමින් නිර්වාණය කෙරෙහි නැමියන පැවැතුම් ඇතිවූ අනුක්‍ර-
මයෙන් ක්ලේශ ක්‍ෂයද කෙරෙයි. එහෙත් සමුත්පාදිත සමා-
පත්ති ලාභයක් නැතිහෙයින් අධිපඤ්ඤා ධම්මවිපස්සනාලා-
භියෙක් පමණකැයි දතයුත්තේය. **ශුෂ්ක විදර්ශකාර්‍යශ්‍රා-
වකයා මෙම නාම ව්‍යවහාරයෙන් ගච්ජමානය.**

iii **අජ්ඣත්ත චේතොසමථලාභී අධිපඤ්ඤාධම්ම
විපස්සනාලාභී:-** අෂ්ටසමාපත්ති උපදවා ගෙන ආර්‍යශ්‍රාවක
භාවයට පැමිණි කෙනෙකි. හෙතෙම කෙලෙස් නවනුයේ
ස්වභාවයෙන්ම විදර්ශනාව පූර්වාඞ්ගම කොටගෙන සමථය
වැඩීමෙනි. යම්පමණ සමාපත්තීනට සමවැදීම කෙරේද
එපමණම සංස්කාරයන් සම්මර්ශනය කිරීම ඔහුගේ ස්වභාවයයි.
යම් තාක් සංස්කාරයන් සම්මර්ශනය කෙරේද, ඒතාක් සමා-
පත්තීනට සමවදී. පළමුකොට ප්‍රථම ධ්‍යානයට සමවැදී
එයින් නැගීසිට සංස්කාර සම්මර්ශනය කිරීමෙන්, අනතුරුවද්වි-
තීය ද්ධ්‍යානයම සමවැදී ඉන් නැගී සිට සංස්කාර සම්මර්ශන-
යන් කෙරෙමින් පිළිවෙළින් නෙවසඤ්ඤා නාසඤ්ඤා-
යතන සමාපත්තිය තෙක් සමථවිදර්ශනා වැඩීම
කරන්නේවෙයි. මෙසේ පුරුදු කරනලද තදඞ්ග විෂ්-

කම්භණ ප්‍රහාණයන්ගේ වශයෙන් චෙතොසමථයත්. කෙළවර ක්ලේශයන්ගේ සමුච්ඡේද ප්‍රහාණයෙන් සබ්බසඞ්ඛාර සමථයත් ලැබගෙන නිවන්දක්නේය.

iv **නෙව අජ්ඣත්ත චෙතො සමථලාභී අධිපඤ්ඤා ධම්ම විපස්සනාලාභී:-** මෙතමින් සැලකෙනුයේ අවුපසම ක්ලේශයන් හා ඉන්ද්‍රියයන් ඇති සාමාන්‍ය ලෞකික මහජනයාය. ඔවුනට අධිප්‍රඥ ලාභයක් තබා ක්ලේශයන් තදඞ්ග වශයෙන් මිස විෂ්කම්භණයෙන් කලක් යටපත්කොට තබා ගන්නට හැකි ශක්තිමත් භාවිත චිත්තයකුත් නැත. එබැවින් පූර්වෝක්ත ද්විධ සමථයෙන්ම දුරස්ථය. ඇතැම්විට දානසීලාදී කුසලයක් කරන කල්හි තාවකාලික චිත්තසමථයක් ලබන්නට පිළිවන් වුවද, ඉතා සුළු වේලාවක් පවත්නා එය මෙහි ගණනට නොගැනේ.

**අනුසොතගාමී, පටිසොතගාමී, ඨිතත්ත, තිණ්ණ:-**

සොත නම් සැඩ ජලපහරය. ජලපහර ගලා බස්නේ යම්සේද එසේ ජලවේගයට අනුගතවැ පහළට ගමන්කරනුයේ අනුසොතගාමීය. ජලපහරින් පහළ නොගොස් විරුද්ධ පාර්ශ්වය බලා ඉදිරියට යනුයේ පටිසොතගාමිය. ඉහළට හෝ පහළට නොගොස් සිටිතැනම සිටිනුයේ ඨිතත්තය. ඒ සා බලසම්පන්න සැඩජල පහරෙහි වේගය බිඳගෙන තරණය කොට එතරට ගොස් ගොඩතිම සිටිනුයේ තිණ්ණය. මෙහි ජල පහර ලෙසින් ගැනෙනුයේ සංසාර වෘත්තයාගේ පැවැත්මය. කර්ම ක්ලේශ විපාක යන වෘත්ත ත්‍රයයෙහි නිමග්නවූ සත්ත්වයා එහිම ගැලෙමින් කප්සියදහස්හිදු කෙළවරක් නොදක අනන්තාපරිමාණ කාලයක් මුළුල්ලෙහි සැරිසරයි. සමාන්‍යයෙන් ලෝකවාසී සියළු සත්ත්වයන්ගේ පැවැත්ම මෙසේවුවද බුද්ධාදී ආර්යයන්ගේ උපදෙශයන්හි පිහිටා මෙම වෘත්තත්‍රයයාගේ ග්‍රහණය හැරපියා සසරින් මිදෙන්නෝද වෙති. ඔවුන්ගේ

ලක්ෂණ විභාග දක්වන්නට මෙම පුද්ගල භේදය දර්ශිතය.

i **අනුසොතගාමී** පඤ්චකාම සම්පත් සෙවනය කරමින් පාපකර්මයන්ද රැස්කරනුයේ මෙනම්වේ. මෙය වට්ටසොතයෙහි ගැලුණු පෘථග්ජන පුද්ගලයා හඳුන්වන අන්‍යතර අන්වර්ථ නාමයෙකි. මෙතෙම සැඩජල පහරකට ගොදුරුවී ගසාගෙනයන නැනැත්තකු වැන්න. සත්ත්වයාගේ සංසාරික ප්‍රවෘත්තිය ස්කන්ධ ධාතු ආයතනයන්ගේ නොසිඳී පැවැත්මෙන් හටගන්නකි. භවයක්පාසා එය පහළවීමට හෙතුවනුයේ කර්ම ක්ලේශ විපාකයන්ගේ වශයෙන් ස්කන්ධාදිය උපදවා ගැන්මය. යම් පුද්ගලයෙක් නැවත නැවත භවොත්පත්තියට හෙතුවන පාපකර්මයන් මිස භව විරාගයට හෙතුවන පුණ්‍යධර්මයන් රැස්නොකරයිද හේ වට්ටසොතය අනුව යන්නෙකි. ඔහුට භවයෙන් නික්මීමක් නැත. ක්ලේශ කාමයන්ගෙන් වස්තුකාමයන් සෙවනය කරන අතර ප්‍රාණඝාතාදී පඤ්චපාපකර්මයන් රැස්කිරීම එයට හෙතුවය. එබැවින් සංසාර වෘත්තයාගේ පැවැත්ම ඉක්ම යානොහී කර්මානුරූපව නරකාදී ආපායික දුඃඛයන්හිත් ජාත්‍යාදී සංසාරික දුඃඛයන්හිත් ගැලෙමින් සසර හැසිරෙන්නේය.

ii **පටිසොතගාමී** කෙලෙස් ජල පහරට අනුව නොගොස් විරුද්ධ ප්‍රතිපදාවෙන් ජලවෙගය කපාගෙන උඩට යන්නකු මෙන් ක්‍රියා කරයි. මෙතෙමේ සසර හැසිරීමේ ආදීනව සලකා වස්තුකාම ක්ලේශ කාමයන් නොසෙවනේ පාපයෙන්වැළකේ. ක්ලේශයන්ගේ උත්සන්නතාවයක් ඇතිකල්හි උපන් දුකින් හා දෙම්නසින් යුක්තව කඳුළු වැකුණු මුහුණු ඇතිව ත්‍රිශික්ෂාවන්හි හික්මෙයි. ඉන් එකකුදු අඩුනොකොට ආරක්ෂා කොරෙමින් උපක්ලේශ රහිත වැ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙයි.

ගසාගෙන යන ජලපහරක උඩට යන්නහුට ජලවෙගය මැඩගත හැකි කාය බලයක් තිබිය යුතුය. බලවත් වීර්යයක් හා චිත්ත ධෛර්යයක් ඇතිව සිහියෙන් යුක්තවූවකුට

ම එම ගමන යායැකිවෙයි. අනාදිමත් කාලයක පටන් පරිචිතව පරිපොෂිත ව පැවත එන රූපාදී ආරම්මණ හෙතුකව ඝටගන්නා තෘෂ්ණාව යටපත් කරලිම මහත් වීර්‍යයකින්ම කටයුතුය. ක්ලේශයන්ගේ රොදනයෙන් ගැහැට විඳිමින් එම ශ්‍රෙෂ්ඨවයසිංවෙහි හැසිරෙන පටිසොතගාමී පුද්ගලයා පුරුෂ පරාක්‍රමයෙන් ක්ලේශාරීනට විරුද්ධවැ රෞද්‍ර යුද්ධයක යෙදෙන්නෙකි. **ඇතැම් ක්ලේශයන් මුලොච්ඡින්න කොට ඉතිරි ක්ලේශයන්ගේ ක්‍රියාකාරී ශක්තියද විනාශකළ සොතාපන්න සකෘදගාමි පුද්ගලයෝ පටිසොතගාමිභූය** පර්‍යාය දෙශනා වශයෙන් තත්ප්‍රතිපද පූරක සීලසම්පන්න පෘථග්ජන භික්ෂුවද එයටම ඇතුලත්වේ.

iii **ඨිතත්ත:-** ක්ලේශ ශ්‍රොතසින් ගසාගෙන නොයන සේ ස්ථාවර තත්ත්වයක් පහළ කරගත් කෙනෙකි. තෘෂ්ණා සොතයට අසුවීමෙන් වරෙක නරකයෙහිද වරෙක මිනිස්ලොවද, හැසිරෙනුයේ සක්කාය දිට්ඨි ආදි ඔරම්භාගිය පඤ්ච සංයෝජනයන්ගෙන් නොමිදුණු නැනැත්තේය. එකොළොස් වැදෑරුම් කාමලොකය තුළ අතරක නතරවීමක් නොමැතිව ඔහුට හැසිරෙන්නට සිදුවේ. ඨිතත්ත පුද්ගලයා ඔරම්භාගියයන් සිඳ බිඳ හැර උද්ධම්භාගියයන්ගෙන් පමණක් යුක්තව රූපලොකොපගතවැ සිටින අනාගාමී කෙනෙකි. හෙතෙම කාමරාග ව්‍යාපාදයන්ගෙන් නොසෙල්වන සිත්ඇත්තෙකු හෙයින්ද පිළිසිඳ ගැනුම් වශයෙන් රූපලොකයෙන් කාමලොකයට නොපැමිණෙන ස්වභාව ඇත්තෙකු හෙයින්ද ඨිතත්තයි ව්‍යවහාර ප්‍රාප්තය.

iv **තිණ්ණ** නමින් සැලකෙනුයේ චතුරොඝය චතුර් මාර්ගඥානයෙන් තරණය කොට ඉන් එතර වී නිර්වාණ නමැති ගොඩබිමට පත් ශ්‍රෙෂ්ඨ පුද්ගලයාය. බහා තබාතලද පාප ඇති බැවින් හේ බ්‍රාහ්මණ නමිනුදු හැඳින්වේ. සකලාශ්‍රවයන් ක්ෂය කිරීමෙන් අහිත්ඵල සමාපත්ති ස්ථලයෙහි පිහිටි මෙතෙම ඵලසමාධියත් ඵලප්‍රඥාවත් විශිෂ්ට ඥානයෙන් දැන

එය ප්‍රත්‍යක්‍ෂ කොට ගෙන වෙසෙන්නෙකි.

කුසලං'කුසල ධර්මයන් මනාකොටදත ක්ලේශයන් විද්වංශනය කළ හෙයින් **"වේදගු ලොකන්තගු පාරගත"** යන අභිධානයන්ගෙනුදු හැඳිනෙනුයේ තිණ්ණ පුද්ගලාඛ්‍ය රහතන්වහන්සේය. මෙම පුද්ගලයන් සිවුදෙනා පඤ්චස්කන්ධ රුචිකයන්ගේ මනොබන්ධනය සඳහා අනුගීති වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙසේද හඳුන්වා වදාළහ.

යෙකෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අවීතරාගා ඉධ කාමභොගිනො
පුනප්පුනං ජාති ජරූප ගාමිනො
තණ්හාධිපන්නා අනුසොත ගාමිනො

තස්මා හි ධීරො ඉධුපට්ඨිතාසති
කාමෙච පාපෙච අසෙවමානො
සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ
පටිසොතගාමිති තමාහු පුග්ගලං

යො වෙ කිලෙසානිපහං පහාය
පරිපුණ්ණ සෙඛො අපරිහාන ධම්මො
චෙතොවසිප්පත්තො සමාහිතින්ද්‍රියො
ස වෙ ඨිතත්තොති නරො පවුච්චති

පරො වරා යස්ස සමෙච්ච ධම්මා
විධූපිතා අත්ථගතා න සන්ති
ස වෙදගූ වුසිත බ්‍රහ්මචරියො
ලොකන්තගූ පාරගතොති වුච්චති'ති

**අපස්සුත සුතෙන අනුප්පන්න, අප්පස්සුත සුතෙන උප්පන්න, බහුස්සුත සුතෙන අනුප්පන්න, බහුස්සුත**

## සුතෙන උප්පන්න

i **අප්පස්සුත සුතෙන අනුප්පන්නා:-** ඉතාමත් මැ ස්වල්පයක් ඉගෙන ඒ අනුව පිළිපැදීමකුදු නැතියේ මෙ නම් වේ. මේසසුත්හි "**සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල යි"** ශාස්තෘ ශාසනය නව වැදෑරුම් වෙයි. එය මුළුල්ලම හෝ කොටසක් හෝ තම නැණපමණින් ඉගෙන එ දහම්හි දැක්වෙන ප්‍රතිපත්තින්හි යෙදී ප්‍රතිවෙධ ප්‍රාප්තයෙකු වීම ශ්‍රාවකයෙකුගේ යුතුකමය. එහෙත් මෙම පුද්ගලයා ඉගෙන ගනුයේ ගාථා කිහිපයකට හෝ සූත්‍ර කීහිපයකට සීමිතවන ස්වල්ප මාත්‍ර ධර්මයකි. තිත වීර්‍යයෙන් පසුබස්නා සුළු චිතම්ද්ධය විසින් අකර්මණ්‍ය භාවයට පමුණුවන ලද මෙතෙම ධර්මය දරන්නට උනන්දු නොවේ. දතුවාවූ ස්වල්ප ධර්මයෙන් පවා ප්‍රයෝජන ගන්නට හෝ ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි පිහිටා සීලසමාධි ප්‍රඥාවන් පුරන්නට හෝ උත්සා නොකරයි. දත්පමණිදු පිළිපැදීමක් නැතිහෙයින් හුදෙක් අල්ප ධර්මයක් දන්නෙකැයි කියනු විනා ධර්මයෙන් ප්‍රයෝජන ගන්නෙකැයි නොකීවහැක උගත් ස්වල්ප දෙයෙහි පවා පාළිය පිරිසිදුලෙස දැන ඒ පිළිබඳ අර්ථකථා විස්තර නිසිලෙස ප්‍රගුණ කොට පිළිපැදීමෙන් සොතාපත්ති ආදී ලොකොත්තර ගුණයක් හෝ එයට අනුරූප පූර්වභාග ප්‍රතිපදා සංඛ්‍යාත සීලාදි ගුණ විශෙෂයක් හෝ පහළ කර ගැනීම කටයුතුය. මොහු තුළ එබඳු පැවැත්මක් නැති හෙයින් ලොකයා විසින් නූගතෙකැයිද දුශ්ශීලයෙකැයිද නින්දාවට භාජන කරනු ලැබේ. **එබැවින් පූර්වොක්ත නාම ව්‍යවහාරය මෙසසුන්හි අල්පශ්‍රැත දුශ්ශීල පුද්ගලයා හඳුන්වනු සඳහා කැරෙන්නකැ යි දතයුත්තේය.**

ii **අප්පස්සුත සුතෙන උප්පන්න** අසා දත ඉගෙනගත් ධර්මය ස්වල්පයක් වුවද, එහි පෙළ හා අර්ථකථා මනා සේ ප්‍රගුණ-කොට ඒ අනුව තමාගේ කායාදී ද්වාරත්‍රය මෙහෙයවා උගත්දෙයින් ප්‍රයෝජන ගනී. එක් ගාථාවක් උගන්නට ලද නමුදු පසුබැසීමක් නොමැතිව රාග ද්වේෂ මෝහාදීන්ගේ විනය සඳහා එය යොමුකරගෙන පිළිවෙත් පුරයි. එබැවින් සිල්වතෙකැයි ප්‍රසිද්ධියක් ලැබ ලොකයාගේ ප්‍රශංසාව හිමි කර ගනී. **අල්ප ශ්‍රැත ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ප්‍රමුඛ වශයෙන් මෙම පුද්ගල භෙදයෙහි සඞ්ගෘහිත වෙති.**

iii **බහුස්සුත සුතෙන අනුප්පන්න:-** බොහෝ ඇසූ පිරූ තැන් ඇති වියතෙකි. නවඞ්ග ශාස්තෘ ශාසනය බෙහෙවින් ප්‍රගුණ කොට ධර්මධරයෙක්ම වෙසෙයි. එහෙත් පෙළ හෝ අර්ථකථා මාර්ගීය නිසැකව, නිසිලෙස හදුරා එහි පිළිපැද ප්‍රතිවෙධය කළ ගුණලාභයක් නැත. ශ්‍රැතයට අනුව මනා පිළිවෙතින් පහළකරගත් සීලාදී සංවරමාත්‍රයකුදු මොහුට අවිද්‍යමාන හෙයින් දුශ්ශීලයෙකැයි ලොකයාගේ නින්දාවට ගොදුරු වේ. ඇතැම්විට ධර්මධර සූත්‍ර ධර උගත් පුද්ගලයෙකැයි ප්‍රශංසා මාත්‍රයක් ලැබෙන නමුදු එයින් ආත්මාර්ථ පරාර්ථ සාධනයක් නොවේමැයි. **මෙසසුන්හි නෙවළා දහම් දත් බහුශ්‍රැත දුශ්ශීල පුද්ගලයා මෙයට අයත්වෙ.**

iv **බහුස්සුත සුතෙන උප්පන්න:-** සූත්‍රගෙය්‍ය වෙය්‍යාකරණාදී ශාස්තෘ ශාසනය බොහෝසෙයින් ඉගෙන එයින් පහළ කැරගත් සීලාදී ගුණ විශෙෂ ඇත්තෙකි. තමා අදහන ආගමයෙන් නියම ප්‍රයෝජන ලබන්නට ධර්මය දැන පිළිපැදීමක් අවශ්‍යය. ශ්‍රාවකයෙකුගේ යුතුකම ශාස්තෘවරයා දෙශනා කළ ධර්මය සම්පූර්ණයෙන් ඉගෙන ගැනීමය. එයට ප්‍රඥා සම්පත්තිය නැතහොත් අධික ප්‍රමාණයක දැනීමක් හෝ ලැබ ගන්නට යත්න කළ යුතුය. ශාස්තෘවරයා තමාගෙන් බලාපොරොත්තුවන පරිදි උගත් ධර්මය අනුව හැඩගසාගත් ජීවි-

නයක් පරිහරණය කිරීම ශ්‍රාවකයෙකුගේ යුතුකම සේම අභිප්‍රායද විය යුතුය. මෙපෙම ශ්‍රාවකත්වයට අනුරූප පැවැතුම් ඇත්තෙකු හෙයින් සීලයෙන් හා උගත්කමිනුත් අශෙෂ ලොකයාගේ ප්‍රශංසාවට පාත්‍ර වේ. ධර්මධරවූද සුප්‍රාඥ බුද්ධ ශ්‍රාවකයෙකුවූ ද මේ උත්තමයාට යුක්ත්‍යනුකූලවැ කිසිවෙකුට කිසිවෙකිනුත් නිග්‍රහ කළ නොහැක. දෙව් මිනිසුන් සහිත ලෝ වැස්සාගේ සතුතිය ඔහු කරා නිරායාසයෙන් ළඟා වේ. **මෙම පුද්ගල සඞ්ඛ්‍යාවට ප්‍රධාන වශයෙන් අයත්වනුයේ බහුශ්‍රැත ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේය.**

## සමණමචල - සමණ පදුම - සමණ පුණ්ඩරීක සමණ සුඛුමාල:-

මෙසසුත්හි ගුණ විශෙෂයනට පත්වන ආර්‍යයන් ගේ සත්ත්වය ඒ ඒ අවස්ථානුකූලව විශෙෂ නාමාරොපණයෙන් හඳුන්වනු සඳහා මෙම පුද්ගල භෙදය දෙසිනය. බුදුරජාණන් වහන්සේ වචනයේ පරිසමාප්තාර්ථයෙන් ශ්‍රමණ ව්‍යවහාරයට යොග්‍ය පළමුවන දෙවන තෙවන හා සිවුවන පුද්ගලයාන් ලැබෙනුයේ තමන්වහන්සේගේ ශාසනයෙහි පමණකැයි ආගමාන්තරයන් සලකා අභිත නාදයක් කොට ශ්‍රාවකයන්ගේ ම විශෙෂ භෙදයක් දක්වූවද: මෙහිලා තමන් වහන්සේද අනාගත වනසේ ශ්‍රමණ ව්‍යවහාරය පැණවූහ.

i **සමණ මචල:-** නොසෙල් වනසේ සපිරව පිහිටා ගත් ගුණ විශෙෂ ඇතියේ මෙනම් වේ. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත **පරාමාස** යන සංයෝජන ත්‍රය සිත් සතන් තුළ **පවත්නා** නාක් සංසාර විමුක්තිය සඳහා නා නා ආගමික සම්ප්‍රදායයන් අනුගමනය කිරීමත් ඒ පිළිබඳ කාලින් කල වෙනස් මත දැරීමත්, මනුෂ්‍යයා තුළ නිසඟීසිද්ධව පහළ වන්නකි. එ ඒ අවස්ථානුරූපව ආත්මය නා නා තත්ත්වයන් භජනය කරන බවත්, ආත්ම පාරි ශුද්ධිය සඳහා ගොවුන අජවුනාදීන්හි යෙදී හැකිනාක් ආත්මයට දුක් දිය

යුතු බවත්, ඔහුගේ සිතට නැගේ. මේ අදහස් මූලික කර ගෙන ලෝකයෙහි බොහෝ ආගමයන් පහළ වී තිබෙන බව කිම යුක්ති යුක්තය. ආත්මය ගළවා ගැනීමේ පහසු මාර්ගයන් ඉදිරිපත් කිරීම් වශයෙන් ආගම් කතුවරයන්ගේ දෙශනා යොමුවී තිබීම එය ස්ථිර කෙරෙයි. මේ ශාසනයෙහි වූකලී ආත්ම නාමයෙන් ගතයුතු කිසිවක් නැතැයි ඉගැන් වේ. යථොක්ත සංයොජනත්‍රයය මූලොච්ඡින්න කළ සම්බොධිය පරායණ කොට ඇති සොතාපන්න පුද්ගලයා ශාසනයෙහි මූලයවූ අචල ශ්‍රද්ධාවෙහි පිහිටි කෙනෙකි. සංසාර විමුක්තිය ප්‍රත්‍යක්ෂ කරගත් මෙම ශ්‍රමණොත්තමයා මෙ සසුනින් කිසිසේත් නො ගිලිහෙයි. පර්වතයක් ශිඛලුවැ පවතිනු මෙන් ඔහුගේ ස්ථිර භාවය අන් ශාස්තෘවරයන්ගේ ඉගැන්වීම් වලින් සෙලවිය නොහේ. එබැවින් අචල ශ්‍රමණ නාමය ව්‍යවහාර කිරීමට අනන්‍යතායෙන් සුදුස්සේය. ඔටුනු පලන් රජකෙනෙකුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා අභිෂෙක නොකළද රජුගේ ඇවෑමෙන් රජකමට පත්වේ. ඔහුගේ රාජ්‍ය උරුමය නීතියෙන්ම ස්ථිරය. එහි වෙනස්වීමක් නොවේ. එමෙන් සොතාපන්න පුද්ගලයාද නිර්වාණය කරා ගමන් කරන මාර්ගයට පිළිපන්නෙකි. හෙතෙම සෝවාන් මගින් නැසූ කෙලෙසුන් නැවත කිසිකලෙකත් නුපදවිය හෙනුයේ ඒ ඒ මාර්ගයෙන් නැසියයුතු කෙලෙසුන් නසමින් අනුක්‍රමයෙන් රහත්බව ලබනු ඒකාන්තය. **ඇතැම් සූත්‍රයක සත්වැදෑරුම් සෙඛපුද්ගලයා සමණමචල නාමයෙන් හඳුන්වා තිබේ.** රහත්වීම දක්වා ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මෙමින් ආශ්‍රවාශ්‍රිත අසම්පූර්ණ ශ්‍රමණ ජීවිතයක් ගත කරන හෙයිනැයි සැලකිය හැක.

ii **සමණ පදුම** සක්කාය දිට්ඨි ආදී ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කොට රාග දෙසමොහයන් තුනී කිරීමෙන් උත්පත්ති වශයෙන් එක්වරක් කාමලොකයට පැමිණ දුක් කෙළවර කරන සකෘදගාමී ආර්ය්‍ය පුද්ගලයා මෙනමින් හැඳින් වේ. මෙහි පදුම ශබ්දය රක්තාර්ථය පවසයි. මොහු ක්ලේශ

රඤ්ජනයන් සර්වප්‍රකාරයෙන් දුරිභූත නොකළ හෙයින් එම නාමාරෝපණය විය. **මෙහි සමණ පදුම නාමයෙන් සකදාගාමි අදහස් කළද, ඇතැම් තැනෙක උභතොභාග විමුක්ත ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ ගැනුණහ.**

ii **සමණ පුණ්ඩරීක** ඔරම්භාගීය පඤ්ච සංයෝජනයන් නසා උත්පත්ති වශයෙන් කාමලෝකයට පැමිණීමක් නැති අනාගාමී මෙයින් අදහස් කරයි. හෙතෙම ශුද්ධාවාසයන්හිදී ක්ලේශ පරිනිර්වාණය කොට ආයු කෙළවර ස්කන්ධ පරිනිර්වාණයෙන් නිවන්පුර වදනේයි. මොහුතුළ කාමරාග සඞ්ඛ්‍යාත රඤ්ජන ක්ලේශයන් නැති බැවින් පුණ්ඩරීක ශබ්දය පද්මාර්ථය නොව පණ්ඩරාර්ථය පවසා. **ධ්‍යානාභිඥා රහිත ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රවයන් වහන්සේද මෙනමින් ව්‍යවහාර වෙති.**

iv **සමණ සුඛුමාල** ආශ්‍රව ක්ෂය කිරීමෙන් ඵල සමාධියත් ඵල ප්‍රඥාවත් පහළ කරගෙන වසන **මහරහතන් වහන්සේය.** සිත් සතන්හි කර්කශබව තදබව ඇති කරන සකල ක්ලේශයන් පහකළ හෙයින් මේ සුදුසුවූම අභිධානයෙකි. උන්වහන්සේගේ සිත හා සිරුරද මෘදුය. රළු පරුෂ බැවින් නොරය. එහෙයින් කායික චෛතසික දුක් රහිත වැ ඒකාන්ත සුඛානුභවය කෙරෙති. එබැවින් ශ්‍රමණයන් අතුරින් ඉතා සිසුමැලි ආත්මයක් පරිහරණය කරන්නෙකැයි කියනු යුක්ති යුක්තය.

මෙම චතුර්විධ ශ්‍රමණයන් අතරෙහි **සුඛුමාල** නාමය **වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ගැලපෙනුයේ බුදුරජාණන් වහන්සේමය.** සිවුපස ලාභයෙනුදු, කායික චෛතසික දුක්රහිත භාවයෙනුදු නිසර්ගජනිත මුදු මෙලෙක් සිරුරක් ඇතිහෙයිනුදු, බුදුරජාණන් වහන්සේම සුඛුමාල බැවින් අග්‍රප්‍රාප්තය. රාජා රාජ මහාමාත්‍යාදීන් විසින් බලවත් ඇවිටිල්ලෙන් පිළිගන්වනු ලබන සිවුපසය

ඇති හෙයින් සිරුර තැවීමට අවස්ථාවක් නොලැබ බුද්ධ ශරීරයේ සුඛුමාල බව ආරක්ෂා වේ. ආශ්‍රිත භික්ෂූන් විසින් කායික වාචසික මානසික වශයෙන් කළයුතු යම් කෘත්‍ය-යක් වේනම් එය බලවත් ඇල්මෙන්ම කැරෙයි. පුද සත්කාරාදියද කරනුයේ මනාප සිතින්මය. පිත්ත සමුට්ඨා-නාදී රෝගොපද්‍රවයෝද ඉතාමැ අල්පයහ. එසේම චතුර ද්ධ්‍යානයන් හා ඵල සමාධියත් ඵල ප්‍රඥවත් ඉතා පහසු-වෙන් උපදවා ගෙන වැඩ වෙසෙති. එබැවින් සර්වඥයන් වහන්සේ ශ්‍රමණයන් අතර අභ්‍යධියෙන් සුඛුමාල සේක.

## චතුෂ්ක පුද්ගල විභාගය නිමි.

# පඤ්චක පුග්ගල පඤ්ඤත්ති.

**ආරභති විප්පටිසාරී - ආරභති න විප්පටිසාරී - න ආරභති විප්පටිසාරී - න ආරභති න විප්පටිසාරී - ඛීණාසව**

ආපත්ති ව්‍යතික්‍රමණාදී වරදකට පැමිණ පසුතැවිලි වන්නවුන්ගේ වශයෙන් මේ පුද්ගල භෙදය දක්විණ. යම්කිසි ප්‍රමාද දෙෂයකින් ආපත්තියකට පැමිණියහොත් වහා ඉන් නැගී සිටීම භික්ෂූන්ගේ සාමයික චාරිත්‍රයකි. අවන් ඇවතින් නැගිසිට මාර්‍ගඥනය ලබාගනු සඳහා උත්සාහවත්ව විදර්‍ශනා භාවනාවන් වඩන යොගාවචරයාහට නිර්‍වාණාවබොධයට බාධාවක් නැත. මෙසසුතින් ලැබෙන පිහිට එකාන්තයෙන්ම ඔහුට අත්කරගත හැක.

i **ආරභති විප්පටිසාරී**·- ආපත්ති ව්‍යතික්‍රමණය කොට ඒ හෙතුවෙන් විපිළිසර බවට පැමිණේ. අවන් ඇවැත් පිළිබඳව නිතර මෙනෙහි කරමින් නැවෙයි. ඔහුගේ එම පැවැත්ම ගුණ විශෙෂාධිගමයට බාධක වූ හුදෙක් චින්තාපරවශ වූ කල්යවන්නට හෙතුවක් වෙයි එබැවින් නිකෙලශී පුද්ගලයකු සාක්ෂි කොට තබා ඔහුගේ දුර්‍වලකම් දුරුකරවන්නට අවවාද දයකයෙක් අවශ්‍ය වේ. යම් අර්‍හත් ·මාර්‍ගඥනාවබොධයෙකින් ඔහු තුළ උපන් ලාමක පාප ධර්‍මයෝ අනවශෙෂයෙන් නිරුද්ධ වෙත්ද, එම අර්‍හත්ඵල සමාධියත් අර්‍හත්ඵල ප්‍රඥවත් අධිගමයක් නොකළ ඔහුට ඒ පිළිබඳ තත්භාව බොධයක් ඔහුට නැත. එබැවින් අන්‍යයන් විසින් අවවාද කළ යුතුය. කරුණා පූර්‍වාඞ්ගමව මෙසේ කිව යුතුය. නැතහොත් මෙසේ හැසිරෙන ලෙස ඔහුගෙන් ඉල්විය යුතුය.

"ආයුෂ්මතුන් පිළිබඳ ආපත්ති ව්‍යතික්‍රමණයෙන් පහළවූ ආශ්‍රවයෝද විපිළිසර බැවින් නැවත නැවත වැඩෙන් නාවූ ආශ්‍රවයෝද පැනතේ. එබැවින් දෙසියයුතු ඇවැත් දෙසීමෙන්ද, නැඟී සිටියයුතු ඇවතින් නැඟී සිටීමෙන්ද, පහළ කළයුතු ඇවැත් පහළ කිරීමෙන්ද, ව්‍යති ක්‍රමණ ජනිතාපත්ති දුරුකළ යුතුය. සුද්ධාන්තයෙහි පිහිටි බව ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් විපිළිසරයෙන් වැඩෙන ආශ්‍රවයන් බැහැරකොට විදර්ශනා සිතත් ඒ හා සමප්‍රයුක්ත ප්‍රඥාවක් වැඩිය යුතුය. එසේ කළ කල්හි පස්වැනිව ලැබෙන රහත් පුද්ගලයා හා ලෝකෝත්තර ගුණයන්ගෙන් සමානයෙක් විය හැකියැ''යි කියයුතුය. මෙසේ අවවාද අනුශාසනා ලබන හෙතෙම ආපත්ති ව්‍යතික්‍රමණාදියකට නොපැමිණ සමාධි ප්‍රඥාවන්හි හික්මෙමින් අනුක්‍රමයෙන් ආශ්‍රවයන් ක්‍ෂයකිරීමෙන් නිර්වාණාවබෝධය ලබන්නේය.

මෙහි පස්වැනි පුද්ගලයායි කියූයේ මේ පුද්ගල භේදයෙහි පශ්චිමයා වශයෙන් ලැබෙන රහතන්වහන්සේය. උන්වහන්සේ ආදර්ශකොට දක්වමින් මෙම අවවාදය ප්‍රධාන වශයෙන් ක්‍ෂීණාශ්‍රව කෙනෙකුන් විසින් කළ යුතුය.

ii **ආරභති න විප්පටිසාරී**:- ඇවැත් අවදී. එහෙත් විපිළිසර බවට නොපැමිණේ. අවන් ඇවත දෙසීම සඳහා සභාග පුද්ගලයෙකු සොයයි. නො එසේවුව, වරදට කළයුතු ප්‍රතිකර්ම කොට නිමාවා පරිශුද්ධත්වයට පැමිණ පසුතැවිලි නොවේ. මෙතෙමේද අර්හත් ඵලාවබෝධයක් නැත්තකුහෙයින් පාපධර්මයන්ගේ නිරවශෙෂ නිරෝධය නොදනී. වරදට පිළියම් කරන නමුදු පුන පුනා ඇවැත් අවදින්නට හැකිය. අන්‍යයන්ගේ අවවාද ලදහොත් ඉන් මිදෙන්නට පිළිවන එබැවින් පූර්වෝක්ත ක්‍රමයෙන් සබ්‍රහ්ම චාරීන්ගේ අනුශාසනා ලැබ ක්ලේශක්‍ෂය කරන්නේය.

iii **න ආරභති විප්පටිසාරී** ඇවැත් අවදනෝ නොවේ. එහෙත් විනය ප්‍රඥප්තිය නියිලෙස නොදත් බැවින් ඇවැත් නොවන්න ඇවැත්සේ ගෙන කුකුස් දන වමින් විපිළිසර බවට පැමිණෙයි. ඇතැම්විට එක්වරක් ඇවතකට පත්ව ඉන් නැඟී සිටිනමුදු එයින් පසු කිසිසේත් ප්‍රඥප්ති ව්‍යතික්‍රම-ණයක් නොකළ නමුදු පසුතැවිල්ල හැරගන්නට අසමර්ථය. එබැවින් මෙම පුද්ගලයාද අන්‍යයන් විසින් අවවාද කටයුත්-තෙකි. ඔහුගේ විපිළිසර බව දුරුවනුයේ එකලය. ඉන් පසු විදර්ශනා සිත හා බැඳුණු ප්‍රඥව පහළ කරගෙන අනු-ක්‍රමයෙන් රහත්බව ලබන්නට හැක්කේය.

iv **නාරභති න විප්පටිසාරී** ඇවැත්වලට හෝ විපිළි-සර බවට කිසිසේත් නොපැමිණේ. එහෙත් අර්හත්ඵල සමාධි-යත් එම ප්‍රඥවත් අවබොධ නොකළ හෙයින් ප්‍රත්‍යක්‍ෂයෙන් නොදනී. මෙතෙම දුශ්ශීල නැතැත්තකු නොවුවද, ප්‍රධන් වීර්‍ය්‍ය හළ කෙනෙකි. සසර සරන රිසිය අධික හෙයින් මෙම බුද්ධසසුන්හි ක්ලේශ පරිනිර්‍වාණය බලාපොරොත්තු නොවේ. මෙතෝ බුදුන්සෙමෙහි පිරිනිවෙන් තෙම්සි සතිටු-හන්කොට පිරිසිදු සිල් ඇතද පිළිවෙත් පුරන්නට උනන්‍දු නොවේ. එබැවින් සමාධි . ප්‍රඥවන් වඩන ලෙස ඔහුගෙන් ඉල්විය යුතුය. පෘථග්ජනයාගේ ගති අතිබද්ධ හෙයින් මෛත්‍රෙය නාථයන් හමුනෝවන්නට ද පිළිවනැයි කියා උත්සාහවත්කොට නිවන්සුව ලබන්නට සැලැස්විය යුතුය. මෙසේ උද්‍යොගවත් කළ විට වීර්‍ය්‍යවඩා කෙලෙස් දුරලීමෙන් අර්හත්ඵල සමාධියත් ඵල ප්‍රඥවත් තත්වූ පරිද්දෙන් දන ක්ලේශ පරිනිර්‍වාණයෙන් නිවන්සුව අත්පත් කරගන්නේය.

v **නාරභති න විප්පටිසාරී** ( ‑ ඛීණාසව ) ඇවැත් ඇවදීමක් හෝ විපිළිසර බවක් හෝ නැති අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කළ රහතන්වහන්සේය. සකල ක්ලේශයන් ප්‍රහීණ කළ උන්වහන්සේට ඒසඳහා අන්‍යසකුගේ අනුශාසනාවක් උවමනා

නොවේ. රහත්ඵලය කැමැතිවන්නවුනට උන්වහන්සේ විසින් උපදෙස් දියහැකිය. එබැවින් පූර්වෝක්ත පුද්ගලයන් සතර දෙනා අනුක්‍රමයෙන් ආශ්‍රවක්ෂය කරනුයේ රහත් කෙනෙකුන් ගේ අවවාදයෙහි පිහිටා ක්‍රියාකිරීමෙනැයි වදළේය.

මෙහි පස්වැනි පුද්ගලයාගේ තත්ත්වනිරූපණයක් නො දැක්වෙයි. එහෙත් **"අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සති"**යි පෙළෙහි එම පුද්ගලයා සඳහන්වේ. ඉන් අදහස් කරනුයේ රහතන් වහන්සේය. ඉතිරි සිවු පුද්ගලයන් උන්වහන්සේ ආදර්ශකොට ගෙන අනුගමනය කිරීමෙන්ම රහත්වන හෙයිනි. එබැවින් මෙතෙක් පවත්වාගෙන ආ ක්‍රමය උල්ලඞ්ඝනය නොකළයුතු හෙයිනුදු, අඞ්ගුත්තර නිකායයෙහි වෙනම පුද්ගල භේදයක් නො වදාරනලද හෙයිනුදු, සුඛාවබෝධය සඳහා මෙසේ දැක්වූ බව සැලකිය යුතුය.

**දත්වා අවජානාති – සංවාසෙන අවජානාති – ආධෙය්‍යමුඛ ලොල – මන්දමොමූහ:-**

i **දත්වා අවජානාති**, දී අවමන් කරනුයේ මෙනම්වේ. මෙසසුන්හි ඇතැම් භික්ෂුවක් මහ පිනැත්තේ චීවර පිණ්ඩපාතාදී සිවුපසය බොහෝසේ ලබයි. හෙතෙම ලැබෙනසියල්ල තමහටම ප්‍රයෝජන ගත නොහැකි හෙයින් මද පිනැති සිවුපස ලාභයක් ප්‍රමාණවත් ලෙස නොලබන අන්‍යයනටද ඉන් කොටසක් බෙදා දෙයි. හෙද දෙනුයේ තමාගේ මහත්ත්වය පෙන්වීම් වශයෙන් මුත් හුදු දානාධ්‍යාශයෙකින් ම නොවේ. එහෙයින් ස්වල්ප ප්‍රමාද දෝෂයකට කිපියේ තමාගෙන් යැපෙනබව කියමින් සිවුපසය ලද්දහු ලජ්ජාවට පත්කොට තුෂ්ණීම්භූත කෙරෙයි. ඔහුගේ ජීවිතය තමා නිසා පවත්නකැයි අන්‍යයනට පෙන්වන්නට තැත් කරයි. තමා දෙන බවද ඔහු ගැනීමට පමණක් සිටිනබවද පවසමින් පහත්කොට සිතා අවමන් කරයි. මෙය දානපතියෙකු තුළ නොපිහිටිය යුතු නොහොබනා පැවැත්මකි. තථාගතයන් වහන්සේ භික්ෂුව

ප්‍රමුඛ ස්ථානයෙහි වැජඹෙන හෙයින් මෙසේ වදාළ නමුදු, සාමාන්‍ය ලොකයා තුළද මෙය බෙහෙවින් දක්නට ලැබෙන සිරිතකි. මද කෝපයක් හටගත්විට දුන්දෙයක් මතක්කරමින් ගත්නැතැත්තනු දුර්මුඛ කරන්නට අවමන් වශයෙන් කථා කිරීම බොහෝදෙනාගේ ගතියකි. එය ශිෂ්ටත්වයට ගැලපෙන්නක් නොවේ. මෙකල ඇතැම් බෞද්ධයන්ගේ යටිසිත්වලද මේ දුබලකම දක්නට ලැබේ. භික්ෂූන්ගේ යැපීම තමන් නිසා පවත්නා හෙයින් තමන්ගේ අශාසනික අනනුලොම ක්‍රියාවලටද භික්ෂුව සම්බන්ධ වියයුතුයැයි සලකන්නාසේ පෙනේ. සවල්ප වරදක් දුටද කම්කාරාදීනටමෙන් මහත්සේ ගැරහීම පුරුද්දක් වැ තිබෙනුයේද යථොක්ත හැඟීම නරයේ කාවැදී පවත්නාහෙයිනි නොඑසේනම් පූජ්‍යවරයෙකුගේ දෙෂය උචිතාවස්ථාවක ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමකින් පැවසීම බෞද්ධයෙකු සතු යුතුකමය. අහර වේලක් දුන් පමණකින් භික්ෂූන් වහන්සේ වැඩකාරයෙකුගේ තත්වයෙන් මැනීම කිසිසේත් යොග්‍යනොවේ. තමන්ගේ උපස්ථානය ආගමික යුතුකමක් ඉටුකිරීම කැයි සලකනොත් මෙබඳු ආගම ධර්ම විරොධී හැඟීම් පහළ නොවනු ඇත.

ii **සංවාසෙන අවජානාති:-** එක්ව විසීමෙන් අවමන් කරනුයේ මෙනමින් හැඳින්වේ. ඇතැම් පුද්ගලයෙක් යම්කිසිවකු ඇසුරු කරමින් දෙතුන් වසක් වැස පසුව නොසලකා හැර ඔහු අවමානයට ගොදුරු කරයි. ආශ්‍රයට පැමිණි මුල් කාලයෙහි ගරු කිරීමාදියෙන් සැලකිලි දැක්වුවද කල්ගතවන විට ගණනකට නොගෙන උපස්ථානාදියට නොඑළඹෙයි සවල්පමාත්‍ර දෙයකට කිපියේ ආශ්‍රිතයාගේ ගුණ දොස් විචාරණයට ඉදිරිපත් වෙයි. මෙතෙක් කලක් ඔබ ඇසුරු කෙළේ අවිචාරයෙන්ම නොව, ඔබ කළ නොකළ දේ පිරික්සීමෙන් යුක්තවයැයි තර්ජන සවරයෙන් කියන කල ආශ්‍රිතයා කිසියම් දෙෂයක් තමාතුළ විද්‍යමාන වනු ඇතැයි සිතා ඔහුටමැ ඉඩ දෙමින් නිසොල්මන් වෙයි.

සාමාන්‍ය ලෝකයා තුළද මෙය බෙහෙවින් ක්‍රියාවෙහි යෙදෙන දුර්ගුණයකි. ඇතැමෙක් පලිගන්නා අදහසින්ද, තව කෙනෙක් ආශ්‍රිත බලවතා හෝ ගුණවතා හා තමාත් අතර වෙනසක් නැතිසේ පෙන්වනු රිසි මාන්නයෙන්ද, ආශ්‍රිතයන්ගේ නුගුණ කියති. ඇසුරු කරන්නහු ප්‍රත්‍යක්ෂයෙන් කීයන්නකැයි සිතා අසන තැනැත්තෝද එය අදහන්නට නොපැකිලෙති. ජනසමාජයෙහි කලකෝලාහලාදියට බොහෝ සෙයින් හේතුවනුයේ මෙබඳු පුද්ගලයන්ගේ අස්ථාන ප්‍රයුක්ත චෝදනාය. මෙසේ කලක් එක්ව වැස අවමන් කරන්නට පුහුසුළුවන තැනැත්තේ සැමදෙනාගේ අවිශ්වාසයට භාජනව තමනට තිබුණු තත්ත්වයෙනුදු ගිලිහී දෙලොවින් මැ පිරිහෙයි.

iii **ආධෙය්‍යමුඛ**; පළමු වචනයෙහිම පිහිටා සිටිනුයේ මෙනම් වහර ලබයි. අන්‍යයන්ගේ ගුණවර්ණනයක් හෝ අගුණ කථනයක් හෝ කරන කල්හි එය වහාම අදහා විශ්වාස කොට නිශ්චයට බැස ගැනීම මොහුගේ ස්වභාවයයි. මාගීයක ඛණිතලද ආවාටයකට නන්දෙසින් ගලාගෙන එන පිරිසිදු හෝ අපිරිසිදු ජලය එක්වනු මෙන් පරීක්ෂා කිරීමක් නොමැතිව මැ අන්‍යයන්ගේ දෝෂයක් ඇසුව, ඔහු දෝෂදූෂිතයකු ලෙසද, ගුණ කථනයක් ශ්‍රවණය වූව, ගුණ පූරිතයකු ලෙද, පිළිගන්නට නොපැකිලේ. මෙසේ යමක් යමක් අසන්නට ලැබේද එහි එහි පිහිටුවනලද මුඛ ඇති පුද්ගලයා අන්වර්ථ නාමවශයෙන් ආධෙය්‍යමුඛයැයි කියැවේ. මෙතෙම සාරූප්‍ය පැවැතුම් ඇති භික්ෂුවක් අසාරූප්‍ය කෙනෙකැයි අසන්නට ලදුයේ එපමණකින්ම තීරණයට එළඹ අසාරූප්‍ය තැනැත්තෙක යන සඤ්ඤාවට බැසගනී. සභාග පැවැතුම් ඇති අන්‍යභික්ෂුවක් හෙතෙම සාරූප්‍ය කෙනෙකැයි කියන ලදද එය නොපිළිගනී. පළමු ඇසූ වචනයෙහිම පිහිටා මුල් තීරණය වෙනස්කරන්නට කැමැති නොවේ. මෙපරිද්දෙන් දුස්සීලයා සීලසම්පන්නයැයිද, සීලසම්පන්නයා දුස්සීලයැයිද

නිශ්චයට බැසගන්නට සිදුවේ, අන්‍යයන්ගේ වචනමාත්‍රය අදයා කුම්භිලග්‍රහණයක්මෙන් තරවැ තිරණයට බැස ගන්නා මෙතෙම අවිචාරවත් පුද්ගලයෙකි.

iv **ලොල,** එක් අරමුණක නොපිහිටන සවභාව අධිකවැ ඇතියේ ලොල නම්. ශ්‍රද්ධා ප්‍රඥදි යහපත් ගුණයක් පහළ වූ කල එය ඉතා සවල්ප කලක් පැවත අශ්‍රද්ධාදීන් කැලඹී වෙනස්වීම ලොල පුද්ගලයාගේ ගතියකි. මොහු තුළ පහළ වන ශ්‍රද්ධාව, භක්තිය, ප්‍රේමය හා ප්‍රසාදය අසම්පූර්ණය. එසේම තාවකාලිකය. මොහොතකින් වෙනස්වන සුළුය. දහයියා ගොඩක සිටවූ කණුවක් මෙන්ද, අශ්වයෙකුගේ පිටෙහි තැබූ කොමඩුවක් මෙන්ද, අස්ථිරය. එක්ලෙසක පිහිටන්නට අසමර්ථය. මොහොතකින් පැහැදේ· අනෙක් මොහොතෙහි කලකිරේ. නැතහොත් කිපේ. මොහුට කිසියම් වැඩක් සම්රලෙස පවත්වාගෙන යන්නට හෝ ගුණ ධර්‍මයක් ආරක්‍ෂා කර ගන්නට හෝ නොහැක්කේය.

v **මන්‍දමොමූහ** කාරණා කාරණ නොදැන් බැවින් අඥාන වනුයේ, යම් දෙයක යථාතත්ත්වය වටහා ගැන්මෙහි ශක්තියක් නැති බැවින් පතළ මහත් මූළාවෙන් යුක්ත වනුයේ මන්‍දමොමූහ නම්. මෙතෙම සියලු පුද්ගලයන් අතර අනුකම්පාවට භාජන වියයුතු තැනැත්තෙකි. තිරිසනකු හා මොහු අතර වෙනසක් දක්නට ලැබෙනුයේ ශාරීරික වශයෙන් පමණැයි කිව යුතුය. "මනුෂ්‍ය රූපෙණ මෘගා ශචරන්ති" යන සදුක්තිය සනාථ වනුයේ මෙවැන්නවුන් මිනිසුන් අතර දක්නට ලැබෙන හෙයිනි. කුසලා'කුසල සාවජ්ජානවජ්ජ-හීනප්පණීළිත -ධර්‍මයන් තත්වූ පරිද්දෙන් දැන වෙන්කොට හඳුනාගන්නට හැකියාවක් මොහුට නැත. තවද මේවා කෘෂ්ණධර්‍ම නම්වූ පාපධර්‍මයන් හා සදෘශය. මේවා ශුක්ලධර්‍ම නම්වූ පුණ්‍යධර්‍මයන් හා සමානයැ යි සභාග විසභාගධර්‍මයන් පිළිබඳ ආගමානුකූල දැනීමක්ද නැත්තේය.

එබැවින් බහල අඥත භාවයම බලපැවැත්වේ. මොහුගේ පර-ලොව ජීවිතය තබා මෙලොව ජීවිතයද දුක් කම්කටුලුවලින් ගහනය. තම ආත්මභාව ප්‍රතිලාභය ඔහුට පමණක් නොව ඥති මිත්‍රාදී හිතවතුනටද කරදර හා අලාභය පිණිසම පවත්නේය.

## පඤ්චවිධ යොධාජීවූපම පුද්ගලයෝ.

මෙලෙව්හි යුද්ධභටයන් වශයෙන් ජීවිකාව කරන පුද්-ගලයන් අතර පස් වැදෑරුම් තත්ත්වයක පිහිටි යුද්ධභටයෝ පස්දෙනෙක් වෙත්. ඉන් පළමුවැන්නා යුද්ධයට ගියේ ඇත් අස් ආදීන්ගේ පාද ඝට්ටණයෙන් නැගුණු දූහුවිලි සමූහය දැක බියපත්ව ඉදිරියට පා තහනු නොහැකිව නැතිගෙන පසුබසී. දෙවැන්නා දූහුවිලි දැක ධෛර්‍ය්‍යය උපදවා ගෙන ඉවසා සිටියහැකි නැනැත්තකු වුවද, හස්ති අශ්වාදීන්ගේ පෘෂ්ඨයන්හි හෝ රථයන්හි ඔසවනලද කොඩිවල අග දුටු පමණින් ධෛර්‍ය්‍යය හිනව පසුබැස යයි. තෙවැන්නා දූහු-විල්ලෙන් හා කොඩි අක්දැක්මෙන් තියනොවී ඉදිරියට යන නමුදු, හස්ත්‍යශ්වරථාදීන්ගේ හා සේනාවගේත් මහගඩ අසා ත්‍රස්තව, යානොහී නවතී. සිවුවැන්නා යථෝක්ත දූහුවිලි ආදිය දැක්මෙන් හෝ හඩඇසීමෙන් හෝ කිසිසේත් අධෛ-ර්‍ය්‍යයට නොපැමිණ යුදබිමටම යන්නේ සවල්පමාත්‍ර යුද්ධ-යකින්ම විනාශයට පත්වැ ප්‍රකෘති භාවය හැර දමයි. පස්වැන්නා දෙතුන් පහරක් ලදනමුත් ඉවසා යුදකොට ජය ලබාගෙන තුවාල සුවකර ගැනීමටත්, විශෙෂ දක්‍ෂයන්හට තනතුරු දීමටත්, ඓශ්වර්‍ය්‍ය සුඛානුභවයටත්, කඳවුර තුළම සත් දවසක් පමණ කල්යවයි. මෙම යෝධයන් පස්දෙනා ගේ පැවැත්මට සමාන කල හැකි ගතිගුණයන්ගෙන් සමන් විත භික්‍ෂූහු පස්දෙනෙක්ද මේ ශාසනයෙහි වෙසෙත්.

i භික්ෂුව අසුවල් ගම්හි හෝ නියම් ගම්හි රූප සම්පන්න දැකිමට සුදුසුවූ දර්ශනයෙන්ම ප්‍රසාදය එළවන උතුම් ශරිර වර්ණයෙන් හා අඞ්ගලක්ෂණයෙන් යුත් ස්ත්‍රියක හෝ කුලකුමාරියක ඇතැයි ඇසූ පමණින්ම මිථ්‍යා විතර්කයට බැස ගනී. පළමුවැනි යොධයා රජස්දූක පසුබැස යනු මෙන් මෙතෙමේද කෙලෙස් රජස් පහළ කැරගෙන බඹසර වස නොසිදු රැකගන්නට නොහැකිවැ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට හීනභාවය (=උපැවිද්ද) ට පැමිණේ. ක්ලේශ යොධයන් හා යුදකොට ඔවුන් පරදවන්නට ගිවිසුම් දී භික්ෂුභාවය නමැති සන්නාහය පැලදියද, ක්ලේශොත්පාදක නිමිති මාත්‍රයක් ගැන අසූ පමණින් ක්ලේශවශගවැ පැරද පලායෙයි.

ii භික්ෂුව පූර්වෝක්ත ලක්ෂණ සම්පන්න ස්ත්‍රියක හෝ කුමාරියක තමාවිසින්ම දැක බඹසරවස්හි සිටින්නට අසමර්ථව ක්ලේශකාලුෂ්‍යයට පැමිණ ශික්ෂා පූරණයට දුබලබැව් පහළ කොට හීනභාවයට පත්වෙයි. මෙතෙම ධජාග්‍රය දිටු පමණින්ම බියපත්ව පසුබැස පලායන යොධයා වැන්න. පසමිතුරන් ජයගනිමියි වහසිබස් තෙපලමින් යුදබිමට යන නමුදු, ඔවුන්ගේ සලකුණු දුටුවිට ධෛර්‍ය්‍යහීනවැ තමා අයත් කාර්‍ය්‍යයෙන් ගිලිහෙන භටයා අභිමතාර්ථ සිද්ධිය මස්තක ප්‍රාප්ත කර ගන්නට අසමර්ථය. මේ භික්ෂුවද ක්ලේශාරීන් මර්දනයට පිළිපන්නෙකු වුවද, ශත්‍රැපාශයක් බඳු රූපදර්ශන මාත්‍රයෙකින් කෙලෙස් සතුරනට ම ගොදුරක්වැ දෙලොවින් පිරිහෙයි.

iii භික්ෂුව ඇත් අස් ආදීන්ගේ මහත් හඬ අසා පලායන භටයකු මෙනි. හෙතෙම අරණ්‍යයකට හෝ රුක්මුලකට හෝ ශූන්‍යාගාරයකට හෝ ගමන්කොට උසස්ලෙස මහණදම් පුරන්නට යත්න දරයි. එහෙත් මාගමක විසින් නුසුදුසු පරිද්දෙන් රාගාන්විත සිනාසීමක් කළද, හඬනගා කථා කළද, අත්ලෙන් අත්ල ගසා ශබ්ද නැගෙන පරිදි

මගත්සේ සිතාසුණද, කල කොලොප්පම් කළද; එහි හඬ අසා ශබ්ද රාගයෙන් මත්ව සීලයෙන් පිරිහී සස්නෙන් ගිලිහී ගිහියකු බවට පැමිණේ. සත්‍රියක විසින් කරනු ලබන ශබ්ද මාත්‍රයෙන් හීනවීය‍ය්‍යීය උපදවා ක්ලේශ යුද්ධයෙන් පැරද පලායෙයි.

iv භික්ෂුව දුහුවිලි ධජාග්‍ර හා රණඝෝෂාව යන යුද්ධ-සේනාවක දිසෙන හෝ ඇසෙන කිසිවකිනුත් බියපත් නොවී යුදබිමට වැද සවල්ප යුද්ධයක් කළ පමණින්ම විනාශයටත් විපතටත් පැමිණෙන යොධයකු වැන්න. මෙතෙම සත්‍රිය-කගේ රූප වර්ණන ශ්‍රවණයෙන් හෝ දශිතයෙන් හෝ කථා කිරීම් ආදියෙන් හෝ ශ්‍රමණධර්මයෙන් නොපිරිහේ. ක්ලේශ වශගතවයෙහි ආදීනව මෙනෙහිකොට රාගාදී ආශ්‍රවයනට සිත්තුළට වැද ගන්නට ඉඩනොදේ. එහෙත් අරණ්‍ය රුක්ඛ-මූල සුඤ්ඤාගාරයනට වැද මහණදම් පුරනවිට මාගමක අවුත් ඔහුගේ තත්වය ගැන නොසිතා මැඩගෙන ඉතා සමීපයෙහි හෝ එකාසනයෙහි ම හෝ හිඳීද, සටපත් කොට ගෙන හෝ සිටීද, එපමණකින් ඔහුගේ ධෛය‍ර්‍යීය බිඳවැටේ. එතෙක් කල් ආරක්ෂාකළ ගුණධර්ම ගැන සැලකීමක් නොකොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයකුදු, මහණදම් පිරීමට දුබලබව පහළ කිරීම කුදු නොමකැරී මෛථුන්දම්හි හැසිරේ. මෙය යුද්ධයෙහි සතුරු පහර ලැබූ භටයාගේ විනාශය සිදුවනු මෙන් යථොක්ත භික්ෂුවගේ චතුපාරි ශුද්ධි සීලය සීසච්ඡේදනයක විලාසයෙන් මූලොච්ඡින්නවීමය. හෙතෙම ක්ලේශ යුද්ධයෙන් අනාත පරාජයක් ලද්දෙකි.

v භික්ෂුව යුද්ධයට යනකල්හි අසන්නට හෝ දකින්-නට ලැබෙන කිසිවකිනුදු, බිය නොවී පුරුෂ ධෛය‍ර්‍යීය උපදවා ගෙන යුදබිමට වැද සතුරන් නසා ජයපානය බොන යොධයා බඳු පැවැතුම් ඇත්තේය. මෙතෙම අරණ්‍යායතනාදියක බවුන් වඩනුයේ මාගමක අවුත් මැඩපවත්වා ගනිමින් සිය

සිරුර අල්වා ගතද, ඇයගේ ග්‍රහණයෙන් මිදී ඇයට වසඟ නොවී තමා කැමති තැනකට යෙයි. පව්ත කඳුර ගිරි-ගුහාදී ජන ශූන්‍ය ස්ථානයකට පැමිණ පලක් බැඳගෙන කය ඍජුකොට පිහිටුවා සිහිය එළවා ගෙන ව්‍යාපාද ථීන මිද්ධාදී නිවරණයන් පහකොට ප්‍රථම ධ්‍යානාදිය උපදවා ගනී. ඉන්පසු දුඃඛ සත්‍යාදිය තත්වූ පරිද්දෙන් අවබොධකොට ගෙන කාම භව අවිද්‍යාශ්‍රවයන්ගෙන් සිත මුදා සසර දුකින් එතරවීම සඳහා කළයුතු දේ කොට නිමවයි. මේ අත්බැව පිණිසම ත්නෙහි කළයුතු කිසිවක් නැතැයි දැන නිවන් පසක් කරයි. මෙතෙම සතුරන් දිනූ යොධයා ඓශ්වය්‍ය සම්පත් විඳිනු මෙන්, ක්ලේශාරීන් නිරවශෙෂයෙන් නිරුද්ධ කොට සදකාලික ශාන්තසුවයට පැමිණ සැනසෙන්නෙක් වෙයි.

## පඤ්ච පිණ්ඩපාතික පුද්ගලයෝ

බුදුරජාණන් වහන්සේ අප්පිච්ඡතා – අලොලතාදී ගුණ සමූහයක පහළවීම සඳහා භික්‍ෂූනට පිණ්ඩපාතය අනුදැන වදාළ බැවින් ගුණධර්‍ම පූරණයට උපකාරක ධර්‍මයක් වශයෙන් පිණ්ඩපාතික වියයුතුය. එහෙත් පාපෙච්ඡතා මහිච්ඡතාදී අදහස් මූලික කොටගෙන ද ඇතැම් අය පිඬුපිණිස හැසිරෙත්. එහෙයින් පිණ්ඩපාතිකයන් අතර පුද්ගල භෙද පඤ්චකයක් ලැබේ.

i **පුද්ගලයා** මන්ද මොමූහ ලක්‍ෂණයන් ගෙන් සමන් විත වැටහෙන නුවණක් හෝ පතල දැනුමක් නැත්තෙකි. මෙතෙම පිඬු පිණිස හැසිරෙන නමුදු, අඞ්ගසමාදන් වන ක්‍රමය හා එහි අනුසස් පිළිබඳව කිසිවක් නොදනී. අනෙක් අය පිඬුපිණිස හැසිරෙනු දැක එය අනුකරණය කරයි. ඔහුගේ පිණ්ඩපාත ගමනෙන් සිරුර යැපීම් පමණකට ප්‍රයෝජන වනු විනා එයට වඩා සිදුවන යහපතක් නැත. පිණ්ඩපාතය අනුදැ-නීමෙන් බුදුරජාණන්වහන්සේ අදහස්කළ උදාර පරමාර්ථ ඉෂ්ට

වන්නට නම් **පිණ්ඩපාත, පිණ්ඩපාත චෙතනා, පිණ්ඩපාත සඤ්ඤා, පිණ්ඩපාත පටිසංඛ්‍යාන ධුතඞ්ග,** යන මෙතෙක් දෑ පිළිබඳ අවබොධයක් තිබිය යුතුය. මෙ කරුණු ගැන දැනීමක් නොමැතිව පිණ්ඩපාතික වීමෙන් ශාසනික අදහස් සමෘද්ධ නොවේ. ගෙදෙරක් පාසා ගොස් යම්කිසි අහරක් ඉල්වා ගෙන දිවි ගෙවන යාචකයන්ගේ පැවැත්මට වඩා සැලකිය යුතු ප්‍රයෝජනයක් ඉන් සිදුවෙතැයි කිව නොහැක.

ii **පුද්ගලයා** පිණ්ඩපාතය කරනුයේ ලාමක අදහස් මුදුන් පත් කර ගන්නා අටියෙනි. හේ පාපෙච්ඡායෙන් යුක්තය. සිවුපසය බොහෝ සෙයින් ලබාගන්නා බලාපොරොත්තුවෙන් පිඬු පිණිස හැසිරෙයි. පිණ්ඩපාතිකයා පාප යෙහි ලජ්ජීපුද්ගලයෙක, අප්පිච්ඡතාදී ගුණ ගණාඞ්ග සඞගත තැනැත්තෙක, යන හැඟීමෙන් මහජන සැලකිලි වඩ වඩා ලැබෙනියි සිතා පිඬු පිණිස යෑම මොහුගේ සිරිතය. මේ ආකාරයෙන් සිවුපස ලාභය හා බුහුමන් ලැබීමේ අදහස පෙරදැරි කරගෙන පිණ්ඩ පාතික ව්‍රතය රැක්මෙනුදු ආගමික අදහස් ඉටුනොවේ. හුදෙක් ඉන් සිදුවනුයේ රස ලොලත්වය වැඩීම පමණකි.

iii **පුද්ගලයා** වික්ෂිප්ත සිතින් පිණ්ඩපාතයෙහි යෙදේ කිසියම් චිත්තභාවනාවක යෙදෙමින් පිඬු රැස්කිරිම ආගම නියමය වුවද මොහුට එබඳු ක්‍රියාවක ප්‍රයෝජනවත් ලෙස නොයෙදිය හැක. මෙතෙම පිණ්ඩපාතිකත්වයෙහි අර්ථයක් නොදක්නේ තමුදු, සිත් පෙරළිය නිසා අනුන් කරනු දැක එසේ කරයි. ඉනුදු සිදුවන ආගමික අභිවෘද්ධියෙක් නැත.

iv **පුද්ගලයා** පිණ්ඩපාතික වනුයේ බුදුවරුන් විසිනුදු බුදු සව්වන් විසිනුදු පිඬු රැස්කිරීමෙන් දිවි පැවැත්වීම වණ්නා කරන ලද්දකැයි පිළිගෙන ඒ අනුව පිළිපැදීම් වශයෙනි. අඞ්ග සමාදානයකින් තමහට හා මෙරමා හටත් සිදුවන යහපතක් ගැන ඔහුගේ සැලකිමක් නැත. උත්තම-යන් විසින් පසස්නා ලද්ද කරනු හොබනේ නොවේ දැයි සිතා එය අනුගමනය කරයි. මහොත්තමයන් වණ්ණිත දෙයක් අනුකරණය කිරීම තමාගේ තත්ත්වය රැකගැනීමට හෙතුවේයැයි සිතයි. සැහැල්ලු පැවැතුම් ඇතිවැ ගුණ දහම් වඩන්නට රුකුල් ලබාගැනීමට අදහසක් නැති බැවින් ඔහුටද පිණ්ඩපාතයෙන් සිදුවන ඓහලෞකික පාරලෞකිකාභි-වෘද්ධියක් නැතැයි කිව හැකිය.

v **පුද්ගලයා** අප්පිච්ඡතාව පිණිසද, යථාලාභාදි සතුට සඳහාද, ක්ලේශයන් විනාශකර දැමීම ප්‍රයොජන කොටද. පිණ්ඩපාතික වත සමාදන් වෙයි. ගුණදහම් වැඩීමේ මූලි-කාද්ධ්‍යාශයෙන් පිඬුපිණිස හැසිරෙන මේතෙම ඒ පිළිබඳ දතයුතු සියල්ලම දැන ගෙන එහි යෙදෙයි. ''ඕදන කුම්මා-**සාදී පිණ්ඩපාත සොළසෙසකැසිද, ජඞ්ඝහතන උද්දෙස-හත්තාදි පිණ්ඩපාත චෙතන පසලොසෙසකැසිද, විතක්ක සමෙනාසගමන සමෙනාසාදි පිණ්ඩපාතය මූලික කොට හටගන්නා සමෙනාසද පසලොසෙක්ම යැසිද' පිණ්ඩ-පාතිකඞ්ග සපදාන චාරිකඞ්ග එකාසනිකඞ්ග පත්ත පිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ග යන ධුතඞ්ග පඤ්-චකය පිඬු සිඟීමෙන් සම්පූර්ණවේ''යැසිද,** දන්නා මෙම පුද්ගලයා ගුණ රැසක් පුරනු රිසින් පිණ්ඩපාතික වූවෙකි.

තවද **''පිණ්ඩියාලොප භොජනං නිස්සාය තෙ පබ්-බජ්ජා''**යි වදාළ බුද්ධ වචනයද සිහියට නගාගෙන අනුන් අයත් පැවැතුම් නැතිබව, නිරවද්‍යබව, පිරිසිදු දිවි වැටුම් ඇති බව ආදී බොහෝ අනුසස් සලකා පිඬු සිඟායැම භික්ෂූත්වයේ

සලකුණකැයි හඟිමින් පිණ්ඩපාතයෙහි හැසිරෙන්නේ වෙයි. ශාසනික උසස් අදහස් පෙරදැරි කර ගෙන පිඬු සිඟන මෙම පුද්ගලයා පූර්වෝක්ත පිණ්ඩපාතිකයන් සිව්දෙනාගෙන් ප්‍රධානද උත්තමද වෙයි. දෙනගෙන් කිරිත් කිරෙන් දීත් දීවලින් වෙඬරුත් වෙඬුරෙන් ගිතෙලුත් ගිතෙලෙන් එම මණ්ඩයත් අනුක්‍රමයෙන් උසස් වනු මෙනැයි සැලකිය යුතුය. **සබ්බ සාසනානුලෝමික උක්කට්ඨ පිණ්ඩපාතිකයා නම් මෙතෙමේ මැයි.** මෙම පස්වැදෑරුම් පුද්ගලයන් අතර පසුව කියැවුණු දෙදෙනා පිණ්ඩපාතිකත්වයට සුදුසු වෙති. ඉතිරි තුන්දෙනා තම්පමණින් පිණ්ඩපාතික වනුමුත් ගුණාන්විතයෝ නොවෙති.

මේ ආකාරයෙන්ම **ඛලුපච්ඡාභත්තික-ඒකාසනික පංසුකූලික - තෙචීවරික - ආරඤ්ඤික - රුක්ඛමූලික අබ්භොකාසික - නෙසජ්ජික - යථාසන්ථතික - සොසානික යන පුද්ගලයන් අතරද' පූර්වෝක්ත පඤ්ච පිණ්ඩපාතික පුද්ගලානුරූප භෙද පඤ්චකය බැගින් ලැබේ.** ඔවුන්ගේ විස්තර විභාගයද පිණ්ඩපාතික පුද්ගල භෙදයෙහි දැක්වුණ පරිදිමය. ඒ ඒ ගුණයන්හි පිහිටීමේදී ඔවුන්ගේ අදහස් ක්‍රියා කිරීමේ ක්‍රමය අනුව යථෝක්ත පඤ්චවිධ භෙදය ලැබෙන බව සැලකිය යුතුය.

## පඤ්චක පුද්ගල විභාගය නිමි.

# ඡක්ක පුග්ගල පඤ්ඤත්ති.

## ෂඩ්විධ සත්‍යාවබොධක පුද්ගලයෝ.

i **සම්මා සම්බුද්ධ** යම් පුද්ගලයෙක් පූර්වයෙහි නොඅස-නලද චතුරාර්‍ය්‍ය සත්‍යධර්මයන් පරොපදෙශ රහිතව මනා-කොට තමාගේම නුවණින් අවබොධ කෙරේද, දතයුතු සියල්ල දක්තාබවට හා ශ්‍රද්ධාදී බලධර්මයන්හි වසඟ බවටත් පැමිණේද හෙතෙම සම්මා සම්බුද්ධ නම් වෙයි. බුදුරජාණන් වහන්සේ දතයුතු සියලු ධර්මයන් ස්වයම්භූඥානයෙන් දත් හෙයිනුදු, වැඩියයුතුසියලු ධර්මයන්වැඩූ හෙයිනුදු,හළයුතුසියල්ල දුරුකළ හෙයිනුදු, ප්‍රත්‍යක්ෂ කළ යුතු දෑ සාක්ෂාත්කළ හෙයිනුදු,සම්මා සම්බුද්ධ නාමයෙන් හැඳින්වෙති. වදාරන ලද්දේමැයි.

**අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බඤ්ච භාවිතං**
**පහාතබ්බං පහීනමෙම - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ**

තවද අනෙක දුඃඛ හෙතුක චක්ෂුස දුඃඛ සත්‍යයනමැයිද, ඒ ඇස පහළවීමට මූල කාරණවූ රූපදර්ශනයෙහි ආශායෙන් හටගත් පූර්ම තණ්හාව සමුදය සත්‍යය නමැයිද, යථොක්ත චක්ෂුසෙහි හා එය ඉපදීමට හෙතුවූ තෘෂ්ණාවගේත් නොපැ-වැත්ම නිරොධ සත්‍යය නමැයිද, එම නිරොධය අවබොධ කරගන්නා ප්‍රතිපදාව මාර්ග සත්‍යය නමැයිද, චක්ෂුරාදී ඉන්ද්‍රි-යයන් පිළිබඳ තත්ත්වාවබොධය තොමේම මනාකොට ලබනුයේ සම්මා සම්බුද්ධ නමැයි දතයුතුය. උක්ත ප්‍රකාරයෙන් ස්කන්ධ ධාත්වායතනාදීන් පිළිබඳ වැද සිවුසස් පිළිවිදීම බුදුවරයන්ගේ සිරිතය. නිර්වාණාවබොධය සඳහා උපයොගීවන යම්තාක්දෑ වෙත්ද ඒ සියල්ල ස්වයම්භූඥානයෙන් දැනගත හැකිවීම සර්-ඥවරයකුගේ බුද්ධිබලයේ මහිමය වේ. එපමණකුදු නොව තමා අවබොධ කොට ගත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් නිරා-ශාසයෙන් අන්‍යයනට ද අවබොධ කරවන්නට හැකි සාමා-ර්ථ්‍යයක් උන්වහන්සේට තිබේ. සත්වයන්ගේ චරිතාධිමුක්තීන් බලා ඔවුනට චතුස්සත්‍යාවබොධය ලැබෙනසේ ධර්මදෙශනා

කරන්නට සමර්ථවරයෙකුට හැකිය. ආශයානුශය ඥානය නම්වූ විනෙය ජනයන්ගේ සිත් හසර දැනගන්නා විශිෂ්ට ඥානයක් පහළවැ පැවැතීම එයට හෙතුවය. තවද චතුරාර්‍ය්‍ය සත්‍යයන් විෂයයෙහි සිවුමගින් කළයුතු සත්‍යඥානාදි ෂොඩශවිධ කෘත්‍යයක් ඇත. එය සම්පූර්ණවූ කල්හි සියලු කෘත්‍යයන් කොට නිමියේ වෙයි. සිවුසස් පිළිවිදීමේ එම සොලොස් ආකාරය සපුරා කෘත්‍යකෘත්‍යයෙහි පිහිටි සම්බුදුවරයෝ '**අභිඤ්ඤා වොසාන පාරමිප්පත්ත**''යි ප්‍රතිඥ කෙරෙති. පරොප දෙශයක් හෝ පරොපකාරයක් නොමැතිවැ හුදෙක් තමාගේමැ නුවණින් චතුස්සත්‍යාව බොධය ලබන්නට කල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති චතුර සඞ්ඛ්‍යයක් හෝ අෂ්ටාසඞ්ඛ්‍යයක් හෝ සොළසා සඞ්ඛ්‍යයක් පාරමී ධර්‍මයන් පිරිය යුතුය. ඒ සා දීර්ඝකාලයක් මුළුල්ලෙහි පරිභාවිත චින්තාශක්තියකින් ම මෙම අනන්‍යසාධාරණ උත්තරිතර සම්බුද්ධ පදවිය අත්පත් කර ගත යුතුය. **එබැවින් අනන්තාපරිමාණ කාලයක් තුළ සමතිංශත් පාරමී ධර්‍මයන් අඤ්ඤනවැ අනධිකවැ සම්පූර්ණකොට බුද්ධත්වය ලබා සත්වයාගේ සංසාරික විමුක්තිය සලසාලන පෙර නොඇසූවිරූ චතුස්සත්‍යයන් ස්වයම්භූඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකළ අද්විතීය අසහාය පුද්ගලයා සම්මාබුද්ධ නමැයි දන්නේය.**

ii **පච්චෙකබුද්ධ** යම් පුද්ගලයෙක් යථොක්ත චතුරාර්‍ය්‍ය සත්‍යධර්‍මයන් පරොපදෙශ රහිතව තෙමේම අවබොධ කරගත් නමුදු ඒ පිළිබඳ සියල්ල දක්නා බවට හෝ ශ්‍රද්ධාදී පඤ්චවිධ බල ධර්‍මයන්හි වසඟබවට හෝ නොපැමිණේද හෙතෙම පච්චෙක සම්බුද්ධ නම් වෙයි. චතුරාර්‍ය්‍ය සත්‍යධර්‍මයන් අනාචාර්‍ය්‍යකව අවබොධ කළද, එය අන්‍යයනට දෙශනා කොට ආචාර්‍ය්‍යත්වයෙහි පිහිටා ප්‍රතිවෙධය කරවීමේ ශක්තියක් මෙම උත්තමයාට නැත. එහෙයින්ම ප්‍රත්‍යෙක සම්බුද්ධ නමින් හැඳින්නේ. ධර්‍මාවබොධය උන්වහන්සේට පමණක් සීමාවී පැවතීම එයට හෙතුවය. අන්‍යයනට ධර්‍මාවබොධය ලබාදෙන්නට ඔවුන්ගේ චරිතාධිමුක්ති දත යුතුය. ආශයානුශය ඥානයනොමැති හෙයිනෙකුන්හට මෙරමා චිත්තාචාරය හත්වූ පරිදි දැනගත නොහැකිබැවින්

එබඳු ඥාන ශක්තියක් නැති පසේබුදුවරයන් වහන්සේගේ ධර්මාවබෝධය තමහට පමණක් සීමිත වනු පුදුමයක් නොවේ. එහෙයින් අනෙක් කෙනෙකුන්හට සසරදුක් කෙළවර කරනු සඳහා වැඩසාදදීමට පිළිවන් කමක් නැත. මෙපරිද්දෙන් ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රත්‍යක්ෂ කරවීමට නොහැකිවුවද, ලෞකික සම්පත් අත් පත් කර දීමට නොහැකි නොවේ. උන්වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කරන්නවුන් හට තමහට රිසියෙන වට්ට සම්පත් සාධාගන්නට පිළිවන. එහෙත් විවට්ට සම්පත්ති සාධනයක් කිසිසේත් නොසිදුවේ. මෙසේ අසම්පූර්ණ සම්බන්ධයක් ලැබගෙන සිවුසස් පිළිවිදීමේ වාසනා ශක්තිය පවා උන්වහන්සේ අත් පත් කරනුයේ දෙයා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දනාදි පාරමිතාවන් පූරණය කිරීමෙනැයි දතයුත්තේය.

iii **සාවක පාරමිප්පත්ත** යම් පුද්ගලයෙක් චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබෝධකොට ගෙන ඉහාත්මයෙහිදීම සසර දුක් කෙළවර කෙරේද, ශ්‍රාවක පාරමී බවටත් පැමිණේද, හෙතෙම ශ්‍රාවක පාරමී ප්‍රාප්ත නම් වෙයි. මේ ශාසනයෙහි **ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාචාර්‍ය්‍යවරයෝ මෙයට අයත්වෙති.** ශ්‍රාවක පාරමීඥානය මුදුන්පත්කරලීම මෙම මහා ශ්‍රාවකයන්ගේ විශේෂය වශයෙන් සැලකියහැකිය. උන්වහන්සේලා සම්බෝධි සඞ්ඛ්‍යාත පාරතීර ප්‍රාප්ත වීමට අතිශයින් ඉවහල් වන දනසීලාදී ගුණධර්මයන් එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පිරීමෙන් ශ්‍රාවක පාරමී ඥානයාගේ පරම කොටියට පැමිණියහ. ගෞතම බුද්ධ සාසනයෙහි සිවුසස් පිළිවිදි ශ්‍රාවකයන් අතර ප්‍රමුඛස්ථානයට පැමිණීමෙන් අගසවු තැන්පත් වීමේ භාග්‍යය ලදුයේ එහෙයිනි. අනෙක් ශ්‍රාවකයන්ද සිවුසස් පිළිවිදින නමුදු, යථෝක්ත අග්‍ර ශ්‍රාවකයෝ විශේෂ ගුණ සහිතව නිවන් අවබෝධ කළ හෙයින් මෙසේ වෙන්කොට දක්වුණහ. තවද මෙහි චතුස්සත්‍යාවබෝධය තුමූමැ කළසේ සඳහන් වුවද,

බුදු පසේබුදුවරයනට මූත් අනෙක් කෙනෙකුට සවබුද්ධි-යෙන් පරොපදෙශ රහිතව තිවත් ප්‍රත්‍යක්‍ෂ කරගන්නට ශක්-තියක් නැත. බුදුවරයන් දක්වන මාර්‍ගයෙහි ගමන්කිරීමෙන්ම එය අවබොධ කටයුතුය. පරතොඝොස ප්‍රත්‍ය බලයෙන් එසේ කරන තමුදු පුද්ගල භෙදය බෙද දක්වන්නට මෙප-රිද්දෙන් ඉගැන්විණ.

iv **අරහා** යම් පුද්ගලයෙක් පෙර නොඇසූ විරූ සිවු-සස් දහම් පිළිවිදීද, මෙ අත්බැව්හිම සසරදුක් අවසන් කෙරේද හෙතෙම අර්‍හත් නම් වෙයි. ශ්‍රාවක පාරමී ඥනාවබොධයක් නොලද තමුත් ජාත්‍යාදී දුක් නිමාවට පමුණුවා සත්‍යයන් ප්‍රත්‍යක්‍ෂකළ උත්තමයා මෙනමින් හැඳිනෙයි. අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනා වහන්සේ හැර සෙසු රහත්හු මේ භෙදයෙහි සඞ්ග්‍රහ වෙති.

v **අනාගාමි** යම් සත්‍යාවබොධක පුද්ගලයෙක් පෙර අත්බැව්හි නොමදත් චතුසසත්‍යයන් අවබොධ කළ තමුදු, මෙලෙම්හිදිම දුක් කෙළවර කිරීමක් නොකෙරේද, කාමලො-කොත්පත්තියට හෙතුභූත ආශ්‍රවයන් ක්‍ෂය කළ හෙයින් සප්තකාම සවර්‍ගයෙහි උපතකට නොඑළඹේද, හෙතෙම අනා-ගාමී නමැයි දන්නේය. මෙම ආත්ම භාවයෙහිදී තිවත් අව-බොධ කොට ගෙන දුක් දුරුකරන්නට ශක්තියක් මොහුට නැතද, කාමලොකයෙහි ස්කන්‍ධ පරිහරණය නැතිකළ හෙයින් ශුද්ධාවාසයෙක දී දුකින් මිදෙන්නේයි.

vi **සොතාපන්න සකෘදගාමි** යම් නැනැත්තෙක් පෙර නොඅසු විරූ ආර්‍ය්‍ය සත්‍යයන් පරොපදෙශයෙන් අව-බොධ කරයිද; එහෙත් එ අත්බැව්හිදී දුක් කෙළවර කරන්-නට සාමාර්ථ්‍යයක් නැත්තේද, කාමලොකයට නැවතත් උත්පත්ති වශයෙන් පැමිණේද, හෙතෙම සොතාපන්න හා සකෘදගාමී නාමොපලක්‍ෂිත පුද්ගලයන් දෙදෙනකු වශයෙන් දක්නා ලැබේ. මේ දෙදෙනාගෙන් සොතාපන්න උඩත් පිරිසෙ සින් සත්වරක් පමණ කාමලොකයෙහි උපදී. සකෘදගාමී එක් වරක් උත්පත්තියලබාක්ලේශපරික්‍ෂීණයකොටදුකින් මිදෙයි.

සෝතාපන්න පුද්ගලයාගේ සසරින් මිදීම ආත්මභාව සත තුළ ක්ෂිප්‍ර ක්‍රමයකින් සිදුවෙයි. මත්තෙහි ඇති සකෘදාගාමි ආදි මාර්ගයන් පිළිබඳ විදර්ශනාවම ඔහුගේ දුක් කෙළවර කිරීමේ කාලය ප්‍රමාණ කෙරේ. හෙතෙම මහ පැණැති තියුණු විදර්ශ-කයෙකු වුවහොත් එකම භවොත්පත්තියක් ලැබ රහත්බවට පැමිණෙනුයේ ‘එකබීජී’ නමින් හැඳිනේ. විදර්ශනා ප්‍රඥව එයට වඩා අනුක්‍රමයෙන් හීනවුව, දෙ-තුන්-සිවු-පස්-සවැනි භවයන් නිපදවා රහත්වී දුකින් මිදෙනුයේ ‘කොලංකොල’ නම්වේයි. අන්තිම වශයෙන් සත්වන භවයකුදු නිපදවා රහත් වනුයේ ‘සත්තක්ඛත්තුපරම’ නමැයි දත්තේය. ප්‍රමාද විහාරී මන්දප්‍රාඥ වට්ටාභිරත පුද්ගලයෙකුගේ වුවද, සත්වන භවයෙහිදී විදසුන් නුවණ මුහුකුරායෙයි. සීසච්ඡේද-අසනි-පාතාදී බලාපොරොත්තු රහිත හදිසි කාලක්‍රියාවකට ඔහු ගොදුරු වුවද, ක්ලේශ පරිනිර්වාණයෙන් පසුවමැ ස්කන්ධ භෙද-ය වේ. සප්පටිසන්ධික කාලක්‍රියාවක් නම් නොවේමය.

## ෂට්ක පුද්ගල විභාගය නිමි.

# සත්තක පුග්ගල පඤ්ඤත්ති.

## සප්ත උදකූපම පුද්ගලයෝ.

ජලයෙහි ගිලෙන අයට උපමා කළහැකි පුද්ගලයෝ **සත්** දෙනෙක් ලොවැ විද්‍යමානවෙත්. වරක් ජලමග්නවූයේ එසේම සිටින්නෙක. උඩමතුවී නැවත ගිලෙන්නෙක. උඩමතුවී එසේම සිටින්නෙක. උඩට පැමිණ යායුතු දිසාව බලන්නෙක. උඩ මතුවී යායුතු දිශාභිමුඛව තරණය කරන්නෙක. උඩමතුව ප්‍රතිෂ්ඨා ස්ථානයක් බලා පිහිනා නැවත ගැඹුරට නොයනසේ සම්රතැනක පිහිටා සිටින්නෙක. උඩ මතුවී පිහිනා ගොඩ-බිමට පැමිණ යථොක්ත දුඃඛයෙන් මිදී සැපවිඳින්නෙකැයි ජලයෙහි නිමග්නවන සත්දෙනෙකුන්ගේ ආකාරය ගෙන මේ පුද්ගල භෙදය විභජිතය.

i **පුද්ගලයා** ඒකාන්තයෙන් කෘෂ්ණපක්‍ෂය සේ සම්මත අකුසලයන්ගෙන් සමන්විතය. ක්ලේශයන්ගෙන් භරිතය. නාස්තිකවාද අහෙතුකවාද අකිරියවාද වශයෙන් ප්‍රසිද්ධ නියත මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවන මේතෙම භවයෙහි ගිලී සිටින්-නෙකි. ජලයෙහි ගිලුනකු උඩ මතුවිය නොහී එසේමැ සිටිනු මෙන් ජාත්‍යාදී සංසාරික දුක් අනුභව කෙරෙමින් වෙසෙයි. නැවත නැවත භවොත්පත්තිය ලබා සංසාර සාගරයෙහි ගිලෙනු මිස ඉන් නැඟී සිටින්නට පුණ්‍යශක්තියක් ඔහුට නැත. අනවරතයෙන් ලොභද්වෙෂාදි පාපයන්ගෙන් භරිතවැ වෙසෙනුයේ **මක්ඛලිගොසාලාදී ශාස්තෘවරයන් මෙන්** යට යට පවත්නා නරක ගිනිවලට ආහාර වෙයි. කප් කෙළසුවහසක් ගියද ඔහුගේ සංසාරික ප්‍රවෘත්තිය කෙළවරකට නොපත්වේ. ක්ලේශෞඝයෙහිගිලී උඩටඊමක් නොමැතිව සිටින්නට සිදුවේ පින්පව් පිළිබඳ හැඳිනීමක් හෝ විශ්වාසයක් නැති හෙයින් ලොභ ද්වේෂ මොහාදී ක්ලේශ භාරයෙන් යට යට භවයන් කරා හදනා ලදුව, එක්වරකුදු මතුවන්නට හැකි ශක්තියක් නැතිවැ එහිමැ වෙසෙයි.

iii **පුද්ගලයා** කුසල් දහම්හි ශ්‍රද්ධාව මැනව හිරිය ඝනපති. ඔත්තප්පය සුදුසුය. වීර්‍ය්‍යය සුන්දරය. ප්‍රඥාව මනා මැයැයි ගනනේය. එහෙත් එම ශ්‍රද්ධාදිය ඔහුතුළ ස්ථිරව නොප වතී. ස්වල්පයකුදු නොමවැඩෙයි. මොහොතකුදු නොපැවත ඉන් පිරිහෙයි. ඔහුගේ සිත්තුළ තාවකාලිකව වුවද, කුසල ච්ඡන්දයක් පහළවීම ,සසරින් එතරවීමට හෙතුවන ආරම්භයක් පමණි. එපමණකින් ජලෞඝ යෙන් මතුවූ පුද්ගලයා හා සං-සන්දනය වේ. ඔහුට ජලයමතුපිට සිටිය නොහැකිව නැවතත් යටයන්නට සිදුවනු මෙන් මහත් වීර්‍ය්‍යයෙන් උපදවාගත් කුසල් සිත පවත්වාගන්නට හෝ දියුණුකර ගන්නට අවස්ථා වක් නොලැබේ. **දෙවදත්තාදීහු මේ පුද්ගල භෙදයට අන්තර්ගත වෙති.** දෙව්දත් මෙසසුන්හි පැවිද්ද ලැබ පඤ්චා භිඥා අෂ්ටසමාපත්තීන් උපදවා ගත් නමුත් බුදුරදුන් කෙරෙහි වෛරබැඳ එම ගුණයන්හි පිහිටා සිටින්නට අසමත්විය. සඞ්ඝ-භෙද රුධිරුප්පාදාදී පඤ්චානන්තර්‍ය්‍ය කර්මයන්කොට නිරයෙහි උපන. ඔහුඅනුවගිය කොකාලික ස්ථවිර දෙඅග සව්වනට උප-වාද කොට පදුම නිරයෙහි ගිණි. මෙපරිද්දෙන් වරෙක පහළ-කැරගත් ශ්‍රද්ධාදී පුණ්‍ය චෙතනාවන් ස්ථිරකරගතනොහී ඉන් පිරිහෙනුයේ ජලයෙන් උඩමතුවී නැවතත් යටට බස්නා පුද්-ගලයා හා සමවෙයි.

iv **පුද්ගලයා** සද්ධා හිරි ඔත්තප්පාදී කුසල ධර්ම්යන් ගේ සාධුත්වය පිළිගෙන එය ආරක්‍ෂා කරයි. පිරිහෙන්නට ඉඩ නොදෙයි. එතකුදුවුවත් වැඩීමකටද උත්සාහ කරන්නේ නොවේ. ශ්‍රද්ධාදී කුසලච්ඡන්දයන් රැකෙන පරිදි පින් දහම් කරන්නට අසමර්ථ කල්හි පිරිහීමක් හෝ සමර්ථ කල්හි වැඩී-මක් හෝ සිදුනොවේ. කුසල ක්‍රියාවන් කරන්නට පොහො-සත් කමක් නැති අපහසු කාලයෙහි දානසීලාදී යම්පිනක් රැස් කරයිද, සලාක භත්ත පක්ඛික භත්තාදී පින්කම් සිතුසේ කළ හැකි පොහොසත් කල්හිදු කරනුයේ එපමණමය. කිසි යම් වෙනසක් නොකොට පෙරකළ පරිදිම අඩුවැඩියක් නොවන

සේ එම පුණ්‍යක්‍රියා මාත්‍රයම පවත්වයි. මෙසේ කිරීමෙන් ඔහුගේ පින්කම්වල වැඩීමක් නොවනු මෙන්ම පිරිහීමක් ද නොසිදුවන බව දතයුතුය. මෙතෙම ජලයෙන් මතුවී නැවත ගිලීමක්නැතිව එසේම සිටින්නට සමර්ථ තැනැත්තහු වැන්න ජලයෙන් මතුවූ පුද්ගලයා නොගිලී සිටින්නට කොතෙක් සමර්ථ වුවද, අනතුරායෙන් මිදුන තත්ත්වයක සිටිනියි ස්ථිරව සිතිය නොහැක. එමෙන්ම මහත් උත්සාහයෙන් උපදවා ගත් ශ්‍රද්ධාදිය නොවැඩෙන කල පිරිහෙන්නටද ඉඩඇත. එබැවින් මොහුගේ තත්ත්වය නියම ස්ථිරත්වයෙහි පිහිටිය කැයි ගණන්ගත නොහේ.

iv **පුද්ගලයා** ශ්‍රද්ධාදී කුසලච්ඡන්දයන් පහළ කරගත සසරින් එතර වන රිසියෙන් ක්‍රියාකරයි. ත්‍රිවිධ සංයෝජනයන් ක්‍ෂයකොට සම්බෝධියම පිහිටකොට නිශ්චිත භව හැසිරීම් ඇතිවැ සෝතාපන්නවැ වෙසෙසි. මොහුගේ ගතිය ස්ථිරය. අත්බැව් සතකට වඩා සසර නොසිටී. ස්ථිරලෙසම වට්ට දුඃඛයෙන් මිදෙන්නට කටයුතු ඇරඹිණැයි කිවහැක්කේය. මෙතෙම ජලයෙහි ගැලී උඩට පැමිණ යායුතු මාර්ගය හෝ දිසාව බලන පුද්ගලයා මෙන්, සසර සයුරින් එතරවැ නිවන්පුර වදනට කවරදු හෝ අවස්ථාව සලසා ගන්නේය.

v **පුද්ගලයා** ශ්‍රද්ධාදී කුසල චේතනාවන් උපදවාගෙන පූර්වෝක්ත ත්‍රිවිධ සංයෝජනයන් නසා රාගද්වේෂ මෝහයන් තුනීකළ කෙනෙකි. එක්වරක් උත්පත්ති වශයෙන් කාම-ලෝවට පැමිණෙන හෙතෙම සකෘදගාමි වූවෙකි. දියෙන් මතුවී ගොඩට පැමිණීම සඳහා මහදුත්සාහයෙන් පිහිනන පුද්ගලයා මොහු හා සමතැන් ගනී. ස්කන්ධභාරය අධික වුවකුට පිහිනිය නොහැකි වනුමෙන් කෙලෙස් බරින් සසර සයුරු පත්වලට අදහා ලබන්නකුට එගර විය නොහේ. සකෘදගාමි ක්ලේශයන් තුනීකළ කෙනෙකු හෙයින් මෙහි පිහිනන්නකු කොට දක්විණ. ශකෘදගාමි මාර්ගඥානයෙන් බෙහෙවින් බහා

තැබූ කෙලෙස් බර ඇති හෙයින් මොහුට අභිමත ස්ථානයට ගමන් කරන්නට අපහසුවක් නැත.

vi **පුද්ගලයා** කුසල් දහම්හි ශ්‍රද්ධාදිය පහළ කර ගැනීම මැනැවැයි පිළිගෙන බවුන් වඩා ඔරම්භාගිය සංයෝජනයන් නසා පඤ්ච ශුද්ධාවාසයෙක ක්ලේශ පරිනිර්වාණය කරන අනාගාමියෙකි. උත්පත්ති වශයෙන් කාමලෝකයට නොපැමිණෙන මෙතෙම ජලයෙන් මතුවූ විගස යායුතු දෙසට පිහිනමින් ගොස් එක් ප්‍රතිෂ්ඨාස්ථානයකට සැපත් ජලමග්න පුද්ගලයා වැන්නැයි කිවයුතුය.

ජලහිරුකයෙකුට මද අස්වැසිල්ලක් ලැබෙනුයේ සැඩපහරින් ගැඹුරට ගසාගෙන නොයන ස්ථානයකට පිහිනන්නට ලැබීමෙනි. ජලයෙහි ගිලීමෙන් වන දුකින් මිදුණුබව සපිරව දැනගැනීම එයට හෙතුවය. එපරිද්දෙන් සත්වයකුගේ කාම්ලොව විසීම ඉන්ද්‍රියයන් පිනවා කාමීයන් රැස්කොට ජාත්‍යාදී දුඃඛයන් හා ආපායිකාදී දුඃඛයන් ලුහාකර ගැනීමකි. අනාගාමි පුද්ගලයා කාම්ලොව ඉපැත්මට හෙතුවන සංස්කාරයන් විනාශ කොට සංසාරික දුඃඛයන්ගෙන් එක්තරා ප්‍රමාණයක් සිතින් දුරුකළ කෙනෙකි. කොතෙක් උත්සාහ කළද, නැවතත් ඔහුගේ සිත්සතන් තුළ එම දුක් පහළකරගත නොහැකිය. අනුක්‍රමයෙන් දුඃඛක්‍ෂය කරා ගමන් කරන හෙතෙම, ගොඩට යන අතරමග ප්‍රතිෂ්ඨාස්ථානයක් ලැබ ජලභීතියෙන් තොරව ගොඩබිමට ළංවීමේ ප්‍රීතියෙන් ඔදවැඩී සිටින පුද්ගලයා මෙනැයි කියනු උචිතතරය. අනතුරුව ලැබියයුතු නිවන් අරමුණුකොට පහළවූ නිරාමිස සුඛයෙන් යුක්තව වසන හේ මත්තෙහි පහළ කරගතයුතු මග බවුන් වඩමින් කල් යවන්නේ යි.

vii **පුද්ගලයා** තම සිත්සතන්හි ශ්‍රද්ධා ප්‍රඥාදිය උපදවා ගැනීම කුසල් නමැයි සලකා ඊට අනුරූප ප්‍රතිපදාවෙහි හැසිරෙයි. සමථ විදර්ශනා වඩාඑම අත්බැව්හිම ක්ලේශක්‍ෂය කොට චිත්තසමාධිය හා ඵලප්‍රඥාව උපදවා මහරහත් බවට පැමිණේ. එවිට ජලෞඝය තරණය කොට පරතෙරෙහිවූ

ගොඩබිමට පැමිණ සුව විඳුනා පුරුෂයා වැනිවේ. වෘත්තත්‍ර-යයෙහි ගැලීසිටින සත්ත්වයා ඉන් මිදීමට අදහස් නොකොට නියත මිථ්‍යාදෘෂ්ටිකයෙකු වීම නැවත නැවත එහිම ගැසීරි-මට හෙතුවේ. යම්හෙයකින් ශ්‍රද්ධාදී කුසල චෛතසිකවන් උපදවා ගැනීමට හැකිවූයේ නම් එය ඉන් මිදීමට ආරම්භයක් සේ සැලකිය හැකිය. එපමණකින්ම තෘප්තියට නොපැමිණ පුන පුනා කාමාවචර රූපාවචරාදී කුසල් සිත් පහල කරගත හොත් වට්ටගාමී තත්ත්වය මදක් නවතා ගන්නට පිළිවන. හෙතෙම ආරබ්ධ වීය්‍ය්‍යීයෙන් යුක්තව ක්‍රියාකරන කල විවට්-ටය දෙස බලනු මෙනි, නව නවද සතනුයේ විවසුන් නුවණින් විවට්ටය කරා යන්නට පටන්ගන්නා ලදැයි කිව-හැක. නැවතද කුසල් සිත් වඩවඩා පහල කරන ප්‍රතිපද-වෙහි යෙදෙනුයේ විවට්ටගාමී මාර්ගයෙහි සපිරවැ පිහිටිසේ පිළිගැනේ. මෙසේ තවදුරටත් උත්සාහ වීය්‍ය්‍යීයෙන් එමග මැ මගනුයේ වට්ටයෙන් එතරවැ චතුරොඝයන් තරණය කොට විවට්ටයෙහිවූ නිර්වාණ ස්ථලයෙහි පිහිටියේ නිවන් අරමුණු කොට ඵලසමවත් සුව විඳුනේ සදකාලික සැපතට පැමිණි-යෙක් වෙයි.

උක්තප්‍රකාරයෙන් චතුරොඝයෙහි ගැලුණුසත්ත්වයා නිර්වාණ ප්‍රාප්තිය හෙක් ගමන්කරන සැටි මේ පුද්ගල භෙදයෙන් නිදර්ශිතය. ඒ ඒ අවස්ථාවන්හිදී ක්ලේශයන් ක්ෂය කරන්-නට යොදගන්නා උපාය මාර්ගයන්ගේ වශයෙන් ජල මග්න පුරුෂයා හා මොහුගේ අවස්ථා භෙදය නිරූපිතය.

**"උභතොභාග විමුත්ත – පඤ්ඤා විමුත්ත – කායසක්ඛි දිට්ඨිප්පත්ත – සද්ධාවිමුත්ත – ධම්මානුසාරි – සද්ධානු සාරී"** යන පුද්ගලයන් සත්දෙනා පිළිබඳවැ දතයුතුදේ එකක පුද්ගල වණ්ණනාවසරයෙහිදී කියැවිණ, නැවතත් විස්තර විසින් දක්වනු නුවුවමනා ප්‍රයාසයක්ද පුනරුක්තයක්ද වන හෙයින්

මෙහි නොදක්වේ. සෝවාන් මාර්ගඥානයේ පටන් අර්හත් ඵලඥානයතෙක් ලැබෙන ආර්ය්‍යයන්ගේ භේද තත්ත්වානුරූපව එක ස්ථලයෙක්හි දක්වන්නට යලිදු ඔවුන්ගේ පුද්ගලතාමයෝ මෙහිදු ගෙනහැර පාන ලදහයි හැඟේ.

## සප්ත පුද්ගල විභාගය නිමි.

# අෂ්ටක පුද්ගල පඤ්ඤත්ති.

## අෂ්ට ආර්‍ය පුද්ගලයෝ

චතුර්මාර්ගී සමඞ්ගී හා ඵල සමඞ්ගී ආර්‍ය්‍යයන්ගේ වශයෙන් මෙම පුද්ගල භෙදය දක්වෙයි. **“සොතාපන්න සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්න - සකදාගාමි - සකදාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්න - අනාගාමි-අනාගාමි ඵල සච්ඡිකිරියාය පටිපන්න - අරහා - අරහත්ත ඵල සච්ඡිකිරියාය පටිපන්න”** යන නාමයන්ගේ වශයෙන් ලැබෙන මෙම ආර්‍ය්‍යයන් පිළිබඳ විශෙෂ විභාගය එකක පුද්ගල වර්ණනාවෙහිදී වෙන වෙනම දක්වූ හෙයින් මෙහි නැවත සඳහන් කිරීම අනුචිතය. රතන සූත්‍රයෙහි **“යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා”**යි මෙම පුද්ගලයන් අටදෙනාගේ දක්ෂිණාර්හ බව පළවෙයි. මාර්ගස්ථයා හා ඵලස්ථයා එක් යුගයක් සේ ගෙන යුග සතරක් වශයෙනුදු මෙම අට වැදෑරුම් පුද්ගලයෝ සඞ්ගෘහිතය හ. වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ශ්‍රාවක නාමය ගැලපෙනුයේ මෙම අටදෙනාහටය. අසන්නා ශ්‍රාවකත්වයෙන් සැලකෙතුදු, මොහු ඇසීමෙන්ම තෘප්තියට නොපැමිණ අසාගත් දෑය අනුව කළයුතු ධර්මානුධර්ම ප්‍රතිපත්ති පුරා මාර්ගඵලවලට පැමිණියානුය. **“යාවතා භික්ඛවෙ සඞ්ඝා වා, ගණා වා, තථාගත සාවක සඞ්ඝො තෙසං අග්ගමක්ඛායති, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා”**යි දක්වෙන තථාගත වචනයෙන් මෙම පුද්ගලයන් අටදෙනාගේ උත්තරීතරත්වය මොනවට ප්‍රකාශ වේ.

අෂ්ටක පුද්ගල විභාගය නිමි.

# නවක පුග්ගල පඤ්ඤත්ති.

## නව විධ පුද්ගලයෝ

**සම්මා සම්බුද්ධ-පච්චෙක බුද්ධ-උභතොභාග විමුත්ත පඤ්ඤා විමුත්ත-කාය සක්ඛි-දිට්ඨිප්පත්ත - සද්ධාවිමුත්ත ධම්මානුසාරී-සද්ධානුසාරී"** යන ආර්යයන්ගේ සංකලන-යෙන් නවකපුද්ගල භෙදය වදරාතිබේ. එකක පුද්ගල ප්‍රඥප්-තියෙහිදු මෙම පුද්ගලයෝ වෙන් වෙන්ව ගෙන පෘථගාර්ය-යන් වශයෙන් වදරන ලදහ. ඒ ඒ තන්හි දීම ඔවුන්ගේ විභාගයද කළහෙයින් මෙහිනැවත ගෙනහැරපෑමෙක් නොවේ.

# නවක පුද්ගල විභාගය නිමි.

---

# දසක පුග්ගල පඤ්ඤත්ති.

## දසවිධ නිෂ්ඨා පුද්ගලයෝ

කාමාවචර භූමියෙහිදී පරමාර්ථය මුදුන්පත්කරගෙන සසර සැරි සැරීම අවසන් කරන පුද්ගලයෝ පස්දෙනෙක්ද, රූපා-වචර භූමියෙහිවූ පඤ්ච ශුද්ධාවාසයෙහි දී එපරිද්දෙන්ම නිමා-වට පවත්වන පුද්ගලයෝ පස්දෙනෙක් දූයි මෙසසුන්හි නිෂ්ඨා පුද්ගලයෝ දසදෙනෙක් වෙත්. **සත්තක්ඛත්තුපරම කොලංකොල එකබීජී සකදාගාමී** යන පුද්ගලයන් සිවු-දෙනා හා මේඅත්බැව්හිදීම අර්හත්වයට පවත්වන පුද්ගලයාද යන පස්දෙනාගේ නිෂ්ඨාව සිදුවනුයේ කාමාවචර භූමියෙහිදීය. කාමාවචර ආත්මභාවයක් ලැබසිටියදීම රහත් බවට පැමිණී-මද. අනුපාදිශෙෂ පරිනිර්වාණයට පත්වීම ද, මෙම පුද්ගල ස්වභාවය වෙයි. මෙහි කාමාවචර භූමිභෙදයට සිව්‍ු අපාය ගැනෙතුදු සොතාපන්න වනු සමගමැ අපායොත්පාදක ක්ලේ-ශයන් නැසෙන හෙයින් ඉතිරි සප්ත කාමස්වර්ගීය පමණක් ගන්නේයි.

**"අන්තරා පරිනිබ්බායී-අසඞ්ඛාර පරිනිබ්බායී-සසඞ්ඛාර පරිනිබ්බායී-උද්ධංසොත-අකනිට්ඨගාමී"** යන පඤ්ච පුද්ගලයන්ගේ නිෂ්ඨාව ශුද්ධාවාස වාසොපගතවැ සිදුවෙයි. මෙහි කාමාවචර අත්බැව්හි සිට සුද්ධාවාස අත්බැවකට පැමිණ විදසුන් වඩා රහත්වී සසර කෙළවර කරනු මෙම ආයතීයන්ගේ සිරිතය. කාමාවචර භූමිය නම්වූ මෙහිදී අනාගාමී ඵලයට පැමිණ මෙයින් චුතවී සුද්ධාවාසයන්හි ඉපද අර්හත්වයට ද, ඉන්පසු අනුපාදිශෙෂ පරිනිර්වාණයටද පැමිණ, සසර ගමන කෙළවර කිරීම මෙම පුද්ගලයන් පස්දෙනාගේ ස්වභාවයවෙයි.

නිෂ්ඨා නාමය නිෂ්පත්තිය හා අවසානයද වාචක බැවින් මෙසේද අදහස් කළහැකි. මෙම දසවැදෑරුම් පුද්ගලයෝ කාමාවචර ලොක හා සුද්ධාවාසයන්හිදී අර්හත් මාර්ගඥානයෙන් නිර්වාණය නිපදවා ගනිති. දේ නොහොත් ඇත්තාවූම නිවණට පැමිණීම කෙරෙති. එමෙන්ම අනන්තාපරිමිත කාලයක් මුළුල්ලෙහි භවයෙන් භවයට ගමන්කිරීම නම්වූ සංසාරික ප්‍රවෘත්තිය අවසන්කොට ආත්මීය ස්කන්ධ පඤ්චකයාගේ නිමාවද සිද්ධකෙරෙත්මය. එබැවින් අර්ථානුගත සංඥා වශයෙන් නිෂ්ඨානාම ප්‍රඥප්තිය ඔවුනට අත්‍යන්තයෙන් යොග්‍ය වෙයි. මෙපරිද්දෙන් යම් උත්තමයෙකු අර්හත් ඵලඥානයෙන් කර්මක්ෂය කළවිට ප්‍රතිසන්ධි විඥානය ක්ෂීණ වැ එම ආත්ම භාවයෙහි චරිම විඤ්ඤාණ නිරොධයෙන් රූපී හෝ අරූපී වශයෙන් කැරෙන නාමප්‍රඥප්තිය අහෝසි වී සත්වයෙකු ලෙස පැවැත්ම අවසන් වන බව දත යුතුයි.

## දසක පුද්ගල විභාගය නිමි.

මෙතෙකින්

සිංහල

පුග්ගල පඤ්ඤත්ති

විභාගය

නිමියේ යි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු